# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# PROGRESS REPORT

# 2024



විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

**Ministry of Foreign Affairs, Foreign Employment and Tourism**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

වෙளிநாட்டு அலுவல்கள்,வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

# MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

| | විදේශ කටයුතු<br>Foreign Affairs<br>வெளிநாட்டு அலுவல்கள் | විදේශ රැකියා<br>Foreign Employment<br>வெளிநாட்டு வேலைவாய்ப்பு | සංචාරක<br>Tourism<br>சுற்றுலாத்துறை |
|---|---|---|---|
| Address | ජනරජ ගොඩනැගිල්ල,<br>ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත,<br>කොළඹ 01<br>Republic Building,<br>Sir Baron Jayathilake Mawatha,<br>Colombo 01<br>குடியரசுக் கட்டிடம்<br>சேர் பாரொன் ஜயதிலக்க மாவத்தை<br>கொழும்பு 01 | 17 වන මහල "මෙහෙවර පියස"<br>නාරාහේන්පිට,<br>කොළඹ 05<br>17th Floor, "Mehewara Piyesa"<br>Narahenpita,<br>Colombo 05<br>17 மாடி "மெஹெவர பியேச<br>நாரஹேன்பிட்ட<br>கொழும்பு 05 | 696/4,<br>මරදාන පාර,<br>කොළඹ 10.<br>696/4,<br>Maradana Road,<br>Colombo 10.<br>696/4,<br>மருதானை வீதி<br>கொழும்பு 10 |
| Telephone | 0112 325 373/5<br>0112 207 200/7 | 0112 331 200 | 0112 381 798<br>0112 321 222 |
| Fax | 0112 446 091 | 0112 330 594 | 0112 436 672 |
| Email | cypher@mfa.gov.lk | info@mfe.gov.lk | secretary@tourismmin.gov.lk |
| Web | www.mfa.gov.lk | www.mfa.gov.lk | www.mfa.gov.lk |

## පටුන

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්.....05

විදේශ කටයුතු.....11

විදේශ රැකියා .....105

සංචාරක .....137

# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

1 කොටස: වගන්තිය (I) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක: 2412/08 - 2024 නොවැම්බර් 25

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III තීරුව* |
|---|---|---|
| **විෂයයන් සහ කාර්යයන්** | **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා** | **ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්** |
| 1. රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක විෂයයන්ට සහ II වැනි තීරුවේ දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම සහ ඇගයීම.<br>2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබාදීම.<br>3. නාස්තිය සහ දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමණාකරන ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.<br>4. විදේශයන් අතර ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපය ස්ථාපිත කරමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුල ක්‍රියාකාරී රටක් වශයෙන් සහයෝගීතාව පුළුල් කරමින් විදේශ රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම.<br>5. ජාත්‍යන්තර සහයෝගීතාවය පුළුල් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව අවශ්‍ය කටයුතු ඉටු කිරීම, සම්බන්ධීකරණය හා රජයට අවශ්‍ය උපදෙස් ලබා දීම<br>6. ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රතිරූපයට එල්ලවන අහිතකර ප්‍රචාරයන් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාර දැක්වීම හා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ස්ථාවර කිරීම | 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල<br>2. ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා ලේකම් කාර්යාලය<br>3. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය<br>4. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>5. ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය (පුද්ගලික) සමාගම<br>6. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය<br>7. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>8. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය<br>9. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | • කොන්සල් කාර්තව්‍ය පිළිබඳ පනත (1981 අංක 4 )<br>• රාජ්‍ය දූත වරප්‍රසාද පනත (1996 අංක 9)<br>• 2000 අංක 45 දරන ශ්‍රී ලංකා උපායමාර්ගික අධ්‍යයන ආයතන පනත.<br>• සංචාරක පනත (2005 අංක 38)<br>• ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත (1985 අංක 21)<br>• ගාස්තු අය කිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත (1956 අංක 37)<br>• වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිත පවරා නොමැති මෙහි I සහ II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

| | | |
|---|---|---|
| 7. දේශපාලන, ආර්ථික, පාරිසරික, සමාජීය හා සංස්කෘතික සහයෝගිතා සම්බන්ධයෙන් අන්තර් ජාතික හා කලාපීය සංවිධාන සමග සක්‍රීයව කටයුතු කිරීම<br>8. විදේශ රටවල් සමග රාජ්‍ය දූත සබඳතා පවත්වාගෙන යාම හා ප්‍රඥප්ති, ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ සාකච්ඡා කිරීම<br>9. රාජ්‍ය දූත විශේෂ මුක්ති හා වරප්‍රසාද ලබාදීම<br>10. විදේශීය වෙළඳ, ආයෝජන , සංචාරක, රැකියා හා විදේශ මුල්‍ය සබඳතා කටයුතු ප්‍රවර්ධනය සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන වලට අවශ්‍ය සහාය ලබා දීම.<br>11. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා සමුද්‍රික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන විදේශ සබඳතා තහවුරු කිරීම<br>12. විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුබසාධනය පිළිබඳ අවශ්‍ය පියවර ගැනීම කොන්සියුලර් සේවා සැපයීම.<br>13. කොන්සියුලර් සේවාවන් සැපයීම<br>14. ශ්‍රී ලංකා විදේශ සේවාව සහ විදේශිය දූත මණ්ඩලවලට අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ගේ පරිපාලනය සහ වෘත්තිමය කුසලතා නැංවීමට අවශ්‍ය පියවර ගැනීම<br>15. භූ දේශපාලන ප්‍රවණතා අධ්‍යනය කිරීම සහ ශ්‍රී ලංකාවට හිතකර අයුරින්, එම ප්‍රවණතා කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ග පිළිබඳ රජයට උපෙදස් දීම.<br>16. නව විදේශ ප්‍රතිපත්ති අරමුණු සපුරාලීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු සුදුසු ක්‍රියාමාර්ග ගැනීම<br>17. ආර්ථික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් කිරීම අරමුණු කර දූත මණ්ඩල විවෘත කිරීම නිර්දේශ කිරීමට ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින, නැගී එන රටවල් සහ ප්‍රදේශ ඇගයීම<br>18. වෙළඳ ප්‍රවර්ධනය, සංචාරක ප්‍රවර්ධනය, වෘත්තීය සහ | | |

| | | |
|---|---|---|
| වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථා සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශීය දූත මණ්ඩලවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම<br>19. රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලීන් වඩාත් කාර්යක්ෂමව සහ පුරවැසියාගේ සහ රාජ්‍යයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා ඒවා සරල කිරීම සහ විධිමත් කිරීම<br>20. නිරන්තර අධීක්ෂණය තුළින් වගවීම සහතික කරන අතරම ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මූලාරම්භ ගැනීමට විදේශ තානාපති කාර්යාල බලගැන්වීම.<br>21. මෘදු බලය (soft power) ගොඩනගා ගැනීමට සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීමට විදේශයන්හි ශ්‍රී ලාංකීය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවීම<br>22. රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය සහ ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ශක්තිමත් කිරීම<br>23. ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ ඇගයීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>24. අදාළ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයට සහ විදේශ කටයුතු අමාත්‍යාංශයට සම්බන්ධ වීම සඳහා සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවක් සිටින සෑම රටකම ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සමඟ උපදේශක මණ්ඩලයක් පිහිටුවීම<br>25. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම | | |

| | | |
|---|---|---|
| හා එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවන් වැඩි දියුණු කිරීමට අදාළ ආයතන සමග කටයුතු කිරීම<br>26. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා නියාමන ක්‍රියාවලීන් හඳුන්වා දීම<br>27. විදේශගත ශ්‍රමිකයින් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට හා ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැපයීම<br>28. විදේශ රැකියා නිම කර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් කියාත්මක කිරීම<br>29. මැදෙපරදිග හා වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම<br>30. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තිමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය පවත්වා ගැනීම<br>31. විේදශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබාගැනීේම් කියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය පතිසංස්කරණ හඳුන්වාදීම රැකියා නියෝජිතායතන මගින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම<br>32. විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීම<br>33. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම<br>34. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම හා විදේශ රැකියා නියෝජිතායතන විසින් රැකියා ස්ථාන සඳහා යොමු කිරීමේදී විදේශ රැකියාවල නියුක්තවන අයගේ සුභසාධනය තහවුරු වන ලෙස කටයුතු කිරීම | | |

| | | |
|---|---|---|
| 35. නුපුහුණු අය වෙනුවට නිපුණතා සහිත පුහුණු පිරිස් විදේශ රැකියා සඳහා යැවීමට අවශ්‍ය පියවර ගැනීම<br>36. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම<br>37. සංචාරක නියෝජිතායතන හා සංචාරක කර්මාන්තයේ යෙදුන්නන් ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු<br>38. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඪ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් ශ්‍රී ලංකාව සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම<br>39. සංචාරකයින් සඳහා නිවාඩු නිකේතනයන් හා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථාන, හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම<br>40. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම<br>41. සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම<br>42. ස්වභාවික හා සංස්කෘතික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම, සංචාරක කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය, නව සංචාරක සේවා සංවර්ධන සහ ප්‍රමිතිකරණය, උපායමාර්ගික ගමනාන්ත ප්‍රවර්ධනය ආදිය සඳහා කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම | | |

| | | |
|---|---|---|
| 43. ආයුර්වේද චිකිත්සාව ඇතුළු සමස්ත වෛද්‍ය සේවා සහ ප්‍රතිකාර ලබාදීමෙන් වෛද්‍ය සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම<br>44. ක්‍රීඩා - සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම<br>45. දෘශ්‍ය කලාව සඳහා වන ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ සංචාරක කර්මාන්තය ඒකාබද්ධ කිරීම<br>46. සංචාරක කර්මාන්තය තුළ සංස්කෘතික උරුමය විශේෂ පැතිකඩක් ලෙස ප්‍රවර්ධනය කිරීම<br>47. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් හා එම ආයතනවලට පැවරී ඇති සියලුම විෂයයන්ට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම<br>48. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

# විදේශ කටයුතු
# வெளிநாட்டு அலுவல்கள்
# FOREIGN AFFAIRS

**ජනරජ ගොඩනැඟිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව**
**குடியரசு கட்டிடம், கொழும்பு 1**
**Republic Building, Colombo 1, Sri Lanka**

011-2325373/375 0112333450/ 2446091 / 2430220 cypher@mfa.gov.lk www.mfa.gov.lk

පටුන

විදේශ කටයුතු පිළිබඳ දැක්ම සහ මෙහෙවර ........................................................................ 15
ආයතනික ව්‍යුහය ........................................................................ 16
සාරාංශය ........................................................................ 17
I වැනි රූප සටහන - විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ කාර්යාල ජාලය ........................................26
II වැනි රූප සටහන - අංශවල ව්‍යුහය ........................................27
I වන වගුව - ඉහළ මට්ටමේ සංචාර - අභ්‍යන්තර........................................28
II වැනි වගුව - ඉහළ මට්ටමේ සංචාර: බාහිර ........................................29
අංශයන්හි ප්‍රගති සමාලෝචනය: අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ........................................ 31
1. ආර්ථික කටයුතු අංශය........................................31
2. මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශය ........................................35
3. ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගිතා අංශය........................................36
4. සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය ........................................38
5. කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශය සහ හදිසි ප්‍රතිචාර ඒකකය ........................................40
6. මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය ........................................41
7. දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (සාර්ක්) අංශය ........................................43
8. එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය........................................45
අංශවල කාර්සාධන සමාලෝචනය: දේශපාලන කටයුතු අංශ ........................................ 50
**9.** අප්‍රිකානු කටයුතු අංශය........................................50
10. නැගෙනහිර ආසියානු අංශය ........................................51
11. ලතින් ඇමරිකානු සහ කැරිබියානු අංශය ........................................53
12. මැද පෙරදිග අංශය........................................58
13. යුරෝපා සහ උතුරු ඇමරිකානු අංශය........................................60
14. දකුණු ආසියානු අංශය ........................................66
15. අග්නිදිග ආසියාව සහ මධ්‍යම ආසියානු අංශය........................................72
අංශවල ප්‍රගති සමාලෝචනය: මෙහෙයුම් අංශ........................................ 80
16. කොන්සියුලර් කටයුතු අංශය........................................80
17. සාමාන්‍ය පරිපාලන අංශය........................................82
18. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය ........................................84
19. අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය........................................87
20. නීති අංශය ........................................88
21. විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය ........................................93
22. සන්ධාන අංශය ........................................95
අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ........................................ 97
මූල්‍ය වාර්තා ........................................ 98
ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKIIRSS)...........100

විදේශ කටයුතු පිළිබඳ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

**ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම.**



## මෙහෙවර

**ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම.**

# ආයතනික ව්‍යුහය



විදේශ කටයුතු, විදේශ රැකියා, සංචාරක අමාත්‍ය
විදේශ කටයුතු, විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය
සංචාරක නියෝජ්‍ය අමාත්‍ය
ලේකම්/ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක
අමාත්‍ය කාර්යාංශය
නියෝජ්‍ය අමාත්‍ය කාර්යාංශය
ලේකම් කාර්යාංශය

**සාරාංශය**

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 සමඟ අනුකූල වන පරිදි පෙළගස්වන ලද 2024 වාර්ෂික ප්‍රගති වාර්තාව, 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය හරහා අමාත්‍යාංශයට ලබා දී ඇති බලතල ප්‍රකාරව 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් අත්කර ගත් ප්‍රගතිය ගෙනහැර දක්වයි. ඉහත සඳහන් ගැසට් නිවේදනය හරහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක යන ක්ෂේත්‍ර ඒකාබද්ධ කරන ලද අතර ඊට පෙර වෙනම අමාත්‍යාංශ තුනක් ලෙස ක්‍රියාත්මක විය. වාර්ෂික ප්‍රගති වාර්තාවේ මෙම කොටස අමාත්‍යාංශයේ විදේශ කටයුතු අංශයට අදාළ කටයුතු ආවරණය කරයි.

රටේ ආරක්ෂාව සහ සමෘද්ධිය සහතික කිරීමේ අරමුණින් හා විදේශයන්හි ශ්‍රී ලංකාවේ අනන්‍යතාව ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති විදේශ කටයුතු අංශය, ප්‍රධාන වශයෙන් කටයුතු කරයි. ජාත්‍යන්තර සබඳතා පැවැත්වීම, විදේශ ජාතීන් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීම, රටේ ජාතික අවශ්‍යතාවලට අනුකූලව විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රක්ෂේපණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සහ විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින්ට සහය වීම මෙම අංශය යටතේ ඇති වගකීම් සහිත ප්‍රධාන ක්ෂේත්‍ර වේ.

මෙම ප්‍රගති වාර්තාව 2024 ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හැට එකක (61) සහ අමාත්‍යාංශයේ අංශ විසිතුනක (23) කාර්ය සාධනය ඉස්මතු කරයි. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල ජාලය රූපය-I මගින් නිරූපණය කර ඇති අතර, ප්‍රධාන අංශ තුනකට වර්ගීකරණය කර ඇති අමාත්‍යාංශයේ එක් එක් අංශවල පිහිටීම රූපය-II මගින් නිරූපණය කරයි. එනම් (i) අංශ ඒ හා සම්බන්ධ විෂයපථයන් සමඟ, (ii) දේශපාලන කටයුතු අංශ සහ (iii) මෙහෙයුම් අංශ යන ලෙස වේ.

2024 නොවැම්බර් 25 වැනි දින අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හරහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇති විෂය පථයට අනුකූලව ජාතික සාගර කටයුතු කමිටු ලේකම් කාර්යාලයේ (NOAC) සහ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ (LKI) කාර්යයන්ද අමාත්‍යාංශයේ අදාළ අංශ විසින් අධීක්ෂණය කරනු ලබන අතර මෙම ප්‍රගති වාර්තාව එම ආයතන දෙකෙහි ප්‍රගතිය ද ඉස්මතු කරයි.

ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා අමාත්‍යාංශය, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හැට එකක (61), ශ්‍රී ලංකාව පදනම් කරගත් විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හතළිස් තුනක (43) සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ශ්‍රී ලංකාව පදනම් කරගත් එහි අනුබද්ධ ආයතන ඇතුළු ජාත්‍යන්තර සංවිධාන තිහක (30) ජාලයක් සමඟ සම්බන්ධ විය.

අපගේ අපනයන සඳහා නව සහයෝගීතා ක්ෂේත්‍ර සහ නව වෙළෙඳපොළවල් විවෘත කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව විදේශයන්හි සිය රාජ්‍යතාන්ත්‍රික කටයුතු පුළුල් කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කර ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා, 2024 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව නවසීලන්තයේ වෙලින්ටන් හි සිය පළමු නේවාසික රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය විවෘත කළේය. මධ්‍යම ආසියානු කලාපයේ සහයෝගීතාව පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව 2025 දී කසකස්තානයේ ඇස්ටානා හි නේවාසික රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක් විවෘත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඇස්ටානා හි දූත මණ්ඩලය මධ්‍යම ආසියානු කලාපයේ පළමු ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලය වනු ඇත. මීට අමතරව, සයිප්‍රසයේ සේවය කරන විශාල ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව පිළිබඳව සලකා බලා, සයිප්‍රසයේ නිකොසියාහි කොන්සල් ජනරාල් මට්ටමින් නේවාසික රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයක් නැවත විවෘත කිරීමට තීරණය කර ඇත. ෆ්‍රෑන්ක්ෆර්ට්/ජර්මනිය (කොන්සල් ජනරාල් කාර්යාලය) සහ බැග්ඩෑඩ්/ඉරාකය (තානාපති කාර්යාලය) 2025 දී නැවත විවෘත කිරීමට නියමිත හා අදාළ කටයුතු සිදුවෙමින් පවතින අනෙකුත් දූත මණ්ඩල වේ.

අමාත්‍යාංශයේ සහ විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ, එහි අරමුණ ඉටු කිරීමට උත්සාහ දරන කැපවූ වෘත්තිකයන් කණ්ඩායමක් විසිනි. අපගේ කණ්ඩායම සේවය අවශ්‍ය ඇතැම් අසීරු අවස්ථාවන්හිදී පවා ඔවුන්ගේ වෘත්තීයභාවය සහ කැපවීම පෙන්නුම් කළහ. අනුබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ සහය ලබා ගනිමින් අමාත්‍යාංශය මෙහෙයවනු ලබන්නේ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්

173 දෙනෙකුගෙනි. වසර 6 කට ආසන්න කාලයකට පසු 2024 වසරේදී, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් 19 දෙනෙකුගෙන් යුත් නව කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. පසුගිය දශකය තුළ අමාත්‍යාංශය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඉක්මවා ගොස් ඇති අතර, අපගේ නිලධාරීන්ගෙන් 60% කට වඩා කාන්තාවන් වේ. අපගේ දූත මණ්ඩල ප්‍රධානීන්, කාර්යාල ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ විධායක භූමිකාවන් බොහොමයක් ද කාන්තාවන් විසින් ඉටු කරනු ලැබේ.

රාජ්‍ය වියදම් අඩු කිරීමේ ජාතික ප්‍රයත්නයන් කෙරෙහි ඔවුන්ගේ කැපවීම පෙන්නුම් කරමින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හැට එකක් (61) අවම මානව සම්පත් ප්‍රමාණයක් සහිතව තම රාජකාරි කාර්යක්ෂමව ඉටු කර ඇත.

ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය, දේශගුණික විපර්යාස සහ පාරිසරික ආරක්ෂාව, විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ සම්බන්ධ වීම සහ ජනතාව අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම ඇතුළු විවිධ අංශ හරහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අංශ ඇතුළුව අමාත්‍යාංශය විසින් ලබා ඇති සමස්ත ප්‍රගතිය මෙම වාර්ෂික ප්‍රගති වාර්තාව සමාලෝචනය කරයි. එබැවින්, ප්‍රගති වාර්තාවේ අරමුණ වන්නේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ 2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ප්‍රමුඛතා සහ ඉලක්කවල සමස්ත කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම ඇගයීමයි.

### 1. අභියෝගාත්මක බාහිර පරිසරය හැසිරවීම

උත්සන්න වන භූ දේශපාලනික ආතතීන්, වෙළෙඳ ආරක්ෂණවාදයේ නැගීම, සැඟවුණු සහ විවෘත ගැටුම් නැවත ඇතිවීම, බහුපාර්ශ්විකත්වයට තර්ජන සහ දේශගුණික විපර්යාසවල වර්ධනය වැනි බලපෑම මගින් සංලක්ෂිත වඩ වඩාත් සංකීර්ණ ගෝලීය පරිසරයක ක්‍රියාත්මක වීමට 2024 වසරේදී අමාත්‍යාංශයට සිදු විය. බාහිර පරිසරයේ අභියෝග නිසා, ගැටුම් සහිත කලාපවල සිරවී සිටින සහ ජාවාරම්වලට ගොදුරු වූ අනෙකුත් අය ඇතුළුව, අමාත්‍යාංශයට සහ විදේශයන්හි දූත මණ්ඩල/කාර්යාලවල විපතට පත් ශ්‍රී ලාංකිකයින්ට සහය වීමට සිදු විය. සහයෝගය දැක්වූ රටවල් අතර රුසියාව, යුක්රේනය, ඊශ්‍රායලය, ලෙබනනය, සිරියාව, මියන්මාරය, කාම්බෝජය සහ තායිලන්තය ඇතුළත් විය.

අපගේ මැදිහත්වීම් හරහා, ශ්‍රී ලංකාව මධ්‍යස්ථභාවය සහ නොබැඳි පිළිවෙත අනුගමනය කිරීමේදී දැඩි උනන්දුවක් සහ සක්‍රීය බවක් පෙන්නුම් කළ අතර කලාපීය සහ ගෝලීය සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරීව දායක විය. රාජ්‍යයන් අතර අන්තර්ක්‍රියා පාලනය කරන ස්වෛරීභාවය සහ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සඳහා ශ්‍රී ලංකාව අඛණ්ඩව පෙනී සිටියේය. ඉන්දියානු සාගර කලාපයේ සැලකිය යුතු භූ-උපායමාර්ගික ස්ථානයක් ඇති කුඩා රටක් ලෙස, ද්විපාර්ශ්වික, කලාපීය සහ ගෝලීය වශයෙන් ශක්තිමත්, මිත්‍රශීලී සබඳතා ගොඩනැගීම අවධාරණය කෙරිණි.

ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයන් සඳහා ජාත්‍යන්තර සබඳතාවලදී සාධාරණ අවස්ථා සපයන නීති මත පදනම් වූ බහුපාර්ශ්වික පද්ධතියට ශ්‍රී ලංකාව ක්‍රියාකාරීව සහය දැක්වීය. ගෝලීය දකුණේ මතයන් පිළිගැනීමට සහ අපගේ කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතුවලදී බහුපාර්ශ්වික පද්ධති වෙත අනුවර්තනය වීමට සහ අන්තර්ග්‍රාහී වීමට අපි පෙනී සිටියෙමු. ගෝලීය දකුණේ දේශපාලන, ආර්ථික, සමාජීය සහ දේශගුණික විපර්යාස අවම කිරීමේ අභිලාෂයන් ඇතුළත් බහු ධ්‍රැවීය ලෝකයක් ගොඩනැගීමට දායක වීමට ශ්‍රී ලංකාව ප්‍රයත්න දැරීය.

### 2. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතියට සහය වීම

2024 දී අපගේ උත්සාහයන් අතර ප්‍රමුඛතම කාර්යය වූයේ ආර්ථික පසුබෑම හමුවේ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සහ ස්ථාවරත්වය සහතික කිරීමයි. ශ්‍රී ලංකාවේ ණය තිරසරභාවය සහතික කිරීම සම්බන්ධයෙන් රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලදී අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව සමඟ පුළුල් ලෙස කටයුතු කළේය. මෙයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල , ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, පැරිස් සමාජය සහ ද්විපාර්ශ්වික ණය දෙන්නන් සමඟ කටයුතු කිරීමට සහය වීම ඇතුළත් වේ. සම්බන්ධීකරණය කරන ලද උත්සාහයන්හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ණය තිරසරභාවය අත්කර ගැනීමට හැකි විය.

වෙළෙඳාම සහ ආයෝජන ඉදිරියට ගෙන යාම සඳහා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා විදේශයන්හි ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ගික සහය සහ මග පෙන්වීමක් ලබා දෙන ලදී. දූත මණ්ඩලවලට නිශ්චිත ආර්ථික ඉලක්ක පවරනු ලබන ආර්ථික රාජ්‍යතාන්ත්‍රික වැඩසටහන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සහ කර්මාන්ත කොටස්කරුවන් ගණනාවක් සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ප්‍රධාන ආර්ථික කටයුතු අතරට නිදහස් වෙළෙඳ සහ වරණීය වෙළෙඳ ගිවිසුම් සාකච්ඡා සඳහා සහය වීම සහ පවතින විධිවිධානවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම ඇතුළත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම (SLSFTA) නැවත නිසි මගට ගන්නා ලද අතර ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමද (SLTFTA) අත්සන් කරන ලදී. ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළෙඳ ගිවිසුමක් සඳහා සාකච්ඡා ආරම්භ කරන ලද අතර නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළැඹීම පිළිබඳව මැලේසියාව සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. යෝජිත බංග්ලාදේශ-ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුම (BSPTA) පිළිබඳවද සාකච්ඡා සම්බන්ධීකරණය කරන ලද අතර ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුමේ (ETCA) 14 වැනි වටයේ සාකච්ඡා සාර්ථකව අවසන් කරන ලදී. ශ්‍රී ලංකාව කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයට (RCEP) ඇතුළත් කිරීම සඳහා පුළුල් ලෙස බලපෑම් කිරීම දිගටම කරගෙන ගිය අතර, ඒ සඳහා 2023 ජූලි මාසයේදී ආසියාන් ලේකම් කාර්යාලයට අභිප්‍රාය ලිපියක් (LOI) ඉදිරිපත් කරන ලදී. එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනා ක්‍රමය (UKDCTS) යටතේ ශ්‍රී ලාංකික ඇඟලුම් අංශයට වඩාත් වාසිදායක කොන්දේසි සඳහා ප්‍රභව නීති රීති සඳහා ඉන්දුනීසියාව සමඟ අන්තර් කලාපීය සමුච්චය ලබා ගැනීමට දරන උත්සාහයන්ට අමාත්‍යාංශය පහසුකම් සපයන ලද අතර, ඒ යටතේ අපනයන නිෂ්පාදන හත්දහසකට (7000) වැඩි ප්‍රමාණයකට එක්සත් රාජධානියේ වෙළෙඳපොළට තීරුබදු රහිත ප්‍රවේශයක් ඇත. ස්විට්සර්ලන්ත රජයේ සහය ඇතිව 2024 ජූලි මාසයේදී දියත් කරන ලද GTEX-II මුලපිරීම හරහා රෙදිපිළි කර්මාන්තයේ තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහාද සහය ලබා දෙන ලදී. EU- GSP + යෝජනා ක්‍රමය සම්බන්ධයෙන්, අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ අනුකූලතා ක්‍රියා පටිපාටි පිළිබඳව යුරෝපීය කොමිසම සමඟ අඛණ්ඩව කටයුතු කරයි.

සෞදි අරාබිය, රුමේනියාව, ඉතාලිය, ප්‍රංශය, චීනය, ජපානය, වියට්නාමය, ඉරානය, ඕමානය, තායිලන්තය, එක්සත් රාජධානිය සහ රුසියාව වැනි හවුල්කාර රටවල් සමඟ වෙළෙඳාම, ආයෝජන, විදේශ රැකියා, කෘෂිකර්මාන්තය, ශ්‍රමය, සාගර කටයුතු සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් කරන ලදී.

අමාත්‍යාංශය සහ විදේශ දූත මණ්ඩල සඳහා ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රධාන ප්‍රමුඛතාවයක් වූ අතර අපනයන ප්‍රවර්ධනය කිරීම, අපනයන සඳහා නව වෙළෙඳපොළවල් සොයා ගැනීම, ප්‍රදර්ශනවලට සහභාගී වීම සහ ව්‍යාපාර අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා 2024 පුරාවටම උත්සාහයන් ගන්නා ලදී. නව වෙළෙඳපොළ ගවේෂණයට ලතින් ඇමරිකානු කලාපයේ බ්‍රසීලයේ පැවති පළමු තනි රටක ප්‍රදර්ශනය සහ මධ්‍යම ආසියාවේ කසකස්තානය, ටර්ක්මෙනිස්තානය සහ කිර්ගිස් ජනරජයේ ගවේෂණාත්මක ව්‍යාපාරික කටයුතු ඇතුළත් විය. ඇඟලුම්, තොරතුරු තාක්ෂණ, ධීවර හා කෘෂිකර්මාන්තය ඇතුළු ප්‍රධාන අපනයන අංශ ප්‍රවර්ධනය කිරීමේදී රේඛීය අමාත්‍යාංශ, කර්මාන්ත, කර්මාන්ත සංගම්, වාණිජ මණ්ඩල, ආර්ථික සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය සමඟ සමීප සම්බන්ධීකරණයෙන් අමාත්‍යාංශය කටයුතු කළේය.

සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල, අමාත්‍යාංශය සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව 2024 වසර පුරා ප්‍රවර්ධන ව්‍යාපාර දියත් කළ අතර, සමාජ මාධ්‍ය හරහා නව්‍ය ප්‍රවර්ධන කටයුතු සඳහා සහය විය. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා රටවල් 35 ක් සඳහා ඒකපාර්ශ්වික වීසා රහිත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති මුලපිරීම් සම්බන්ධයෙන්ද අමාත්‍යාංශය මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කළ අතර, එය තවමත් ක්‍රියාත්මක වේ. රටවල් කිහිපයක් සමඟ අන්‍යෝන්‍ය වීසා රහිත ප්‍රවේශ විධිවිධාන ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කළ අතර තායිලන්තය සහ ශ්‍රී ලංකාව 2024 දී එවැනි විධිවිධානයක් ක්‍රියාත්මක කළේය.

විවිධ කණ්ඩායම්වල (නිපුණ, අර්ධ නිපුණ, නුපුහුණු) ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා අවස්ථා සුරක්ෂිත කිරීම අමාත්‍යාංශයේ ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් විය. රැකියා අවස්ථා සුරක්ෂිත කර ඇති නව ක්ෂේත්‍ර අතරට

සිංගප්පූරුවේ හෙද සහ සහයක පොලිස් බලකාය ඇතුළත් වේ. එක්සත් රාජධානියේ හෙද සේවය සහ ජර්මනියේ වයෝවෘද්ධ හෙද සේවය සඳහා රැකියා අවස්ථා සොයමින් පවතී. මැද පෙරදිග සාම්ප්‍රදායික ශ්‍රම වෙළෙඳපොළට අමතරව මැලේසියාව, පෝලන්තය, රුමේනියාව, ඉතාලිය සහ එක්සත් රාජධානිය යන රටවල ශ්‍රී ලාංකිකයන් සඳහා රැකියා අවස්ථා ද සොයමින් පවතී. රැකියා සුරක්ෂිත කිරීම සඳහා විදේශ දූත මණ්ඩල සඳහා නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශය ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය සමඟ කටයුතු කරයි.

ලෝක වෙළෙඳ සංවිධානය (WTO) හරහා විවෘත ගෝලීය වෙළෙඳ පද්ධතිය ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන නීති රීති සහ ගිවිසුම් රාමුවට ශ්‍රී ලංකාව ද කැපවී සිටී. ආර්ථික වර්ධනය සහ සංවර්ධනය මෙහෙයවීම සඳහා වටිනා මෙවලමක් වුවද, වත්මන් අභියෝගවලට මුහුණ දීම සහ දෝහා සංවර්ධන වැඩසටහන හරහා ලබා දී ඇති පොරොන්දු ඉටු කිරීම සඳහා බහුපාර්ශ්වික වෙළෙඳ පද්ධතියට ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. අබුඩාබි හි පැවති ලෝක වෙළෙඳ සංවිධානයේ අමාත්‍ය සමුළුවේදී ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයට ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකාව ඉල්ලා සිටියේය.

### 3. සබඳතා ශක්තිමත් කිරීම සහ උනන්දුව වර්ධනය කිරීම

සමාලෝචනයට භාජනය වැනි වර්ෂය තුළ, ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික හවුල්කරුවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම සඳහා සාමූහික උත්සාහයන් ගන්නා ලදී. 2024 වසර පුරාම ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් වූ අතර, ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා දෙසැම්බර් 15 සිට 17 දක්වා ඉන්දියාවට සිය පළමු විදේශ රාජ්‍ය සංචාරයෙන් සිදු කළේය. මෙම සන්ධිස්ථානීය සංචාරය දෙරට අතර දිගුකාලීන, ඓතිහාසික සබඳතා පිළිබිඹු කරන අතරම, සංචාරය අවසානයේ නිකුත් කරන ලද ඉන්දියා-ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රකාශයේ දක්වා ඇති පරිදි සම්බන්ධතාව තවදුරටත් වර්ධනය වැනි බව පෙන්නුම් කරයි. "බෙදාගත් අනාගතයක් සඳහා හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම" යන මාතෘකාව යටතේ, ඒකාබද්ධ ප්‍රකාශය, දෙරටේ ජනතාවගේ යහපැවැත්ම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් හවුල්කාරිත්වයක් දක්වා ද්විපාර්ශ්වික සම්බන්ධතාවය ප්‍රගතියට පත් කිරීමට ඇති කැපවීම නැවත තහවුරු කළේය. ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ශ්‍රී ලාංකික සිවිල් සේවකයින් සඳහා පුහුණුව සහ ශක්‍යතා වර්ධන වැඩසටහන් සඳහා දෙරට ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් දෙකකටද එළැඹුණි.

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් වැදගත් සංචාර අතරට 2024 ජූනි 3 සිට 6 දක්වා මාලදිවයිනේ විදේශ අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයද ඇතුළත් විය.

ශ්‍රී ලංකාව සහ මහජන චීන සමූහාණ්ඩුව අතර දිගුකාලීන මිත්‍ර සබඳතා 2024 වසර පුරා ඉහළ පෙළේ රාජ්‍යතාන්ත්‍රික කටයුතු කිහිපයක් සමඟ තවදුරටත් තහවුරු විය. 2024 මාර්තු මාසයේදී බෝඕ සංසදය සඳහා හිටපු අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයට චීන ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා සමඟ සමුළු මට්ටමේ රැස්වීමක් ඇතුළත් වූ අතර, අවසානයේ ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ ප්‍රවේශය, කාර්මික සහයෝගීතාව, වෙළෙඳ ප්‍රවර්ධන සහයෝගීතාව, මාධ්‍ය සහයෝගීතාව සහ අධ්‍යාපන ඩිජිටල්කරණය වැනි ක්ෂේත්‍රවල අවබෝධතා ගිවිසුම් නවයක් (09) මෙම සංචාරයේදී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකාව උණුසුම් හා දිගු කාලීන මිත්‍රත්වයක් බෙදා ගන්නා රටක් වන ජපානය සමඟ කළ කටයුතු අතර ජපානයේ සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරුන්ගේ අන්‍යෝන්‍ය සංචාර ඇතුළත් වූ අතර එමඟින් සබඳතා ශක්තිමත් කිරීමට සහ සහයෝගීතාවේ නව ක්ෂේත්‍ර විවෘත විය. 2024 ජනවාරි මස ජපානයේ මුදල් අමාත්‍ය සහ 2024 පෙබරවාරි මස ජපානයේ කෘෂිකර්ම, වන සහ ධීවර අමාත්‍ය ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාර ජපානයෙන් කෙරුණු අනෙකුත් ඉහළ මට්ටමේ සංචාර අතරට එක් විය.

2024 දී ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාව ශක්තිමත් වූ අතර ඇමරිකා එක්සත් ජනපදය-ශ්‍රී ලංකා හවුල්කාරිත්ව සංවාදය සහ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභා යාන්ත්‍රණයන් සාර්ථකව පවත්වන ලදී. මේවා වසර පුරා ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය සහ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික පදනමක් මත පැවති රැස්වීම් රාශියකට අමතරව විය. ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පවතින අතර මෙම වෙළෙඳපොළවල් වෙත වරණීය ප්‍රවේශයෙන් ශ්‍රී ලංකාව දිගටම ප්‍රතිලාභ ලබයි.

ශ්‍රී ලංකාවට පැමිණි අනෙකුත් වැදගත් සංචාර අතරට තායිලන්ත අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය (2024 පෙබරවාරි 3-4), කොරියානු ජනරජයේ අග්‍රාමාත්‍යවරයා සහ නියෝජ්‍ය කථානායකවරයාගේ (පිළිවෙලින් 2024 අප්‍රේල් සහ මාර්තු), ඝානාවේ විදේශ කටයුතු සහ කලාපීය ඒකාබද්ධතා අමාත්‍යවරයාගේ සංචාරය (2024 අගෝස්තු), ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ද්විපාර්ශ්වික සබඳතාවල 75 වැනි සංවත්සරය සනිටුහන් කිරීම සඳහා රාජකීය කුමරියගේ සංචාරය සහ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඒකාබද්ධව විවෘත කරමින් ශ්‍රී ලංකාව සහ ඉරානය අතර සංස්කෘතිය, තාක්ෂණික සහයෝගීතාව, චිත්‍රපට, ජනමාධ්‍ය, සංචාරක ව්‍යාපාරය සහ වාණිජ මණ්ඩල සහ ජාතික පුස්තකාල අතර සහයෝගීතාවයට අදාළ ගිවිසුම් පහක් එළඹුණු ඉරාන ජනාධිපතිගේ ශ්‍රී ලංකා සංචාරය (2024 ජනවාරි) ඇතුළත් විය.

මෙම සමාලෝචිත කාලය තුළ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සිදු කළ විදේශ සංචාර ගණනාවක් ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ද්විපාර්ශ්විකව සහ බහුපාර්ශ්විකව වැඩිදියුණු කළේය. ස්විට්සර්ලන්තය, සිංගප්පූරුව, උගන්ඩාව, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව සහ ඉන්දියාව වැනි රටවලට කළ නිල සංචාර, විවිධ ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

තවද, ලෝක ආර්ථික සංසදය (WEF), නොබැඳි ජාතීන්ගේ 19 වැනි සමුළුව (NAM) සහ මෙම රැස්වීම්වලට සමගාමීව ලෝක නායකයින් සමඟ හිටපු ජනාධිපති වික්‍රමසිංහ මහතාගේ කලාපීය සහ බහුපාර්ශ්වික කටයුතු, මෑත වසරවල අභියෝගවලට මුහුණ දීමෙන් පසු ශ්‍රී ලංකාවට තම ආර්ථික පුනර්ජීවන සැලසුම් ප්‍රදර්ශනය කිරීමට සහ වෙළෙඳ හා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට කදිම වේදිකාවක් සපයන ලදී.

එපමණක් නොව, 2024 ජනවාරි 15 වැනි දින ස්විට්සර්ලන්තයේ ඩාවෝස් හි පැවති ලෝක ආර්ථික සමුළුවේ "හරිත තාක්ෂණ සංසදයේදී", "බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවකට මග පෑදීම" යන තේමාව යටතේ කතා කරමින් ජනාධිපති වික්‍රමසිංහ මහතා, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති අංශයේ සැලකිය යුතු විභවයන් ඉස්මතු කළේය. පුනර්ජනනීය බලශක්ති අංශයේ ආයෝජන හිතකාමී පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා පසුගිය වසර දෙක තුළ රජය ගෙන ඇති මුලපිරීම් ඔහු තවදුරටත් ගෙනහැර දැක්වීය.

මීට අමතරව, හිටපු විදේශ කටයුතු අමාත්‍ය, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය සහ විදේශ කටයුතු ලේකම්වරයා 2024 දී ශ්‍රී ලංකාවේ අවශ්‍යතා වැඩි දියුණු කිරීමේ අරමුණින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික ස්වභාවයේ වැදගත් සංචාර ගණනාවක් සිදු කළේය. මේවාට පෝලන්තය, ජර්මනිය, රුමේනියාව, බෙල්ජියම, ඔස්ට්‍රියාව, ඊජිප්තුව, සෞදි අරාබිය, ඉරානය, ඉන්දියාව, සිංගප්පූරුව, මියන්මාරය සහ තායිලන්තය යන රටවල සංචාර ඇතුළත් විය.

2024 දී චීනය, එක්සත් රාජධානිය (2 වැනි උපායමාර්ගික සංවාදය), එස්තෝනියාව, ලැට්වියාව, ස්විට්සර්ලන්තය, එක්සත් ජනපදය, පකිස්ථානය, කසකස්තානය, කිර්ගිස් ජනරජය සහ ටර්ක්මෙනිස්තානය සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන ආරම්භ කර පහසුකම් සැලසීමට අමාත්‍යාංශය කටයුතු කළේය.

බෝඕ සංසදය, 3 වැනි යුරෝපා සංගම් ඉන්දු-පැසිෆික් අමාත්‍ය සංසදය, මියුනිච් ආරක්ෂක සමුළුවේ 60 වැනි සංස්කරණය, බ්‍රික්ස් අමාත්‍ය සැසිය, ආසියානු සහයෝගිතා සංවාද අමාත්‍ය සැසිය, ඇන්ටාලියා රාජ්‍ය තාන්ත්‍රික සංසදය, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ චීන-ෂිසැන්ග් ට්‍රාන්ස් හිමාලය සංසදය, ආසියාන් කලාපීය සංසදයේ (ARF) අමාත්‍ය සැසිය, බිම්ස්ටෙක් අමාත්‍ය සැසිය සහ රොයිටර්ස් NEXT APAC 2024 සමුළුව යන අංශවල ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද අතර, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වැදගත්කමක් ඇති තීරණාත්මක ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ ජාත්‍යන්තර සංසදවල ශක්තිමත් සහභාගීත්වයක් පෙන්නුම් කරන ලදී.

2024 දී සිවිල් වැසියන්ගේ පීඩා සමනය කිරීම සඳහා වහාම සටන් විරාමයක් සහ ගාසා තීරයට අසීමිත මානුෂීය ප්‍රවේශයක් සඳහා වැනි ඉල්ලීම ශ්‍රී ලංකාව නැවත අවධාරණය කළේය. ගාසා තීරයේ වින්දිතයින්ට ආධාර සැපයීම අරමුණු කරගත් දයානුකම්පිත මුලපිරීමක් වන "ගාසා තීරයේ දරුවන් සඳහා අරමුදල" පිහිටුවීමට ශ්‍රී ලංකා රජය අනුමැතිය දුන් අතර ගාසා තීරයේ වින්දිතයින්ට අත්‍යවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා එක්සත් ජාතීන්ගේ ආයතන (පලස්තීන සරණාගතයින් සඳහා එක්සත් ජාතීන්ගේ සහන සහ වැඩ ඒජන්සිය) හරහා ඇමරිකානු ඩොලර් මිලියනයක් පරිත්‍යාග කළේය. ගැටුමට තිරසර දේශපාලන විසඳුමක් සහ අදාළ එක්සත් ජාතීන්ගේ යෝජනාවලට අනුකූලව 1967 දේශසීමා මත පදනම්ව ස්වාධීන හා ස්වෛරී පලස්තීන රාජ්‍යයක්

පිහිටුවීම මෙන්ම ඊශ්‍රායලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වැනි  ගෝලීය ඉල්ලීම්වලට ශ්‍රී ලංකාව ද එක් විය. ශ්‍රී ලංකාව 2024 අගෝස්තු මාසයේදී ගාසා තීරයේ දරුවන් වෙනුවෙන් වූ අරමුදලට තවත් ඇමරිකානු ඩොලර් 590,000 ක් පරිත්‍යාග කළේය.

මෙම කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවට පැමිණි හා ශ්‍රී ලංකාවෙන් පිටතට ගිය ඉහළ මට්ටමේ සංචාර පහත I සහ II වගු වලින් නිරූපණය කෙරේ.

## 4. කලාපීය සහ බහුපාර්ශ්වික සහයෝගීතාව පුළුල් කිරීම

2024 වසර තුළ කලාපීය කණ්ඩායම් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් කරන ලද අතර, ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමය (අයෝරා), බිම්ස්ටෙක්, ආසියානු සහයෝගිතා සංවාදය (ACD), සාර්ක්, ආසියාන් කලාපීය සංසදය (ARF), ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව (CICA) සහ කොළඹ සැලැස්ම ඇතුළු වැදගත්කමක් ඇති කලාපීය ව්‍යුහයන් තුළ සම්බන්ධතා වැඩි කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

අයෝරාහි සභාපතිත්වය දරන ශ්‍රී ලංකාව, 2024 මාර්තු 10 වැනි  දින විදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව සංවිධානය කරන ලද "අනාගත පරම්පරාවන් සඳහා තිරසර ඉන්දියානු සාගරයක් සහතික කිරීම" යන තේමාව යටතේ අයෝරා දිනය සැමරීය. විශේෂයෙන්, ශ්‍රී ලංකාව 26 වැනි  අයෝරා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුව (මාර්ගස්ථ ක්‍රමය), මුදල් පිළිබඳ අයෝරා උප කමිටුව (මාර්ගස්ථ ක්‍රමය) සඳහා සත්කාරකත්වය දරමින් එහි සභාපතිත්වය දැරූ අතර කොළඹදී ලංකා වාණිජ මණ්ඩලය සමඟ එක්ව අයෝරා ව්‍යාපාරික සමුළුව කැඳවීය. ශ්‍රී ලංකාව සිය කටයුතු හරහා ඉන්දියානු සාගරයේ නීති මත පදනම් වූ සමුද්‍රීය පිළිවෙලක් සඳහා පෙනී සිටීම දිගටම කරගෙන ගියේය. අයෝරාහි සභාපතිත්වය දැරීමෙන්, ශ්‍රී ලංකාව වෙරළබඩ රාජ්‍යයන්ගේ අරමුණට නායකත්වය දීමට සහ ජයග්‍රහණය කිරීමට ඇති කැමැත්ත පෙන්නුම් කළේය.

බිම්ස්ටෙක් කණ්ඩායම සඳහා ශ්‍රී ලංකාවේ අඛණ්ඩ කැපවීම අවධාරණය කරමින්, ශ්‍රී ලංකාව විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ 2 වැනි  රැස්වීම සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ 1 වැනි  රැස්වීම සඳහා සත්කාරකත්වය ලබා දුන්නේය.

දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය සහ ව්‍යාපාරික සංසදයට සහභාගී වීම සඳහා සාර්ක් මහලේකම්වරයාගේ ශ්‍රී ලංකානු සංචාරයට අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලද අතර, ශ්‍රී ලංකාව 2024 වසර පුරාම සාර්ක් ක්‍රියාකාරකම් සමඟ ක්‍රියාකාරීව සහ ඵලදායී ලෙස සම්බන්ධ විය.

බහුපාර්ශ්වික වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන අභියෝගයක් වූයේ ශ්‍රී ලංකාවට එරෙහිව මානව හිමිකම් කවුන්සිලයේ සෑම සැසිවාරයකදීම ඉදිරිපත් කරන ලද රටට විශේෂිත යෝජනාවයි. 2024 දී පැවති මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී (54 වැනි සහ 55 වැනි  සැසිවාරවලදී) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රකාශය ඉදිරිපත් කරමින් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා 51/1 දරන මානව හිමිකම් කවුන්සලයේ යෝජනාව සහ බාහිර සාක්ෂි රැස් කිරීමේ යාන්ත්‍රණය ප්‍රතික්ෂේප කිරීම නැවත අවධාරණය කළේය. HRC හි 55 වැනි සැසිවාරයේදී න්‍යාය පත්‍ර අයිතමය 2 යටතේ පැවති පොදු විවාදයේදී රටවල් දොළහක් (12) ශ්‍රී ලංකාව ගැන සඳහන් කළ අතර ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සටහන් කළහ.

හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල තීරණයකින් පිහිටුවැනි  ලද මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුව 2024 පෙබරවාරි 13 වැනි  දින එහි පළමු රැස්වීම පැවැත්වීය. රාජ්‍ය ආයතන 21 කින් සමන්විත මෙම කමිටුව, මානව හිමිකම් සහ සංහිඳියාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාත්‍යන්තර කැපවීම් කාර්යක්ෂම සම්බන්ධීකරණය සහ වාර්තා කිරීම සහතික කිරීම සඳහා ස්ථාවර ජාතික රාමුවක් ලෙස අපේක්ෂා කරන ලදී.

නිරායුධකරණය සහ අවි ව්‍යාප්තිය වැළැක්වීම සහ ආපදා සහන වැනි කලාපීය සහ ගෝලීය අවධානයට ලක්වන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දෘශ්‍යතාව සහ ස්ථාවරය වැඩිදියුණු කළ කලාපීය සංසද

කිහිපයකට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා අමාත්‍යාංශය පහසුකම් සැලසීය. ශ්‍රී ලංකාව තායිලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය සමඟ එක්ව න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීම සහ නිරායුධකරණය පිළිබඳ ASEAN කලාපීය සංසදයේ (ARF) අන්තර්-සැසිවාර රැස්වීමේ සම-සභාපතිත්වය දැරූ අතර, වියට්නාමය සහ බංග්ලාදේශය සමඟ එක්ව ආපදා සහන පිළිබඳ ARF අන්තර්-සැසිවාර රැස්වීමේ සම-සභාපතිත්වය දැරීය. විශේෂයෙන් මධ්‍යම ආසියානු කලාපය සමඟ එහි සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) කටයුතු වලට ක්‍රියාකාරීව නිරත විය.

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය, පොදුරාජ්‍ය මණ්ඩලය සහ අයෝරා තුළ වැදගත් පාරිසරික හේතූන් කිහිපයක් සඳහා ශ්‍රී ලංකාව සහය දැක්වීය. 2024 පෙබරවාරි මාසයේදී කෙන්යාවේ නයිරෝබි හි පැවති 6 වැනි එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේදී (UNEA) ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය එක්ව "ජල ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා ඵලදායී විසඳුම්" පිළිබඳ කෙටුම්පත් යෝජනාවක් සම්මත කරන ලදී. 2025 ජූලි මාසයේදී සිම්බාබ්වේ හි පැවැත්වීමට නියමිත RAMSAR සම්මුතියේ 15 වැනි පක්ෂ සමුළුවට (COP) "තෙත්බිම් වල ස්වභාවධර්මයේ අයිතිවාසිකම්" යන මාතෘකාව යටතේ නව යෝජනාවක් ඉදිරිපත් කිරීම කෙටුම්පත් කිරීමට ද අමාත්‍යාංශය දායක වූ අතර එය සම්මත කර ගැනීම සඳහා සහය ලබා ගැනීමට, සාමාජික රටවලට බලපෑම් කිරීමට සැලසුම් කරමින් සිටී.

පොදුරාජ්‍ය මණ්ඩලීය කඩොලාන පරිසර පද්ධති ජීවනෝපාය ක්‍රියාකාරී කණ්ඩායමේ (MELAG) ශූර රටක් ලෙස අමාත්‍යාංශය අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කළ අතර එහිදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ලෝක ප්‍රතිස්ථාපන ප්‍රමුඛස්ථානයක් ලෙස සම්මානයට පාත්‍ර වූ අතර, 6 වැනි UNEA හිදී ගෝලීය වශයෙන් මහා පරිමාණ, දිගුකාලීන පරිසර පද්ධති ප්‍රතිසංස්කරණයේ හොඳම උදාහරණවලින් එකක් ලෙස එය ඉස්මතු කළේය. පොදුරාජ්‍ය මණ්ඩලීය Blue Charter Project Incubator යටතේ 2024 දී ශ්‍රී ලංකාවේ නිල් කාබන් සහ මුහුදු තෘණ-කඩොලාන සඳහා සිතියම්කරණ තාක්ෂණය පිළිබඳ ව්‍යාපෘති දෙකක් සඳහා MELAG යටතේ අරමුදල් අනුමත කරන ලදී.

ශ්‍රී ලංකාවේ දකුණේ යෝජිත නව රථවාහන මංතීරු ස්ථාපිත කිරීමේ යෝජනා ක්‍රමයකට අදාළව ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) ශ්‍රී ලංකාවට බලපාන ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ජාතික සමුද්‍රීය කාර්ය සාධක බලකායක් පිහිටුවීමට ද අමාත්‍යාංශය සහය දුන් අතර වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව හා ශාක විශේෂවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) ආශ්‍රිත මුලපිරීම් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ සමඟ පුළුල් ලෙස කටයුතු කළේය.

2025 දී මාර්ගගත ක්‍රමයට දියත් කිරීමේ අරමුණින් SMART-IORA සාගර විද්‍යාව සහ පරිසරය පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට සාගර විශ්වවිද්‍යාලය සමඟ එක්ව පියවර ගනිමින් සිටී. 2025 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වාර්ෂික අයෝරා නිල් කාබන් බුද්ධි මණ්ඩල සම්මන්ත්‍රණය පැවැත්වීමට ද කටයුතු ආරම්භ කර ඇති අතර ඒ සඳහා පූර්ණ අනුග්‍රහය ලබාගෙන ඇත.

සාගර රට හවුල්කාරිත්වය (OCPP) හරහා සහයෝගීතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පස් අවුරුදු හවුල්කාරිත්වයක් අවසන් කරන ලදී. 2024 මැයි මාසයේදී ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර නිල් ග්‍රහලෝක අරමුදල (BPF) යටතේ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, එහි ප්‍රධාන අවධානය යොමු වූ ක්ෂේත්‍ර අතරට ශක්‍යතා වර්ධනය සහ තාක්ෂණික සහය අවධාරණය කරමින් සමුද්‍ර දූෂණය, තිරසර මුහුදු ආහාර සහ සමුද්‍ර ජෛව විවිධත්වය මැඩපැවැත්වීම ඇතුළත් විය.

ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ජල මානක ක්ෂේත්‍රයේ සහයෝගීතාවද ආරම්භ කර ඇත.

G-20 ගෝලීය මිශ්‍ර මූල්‍ය මුලපිරීම (GBFA) සහ ජනතාව සහ ලෝකය සඳහා වූ පැරිස් ගිවිසුම (4P) ඇතුළු ගෝලීය දේශගුණික මුලපිරීම් සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සහභාගීත්වයට අමාත්‍යාංශය අඛණ්ඩව සහය දක්වයි.

**5. කොන්සියුලර් සහය ලබා දීම සහ විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින්ට සහය වීම.**

කොළඹ, යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල යන ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල හරහා මෙන්ම විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හරහා මහජනතාවට කඩිනම් කොන්සියුලර් සේවා ලබා දීමෙන් අමාත්‍යාංශය සැලකිය යුතු සන්ධිස්ථානයක් අත්කර ගත්තේය. කොන්සියුලර් අංශයේ තිරසර ඩිජිටල්කරණ මුලපිරීම් මගින් අ.පො.ස. සාමාන්‍ය පෙළ (සා/පෙළ) සහ උසස් පෙළ (උ/පෙළ) සහතික සඳහා මාර්ගගත සත්‍යාපන පද්ධතියක් හඳුන්වා දෙන අතර එමඟින් අයදුම්කරුවන්ට කොළඹ කොන්සියුලර් අංශයට පැමිණීමෙන් තොරව ඔවුන්ගේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික සඳහා මාර්ගගත සත්‍යාපනය සඳහා අයදුම් කිරීමට ඉඩ සලසයි.

ලේඛන සත්‍යාපනය ඩිජිටල්කරණය කිරීමේ අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, e-DAS (ඉලෙක්ට්‍රොනික ලේඛන සහතික කිරීමේ පද්ධතිය) සහ e-BDM (ඉලෙක්ට්‍රොනික උපත්, මරණ, විවාහ ලියාපදිංචි කිරීම, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව) දත්ත සමුදායන් ඒකාබද්ධ කිරීම 2024 සැප්තැම්බර් 02 වැනි දින ක්‍රියාත්මක කරන ලදී. මෙම ඩිජිටල් ඒකාබද්ධ කිරීම මඟින් අයදුම්කරුවන්ට ඔවුන්ගේ උප්පැන්න, විවාහ සහ මරණ සහතික සත්‍යාපනය සඳහා සම්පූර්ණයෙන්ම මාර්ගගතව අයදුම් කිරීමට ඉඩ සලසයි, එමඟින් අංශයට පැමිණීමේ අවශ්‍යතාවය ඉවත් කෙරේ.

විදේශයන්හි දුෂ්කර තත්වයන් යටතේ සිටින ශ්‍රී ලාංකිකයන් බේරා ගැනීමේ උත්සාහයන් සඳහා අමාත්‍යාංශය පෙරමුණ ගෙන ඇත. මැද පෙරදිග පවතින ආතතීන්ගෙන් බලපෑමට ලක් වූ ශ්‍රී ලාංකිකයින්ට ලෙබනනයේ සහ ඊශ්‍රායලයේ අපගේ දූත මණ්ඩල විසින් ලබා දෙන සහය ද මෙයට ඇතුළත් වේ.

සෝමාලි මුහුදු කොල්ලකරුවන් විසින් අල්ලා ගන්නා ලද ශ්‍රී ලාංකික බහුදින ධීවර යාත්‍රාවක් වන "ලොරෙන්සෝ පුතා-4" එහි කාර්ය මණ්ඩල සාමාජිකයින් හය දෙනෙකු සමඟ ගලවා ගැනීමේ මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම සඳහා අමාත්‍යාංශය සීෂෙල්ස් ආරක්ෂක හමුදා සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. සමස්තයක් වශයෙන්, අතරමං වූ ධීවර යාත්‍රා 16 ක් අමාත්‍යාංශය විසින් කළමනාකරණය කරන ලද අතර සාමාජිකයින් 87 දෙනෙකු සහ ධීවර යාත්‍රා 9 ක් සියරට ගෙන්වා ගැනීමට පහසුකම් සපයන ලදී. විවිධ හේතූන් මත විදේශයන්හි අතරමං වූ ශ්‍රී ලාංකිකයන් 1520 දෙනෙකු සියරට ගෙන්වා ගැනීමේ ඉල්ලීම් විශාල සංඛ්‍යාවක්ද අමාත්‍යාංශය විසින් හසුරුවන ලද අතර සම්බන්ධීකරණය කරන ලදී.

2024 දී, අමාත්‍යාංශය, තායිලන්තයේ සහ මියන්මාරයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ එක්ව, මියන්මාරයට මියවඩි කලාපයේ පිහිටි සයිබර් අපරාධ මධ්‍යස්ථානවල සේවය කිරීම සඳහා ප්‍රවාහනය කරන ලද ශ්‍රී ලාංකිකයින් බේරා ගැනීමට සහ ආරක්ෂිතව සියරට ගෙන්වා ගැනීමට රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයත්නවල ක්‍රියාකාරීව නිරත විය. මෙම උත්සාහයන් 2024 අප්‍රේල් මාසයේදී පුද්ගලයින් 8 දෙනෙකු සහ 2024 සැප්තැම්බර් මාසයේදී තවත් 20 දෙනෙකු බේරා ගැනීමට සහ සියරටට ගෙන්වා ගැනීමට සාර්ථකව පහසුකම් සැලසීය. ඊට අමතරව, සාර්ථක සම්බන්ධීකරණ ක්‍රියාවලියකින් පසු, මිනිස් ජාවාරමට ගොදුරු වූ ශ්‍රී ලාංකිකයන් තිස් දෙදෙනෙකු (32) 2024 දෙසැම්බර් මාසයේදී බේරාගෙන ආරක්ෂිතව ගෙන්වා ගන්නා ලදී. ඉතිරි ශ්‍රී ලාංකිකයන් බේරා ගැනීම සඳහා ශ්‍රී ලංකාව මියන්මාර සහ තායිලන්ත රජයන් සමඟ අඛණ්ඩව කටයුතු කරයි (වාර්තාවන් පරිදි 18 දෙනෙක් තවමත් මියවඩි ප්‍රදේශයේ සිටිති).

මෙම වසරේ පුද්ගල ජාවාරම් වාර්තාවේ ශ්‍රී ලංකාව '2 වැනි ස්ථරයේ' පැවතුනි.

අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර ඒකකය, පරිත්‍යාගශීලී රටවලින් අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. 2024 දී ශ්‍රී ලංකා රජයේ මානුෂීය ආධාර ලෙස ගාසා තීරයේ පලස්තීනයේ ජනතාවට, මියන්මාරයේ යාගි සුළි කුණාටුවෙන් පීඩාවට පත් පුද්ගලයින්ට සහ ලිබියාවේ ගංවතුරෙන් විපතට පත් වූවන්ට සිලෝන් තේ පරිත්‍යාග කිරීමට මෙම ඒකකය පහසුකම් සැලසීය.

**අවසානය**

සමස්තයක් වශයෙන්, මෙම වාර්තාව 2024 වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ පුළුල් සමාලෝචනයක් සපයන අතර, විදේශයන්හි පිහිටි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල, රේඛීය අමාත්‍යාංශ/නියෝජිත ආයතන, විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ කොළඹ පදනම් කරගත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් අමාත්‍යාංශයේ එක් එක් අංශය ලබා ඇති ජයග්‍රහණ කෙරෙහි අවධානය යොමු කරයි.

I වැනි රූප සටහන - විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ කාර්යාල ජාලය



**II වැනි රූප සටහන - අංශවල ව්‍යුහය**



I වන වගුව - ඉහළ මට්ටමේ සංචාර – අභ්‍යන්තර

| | | |
|---|---|---|
| **රාජ්‍ය නායකවරුන්/ ආණ්ඩු ප්‍රධානීන් සිදුකල සංචාර** | | |
| 1. | ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායක ආචාර්ය සයිඩ්නා මුෆද්දල් සයිෆුදීන් සහේබ් මහතා සිදුකල සංචාරය | 2024 ජනවාරි 29 - පෙබරවාරි 27 |
| 2. | අතිගරු තායිලන්ත අග්‍රාමාත්‍ය ශ්‍රේත්තා තාවිසින් මහතාගේ රාජ්‍ය සංචාරය | 2024 පෙබරවාරි 04 |
| 3. | අතිගරු ඉරාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති ආචාර්ය ඊබ්‍රාහිම් රයිසි මහතාගේ නිල සංචාරය | 2024 අප්‍රේල් 23-24 |
| 4. | ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායක ආචාර්ය සයිඩ්නා මුෆද්දල් සයිෆුදීන් සහේබ් මහතා ආරාධිත රාජ්‍ය අමුත්තෙකු ලෙස සිදුකල සංචාරය | 2024 ජූනි 25 - ජූලි 03 |
| 5. | සියෙරා ලියොන් හි අතිගරු ජනාධිපති ජුලියස් මාඩා බියෝ මහතාගේ පුද්ගලික සංචාරය | 2024 ඔක්තෝබර් 20-21 |
| 6. | ජාත්‍යන්තර බෝරා ප්‍රජාවේ අධ්‍යාත්මික නායක ආචාර්ය සයිඩ්නා මුෆද්දල් සයිෆුදීන් සහේබ් මහතා සිදුකල සංචාරය | 2024 ඔක්තෝබර් 26 - නොවැම්බර් 08 |
| **විදේශ අමාත්‍යවරු සිදුකල සංචාර** | | |
| 1. | ඉරානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු හොසේන් අමීර් අබ්දුල්ලාහියන් මහතාගේ සංචාරය | 2024 පෙබරවාරි 19-20 |
| 2. | ජපානයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු යෝකෝ කොමිකාවා මහත්මියගේ සංචාරය | 2024 මැයි 04 - 05 |
| 3. | මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය ගරු මූසා සමීර් මහතාගේ සංචාරය | 2024 ජූනි 03 - 06 |
| 4. | ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සුබ්‍රමනියම් ජයශංකර් මහතාගේ සංචාරය | 2024 ජූනි 20 |
| 5. | ඝානාවේ විදේශ කටයුතු සහ කලාපීය ඒකාබද්ධතා අමාත්‍ය ගරු ෂර්ලි අයෝර්කෝර් බොච්වේ මහත්මියගේ සංචාරය | 2024 අගෝස්තු 19-21 |
| 6. | ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සුබ්‍රමනියම් ජයශංකර් මහතාගේ සංචාරය | 2024 ඔක්තෝබර් 4 |
| 7. | පෝලන්තයේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ පෞද්ගලික සංචාරය | 2024 දෙසැම්බර් 23 |
| **පාර්ලිමේන්තු කථානායකවරුන්ගේ සහ අනෙකුත් අමාත්‍යවරුන්ගේ සංචාර** | | |
| 1. | ඊශ්‍රායලයේ ප්‍රවාහන, ජාතික යටිතල පහසුකම් සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ අමාත්‍ය ගරු මිරි රෙගෙව් මහත්මියගේ සංචාරය | 2024 පෙබරවාරි 13-18 |
| 2. | නවසීලන්ත කථානායක ගරු ජෙරී බ්‍රවුන්ලි මහතාගේ සංචාරය | 2024 ජූලි 07-11 |
| 3. | සිංගප්පූරු ස්වදේශ කටයුතු සහ නීතිය පිළිබඳ අමාත්‍ය ගරු කේ. ෂන්මුගම් මහතාගේ සංචාරය | 2024 අගෝස්තු 11-14 |
| 4. | චීනයේ CPPCC හි උප සභාපති ගරු කින් බුයෝන්ග් මහතාගේ සංචාරය | 2024 දෙසැම්බර් 16-19 |

**වෙනත් විදේශීය සම්භාවනීය අමුත්තන්ගේ සංචාර**

| | | |
|---|---|---|
| 1. | එක්සත් රාජධානියේ රාජකීය ඇන් කුමරියගේ සංචාරය | 2024 ජනවාරි 10 – 12 |
| 2. | ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) මහලේකම් කයිරට් සාරිබේ මහතාගේ  සංචාරය | 2024 පෙබරවාරි 22-23 |
| 3. | අයෝරා දින සැමරුමට සහභාගී වීමට අයෝරා මහලේකම් සල්මන් අල් ෆාරිසි මහතාගේ  සංචාරය | 2024 මාර්තු 08-10 |
| 4. | වියනා පිල්හමොනික් වාද්‍ය වෘන්දයේ සභාපති මහාචාර්ය ඩැනියෙල් ෆ්‍රොස්චෝවර් මහතාගේ  සංචාරය | 2024 අප්‍රේල් 02 - 06 |
| 5. | බිම්ස්ටෙක් මහලේකම් ඉන්ද්‍රා මනි පාණ්ඩේ මහතාගේ සංචාරය | 2024 අප්‍රේල් 08 - 10 |
| 6. | එරික්  සෝල්කයිම් මහතාගේ  සංචාරය | 2024 අප්‍රේල් 27 - 2024 මැයි 03 |
| 7. | සාර්ක් මහලේකම්  අතිගරු ගෝලම් සර්වර් මහතාගේ සංචාරය | 2024 ජූනි 10-14 |
| 8. | ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක අජිත්  දොවාල් මහතාගේ  සංචාරය | 2024 අගෝස්තු 27-29 |
| 9. | ප්‍රංශ විදේශ අමාත්‍යාංශයේ මහලේකම්වරයාගේ  සංචාරය | 2024 දෙසැම්බර් 10-11 |

II වැනි වගුව - **ඉහළ මට්ටමේ සංචාර: බාහිර**

| | | |
|---|---|---|
| | **ජනාධිපතිතුමාගේ සංචාර** | |
| 1. | ලෝක ආර්ථික සංසදයට (WEF) සහභාගී වීම සඳහා ස්විට්සර්ලන්තයේ ඩාවෝස් වෙත සිදුකළ සංචාරය | 2024 ජනවාරි 13- 18 |
| 2. | නොබැඳි ව්‍යාපාරයේ (NAM) 19 වන සමුළුවට සහභාගී වීම සඳහා උගන්ඩාව වෙත සිදුකළ සංචාරය | 2024 ජනවාරි 21 – 22 |
| 3. | ඉන්දියානු සාගර සමුළුවට (IOC) සහභාගී වීම සඳහා ඕස්ට්‍රේලියාවේ පර්ත් වෙත සිදුකළ සංචාරය | 2024 පෙබරවාරි 09 - 10 |
| 4. | 10 වන ලෝක ජල සංසදයේ ඉහළ මට්ටමේ රැස්වීමට සහභාගී වීම සඳහා ඉන්දුනීසියාවේ බාලි වෙත සිදුකළ සංචාරය | 2024 මැයි 19-20 |
| 5. | ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මහතාගේ දිවුරුම් දීමේ උත්සවයට සහභාගී වීම සඳහා ඉන්දියාවේ නවදිල්ලි වෙත සිදුකළ සංචාරය | 2024 ජූනි 09-10 |
| 6. | ඉන්දියාවේ නවදිල්ලි වෙත සිදුකළ රාජ්‍ය සංචාරය | 2024 දෙසැම්බර් 15-17 |
| | **හිටපු අග්‍රාමාත්‍යතුමාගේ සංචාර** | |
| 1. | Boao Forum හි ආරම්භක සැසිවාරයට සහභාගී වීම සඳහා චීනය වෙත සිදුකළ සංචාරය | 2024 මාර්තු 24-30 |
| 2. | කොරියානු ජනරජය වෙත සිදුකළ නිල සංචාරය | 2024 අප්‍රේල් 02-05 |
| | **විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාර** | |
| 1. | නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ (NAM) 19 වන සමුළුවට සහභාගී වීම සඳහා උගන්ඩාවේ සිදුකළ සංචාරය | 2024 ජනවාරි 22-27 |
| 2. | එක්සත් රාජධානියේ ලන්ඩන් වෙත සිදුකළ සංචාරය | 2024 ජනවාරි 27-29 |

| | | |
|---|---|---|
| 3. | තුන්වන යුරෝපා සංගම් ඉන්දු-පැසිෆික් අමාත්‍ය සංසදයට සහභාගී වීම සඳහා බෙල්ජියමේ බ්‍රසල්ස් වෙත සිදුකළ සංචාරය | 2024 පෙබරවාරි 01-04 |
| 4. | ඉන්දියානු සාගර සමුළුවට (IOC) සහභාගී වීම සඳහා ඕස්ට්‍රේලියාවේ පර්ත් වෙත සිදුකළ සංචාරය | 2024 පෙබරවාරි 09-10 |
| 5. | මියුනිච් ආරක්ෂක සමුළුවේ 60 වන සංස්කරණයට සහභාගී වීම සඳහා ජර්මනියේ මියුනිච් වෙත සිදුකළ සංචාරය | 2024 පෙබරවාරි 16- 18 |
| 6. | සෞදි අරාබියේ ජෙඩා වෙත සිදුකළ සංචාරය | 2024 පෙබරවාරි 27 - මාර්තු 03 |
| 7. | ලෝක ආර්ථික සමුළුවට සහභාගී වීම සඳහා සෞදි අරාබියේ රියාද් වෙත සිදුකළ සංචාරය | 2024 අප්‍රේල් 28-29 |
| 8. | බ්‍රික්ස් අමාත්‍ය සැසිවාරයට සහභාගී වීම සඳහා රුසියාවේ මොස්කව් වෙත සිදුකළ සංචාරය | 2024 ජුනි 10-13 |
| 9. | දිවංගත ජනාධිපති ගරු ඊබ්‍රහිම් රයිසිගේ අවමංගල්‍යයට සහභාගී වීම සඳහා ඉරානයේ ටෙහෙරාන් වෙත සිදුකළ සංචාරය | 2024 ජුනි 21-23 |
| 10. | ජපානයේ ටෝකියෝ වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 01-07 |
| 11. | රොයිටර්ස් 2024 NEXT APAC සමුළුවට සහභාගී වීම සඳහා සිංගප්පූරුව වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 09 |
| 12. | රුමේනියාව වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 15-18 |
| 13. | පෝලන්තය වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 18-21 |
| 14. | ඊජිප්තුව වෙත සිදුකළ සංචාරය | 2024 අගෝස්තු 7-11 |
| 15. | අතිගරු ජනාධිපතිතුමා සමඟ නවදිල්ලිය වෙත සිදුකළ සංචාරය | 2024 දෙසැම්බර් 15-17 |
| **විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාර** | | |
| 1. | ඇන්ටාලියා රාජ්‍ය තාන්ත්‍රික සංසදයේ (ADF) 3 වන සමුළුවට සහභාගී වීම සඳහා තුර්කියේ ඇන්ටාලියා වෙත සිදුකළ සංචාරය | 2024 මාර්තු 01-03 |
| 2. | මියන්මාරය වෙත සිදුකළ නිල සංචාරය | 2024 ජුනි 9-14 |
| 3. | තායිලන්තය වෙත සිදුකළ සංචාරය | 2024 ජුනි 9-14 |
| 4. | ආසියානු සහයෝගිතා සංවාදයේ (ACD) සාමාජික රාජ්‍යයන්වල 19 වන අමාත්‍ය රැස්වීමට සහභාගී වීම සඳහා ඉරානයේ ටෙහෙරාන් වෙත සිදුකළ සංචාරය | 2024 ජුනි 22-24 |
| 5. | රුසියාවේ මොස්කව් වෙත සිදුකළ සංචාරය | 2024 ජුනි 25-28 |
| 6. | ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ 4 වන චීන ෂිසැන්ග් ට්‍රාන්ස්-හිමාලයා සංසදයට සහභාගී වීම සඳහා චීනය වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 01-05 |
| 7. | 2 වන බිම්ස්ටෙක් විදේශ අමාත්‍ය රැස්වීමට සහභාගී වීම සඳහා නවදිල්ලිය වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 11-12 |
| 8. | 31 වන ASEAN කලාපීය සංසදයට (ARF) සහභාගී වීම සඳහා ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය වෙත සිදුකළ සංචාරය | 2024 ජූලි 26-29 |

**සම්මන්ත්‍රණ සහ රැස්වීම්**

| | | |
|---|---|---|
| 1. | කොළඹ ආරක්ෂක සමුළුව | 2024 අගෝස්තු 29 |
| 2. | ඒකාබද්ධ කොමිෂන් සභා සහ දේශපාලන උපදේශන | ජනවාරි - සැප්තැම්බර් 2024 |
| 3. | විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් පාර්ශවකරුවන්ගේ රැස්වීම | |

**රාජ්‍ය තාන්ත්‍රික බලකායේ සහභාගීත්වයෙන් යුත් සමාජීය වැඩසටහන් - 2024**

| | | |
|---|---|---|
| 1. | අයෝරා දින සැමරුම | 2024 අප්‍රේල් 10 |
| 2. | 2024 සිංහල/දෙමළ අලුත් අවුරුදු උත්සවය | 2024 අප්‍රේල් 17 |
| 3. | 2024 වෙසක් උත්සවය | 2024 මැයි 21 |
| 4. | මහනුවර ඇසළ පෙරහැර | 2024 අගෝස්තු 20 |
| 5. | රාජ්‍ය තාන්ත්‍රික වෙළෙඳ සල්පිල | 2024 දෙසැම්බර් 07 |
| 6. | 2024 නත්තල් උත්සවය | 2024 දෙසැම්බර් 20 |

## අංශයන්හි ප්‍රගති සමාලෝචනය: අංශ ඒ හා සම්බන්ධ විෂය පථයන් සමඟ

### 1. ආර්ථික කටයුතු අංශය

විදේශ කටයුතු අංශයේ ආර්ථික කටයුතු අංශය ප්‍රධාන වශයෙන් ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් ඉටු කරමින් විදේශ දූත මණ්ඩල සහ ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ/ආයතන අතර සම්බන්ධීකරණ කාර්යභාරයක් ඉටු කරන අතරම, විදේශයන්හි ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපායමාර්ගික සහය සහ මඟ පෙන්වීම සපයයි. අංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට ආර්ථික ඉලක්ක පවරා ඇති අතර එම වැඩසටහන ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පෙර මුදල් හා රාජ්‍ය ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ එහි අනුබද්ධ ආයතන (විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව ආදිය), වාණිජ දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, වාණිජ මණ්ඩල, ඒකාබද්ධ ඇඟලුම් සංගමය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), කොළඹ කොටස් හුවමාරුව (CSE) ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක් සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වේ.

**1.1. ආර්ථික කටයුතු (ද්විපාර්ශ්වික) :** සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ, මෙම අංශය තායිලන්ත-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ ද්විපාර්ශ්වික ලේඛන සඳහා පහසුකම් සැලසූ අතර දැනට ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් එය අනුමත කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් සිටියි. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම, 2024 අප්‍රේල් 30 වන දින රියාද්හිදී අත්සන් කරන ලද සෘජු ආයෝජන ප්‍රවර්ධන සහයෝගීතාව පිළිබඳ සෞදි අරාබිය සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාව සහ රුමේනියාව අතර කම්කරු සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර සංක්‍රමණ සහ සංචලන හවුල්කාරිත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම, ආර්ථික හා මූල්‍ය සංවාදයක් පිළිබඳ ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර අවබෝධතා ගිවිසුම, චීනයට තිරිඟු නිවුඩ්ඩ අපනයන කිරීම වෙළඳපොළ ප්‍රවේශයන් පහසු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන කුකුළු නිෂ්පාදන පරීක්ෂා කිරීම, නිරෝධායනය සහ සනීපාරක්ෂක අවශ්‍යතා පිළිබඳ ශ්‍රී ලංකාව සහ චීනය අතර ප්‍රොටෝකෝලය, ආයෝජන සහයෝගීතාව සඳහා ජපාන විදේශ වෙළඳ සංවිධානය (JETRO) සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම යනාදී ද්විපාර්ශ්වික නෛතික ලියවිලි සඳහා මෙම අංශය පහසුකම් සලසන ලදී.

2024 ජූලි 24 සිට 26 දක්වා ශ්‍රී ලංකාවේ පැවති ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුමේ (ETCA) 14 වන වටයේ සාකච්ඡා, 2024 ජූනි 19 සිට 23 දක්වා කොළඹදී පැවති කර්මාන්ත ප්‍රදර්ශනය 2024 සඳහා විදේශීය නියෝජිතයින්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැපයීම, රුසියාව සහ ශ්‍රී ලංකාව අතර රේගු කටයුතු සම්බන්ධ සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය සහය පිළිබඳ ගිවිසුම අත්සන් කිරීම, 2024 ජූනි 25 වන දින පැවති DigiECon ගෝලීය ආයෝජන සමුළුව සංවිධානය කිරීමේදී තාක්ෂණ අමාත්‍යාංශය සමඟ හවුල් වීම, 2024 නොවැම්බර් 26 වන දින කොළඹ පැවති සමුද්‍ර සමුළු චාරිකාව සඳහා විදේශීය නියෝජිතයින්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම, වෙළඳ ප්‍රදර්ශන, ව්‍යාපාර රැස්වීම් සහ විදේශයන්හි ව්‍යාපාරික කටයුතු සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකික නිලධාරීන්/සමාගම් සඳහා වීසා බලපත්‍ර සඳහා පහසුකම් සැලසීම ඇතුළු කාර්යන් ගණනාවක් ද ඉටු කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපාන, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිකුත් කරන ලද සංචාරක උපදේශන පිළිබඳ අධීක්ෂණය සඳහා ද මෙම අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර එමඟින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ එක්ව ඒවා යාවත්කාලීන කිරීම සඳහා මෙම අංශය කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා - තුර්කි ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ඒකාබද්ධ කොමිසමේ (JCETC) 3 වන සැසිවාරය සහ ශ්‍රී ලංකා - රුසියානු අන්තර් රාජ්‍ය වෙළඳ,

ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතා කොමිසමේ (IGC) 3 වන සැසිවාරය සඳහා දිනයන් වෙන් කරගැනීමටද මෙම අංශය පහසුකම් සපයන ලදී. රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය පිළිබඳ රුසියාව සහ ශ්‍රී ලංකාව අතර ගිවිසුම අත්සන් කිරීම අවසන් කිරීමට මෙම අංශය පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකා - තුර්කි ඒකාබද්ධ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා කොමිසමේ (JCETC) තුන්වන (3 වන) සැසිවාරය, ශ්‍රී ලංකා - රුසියානු අන්තර් රාජ්‍ය වෙළඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතා කොමිසමේ (IGC) 3 වන සැසිවාරය, ඉරාක - ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටු රැස්වීමේ 9 වන සැසිවාරය සහ ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතා කොමිසමේ 12 වන සැසිවාරය සඳහා දිනයන් වෙන් කර ගැනීම සඳහා පහසුකම් සැලසීම/සම්බන්ධීකරණය කරන ලදී.

බේරූට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ සිරියාවේ ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා විසින් සංවිධානය කරන ලද සංචාරක අංශයෙහි නිරත සිරියානු ව්‍යාපාරික නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීම ද ආර්ථික කටයුතු අංශය සම්බන්ධීකරණය කළේය. මෙම අංශය ආර්ථික සහයෝගීතාවට අදාළව රේඛීය ආයතනවලින් යෝජනා කැඳවා ඇත. ශ්‍රී ලංකාව ආර්ථික ස්ථායිකරණය සම්බන්ධයෙන් ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය සහ රට ආදායම් උත්පාදනය සහ වර්ධනය කරා ගමන් කරන විට ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය කෙරෙහි රජය විසින් ලබා ඇති ඉහළ ප්‍රමුඛතාවය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විදේශ ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ක්‍රිස්ටෝෆර් මැක්ලෙනන් මහතා අතර හමුවක් මෙම අංශය පහසුකම් සැලසීමෙන් 2024 මැයි මස 28 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

2024 ජූනි 19 සිට 23 දක්වා කොළඹ පැවති කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා විදේශීය නියෝජිතයින්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සලසන ලදී. 2024 ජූනි 25 වන දින පැවති DigiECon ගෝලීය ආයෝජන සමුළුව සංවිධානය කිරීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශය තාක්ෂණ අමාත්‍යාංශය සමඟ හවුල් විය. 2024 ජූනි 28 වන දින වොෂින්ටන් ඩී.සී. හි පැවති 5 වන එක්සත් ජනපද - ශ්‍රී ලංකා හවුල්කාරිත්ව සංවාදයේ ඒකාබද්ධ ප්‍රකාශය සහ දෙරට අතර සබඳතා වැඩි දියුණු කිරීම සඳහා ඊජිප්තුවේ කයිරෝ හි 2024 අගෝස්තු 7 සිට 11 දක්වා පැවති ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා සහභාගී වූ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරයටද මෙම අංශය විශේෂයෙන් පහසුකම් සැලසීය.

2024 සැප්තැම්බර් 3 සිට 6 දක්වා තුර්කියේ ඉස්තාන්බුල් හි පැවති 2024 ලෝක ආහාර ඉස්තාන්බුල් ප්‍රදර්ශනයට සහභාගී වූ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්ට වීසා ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ ආර්ථික සහයෝගීතා පරිච්ඡේදය යටතේ හඳුනාගෙන ඇති සහයෝගීතා ක්ෂේත්‍රවලට අදාළ යෝජිත රේඛීය ආයතනවලින් යෝජනා කැඳවා ඇත. 2024 ජනවාරි 6 සිට 8 දක්වා ශ්‍රී ලංකාවේ පැවති FACETS 2024 සංවිධානය කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

2024 මාර්තු 14 වන දින ශ්‍රී ලංකා - ඉන්දුනීසියානු වරණීය වෙළඳ ගිවිසුමේ සාකච්ඡා දියත් කිරීම සඳහා පහසුකම් සලසන ලදී. ආයෝජන සහයෝගීතාව සඳහා ජපාන විදේශ වෙළඳ සංවිධානය (JETRO) සහ ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපෑ හැකි ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිකුත් කරන ලද සංචාරක උපදේශන සම්බන්ධයෙන් අවධානය යොමු කර ඒවා යාවත්කාලීන කිරීම සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ කටයුතු කරන ලදී. මොස්කව් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) අතර ස්මාර්ට් සිටි ව්‍යාපෘතියක් සම්බන්ධීකරණය කරන ලදී. විදුලි සංදේශ අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් euTeLSAT ONEWEB හි ආසියානු උප සභාපතිවරයාගේ සංචාරයේදී ශ්‍රී ලංකා ආයතන සමඟ රැස්වීම් සඳහා පහසුකම් සලසන ලදී.

එසේම 2024 වර්ෂය තුළදී, විභව ආයෝජන අංශ හඳුනා ගැනීම සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල සමඟ සම්බන්ධීකරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන ව්‍යාපෘති සමඟ ඒවා සම්බන්ධ කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සමඟ කටයුතු කිරීම යනාදියද මෙම අංශය

විසින් සිදු කරන ලදී. එසේම ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා දායක වන ක්‍රියාකාරී සැලැස්මක් අවසන් කිරීම සඳහා ධීවර අංශයේ පාර්ශ්වකරුවන්ගේ පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි දියුණු කිරීම පිළිබඳ උප අපනයන කමිටුවේද (SEC) මෙම අංශය අමාත්‍යාංශය නියෝජනය කරන ලදී. එසේම ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශය විදේශයන්හි ප්‍රවර්ධනය කිරීම සඳහා SLASSCOM, අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ Federation of Information Technology Industry Sri Lanka (FITIS) සමඟද මෙම අංශය කටයුතු කළේය.

**1.1.1.** ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන**:** ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික වැඩසටහන යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් ක්‍රියාත්මක වෙළඳ හා ආයෝජන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 7.25 ක් සහ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 2.88 ක් වෙන් කිරීම සම්බන්ධීකරණය කරන ලදී. 2024 වර්ෂය සඳහා වෙන් කල මුළු රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 10.14 ක් දූත මණ්ඩල සඳහා වෙන් කර ඇත.

**1.2. ආර්ථික කටයුතු (බහුපාර්ශ්වික):** ආර්ථික කටයුතු අංශයේ බහුපාර්ශ්වික කටයුතු අංශය, ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ජාත්‍යන්තර, අන්තර් රාජ්‍ය සහ කලාපීය සංවිධාන සමඟ බහුපාර්ශ්වික සහයෝගීතාවයට අදාළ කරුණු හසුරුවයි. අදාල පාර්ශවකරුවන් සමග සාකච්ඡා කර ශ්‍රී ලංකාවේ ස්ථාවරයන් සකස් කිරීම සහ ජාත්‍යන්තරව ශ්‍රී ලංකා රජය විසින් කරන ලද කැපවීම් ශක්තිමත් කිරීම සහ පසු විපරම් කිරීම සඳහා මෙම අංශය කටයුතු කරයි.

**1.2.1. ලෝක ආර්ථික සංසදය -** 2024 ජනවාරි 13 සිට 18 දක්වා ස්විට්සර්ලන්තයේ ඩාවෝස් ක්ලෝස්ටර්ස් හි පැවති ලෝක ආර්ථික සංසදයේ වාර්ෂික රැස්වීමට හිටපු ජනාධිපතිවරයා සහභාගී විය. 2024 අප්‍රේල් 28 සිට 29 දක්වා සෞදි අරාබියේ රියාද් හි පැවති සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව, වර්ධනය සහ බලශක්තිය පිළිබඳ ලෝක ආර්ථික සංසදයේ විශේෂ රැස්වීමට හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගී විය.

**1.2.2. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානය (IORA) -** ශ්‍රී ලංකාව දැනට සභාපතිත්වය දරන ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානය (IORA) සඳහා ශ්‍රී ලංකාවේ සම්බන්ධීකාරක ලෙස මෙම අංශය ක්‍රියා කරයි. මෙම අංශය 2024 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා අදාළ රේඛීය අමාත්‍යාංශ/ආයතන සහ මොරිෂස්හි අයෝරා ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් අයෝරා ආශ්‍රිත රැස්වීම්/වැඩමුළු/පුහුණු වැඩසටහන් තිස් පහකට (35) සහභාගී විය/පහසුකම් සැපයීය. මෙම අංශය මාර්ගගතව පැවති අයෝරා ආශ්‍රිත රැස්වීම් දහයකට (10) ක්‍රියාකාරීව සහභාගී විය. අයෝරාහි සභාපතිත්වය යටතේ ශ්‍රී ලංකාව 2024 මාර්තු 10 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව සංවිධානය කරන ලද "අනාගතය සඳහා තිරසාර ඉන්දියානු සාගරයක් සහතික කිරීම" යන තේමාව යටතේ අයෝරා දිනය සැමරීය. අයෝරා ක්‍රියාකාරී ආයතනවල සභාපතිවරුන් සහ සම්බන්ධීකරණ රටවල (FBC-CC) පස්වන රැස්වීම 2024 අප්‍රේල් 23 වන දින මාර්ගගතව පැවැත්විණි.

2024 මැයි 07 වන දින ශ්‍රී ලංකාව අයෝරා මූල්‍ය උප කමිටුවේ (SCF) සත්කාරකත්වය සහ මුලසුන මාර්ගගතව දැරීය. 2024 මැයි 21 වන දින අයෝරා හි මීළඟ මහලේකම් තනතුර සඳහා අපේක්ෂකයින්ගේ සම්මුඛ පරීක්ෂණය (මාර්ගගතව) ශ්‍රී ලංකාව විසින් මෙහෙයවන ලදී. "තිරසාර සංවර්ධනය-සීමාමායිම් පුළුල් කිරීම " යන තේමාව යටතේ අයෝරා - ව්‍යාපාර සමුළුව 2024, ලංකා වාණිජ මණ්ඩලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව 2024 මැයි 28-29 දිනවල කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා රජය 2024 මැයි 30-31 දක්වා 26 වන අයෝරා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු (CSO) රැස්වීමට මාර්ගගත ආකාරයෙන් සත්කාරකත්වය දැරූ අතර එහි මුලසුනද දැරීය. ඉහත අයෝරා රැස්වීම් සඳහා සූදානම් කිරීම් සහ වැදගත් කරුණු ගොනු කිරීමේ ප්‍රධාන කාර්යභාරය මෙම අංශය විසින් ඉටු කරන ලදී. 2024 ඔක්තෝබර් 28 වන දින ශ්‍රී ලංකාව අයෝරා මූල්‍ය උප කමිටුවේ (SCF) මාර්ගගත ආකාරයෙන් සත්කාරකත්වය සහ මුලසුන දැරීය.

**1.2.3. බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත මුලපිරීම (BIMSTEC):** ශ්‍රී ලංකාවේ නියෝජිතයින් අනෙකුත් සාමාජික රටවල් විසින් සත්කාරකත්වය දරන බිම්ස්ටෙක් ආංශික රැස්වීම්වලට සහභාගී වී ඇත. මීට අමතරව, 2024 දී ශ්‍රී ලංකාව පහත සඳහන් බිම්ස්ටෙක් රැස්වීම් සඳහා සත්කාරකත්වය ලබා දුන් අතර, ආර්ථික කටයුතු අංශය විසින් සූදානම් කිරීම් සහ වැදගත් කරුණු සැකසීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කර ඇත. එම රැස්වීම් අතර ව්‍යාප්තවන බෝවන රෝග තත්ත්වයන් සහ බිම්ස්ටෙක් කලාපයේ රටවල නිසි භාවිතයන් පිළිබඳ දැනුම බෙදා ගැනීමේ රැස්වීම්, මේස අභ්‍යාස , 2024 ජූනි 24 සිට 27 දක්වා කොළඹදී පැවති ආසියානු පැසිෆික් සෞඛ්‍ය මූල්‍යකරණ සංසදය, 2024 ජූලි 25 සිට 26 දක්වා කොළඹදී පැවති විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ දෙවන රැස්වීම, 2024 ජූලි 11 සිට 12 දක්වා නවදිල්ලියේදී පැවති හිටපු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහභාගී වූ දෙවන බිම්ස්ටෙක් විදේශ අමාත්‍යවරුන්ගේ සැසිය ද වේ. 2024 අගෝස්තු 21 සිට 22 දක්වා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ පළමු රැස්වීම ශ්‍රී ලංකාව විසින් 2024 අගෝස්තු 21 සිට 22 දක්වා මාර්ගගතව පවත්වන ලදී. සංස්කෘතික සහයෝගීතාව පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ තුන්වන රැස්වීම පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟ වී තිබේ. දින වකවානු තවමත් තීරණය කර නොමැත. ශ්‍රී ලංකාව බත්තරමුල්ල සෙත්සිරිපායේ බිම්ස්ටෙක් තාක්ෂණ හුවමාරු පහසුකම් මධ්‍යස්ථානය (TTF) පිහිටුවීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර සත්කාරක ගිවිසුම ශ්‍රී ලංකාව විසින් කෙටුම්පත් කර ඇත. නේපාලයෙන් සහයෝගිතා ගිවිසුම අනුමත කරන තෙක්, විදේශ කටයුතු ලේකම් 2024 දෙසැම්බර් 19 වන දින පැවති බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ 24 වන සැසිවාරය සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසට මාර්ගගතව නායකත්වය දුන්නේය.

**1.2.4. බ්‍රික්ස් සංවිධානය** - හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා අයෝරා සංවිධානයේ සභාපති ලෙස 2024 ජූනි 11 සිට 12 දක්වා රුසියාවේ පැවති බ්‍රික්ස් අමාත්‍ය සංසදය ඇමතීය. බ්‍රික්ස් සහ නව සංවර්ධන බැංකුවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ නියෝග මත සම්බන්ධීකරණය කරන ලදී.

**1.2.5. ආසියානු සහයෝගිතා සංවාදය (ACD) –** එවකට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2024 ජූනි 24 වන දින ඉරාන ඉස්ලාමීය ජනරජයේ ටෙහෙරාන් හි පැවති 19 වන අමාත්‍ය මණ්ඩල රැස්වීමට සහභාගී විය. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම (SOM) 2024 සැප්තැම්බර් 18 වන දින මාර්ගගත ආකාරයෙන් පවත්වන ලද අතර එහිදී දෝහා ප්‍රකාශනයට එළඹිනි. තුන්වන (3 වන) ආසියානු සහයෝගිතා සංවාද (ACD) සමුළුව සහ 2 වන ව්‍යාපාරික සංසදය 2024 ඔක්තෝබර් 2-3 දිනවල කටාර් රාජ්‍යයේ දෝහා හිදී පවත්වන ලද අතර කටාර්හි ශ්‍රී ලංකාවේ හිටපු තානාපතිවරයා අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් ඉහත රැස්වීම්වලට සහභාගී විය. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම (SOM) 2024 දෙසැම්බර් 23 වන දින මාර්ගගතව පැවැත්විණි. සම්බන්ධතාවය, විද්‍යා තාක්ෂණය සහ නවෝත්පාදනය, අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය සහ ආහාර බලශක්තිය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් මෙම වසර තුළ මාර්ගගතව පවත්වන ලදී.

**1.2.6. කොළඹ සැලැස්ම** - ශ්‍රී ලංකාව 2024 මැයි 9 වන දින පැවති කොළඹ සැලසුම් කවුන්සිලයේ 308 වන සැසිවාරයේදී තායිලන්තයට සභාපතිත්වය භාර දුන්නේය. වරාය ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිත පිරිස 2024 මැයි 10 සිට 22 දක්වා කොළඹ සැලැස්මේ ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත සුහුරු වරාය සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාව 2024 මැයි 29-31 දක්වා මොන්ගෝලියාවේ උලාන්බාතර් හි පැවති කොළඹ සැලැස්මේ 48 වන උපදේශක කමිටු රැස්වීමට (CCM) සහ 2024 සැප්තැම්බර් 19 වන දින තායිලන්තයේ සභාපතිත්වය යටතේ කොළඹදී රැස්වූ කොළඹ සැලසුම් කවුන්සිලයේ 309 වන සැසිවාරයට සහභාගී විය.

**1.2.7. තාක්ෂණික සහයෝගීතාව:** ආර්ථික කටයුතු අංශය විසින් ශ්‍රී ලංකාවේ නිශ්චිත රාජකාරි සඳහා සේවයේ නියුතු ජාත්‍යන්තර සංවිධානවල සේවකයින් සඳහා කෙටි කාලීන ප්‍රවේශ වීසා 209 +3, දිගු කාලීන ප්‍රවේශ වීසා 62 +3 සහ නේවාසික වීසා 119 + 10 සත්‍යාපනය කර නිර්දේශ කරන ලදී. මුදල් අමාත්‍යාංශය යටතේ ඇති තිරසාර සංවර්ධන කවුන්සිලය ඇතුළු රේඛීය අමාත්‍යාංශ විසින් ශ්‍රී

ලංකාවේ සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගී වන සහභාගිවන්නන් සඳහා වීසා පහසුකම් සපයන ලදී.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවලින් ලැබුණු ප්‍රසම්පාදන නිවේදන 146 +10 සඳහා පහසුකම් සපයන ලද අතර, නිවේදන සඳහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දෙන ලෙස සහ දූත මණ්ඩල/කාර්යාල වල වෙබ් අඩවිය/සමාජ මාධ්‍ය යාවත්කාලීන කරන ලෙස විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දෙන ලදී. රජයේ ආයතන, ව්‍යවසායකයින් ආදි සහාය අවශ්‍ය අය සඳහා වීසා 120 ක් ලබා දෙන ලදී. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ජාත්‍යන්තර සමාගම් නවයක (09) සත්‍යාපනයන් සඳහා ද පහසුකම් සපයන ලදී.

## 2. මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශය

මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු (HRD, R & T) අංශය, ශ්‍රී ලංකා විදේශ සේවා (SLFS) නිලධාරීන් ඇතුළු අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කර පහසුකම් සපයයි. අමාත්‍යාංශයේ සම්බන්ධීකාරක ලෙස ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKI) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සම්බන්ධ කටයුතු ද මෙම අංශය සම්බන්ධීකරණය කරයි. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ අංශයේ විෂය පථයට අනුකූලව අංශය ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වේ:

**2.1.** **වාර්තා සහ ප්‍රකාශන:** 2022/2023 දිනට විදේශයන්හි රාජ්‍ය තාන්ත්‍රික, කොන්සියුලර් සහ අනෙකුත් නියෝජනයන් පිළිබඳ නාමාවලිය 2024 ජනවාරි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද අතර ප්‍රකාශනයට සූදානම් කර ඇති 2024 විදේශයන්හි රාජ්‍ය තාන්ත්‍රික, කොන්සියුලර් සහ අනෙකුත් නියෝජනයන් පිළිබඳ නාමාවලිය සම්පාදනය කරන ලදී.

**2.2.** **විභාග:** 2024 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වන පළමු සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ විදේශ භාෂා පරීක්ෂණය - 2020 (2024) සඳහා ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී. 2025 දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා දූත මණ්ඩල /කාර්යාල සඳහා දේශීය පදනමින් බඳවා ගන්නා කළමනාකරණ සේවා නිලධාරි කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේ සීමිත තරඟ විභාගය සඳහා ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.

2025 දී පැවැත්වෙන ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල/කාර්යාල සඳහා දේශීය පදනමින් බඳවා ගන්නා පුද්ගලික සහකාර තනතුරු සඳහා වන සීමිත තරඟකාරී විභාගය සඳහා ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට මූලික පියවර ගන්නා ලදී. 2025 දී ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය සඳහා වන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.

**2.3.** **පුහුණුවීම්:** සමාලෝචිත කාලය තුළ, අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ශක්‍යතා වැඩි දියුණු කිරීමේ අරමුණින් විදේශීය පුහුණු වැඩසටහන් 48 ක් සහ දේශීය පුහුණු වැඩසටහන් 03 ක් සඳහා පහසුකම් සපයමින් සම්බන්ධීකරණය කරන ලදී. 2024 ජූනි සිට ජූලි දක්වා අලුතින් බඳවා ගත් ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා රාජ්‍ය තාන්ත්‍රික පුහුණු වැඩසටහනක් සහ 2024 මාර්තු සහ අගෝස්තු මාසවලදී දූත මණ්ඩල ප්‍රධානීන් (HOM) සඳහා දිශානති වැඩසටහන් දෙකක් (02) පවත්වන ලදී. ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල තනතුරු සඳහා පත් කරන ලද සුදුසුකම් ලත් කළමනාකරණ සේවා නිලධාරීන් (MSOs), පුද්ගලික සහායකයින් (PAs) සහ කම්කරු නිලධාරීන් සඳහා අමාත්‍යාංශයේදී දිශානති වැඩසටහන් තුනක් (03) පවත්වන ලදී.

## 3. ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගිතා අංශය

**3.1. එල්ටීටීඊ සංවිධානයට අදාළ කරුණු:** යුරෝපීය සංගමය තුළ එල්ටීටීඊ සංවිධානය අඛණ්ඩව තහනම් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ආරක්ෂක සහයෝගිතා අංශය (ISC) අවශ්‍ය තොරතුරු ලබා දුන් අතර විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල සමඟ සම්බන්ධීකරණය කළේය. 2024 මාර්තු 31 සහ 2024 ඔක්තෝබර් 04 යන දිනවල පිළිවෙලින් යුරෝපා සංගමයට ඉදිරිපත් කරන ලද ද්විවාර්ෂික ඉදිරිපත් කිරීම් මෙම අංශය විසින් සකස් කරන ලදී. 2024 පෙබරවාරි මාසයේදී එල්.ටී.ටී.ඊ තහනම් කිරීම යුරෝපා සංගමය නිවේදනය කළේය. 2024 මාර්තු 22 වන දින කැනඩාවේ එල්.ටී.ටී.ඊ තහනම් කිරීමේ ලැයිස්තුවේ රඳවා තබා ගැනීම සඳහා අංශය තොරතුරු ඉදිරිපත් කළේය.

කැනේඩියානු බලධාරීන් විසින් ජන සංහාර චෝදනා පිළිගැනීමට එරෙහිව කටයුතු කිරීමේ අරමුණින් අංශය රැස්වීම් සම්බන්ධීකරණය කර ඊට අදාල ඉදිරිපත් කිරීම් සකස් කළේය. අවධානය යොමු කළ යුතු අවස්ථා සහ වර්ධනයන් හඳුනා ගැනීම සඳහා සැලකිය යුතු දින සහ සිදුවීම් වලදී විදේශයන්හි එල්ටීටීඊ සංවිධානයට අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම අංශය අඛණ්ඩව කරගෙන ගියේය.

**3.2. ද්විපාර්ශ්වික ආරක්ෂක සහයෝගීතාව පුළුල් කිරීම:** පිලිපීනය, ඉන්දුනීසියාව, පාකිස්තානය, බංග්ලාදේශය සහ ඉරාකය සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම අංශය කඩිනම් කළේය.

i. ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර අවබෝධතා ගිවිසුමට දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එය අත්සන් කිරීමට නියමිත අතර දිනය සහ ස්ථානය තහවුරු කර ගැනීමට නියමිතය.

ii. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සාකච්ඡා කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් කරන ලද සංශෝධන සඳහා අංශය ඉන්දුනීසියානු පාර්ශවයෙන් නිරීක්ෂණ ඉල්ලා ඇත.

iii. ාකිස්තාන බලධාරීන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා කොළඹ පිහිටි පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයට ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර අවබෝධතා ගිවිසුම ඉදිරිපත් කරන ලදී.

iv. "ජාත්‍යන්තර ත්‍රස්තවාදය සහ අන්තර්ජාතික අපරාධ සහ බුද්ධි හුවමාරුව මැඩපැවැත්වීම" පිළිබඳ ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර කෙටුම්පත් අවබෝධතා ගිවිසුමක් බංග්ලාදේශ පාර්ශවයට නිරීක්ෂණ සඳහා යවන ලද අතර ගිවිසුමට එළඹීම සඳහා ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.

v. ශ්‍රී ලංකාව සහ ඉරාකය අතර ත්‍රස්තවාදය මර්දනය කිරීමේ ක්ෂේත්‍රයේ ඒකාබද්ධ සහයෝගීතාව සඳහා යෝජිත අවබෝධතා ගිවිසුම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිරීක්ෂණ අංශය විසින් ලබා ගන්නා ලද අතර අමාත්‍යාංශයේ නීති අංශයේ නිරීක්ෂණ බලාපොරොත්තුවෙන් සිටී.

**3.3. දේශීය ආරක්ෂක, ආරක්ෂණ සහ නීති ආයතනවල ශක්‍යතා සංවර්ධනය:** මෙම අංශය, සන්නද්ධ හමුදා සහ ආරක්ෂක අමාත්‍යාංශ නිලධාරීන් සඳහා අනෙකුත් රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන (උදා: UNODC) විසින් පිරිනමනු ලබන ශක්‍යතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වීම සම්බන්ධීකරණය කළේය.

ඊට අමතරව, බහුවිධ සහයෝගීතාවය තුළින් පුළුල් පුනරුත්ථාපන සහ නැවත ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ග වැඩිදියුණු කිරීම සඳහා නිසි භාවිතයන් සහ දැනුම බෙදා ගැනීමට අදහස් කරන දකුණු ආසියානු ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමේ ජාලය (SAN-PVE) යටතේ UNODC සමඟ පුනරුත්ථාපනය සහ නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ පළමු තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම සංවිධානය කිරීම සම්බන්ධීකරණය කරන ලදී.

**3.4. ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීමට / මැඩපැවැත්වීමට සහාය වීම:** ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව සටන් කිරීම සහ වැළැක්වීම සඳහා අදාළ ආයතන අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා අංශය සහාය ලබා දුන්නේය.

ශ්‍රී ලංකාව සඳහා වූ වේගවත් අරමුදල් යාන්ත්‍රණය යටතේ ගෝලීය ප්‍රජා සහභාගීත්ව සහ ඔරොත්තු දීමේ අරමුදල (GCERF- ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා කැප වූ ගෝලීය අරමුදලක්) UNODC SAN-PVE ජාලය යටතේ ව්‍යාපෘති හඳුනාගෙන අරමුදල් ඒකාබද්ධ කරයි. මෙම අංශය GCERF සහ අනෙකුත් ශ්‍රී ලාංකික කොටස්කරුවන් අතර කටයුතු සම්බන්ධීකරණය කළේය.

**ප්‍රචණ්ඩ අන්තවාදය වැළැක්වීම සඳහා වූ දකුණු ආසියානු ජාලයේ (SAN-PVE)** සාමාජිකයෙකු ලෙස, SAN-PVE සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය විධිමත් කිරීම සඳහා SAN-PVE පිළිබඳ අමාත්‍ය මණ්ඩලයට සටහන් දෙකක් ඉදිරිපත් කරන ලදී.

**අග්නිදිග ආසියානු කලාපීය ත්‍රස්තවාදයට එරෙහි මධ්‍යස්ථානය (SEARCCT)** සමඟ සම්බන්ධතාවය ආරම්භ කිරීම සඳහා මෙම අංශය ආරක්ෂක අමාත්‍යාංශය සහ මැලේසියානු බලධාරීන් සමඟ සමීපව කටයුතු කරයි. මෙම උත්සාහයන් අරමුණු කරන්නේ ත්‍රස්තවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදයට එරෙහිව සටන් කිරීමේදී වේගවත් සහයෝගීතාවයක් සහ හොඳම භාවිතයන් හුවමාරු කර ගැනීම, අනාගතයේදී ගැඹුරු සහයෝගීතාවයක් සඳහා අඩිතාලම දැමීමයි.

**3.5. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම:** UNSCR 1373 ප්‍රකාශයට පත් කිරීම සඳහා 2012 එක්සත් ජාතීන්ගේ රෙගුලාසි අංක 1 යටතේ නම් කරන ලද පුද්ගලයින් සහ ආයතන ලැයිස්තුව සමාලෝචනය කිරීම සඳහා ජාතික බුද්ධි ප්‍රධානියා විසින් කැඳවන ලද නිලධාරීන්ගේ කමිටුවට විදේශ අමාත්‍යාංශය නියෝජනය කරමින් මෙම අංශය සහභාගී විය.

**3.6. ජාතික ආරක්ෂාවට/ප්‍රතිරූපයට එල්ල වන තර්ජන පිළිබඳ අවධානය යොමු කිරීමෙන් අනෙකුත් අංශ සඳහා සහය වීම:** එල්ටීටීඊ හිතවාදීන්ගේ ප්‍රකාශ, සිදුවීම්, සමාජ මාධ්‍ය සහ දේශපාලන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සහ ප්‍රතික්‍රියාමාර්ග සඳහා නිර්දේශ සහ අදහස් ලබා දීම හරහා ශ්‍රී ලංකාව පිළිබඳ අසත්‍ය ප්‍රචාර මැඩපැවැත්වීම සඳහා අදාළ දේශපාලන අංශ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සමඟ මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

**3.7. රැස්වීම්/සම්මේලන සඳහා සහභාගී වීම:** මෙම අංශය 2024 පෙබරවාරි 16-18 දිනවල ජර්මනියේ මියුනිච් ආරක්ෂක සමුළුවට සහභාගී වූ එවකට විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිල සංචාරය සම්බන්ධීකරණය කළේය. මෙම අංශය 2024 ජනවාරි 23-25 දිනවල බ්‍රසල්ස් හි පැවති යුරෝපීය ආරක්ෂක සහ ආරක්ෂණ විද්‍යාලය (ESDC) / ජාත්‍යන්තර ත්‍රස්ත විරෝධී මධ්‍යස්ථානය (ICCT) විසින් සංවිධානය කරන ලද "යුරෝපා සංගම් ත්‍රස්ත විරෝධී සහ ප්‍රචණ්ඩ අන්තවාදී පරිසර පද්ධතිය සහ භාවිතයේ ප්‍රමුඛතා පිළිබඳ සම්මන්ත්‍රණයට" ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු සමඟ සහභාගී වී ඇත. 2024 ජූලි 9 සිට 12 දක්වා තායිලන්තයේ බැංකොක් හි පැවති "UNOCT-UNCCT කලාපීය CBRN අභ්‍යාස වැඩසටහනේ" සංචාරය ද මෙම අංශය සම්බන්ධීකරණය කළ අතර ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී විය.

## 4. සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය

සාගර කටයුතු, පරිසර සහ දේශගුණික විපර්යාස අංශය, ශ්‍රී ලංකාවේ සාගර කටයුතු, පරිසරය සහ දේශගුණික විපර්යාස සම්බන්ධ ජාත්‍යන්තර කටයුතු ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ සහතික කිරීම සඳහා වගකිව යුතු අතර, අදාළ රජයේ අමාත්‍යාංශ සහ ආයතනවලට ඒ සම්බන්ධව විදේශ ප්‍රතිපත්තිමය අවබෝධයක් ලබා දෙයි.

මීට අමතරව, මෙම ක්ෂේත්‍රවල ජාත්‍යන්තර, කලාපීය සහ උප කලාපීය සංවිධානවල ශ්‍රී ලංකාවේ භූමිකාව ශක්තිමත් කිරීමට මෙම අංශය කටයුතු කරන අතර, සංවිධානාත්මක අරමුණු සහ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා ද්විත්වයම ඉදිරියට ගෙන යාමේ සන්ධිස්ථානයක් ලෙස රට ස්ථානගත කරයි.

**4.1. දේශපාලන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** සමුද්‍ර දේශ හවුල්කාරිත්ව වැඩසටහන (OCPP) හරහා සහයෝගීතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පස් අවුරුදු හවුල්කාරිත්වයක් සැකසීමට මෙම අංශය පහසුකම් සැලසීය. 2024 මැයි 17 වන දින, නීල ග්‍රහලෝක අරමුදල (BPF) යටතේ ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ප්‍රධාන අවධානය යොමු කළ ක්ෂේත්‍ර අතරට සමුද්‍ර දූෂණය, තිරසාර මුහුදු ආහාර සහ සමුද්‍ර ජෛව විවිධත්වය, ශක්‍යතා සංවර්ධනය අවධාරණය කිරීම සහ තාක්ෂණික සහාය ඇතුළත් වේ. මෙම අංශය සමුද්‍ර දේශ හවුල්කාරිත්ව වැඩසටහන (OCPP) යටතේ ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන ගියේය.

එක්සත් රාජධානියේ ජල විද්‍යාත්මක කාර්යාලය සහ ශ්‍රී ලංකා ජාතික ජල විද්‍යාත්මක කාර්යාලය අතර ද්විපාර්ශ්වික සැකැස්ම පිළිබඳ අවබෝධතා ගිවිසුමට එළඹීම සඳහා මෙම අංශය කඩිනම් පියවර ගත් අතර, ආරක්ෂක අමාත්‍යාංශය විසින් එම ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

තවද, SLNHO සහ අනෙකුත් විදේශීය ප්‍රතිනියෝජිතායතන අතර මෙහෙයුම් වැඩි දියුණු කිරීම සහ සම්බන්ධතාවය ආයතනිකකරණය කිරීම සඳහා සහාය ලබා ගැනීම සඳහා අංශය අනෙකුත් රටවල් සමඟ අඛණ්ඩව සම්බන්ධ විය.

**4.2. බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** කෙන්යාවේ නයිරෝබි හි පැවති 6 වන එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේදී (UNEA) (2024 පෙබරවාරි 19–23), ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය එක්ව "ජල ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා ඵලදායී සහ අන්තර්ග්‍රාහී ගිවිසුම් " පිළිබඳ කෙටුම්පත් යෝජනාවක් සම්මත කරන ලදී. තවද, 2025 ජූලි මාසයේදී සිම්බාබ්වේ හි පැවැත්වීමට නියමිත RAMSAR සම්මුතියේ **15** වන පාර්ශ්ව සම්මේලනයට (COP) 'තෙත්බිම් වල ස්වභාවධර්මයේ අයිතිවාසිකම්' යන මාතෘකාව යටතේ නව යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා කෙටුම්පත් සකස් කිරීමට මෙම අංශය දායක වූ අතර සම්මත කර ගැනීම සඳහා සහය ලබා ගැනීමට සාමාජික රටවලින් ඉල්ලීම් කිරීමට සැලසුම් කරයි.

පොදුරාජ්‍ය මණ්ඩලීය කඩොලාන පරිසර පද්ධති ජීවනෝපාය ක්‍රියාකාරී කණ්ඩායමේ (MELAG) ප්‍රමුඛ රටක් ලෙස විදේශ කටයුතු අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කළ අතර, 2024 පෙබරවාරි 26 සිට මාර්තු 1 දක්වා පැවති 6 වන United Nations Environment Assembly (UNEA) හීදී ගෝලීය වශයෙන් මහා පරිමාණ, දිගුකාලීන පරිසර පද්ධති ප්‍රතිසංස්කරණයේ හොඳම උදාහරණවලින් එකක් ලෙස එය ඉස්මතු කරමින් ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ලෝක ප්‍රතිසංස්කරණ ප්‍රමුඛස්ථානයක් ලෙස සම්මානයට පාත්‍ර විය. තවද, MELAG යටතේ, පොදුරාජ්‍ය මණ්ඩලීය Blue Charter Project Incubator යටතේ මුහුදු තෘණ - කඩොලාන සඳහා නිල් කාබන් සහ සිතියම්කරණ තාක්ෂණය පිළිබඳ ව්‍යාපෘති දෙකක් සඳහා 2024 දී ශ්‍රී ලංකාව සඳහා අරමුදල් අනුමත කරන ලදී.

සාගර කටයුතු අංශය සහ සාගර විශ්ව විද්‍යාලය, 2025 පෙබරවාරි මාසයේදී පැවැත්වීමට නියමිත අයෝරා අමාත්‍ය මණ්ඩල රැස්වීමට පෙර මාර්ගගතව දියත් කිරීම අරමුණු කරගත් සුහුරු අයෝරා සාගර විද්‍යාව සහ පරිසරය පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානයේ වලංගුභාවය පිළිබඳ කටයුතු අවසන්

කරමින් සිටී. 2025 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වාර්ෂික අයෝරා නීල කාබන් පිළිබඳ විද්වත් සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා සාකච්ඡා ද මෙම අංශය ආරම්භ කළ අතර, ඒ සඳහා පූර්ණ අනුග්‍රහය ලබා දෙන ලදී.

ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේදී (IMO) ශ්‍රී ලංකාවට බලපාන ගැටළු වළක්වා ගැනීම සඳහා ජාතික සමුද්‍රීය කාර්ය සාධක බලකායක් පිහිටුවීමට පහසුකම් සපයන ලද අතර උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ දකුණු මුහුදු ප්‍රදේශයේ නව මුහුදු ගමන් මාර්ග සැලැස්මක් හඳුන්වා දීම සඳහා වන යෝජනාව ඉදිරිපත් කිරීමට පහසුකම් සලසන ලදී. මෙම උත්සාහය දේශීය ආයතන, ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ IMO අතර සම්බන්ධීකරණය ශක්තිමත් කර ඇත. මීට අමතරව, IMO සමඟ සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ IMO සඳහා දකුණු ආසියානු කලාපීය කාර්යාලයක් පිහිටුවීමේ යෝජනාවක් අංශය ඉදිරිපත් කරමින් සිටී. ශ්‍රී ලංකාවේ දේශගුණික අවදානම් සංසදයේ (CVF) කලාපීය කාර්යාලයක් පිහිටුවීම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර මේ සම්බන්ධයෙන් වන සත්කාරක රට ගිවිසුම වර්ථමානයේ පරිසර අමාත්‍යාංශයේ අවසන් අදියරේ පවතී.

Convention on International Trade in Endangered Species of Wild Fauna and Flora (CITES) ආශ්‍රිත ප්‍රධාන මුලපිරීම් දෙකක් සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්කර ගන්නා ලද අතර ඒවා 2014 දී අල්ලා ගන්නා ලද මැලගසි රෝස්වුඩ් තොගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව CITES ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීම අවසන් කිරීම සහ මෝරුන්, මොබුලා මසුන් සහ ඒ ආශ්‍රිත විශේෂ සංරක්ෂණ තත්ත්වය පිළිබඳ CITES හි COP20 යෝජනා පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරය සකස් කිරීම සඳහා ජාතික උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම දැක්විය හැක. මෙම තීරණාත්මක කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සමස්ත ස්ථාවරය සකස් කිරීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කර ඇති අතර, එය Convention on Migratory Species (CMS) සහ Indian Ocean Tuna Commission (IOTC) වැනි අනෙකුත් අදාළ සම්මුතීන් සමඟ ද සමපාත වේ.

ඵලදායී සහභාගීත්වය සහතික කිරීම සඳහා ජාතික පාර්ශ්වකරුවන් අතර සාකච්ඡා සහ සහයෝගීතාවය සම්බන්ධීකරණය කරමින්, මිශ්‍ර දේශගුණික මූල්‍ය සඳහා GBFA සහ ජනතාව සහ විශ්වය සඳහා පැරිස් ගිවිසුම (4P) ඇතුළු ගෝලීය දේශගුණික මුලපිරීම් සඳහා මෙම අංශය ක්‍රියාකාරීව සම්බන්ධ විය.

පරිසර අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන්, 2024 මාර්තු 1 වන දින මීගමුවේ දී, විද්වතුන්, විශේෂඥයින් සහ රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේ සහභාගීත්වයෙන් 2 වන ලෝක මුහුදු තෘණ දින උත්සවය සංවිධානය කරන ලදී. 2025 දී පැවැත්වෙන 3 වන ලෝක මුහුදු තෘණ දින උත්සවය සඳහා සූදානම් කිරීම් දැනටමත් සිදු වෙමින් පවතී. ඊට අමතරව, කොළඹ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ හවුල්කාරිත්වයෙන්, මෙම අංශය 2024 මාර්තු 1 සිට 14 දක්වා වොලොන්ගොං විශ්ව විද්‍යාලයේ ඕස්ට්‍රේලියානු ජාතික සාගර සම්පත් සහ ආරක්ෂාව පිළිබඳ මධ්‍යස්ථානය (ANCORS) සමඟ සමුද්‍රීය නියාමනය, බලාත්මක කිරීම සහ පාලන ගැටළු කෙරෙහි අවධානය යොමු කරමින් සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය.

මෙම අංශය ඉහළ මට්ටමේ සංචාර සඳහා පහසුකම් සැලසූ අතර විදේශ ප්‍රතිපත්ති දෘෂ්ටිකෝණයකින් පාරිසරික ගිවිසුම් පිළිබඳ ශ්‍රී ලංකාවේ ස්ථාවරයන් සකස් කිරීමට ක්‍රියාකාරීව සම්බන්ධ විය; උදාහරණයක් ලෙස: ඕස්ට්‍රේලියාවේ පර්ත් හි පැවති හත්වන ඉන්දියානු සාගර සමුළුවට (2024 පෙබරවාරි 9-10) ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගී වීම, ඉන්දුනීසියාවේ බාලි හි පැවති ලෝක ජල සංසදය සඳහා හිටපු ජනාධිපති (2024 මැයි 18-25) සහභාගී වීම, සයිප්‍රසයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය සාගර අමාත්‍යවරුන්ගේ රැස්වීමට (COMM) හිටපු නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා සහ සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා (2024 අප්‍රේල් 17-19) සහභාගී වීම, සැමෝවා හි අපියා හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමේ සාගර ප්‍රකාශන කෙටුම්පතට දායක වීම (2024 ඔක්තෝබර් 21-25), කොලොම්බියාවේ කැලි හි ජෛව විවිධත්වය පිළිබඳ සම්මුතියට COP 16 (2024 ඔක්තෝබර්) සහභාගී වීම, අසර්බයිජානයේ බාකු හි පැවති දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතියට COP 29 (2024 නොවැම්බර්) සහභාගී වීම, සෞදි අරාබියේ රියාද් හි කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතියට COP 16 (2024 දෙසැම්බර්) සහභාගී

වීම, සහ කොරියානු ජනරජයේ බුසාන් හි පැවති ප්ලාස්ටික් දූෂණය පිළිබඳ 5 වන අන්තර් රාජ්‍ය සාකච්ඡා කමිටු රැස්වීමට සහභාගී වීම.

මෙම අංශය ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශ වල සමුද්‍ර ජෛව විවිධත්වය සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය යටතේ ඇති ගිවිසුම (BBNJ) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම සඳහා රැස්වීමක් සංවිධානය කළ අතර, ශ්‍රී ලංකාව එයට අත්සන්කරුවෙකු වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, අත්සන් කිරීමෙන් පසු අනුමත කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. BBNJ ක්‍රියාත්මක කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයෙන් තාක්ෂණික සහාය ද අංශය ඉල්ලා සිටියේය. ඊට අමතරව, 2025 ජූනි මාසයේදී ප්‍රංශයේ නීස් හි පැවැත්වෙන සමුළුවේදී සම්මත කර ගැනීමට නියමිත 3 වන එක්සත් ජාතීන්ගේ සාගර සම්මන්ත්‍රණ ප්‍රකාශනයේ ශුන්‍ය කෙටුම්පත සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාවරය සහ යෙදවුම් මෙම අංශය විසින් දැනට සකස් කරමින් සිටී.

**4.3. විද්‍යා හා තාක්ෂණික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** අවබෝධතා ගිවිසුමක් අවසන් කරන ලදී; සාගර අවදානම් සහ ඔරොත්තු දීමේ ක්‍රියාකාරී සන්ධානය (ORRAA) සමඟ හවුල් වීමට අංශය කටයුතු ආරම්භ කළ අතර, සාමාජික ගිවිසුම සඳහා මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අමාත්‍ය මණ්ඩල ඉල්ලා සිටියේය. ඊට අමතරව, ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර දේශගුණික විපර්යාස පිළිබඳ සහයෝගීතා ගිවිසුමට එළඹීම සඳහා අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, එය දේශීය ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීමෙන් පසු අත්සන් කිරීමේ දිනයක් කොරියානු පාර්ශ්වයෙන් බලාපොරොත්තුවෙන් සිටී.

## 5. කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශය සහ හදිසි ප්‍රතිචාර ඒකකය

**5.1. කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශය:** 2023 ජනවාරි මාසයේදී පිහිටුවන ලද කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශයට (i) අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඇගයීම, (ii) අමාත්‍යාංශයේ සියලුම වාර්ෂික සහ කාර්තුමය වාර්තා සකස් කිරීම සහ සියලුම අංශවලින් වාර්තා ලබා ගැනීම සහ පසුව හඳුනාගත් ඉලක්ක සපුරා ගැනීම අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා විදේශ කටයුතු ලේකම්වරයාට සහාය වීම (iii) විදේශ රටවල් සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් වල තත්ත්වය සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම. (iv) පාර්ලිමේන්තු විදේශ කටයුතු උපදේශක කමිටු රැස්වීම, COPA සහ අනෙකුත් අදාළ විගණන සහ මූල්‍ය රැස්වීම් සම්බන්ධීකරණය කිරීම (v) හදිසි ප්‍රතිචාර ඒකකයේ කාර්යයන් හැසිරවීම යන කාර්යයන් පැවරී ඇත. ඊට අමතරව, ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRA) යටතේ විදේශ ලේකම්වරුන්ගේ කාර්ය සාධන සැලැස්ම පිළිබඳ විශේෂ කාර්තුමය ප්‍රගති වාර්තා මෙන්ම ජනාධිපතිවරයා විසින් රාජාසන කතාවේ පසු විපරමට අදාළ කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීමට ද අංශයට බලය පවරා ඇති අතර ඒවා ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ අංශය විසින් ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වේ:

**5.1.1. අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම:** අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම- 2024 සකස් කර අදාළ ආයතන සමඟ බෙදා ගන්නා ලදී.

**5.1.2. අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව:** අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව- 2023 සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ අනෙකුත් අදාළ රජයේ ආයතනවලට ඉදිරිපත් කරන ලදී.

**5.1.3. ලේකම්වරුන්ගේ කාර්ය සාධන ගිවිසුම:** අමාත්‍යාංශයේ අංශ සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල සමඟ සම්බන්ධීකරණයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ විදේශ ලේකම්වරයාගේ කාර්ය සාධන ගිවිසුම සඳහා ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRA) වාර්ෂික කාර්ය සාධන සැලැස්ම සකස් කරන ලද අතර ජනාධිපති ලේකම් කාර්යාලයට අර්ධ වාර්ෂික ප්‍රගතිය වාර්තා කරන ලදී.

**5.1.4. විදේශ රටවල් සමඟ අත්සන් කරන ලද ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ අනෙකුත් ලේඛන ක්‍රියාත්මක කිරීම:** විදේශ රටවල් සමඟ අත්සන් කරන ලද ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ අනෙකුත් ලේඛන ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ/ආයතන, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ අමාත්‍යාංශයේ අංශ සමඟ සම්බන්ධීකරණයෙන් ඩිජිටල් වේදිකාවක් සකස් කරන ලදී.

### 5.2. හදිසි ප්‍රතිචාර ඒකකය

සියලු ආකාරයේ හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරකම් හැසිරවීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය 2023 ජනවාරි මාසයේ සිට හදිසි ප්‍රතිචාර ඒකකයක් ස්ථාපිත කළේය. ඒ අනුව, මෙම ඒකකය ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (ආරක්ෂක අමාත්‍යාංශය) සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ගුවන් සේවය, ලංකා නැව් සංස්ථාව මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල වැනි අනෙකුත් ආයතන සමඟ එවැනි හදිසි මෙහෙයුම් කටයුතුවලදී සහයෝගයෙන් කටයුතු කළේය.

මෙම ඒකකය, ලන්ඩනයේ හැවර්ස්ටොක් පාසලේ පුස්තකාලය සහ ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට අධ්‍යයන හා අධ්‍යයන නොවන පොත් එකතුවක් පරිත්‍යාග කිරීම සම්බන්ධීකරණය කළේය. තවද, මෙම ඒකකය, අනෙකුත් විදේශ රටවල ප්‍රධාන හදිසි අවස්ථා / විපත් වලදී ශ්‍රී ලංකා රජය විසින් කරන පරිත්‍යාග සම්බන්ධීකරණය කරයි.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ හදිසි ප්‍රතිචාර ඒකකය විසින් සංවිධානය කරන ලද උත්සවයකදී ගාසා තීරයේ පලස්තීනයේ ජනතාවට සිලෝන් තේ කිලෝ ග්‍රෑම් දහස් ගණනක් (1000) ප්‍රදානය කෙරිණි. මියන්මාරයේ යාගි සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාවට, ලිබියාවේ ගංවතුරෙන් විපතට පත් වූවන්ට සහ මොරොක්කෝවේ භූමිකම්පාවෙන් විපතට පත් වූවන්ට සහය දැක්වීම සඳහා මානුෂීය ආධාර ලෙස තවත් සිලෝන් තේ කිලෝග්‍රෑම් 227 ක් යැවීමට ද මෙම ඒකකය කටයුතු කරමින් සිටී.

## 6. මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය

මහජන රාජ්‍ය තාන්ත්‍රික (PD) අංශය විදේශ කටයුතු අංශයේ සියලුම මාධ්‍ය සහ මහජන සන්නිවේදන ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කළ අතර එයට ගරු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල ඇතුළත් වේ. මෙම ක්‍රියාකාරකම්වලට විදේශ ප්‍රතිපත්ති ඉදිරිදර්ශනයක් සහිත ශ්‍රී ලංකා රජයේ වැදගත් රැස්වීම්, සිදුවීම්, කෙටි විස්තර, ප්‍රතිපත්ති තීරණ සහ ප්‍රකාශ කිරීම් ඇතුළත් වේ.

මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය අමාත්‍යාංශයට/ශ්‍රී ලංකාවට අදාළ වැදගත් ප්‍රවෘත්ති දේශීය/විදේශ මාධ්‍ය සහ වෙබ් අඩවි හරහා ප්‍රවෘත්ති පිළිබඳ නිරීක්ෂණය කළ අතර අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා, ලේකම් සහ නිලධාරීන් සහ සියලුම දූත මණ්ඩල/කාර්යාල ඒ පිළිබඳව දැනුවත් කරයි. අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට අහිතකර ප්‍රවෘත්ති පිළිබඳ දෛනික යාවත්කාලීන කිරීම් ලේකම්වරයාගේ අවධානයට යොමු කරනු

ලබන අතර අවශ්‍ය යැයි සැලකෙන විට ප්‍රතික්ෂේප කිරීම් නිකුත් කරනු ලැබේ. සති අන්ත සහ නිවාඩු දිනවලද සියලුම ලිඛිත සහ වාචික මාධ්‍ය විමසීම් සඳහා මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය ප්‍රතිචාර දක්වයි.

**6.1.** සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, 2024 පෙබරවාරි 06 වන දින තායිලන්ත අග්‍රාමාත්‍යවරයාගේ නිල සංචාරයේ ප්‍රතිඵල පිළිබඳව හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාව, 2024 පෙබරවාරි 20 වන දින ශ්‍රී ලංකා සහ ඉරාන විදේශ කටයුතු අමාත්‍යවරුන් විසින් පැවැත්වූ ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාව, 2024 අප්‍රේල් 04 වන දින ශ්‍රී ලංකා සහ ජපාන විදේශ කටයුතු අමාත්‍යවරුන් විසින් පැවැත්වූ ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාව, 2024 මැයි 22 වන දින "පන්සලෙන් පන්සලට" රාජ්‍ය තාන්ත්‍රික මුලපිරීමේ ධනාත්මක ප්‍රතිඵල පිළිබඳව විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාව, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකාවේ සිටින රුසියානු තානාපතිවරයා විසින්, 2024 මැයි 30 වන දින රුසියානු යුක්රේන ගැටුමට යොදවා ඇති ශ්‍රී ලාංකිකයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා පවත්වන ලද ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාව, 2024 ජූනි 05 වන දින ශ්‍රී ලංකා සහ මාලදිවයින විදේශ කටයුතු අමාත්‍යවරුන් විසින් පවත්වන ලද ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාව, 2024 අගෝස්තු 16 වන දින මියන්මාරයේ මිනිස් ජාවාරමට ගොදුරු වී අතරමං වූ ශ්‍රී ලාංකිකයන් 20 දෙනෙකු බේරා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා එවකට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් පවත්වන ලද දැනුවත් කිරීම, 2024 අගෝස්තු 28 වන දින ජනාධිපති මාධ්‍ය ඒකකයේදී පැවති පසුගිය වසර දෙක තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව යනාදිය සංවිධානය කරන ලදී.

**6.2.** සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ සිදු කරන ලද විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාල සංචාර/සිදුවීම්වල මාධ්‍ය ආවරණද මෙම අංශය සම්බන්ධීකරණය කරන ලදී, එනම් - 2024 ජනවාරි 10 සිට 13 දක්වා එක්සත් රාජධානියේ රාජකීය කුමරිය වන ඈන් කුමරියගේ ශ්‍රී ලංකා සංචාරය, 2024 පෙබරවාරි 03-04 දක්වා තායිලන්ත අග්‍රාමාත්‍යවරියගේ නිල සංචාරය, 2024 මාර්තු 10 වන දින ගාලු මුවදොර පිටියේ අයෝරා දිනය, 2024 පෙබරවාරි 19 සිට 21 දක්වා ඉරාන විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිල සංචාරය, 2024 අප්‍රේල් 04 වන දින ජපාන විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිල සංචාරය, 2024 අප්‍රේල් 24 වන දින ඉරාන ජනාධිපතිවරයාගේ රාජ්‍ය සංචාරය, ජාතික වෙසක් දින උත්සවය ආවරණය කිරීම සඳහා 2024 මැයි 17 වන දින වියට්නාම මාධ්‍යවේදීන්ගේ ශ්‍රී ලංකා සංචාරය, 2024 ජූනි 20 වන දින ගරු ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිල සංචාරය, 2024 දෙසැම්බර් 15-17 දිනවල ජනාධිපතිතුමාගේ ඉන්දීය නිල සංචාරය, 2024 අගෝස්තු 14 වන දින පැවති ජිනීවා සම්මුතිවල 75 වන සංවත්සරය සහ 2024 දෙසැම්බර් 07 වන දින පැවති රාජ්‍ය තාන්ත්‍රික වෙළෙඳ සැණකෙළියේ සමරු උත්සවය යන අවස්ථා මාධ්‍ය අංශය සම්බන්ධීකරණය කරන ලදී.

**6.3.** ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව 2024 අගෝස්තු 29 වන දින මැද පෙරදිග කලාපයේ මාධ්‍යවේදීන් 10 දෙනෙකු සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සමඟ අන්තර්ක්‍රියාකාරී සැසියක් සංවිධානය කරන ලදී. තවද, විදේශයන්හි සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට නියෝජිත මොඩියුල පද්ධතිය හරහා වීසා නිකුත් කිරීමට ප්‍රවේශය නොතිබූ අවධියේ, පහත සඳහන් මාධ්‍ය සංවිධානවල මාධ්‍යවේදීන් සඳහා වීසා නිකුත් කිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන ලදී:

ARD ජර්මන් රේඩියෝව, ආනන්ද විකටන් ප්‍රකාශකයින්, BBC, චයිනා ග්ලෝබල් ටෙලිවිෂන් ජාලය, SBS ඕස්ට්‍රේලියාව, ල මොන්ද්, ද ඉකොනොමිස්ට්, ඇසෝසියේටඩ් ප්‍රෙස්, ලෙ එකෝස්, ස්වීඩන් විකාශන සංස්ථාව, ඕස්ට්‍රේලියානු විකාශන සංස්ථාව, ඩොයිෂ් වෙලේ, නිව් ජෙනරේෂන් මීඩියා, ද පබ්ලිෂිං පුද්ගලික සමාගම, අල්ජසීරා මාධ්‍ය ජාලය, ෆිනෑන්ෂල් ටයිම්ස්, නිව් යෝර්ක් ටයිම්ස්, ඒජන්ස්-ෆ්‍රාන්ස් ප්‍රෙස්, බ්ලූම්බර්ග්, කැනේඩියානු විකාශන සංස්ථාව, චීන මාධ්‍ය සමූහය, සාමූහික ප්‍රවෘත්ති කාමරය, ෆ්‍රැන්ක්ෆර්ටර් ඇල්ගෙමයින් සයිටං, ග්ලෝබෝ වාර්තාකරුවන්, ITV ලන්ඩන්, ජිජි ප්‍රෙස්, කියෝදෝ ප්‍රවෘත්ති, මීඩියාකෝප්, නිව් ජෙනරේෂන් මාධ්‍ය සංස්ථාව, ජපාන විකාශන සංස්ථාව, නිකේයි ඉන්කෝපරේෂන්, රොයිටර්ස්, රේඩියෝ රැඩිකල්, ස්කයි නිවුස්, ස්ට්‍රින්ගර් ප්‍රවෘත්ති ඒජන්සිය, Taz.die.tageszeitung, ද වීක්, TRT වර්ල්ඩ්, වෝල් ස්ට්‍රීට් ජර්නල්, යොමියුරි ෂින්බන්, NDTV ඉන්දියා, ස්ට්‍රේට් ටයිම්ස්, ද ප්‍රින්ට්, ජාතික මහජන ගුවන් විදුලිය (NPR).

**6.4.** ඉහත සඳහන් කරුණු වලට අමතරව, අමාත්‍යාංශ මාධ්‍ය නිවේදන 225 ක්, දූත මණ්ඩල නිවේදන 675 ක් සහ දැන්වීම් 207 ක් දේශීය මුද්‍රිත, මාර්ගගත සහ විද්‍යුත් මාධ්‍ය සහ කොළඹ පදනම් කරගත් විදේශීය වාර්තාකරුවන්ට බෙදා හරින ලදී. X සටහන් – 231, ෆේස්බුක් සටහන් – 197 සහ යූටියුබ් – (වීඩියෝ 03) හරහා මහජන සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකාවල දිනපතා යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය ප්‍රතීතන 104 ක් සඳහා පහසුකම් සැලසූ අතර ජාතික චිත්‍රපට සංස්ථාව සමඟ සම්බන්ධීකරණයෙන් වාර්තා චිත්‍රපට නිෂ්පාදනය කරන විදේශීය චිත්‍රපට කණ්ඩායම් 51 ක කාර්යය පහසුකම් සැලසීය. ප්‍රතිපත්ති ප්‍රකාශන සහ වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධන, සංචාරක ප්‍රවර්ධනය සහ විකාශනය වන ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ආයතනවලට අදාළ ප්‍රධාන සංවර්ධනය පිළිබඳ දෛනික යාවත්කාලීන කිරීම් පිළිබඳ තොරතුරු, අංශය විසින් ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල වෙත ලබා දෙන ලදී.

2024 දී සමරනු ලැබූ නිදහස් දිනය සම්බන්ධයෙන්ද මෙම අංශය ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළ අතර සමාලෝචනයට භාජනය වන කාලය තුළ විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවති වැදගත් රැස්වීම්, සංස්කෘතික හා ආගමික සිදුවීම් සඳහා ආවරණයක් ද ලබා දුණි.

## 7. දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (සාර්ක්) අංශය

දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (SAARC) ලේකම් කාර්යාලය, එහි කලාපීය මධ්‍යස්ථාන (05), විශේෂිත ආයතන (04), ප්‍රධාන ආයතන (06) සහ පිළිගත් ආයතන (18) විසින් පවත්වනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සාර්ක් අංශය විසින් සිදු කරනු ලැබේ.

**7.1.** **සාර්ක් ලේකම් කාර්යාලය හරහා ශ්‍රී ලංකාව සහ සාර්ක් සාමාජික රටවල් අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:** සාර්ක් වැඩසටහන් කමිටුවේ (DG-මට්ටමේ) 59 වන සැසිවාරය වසර 04 ක විරාමයකින් පසු 2024 මාර්තු 6-7 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවැත්විණි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සාර්ක් අධ්‍යක්ෂ ජනරාල්/සාර්ක් අංශය රැස්වීමට සහභාගී විය. සාර්ක් මහලේකම් (SG/SAARC) වරයාගේ ශ්‍රී ලංකා සංචාරය 2024 ජූනි 10-14 දිනවල අමාත්‍යාංශයේ සන්ධාන අංශය සමඟ සහයෝගයෙන් අංශය විසින් සංවිධානය කරන ලදී. මෙම සංචාරය අතරතුර, සාර්ක් මහලේකම් එම්.ඩී. ගෝලම් සර්වර් මහතා අතිගරු ජනාධිපතිතුමන්, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ වැඩබලන විදේශ කටයුතු ලේකම් හමුවිය. සාර්ක් මහලේකම්වරයා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ (LKI) පැවති වටමේස සාකච්ඡාවකට ද සහභාගී වූ අතර වත්මන් වර්ධනයන් සහ සාර්ක් ක්‍රියාවලියේ අනාගත දිශාව පිළිබඳව සහභාගී වූවන් දැනුවත් කළේය. මෙම සංචාරය අතරතුර, සාර්ක් මහලේකම්වරයා 45 වන සාර්ක් මූල්‍ය ආණ්ඩුකාර රැස්වීමේ සමාරම්භක සැසියට ද සහභාගී වූ අතර මහනුවර පිහිටි සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය (SCC) සහ සම-අරමුදල් සහිත ව්‍යාපෘතියක් වන සාර්ක් සංවර්ධන අරමුදල වෙතද සංචාරයක නිරත විය. 2024 වසර සඳහා සාර්ක් ලේකම් කාර්යාලය සඳහා ශ්‍රී ලංකා රජයේ වාර්ෂික කොටස් දායකත්වය ගෙවීම. 2024 දෙසැම්බර් 08 වන දින කොළඹ පැවති සාර්ක් ප්‍රඥප්ති දිනයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ සාර්ක් අංශයෙහි වැඩබලන අතිරේක ලේකම් ශ්‍රී ලංකාව වෙනුවෙන් ප්‍රකාශයක් ඉදිරිපත් කළේය.

**7.2.** **සාර්ක් වීසා - සාර්ක් වීසා නිදහස් කිරීමේ යෝජනා ක්‍රමය (SVES) යටතේ නිකුත් කරන ලද සාර්ක් වීසා ගණන:** 2024 දෙසැම්බර් 31 වන දින වන විට, සාර්ක් ආශ්‍රිත රැස්වීම්වලට සහභාගී වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් / රජයේ නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීම් මත, සාර්ක් වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අංශය විසින් ලිපි 52 ක් නිකුත් කරන ලදී (ඇමතිවරුන් / පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ යැපෙන්නන් - 41 අනෙකුත් නිලධාරීන් - 48). සාර්ක් ලේකම් කාර්යාලයෙන් ලැබුණු මඟ පෙන්වීම අනුව, 2020 අප්‍රේල් 30 වන දින සිට නතර කරන ලද දේශීය ව්‍යාපාරිකයින් සහ කර්මාන්තකරුවන් සඳහා 2024 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සාර්ක් ව්‍යාපාරික වීසා නිකුත් කිරීම නැවත ආරම්භ කිරීම සඳහා මෙම අංශය

විසින් කඩිනමින් පියවර ගන්නා ලද අතර සාර්ක් වීසා නිකුත් කිරීම සඳහා අංශය විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ලිපි 04 ක් නිකුත් කරන ලදී.

**7.3. ශ්‍රී ලංකාව සහ සාර්ක් කලාපීය මධ්‍යස්ථාන අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:** මෙම අංශය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ සාර්ක් සමාජය සමඟ ක්‍රියාකාරීව සම්බන්ධීකරණය කරමින් සිටින අතර "මාතර නාවිමන හි සාක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම පිළිබඳ වැඩිදුර ක්‍රියාමාර්ග" සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීම සඳහා රැස්වීම්වලට සහභාගී විය. කොළඹ සාක් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා සුදුසු ස්ථිර ස්ථානයක් සොයා ගැනීමේ අරමුණින් සාකච්ඡා පැවැත්වෙමින් පවතී. 2024 පෙබරවාරි 05 වන දින සාක් සංස්කෘතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා විසින් එවකට විදේශ කටයුතු ලේකම්වරයා සමඟ කළ සුහද හමුව, සාර්ක් කලාපීය මධ්‍යස්ථාන විසින් සංවිධානය කරන ලද රැස්වීම්/පුහුණු/වැඩමුළු සඳහා කැමැත්ත/සහභාගීත්වය ලබා ගැනීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ/ආයතන සමඟ සම්බන්ධීකරණය, කොළඹ දී සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී වීම, සාර්ක් සමාජය සඳහා සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම, සාර්ක් කලාපීය මධ්‍යස්ථානවල පාලක මණ්ඩල (GB) රැස්වීම්වලට ශ්‍රී ලංකා රජයේ සහභාගීත්වය සම්බන්ධීකරණය කරන ලදී. 2024 ඔක්තෝබර් 22-23 දිනවල කොළඹ දී පැවති සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා වූ සාර්ක් සමාජයේ 14 වන රැස්වීමට දකුණු ආසියා සහ සාර්ක් අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් සහභාගී විය.

**7.4. ශ්‍රී ලංකාව සහ සාර්ක් විශේෂිත ආයතන අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:** මෙම අංශය අමාත්‍යාංශයේ නීති අංශය සමඟ සම්බන්ධීකරණයෙන් සාර්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ එකඟතාවය දන්වා සිටියේය. භූතානයේ චොයිනිං ඩෝර්ජි මහතා 2024 ජූනි 25 වන දින සාර්කෝ අධ්‍යක්ෂ ජනරාල් ලෙස වැඩ භාර ගත්තේය. 2024 වර්ෂය සඳහා සාර්ක් විනිශ්ච කවුන්සිලය (සාර්කෝ) සඳහා ශ්‍රී ලංකා රජයේ වාර්ෂික කොටස් දායකත්වය ගෙවීම මෙම අංශය සම්බන්ධීකරණය කළේය. සාර්ක් විශේෂිත ආයතන විසින් සංවිධානය කරන ලද රැස්වීම්/පුහුණුවීම්/වැඩමුළු සඳහා එකඟතාව/සහභාගීත්වය ලබා ගැනීමේදී අදාළ රේඛීය අමාත්‍යාංශ/නියෝජිතායතන මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

**7.5. ශ්‍රී ලංකාව සහ සාර්ක් ඉහළම සහ පිළිගත් ආයතන අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම:** ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් සංවිධානය කරන ලද දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය සහ ව්‍යාපාර සංසදයට සහභාගී වීම සඳහා 2024 අගෝස්තු 01-04 දිනවල සාර්ක් මහලේකම්වරයාට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට මෙම අංශය පහසුකම් සැලසීය. මෙම සංචාරය අතරතුර, අතිගරු සාර්ක් මහලේකම්වරයා 2024 අගෝස්තු 02 වන දින විදේශ කටයුතු ලේකම්වරයා හමුවිය.

**7.6. ජාත්‍යන්තර සංවිධාන විසින් පවත්වන ලද අධ්‍යයන/වැඩමුළු ආදිය හරහා සාර්ක් සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම:** කලාපීය බහුමාධ්‍ය ප්‍රවාහන අධ්‍යයනය (SRMTS) පිළිබඳ සාර්ක් ADB අවසාන වැඩමුළුව 2024 පෙබරවාරි 28-29 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවරදී පැවැත්විණි. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය නියෝජනය කරන තවත් නිලධාරීන් තිදෙනෙකු සමඟ සාර්ක් අධ්‍යක්ෂ ජනරාල් ඉහත වැඩමුළුවට සහභාගී විය. 2024 ජූලි 10-11 දිනවල භූතානයේ තිම්පු හි පැවති දේශගුණික විපර්යාස පිළිබඳ සාර්ක් - ආසියා සංවර්ධන බැංකුවේ උපදේශන වැඩමුළුවේදී විදේශ කටයුතු අංශය නියෝජනය කරන ලදී. දේශගුණික විපර්යාස පිළිබඳ තිම්පු ප්‍රකාශය (TSCC) ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය සහ ජාතික ක්‍රියාමාර්ග සඳහා නිසි භාවිතයන් සහ දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායමේ (IGEG.CC) රැස්වීමේදී සාකච්ඡා කළ යුතු කරුණු ඇතුළුව ඉදිරි මාවත පිළිබඳව රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව 2024 දෙසැම්බර් 3-4 දිනවල ශ්‍රී ලංකාවේ කොළඹදී පැවති පස්වන IGEG.CC රැස්වීම සම්බන්ධීකරණය කරන ලදී. 2024 ජූලි 11-12 දිනවල නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති "නව යොවුන් වියේ ගැබ් ගැනීම් පිළිබඳ කලාපීය සංවාදයට" සහභාගී වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට පහසුකම් සපයන ලදී. දකුණු ආසියාව සඳහා යුනිසෙෆ් කලාපීය කාර්යාලය (ROSA), එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල

(UNFPA) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමඟ සහයෝගයෙන් සාර්ක් ලේකම් කාර්යාලය විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

2024 ඔක්තෝබර් 1-2 දිනවල කත්මණ්ඩු නුවර සාර්ක් ලේකම් කාර්යාලයේ පැවති රේගු සහයෝගීතාව පිළිබඳ සාර්ක් උප කණ්ඩායමේ 10 වන රැස්වීම, 2024 ඔක්තෝබර් 21-22 දිනවල කත්මණ්ඩු නුවර පැවති තිරසාර සංවර්ධන ඉලක්ක සන්දර්භගත කිරීම සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා සාර්ක් ක්‍රියාකාරී සැලැස්ම නැවත සලකා බැලීම පිළිබඳ සාර්ක්-ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශන වැඩමුළුව සහ 2024 ඔක්තෝබර් 24-25 දිනවල කත්මණ්ඩු නුවර පැවති කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යයනය (අදියර II) පිළිබඳ 6 වන සාර්ක්-ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ රැස්වීම.

**7.7. සාර්ක් නිරීක්ෂකයින් සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම:** 2024 ජූලි මාසයේදී ROK-SAARC හවුල්කාරිත්ව සම්මන්ත්‍රණයට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහභාගීත්වය සම්බන්ධීකරණය කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර, "ජපාන - නැගෙනහිර ආසියානු සිසුන් සහ තරුණයින් සඳහා හුවමාරු ජාලය (JENESYS)-2024" ලෙස නම් කර ඇති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ එකඟතාව මෙම අංශය සාර්ක් ලේකම් කාර්යාලයට දැනුම් දුන්නේය.

## 8. එක්සත් ජාතීන් සහ මානව හිමිකම් අංශය

ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික සබඳතා සන්දර්භය තුළ, නිව්යෝර්ක්, ජිනීවා, සහ වියානා, පැරිස්, රෝමය, නයිරෝබි, බැංකොක් සහ හේග් හි එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනවල තානාපති කාර්යාල/ ප්‍රතීතනය කර ඇති නිත්‍ය නියෝජිත කාර්යාල මෙම අංශයේ විෂය පථයට අයත් වේ:

**8.1. නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) 79 වන සැසිවාරය:** එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් අංශය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (UNGA) ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා සැලකිය යුතු යෙදවුම්/මාර්ගෝපදේශ ලබා දුන්නේය. පවතින තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසුව සහ ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූලව ඡන්ද විමසීමේ උපදෙස් ද ලබා දෙන ලදී. 2024 සැප්තැම්බර් 22 සිට 30 දක්වා පැවති UNGA හි ඉහළ මට්ටමේ සතියේදී, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා 2024 සැප්තැම්බර් 30 වන දින 79 වන UNGA සමුළුව ඇමතූ අතර, බහුපාර්ශ්වික සංසදවල ශ්‍රී ලංකාවේ නියෝජනය සහ ස්ථාවරය වැඩි දියුණු කරමින් ඉහළ මට්ටමේ සංසදවල තවදුරටත් සම්බන්ධ වී ප්‍රකාශ ලබා දුන්නේය. 2024 සැප්තැම්බර් මාසයේ පැවති අනාගත සමුළුව, 2024 සැප්තැම්බර් මාසයේ මුහුදු මට්ටම ඉහළ යාම නිසා ඇති වන පැවැත්මේ තර්ජන ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ඉහළ මට්ටමේ පූර්ණ රැස්වීම, 2024 සැප්තැම්බර් මාසයේ ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධය පිළිබඳ ඉහළ මට්ටමේ රැස්වීම සහ 2024 සැප්තැම්බර් මාසයේ න්‍යෂ්ටික අවි සම්පූර්ණයෙන්ම තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය සැමරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ මට්ටමේ රැස්වීම, ශ්‍රී ලංකාව සහභාගී වූ සහ ප්‍රකාශ ලබා දුන් ඉහළ මට්ටමේ සංසද වේ.

**8.1.1. ශ්‍රී ලංකාව සහභාගී වූ 79 වන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සමගාමීව පැවති රැස්වීම්:** 24 වන පොදුරාජ්‍ය මණ්ඩලීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීම (CFAMM), විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ Non-Aligned Movement (NAM) අමාත්‍ය රැස්වීම, ගෝලීය බෝ නොවන රෝග (NCD) ගිවිසුමේ තුන්වන වාර්ෂික රැස්වීම, Comprehensive Nuclear Test Ban Treaty (CTBT) හි මිතුරන්ගේ 11 වන අමාත්‍ය රැස්වීම, විසි දෙනෙකුගෙන් යුත් දෙවන කණ්ඩායමේ (G20) විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීම, 77 කණ්ඩායමේ සහ චීනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 36 වන වාර්ෂික රැස්වීම, ගෝලීය සංවර්ධන මුලපිරීම (GDI), දේශගුණික අවදානම් සංසදය (CVF), අතුරු වැඩසටහන්: “සාමාන්‍ය ක්ෂුද්‍ර ජීවී නාශක භාවිතයෙන් කෘෂිකාර්මික ආහාර පද්ධති විසන්ධි කිරීම: සත්ව සෞඛ්‍ය සහ සුභසාධනයේ වැදගත්කම”, ආසියානු සහයෝගිතා සංවාදයේ (ACD) 19 වන

අමාත්‍ය රැස්වීම, පලස්තීනය පිළිබඳ NAM අමාත්‍ය කමිටුව, "ගාසා හි තත්ත්වය සහ සාධාරණ හා ස්ථිර සාමයක් සඳහා මාවත ලෙස ද්වි-රාජ්‍ය විසඳුම ක්‍රියාත්මක කිරීම" පිළිබඳ අමාත්‍ය රැස්වීම, 77 කණ්ඩායමේ සහ චීනයේ සාමාජික රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 48 වන වාර්ෂික රැස්වීම, UNAOC මිතුරන්ගේ කණ්ඩායමේ ඉහළ මට්ටමේ රැස්වීම සහ BIMSTEC විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීම.

**8.1.2.** ශ්‍රී ලංකාව UNGA හි 79 වන සැසිවාරයට UNGA හි කමිටු හයම (6) ආවරණය වන පරිදි සහභාගී විය. 2024 ඔක්තෝබර් 3 සිටනොවැම්බර් 08 දක්වා නිව්යෝර්ක්හිදී පවත්වන ලද 79 වන සැසියෙහි පළමුවන කමිටුව, 2024 ඔක්තෝබර් 03 සිට නොවැම්බර් 27 දක්වා නිව්යෝර්ක්හිදී පවත්වන ලද දෙවැනි කමිටුව 2024 ඔක්තෝබර් 03 සිට නොවැම්බර් 22 දක්වා පවත්වන ලද තුන්වැනි කමිටුව, 2024 ඔක්තෝබර් 03 සිට නොවැම්බර් 20 දක්වා පවත්වන ලද සිව්වැනි කමිටුව, 2024 ඔක්තෝබර් 07 සිට දෙසැම්බර් 10 දක්වා පවත්වන ලද පස්වැනි කමිටුව සහ 2024 ඔක්තෝබර් 02 සිට නොවැම්බර් 22 දක්වා පවත්වන ලද හයවැනි කමිටුව

**8.2.** **සංහිඳියාව සහ මානව හිමිකම්:** ශ්‍රී ලංකාව 2024 මාර්තු, ජූනි සහ සැප්තැම්බර් මාසවල පැවති මානව හිමිකම් කවුන්සිලයේ (HRC) 55, 56 සහ 57 වන සැසිවාරවලට පිළිවෙලින් සහභාගී විය. රට තුළ සිදුවෙමින් පවතින ප්‍රගතිය පිළිබඳව ඔවුන්ගේ මැදිහත්කරුවන්ට දැනුම් දීම සහ එකඟතාවයට එළඹීම සඳහා දේශීය යාන්ත්‍රණ සඳහා සහාය ලබා ගැනීමේ අරමුණින් සංහිඳියාව සහ මානව හිමිකම් සම්බන්ධයෙන් දේශීයව ගෙන ඇති පියවර පිළිබඳව විදේශයන්හි සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අඛණ්ඩව දැනුම් දෙන ලදී. සෑම කවුන්සිල සැසිවාරයකදීම, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රකාශය, ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා 51/1 ප්‍රතික්ෂේප කළේය. මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුව 2024 පෙබරවාරි 13 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසු එහි පළමු රැස්වීම පැවැත්වීය. රාජ්‍ය ආයතන 21 කින් සමන්විත මෙම කමිටුව, මානව හිමිකම් සහ සංහිඳියාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා ජාත්‍යන්තර කැපවීම් කාර්යක්ෂම සම්බන්ධීකරණය සහ වාර්තා කිරීම සහතික කිරීම සඳහා ස්ථාවර ජාතික රාමුවක් ලෙස ක්‍රියා කිරීම අපේක්ෂා කෙරේ.

2025 පෙබරවාරි 13 වන දින පැවැත්වීමට නියමිත Committee on the Elimination of Discrimination Against Women (CEDAW) යටතේ ශ්‍රී ලංකාවේ 9 වන කාලාන්තර සමාලෝචනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව සම්පත් අංශය අඛණ්ඩව සූදානම් වෙමින් සිටියේය. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ CEDAW කමිටුවේ සාමාජිකයාගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශයේදී රැස්වීම් පැවැත්විණි.

**8.3.** **තිරසාර සංවර්ධනය:** 2024 අගෝස්තු 22 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී අනාගත සමුළුවේ අරමුණු කෙරෙහි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා ප්‍රදර්ශනය කිරීම සඳහා අංශය විසින් එක්දින ජාතික උත්සවයක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට අනාගත ගිවිසුමේ යෝජිත පරිච්ඡේදවලට අනුරූපව කණ්ඩායම් සාකච්ඡා හතරක් ඇතුළත් විය. මෙම අවස්ථාවට ආවරණය කරන ලද මාතෘකා අතර තිරසාර සංවර්ධනය සහ දේශගුණික මූල්‍යකරණය, ඩිජිටල් බෙදීම සහ ගෝලීය ඩිජිටල් සංයුක්ත කිරීම, කාන්තාවන්, තරුණයින් සහ අනාගත පරම්පරාවන් සහ යුද්ධයේදී මානුෂීය ක්‍රම ප්‍රවර්ධනය කිරීම ඇතුළත් විය.

**8.4.** **නිරායුධකරණය:** මෙම අංශය මේ සම්බන්ධයෙන් වන ප්‍රධාන රැස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසූ අතර, එමඟින් නිරායුධකරණ අංශයේ ශ්‍රී ලංකාවේ නිරූපණය සහ ස්ථානය වැඩි දියුණු කෙරිණි. ශ්‍රී ලංකාව, තායිලන්තය සමඟ එක්ව, 2024 අප්‍රේල් 29 සිට 2024 මැයි 01 දක්වා හවායි හි පැවති 2022-2024 සඳහා න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීම සහ නිරායුධකරණය පිළිබඳ ASEAN කලාපීය සංසදයේ (ARF) අන්තර්-සැසිවාර රැස්වීමේ සම-සභාපතිත්වය දැරීය.

විස්තීර්ණ න්‍යෂ්ටික පරීක්ෂණ-තහනම් ගිවිසුම් සංවිධානය (CTBTO), ස්ථානීය පරීක්ෂාව (OSI) සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර අභ්‍යාසය (IFE) 2025 සඳහා සත්කාරකත්වය සැපයීම සඳහා ශ්‍රී ලංකාව තෝරා ගැනීමෙන් පසුව 2023.06.05 දිනැති අංක 23/0985/619/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය

මගින් ඒ සඳහා ශ්‍රී ලංකාව මගින් සත්කාරකත්වය සැපයීම අනුමත කළේය. ඒ අනුව, 2025 IFE සඳහා සූදානම් වීමට පෙර, 2024 දී CTBTO සමඟ සහයෝගයෙන් මෙම අංශය විසින් පහත සඳහන් සංචාර/අභ්‍යාස සඳහා පහසුකම් සපයන ලදී. CTBTO නියෝජිත පිරිසක් 2024 පෙබරවාරි 14 සිට 23 දක්වා තාක්ෂණික-මෙහෙයුම් සංචාරය (TOV) සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. 2024 ජූනි 29 සිට ජූලි 03 දක්වා හංගේරියාවේ පැවති OSI ගොඩනැගීමේ අභ්‍යාසයට (BUE24) ශ්‍රී ලංකාවේ නියෝජිත පිරිසක් සහභාගී වූහ.

ශ්‍රී ලංකාව නිරායුධකරණයට අදාළ වැදගත් රැස්වීම්වලට තවදුරටත් සහභාගී විය. කුඩා අවි සහ සැහැල්ලු අවි නීති විරෝධී වෙළඳාම වැළැක්වීම, සටන් කිරීම සහ මුලිනුපුටා දැමීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී වැඩසටහන සහ ආසියාව සඳහා එහි ජාත්‍යන්තර ලුහුබැඳීමේ මෙවලම (ITI) පිළිබඳ සිව්වන සමාලෝචන සමුළුව (RevCon4) ඇතුළුව, ශ්‍රී ලංකාව 2024 ජනවාරි 23 සිට 25 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවරදී ශ්‍රී ලංකාවේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා 2024 පෙබරවාරි 26 වන දින ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර පැවති නිරායුධකරණය පිළිබඳ සමුළුවේ ඉහළ මට්ටමේ කොටසේදී මාර්ගගත වීඩියෝ ප්‍රකාශයක් ඉදිරිපත් කළේය. න්‍යෂ්ටික අවි ව්‍යාප්ත නොකිරීමේ ගිවිසුමේ (NPT) පාර්ශවයන්ගේ 2026 සමාලෝචන සමුළුව සඳහා වන 2 වන සූදානම් කිරීමේ කමිටුව 2024 ජූලි 22 සිට 2024 අගෝස්තු 02 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරදී පැවැත්විණි. එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩලය විසින් මෙම රැස්වීමේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද අතර එහිදී ශ්‍රී ලංකාව NPT අරමුණු සහ න්‍යෂ්ටික අවිවලින් තොර ලෝකයක් සඳහා වන ඉලක්කය සඳහා ඇති කැපවීම සහ ඉදිරි දිනවලදී අර්ථවත් සාකච්ඡා සඳහා ශ්‍රී ලංකාව බලාපොරොත්තු වන බව නැවත අවධාරණය කරමින් ප්‍රකාශයක් ඉදිරිපත් කළේය. පොකුරු බෝම්බ පිළිබඳ සම්මුතියේ (CCM) රාජ්‍ය පාර්ශවකරුවන්ගේ 12 වන රැස්වීම (MSP) 2024 සැප්තැම්බර් 10 සිට 13 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවාහිදී පැවැත්විණි. එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත/ජිනීවා දූත මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එහිදී ප්‍රකාශයක් කළේය. 2024 සැප්තැම්බර් 10 සිට 13 දක්වා පැවති CCM හි රාජ්‍ය පාර්ශවකරුවන්ගේ 12 වන රැස්වීමේදී ශ්‍රී ලංකාව උප සභාපති ධුරය දැරීය. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ (IAEA) මහා සම්මේලනයේ 68 වන නිත්‍ය සැසිය 2024 සැප්තැම්බර් 16 සිට 20 දක්වා ඔස්ට්‍රියාවේ වියානාහිදී පැවැත්විණි. IAEA සඳහා ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා මෙම සැසියට සහභාගී වී ප්‍රකාශයක් කළේය.

2024 නොවැම්බර් 25 සිට 29 දක්වා නෙදර්ලන්තයේ හේග් නුවර පැවති රසායනික අවි සම්මුතියේ රාජ්‍ය පාර්ශවකරුවන්ගේ සමුළුවේ 29 වන සැසිවාරයට ශ්‍රී ලංකාව සහභාගී විය. රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ (OPCW) ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා, 2024 ඔක්තෝබර් 16 සිට 18 දක්වා වියානාහි පැවති විස්තීර්ණ න්‍යෂ්ටික පරීක්ෂණ තහනම් ගිවිසුම් සංවිධානය සඳහා වූ සූදානම් කිරීමේ කොමිසමේ 66 වන සැසිවාරය, ක්‍රියාකාරී කණ්ඩායම A සහ අවිධිමත්/විශේෂඥ රැස්වීම්, 2024 දෙසැම්බර් 2 සිට 6 දක්වා කාම්බෝජයේ සියම් රීප් හි පැවති පුද්ගල නාශක පතල් භාවිතය, තොග රැස් කිරීම, නිෂ්පාදනය සහ හුවමාරුව තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතියේ රාජ්‍ය පාර්ශවකරුවන්ගේ පස්වන සමාලෝචන සමුළුව ඇතුළු සැසිවාරවලදී ප්‍රකාශ නිකුත් කළ අතර මැදිහත්වීම් තුනක් සිදු කළේය. 2024 මාර්තු 4-8, 2024 ජූලි 8-12 සහ 2024 දෙසැම්බර් 2-6 යන දිනවල නිව්යෝර්ක් නුවර පැවති, 2021–2025 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්හි ආරක්ෂාව සහ භාවිතය පිළිබඳ විවෘත-අවසන් ක්‍රියාකාරී කණ්ඩායමේ 7 වන, 8 වන සහ 9 වන සැසිවාරය යටතේ, පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීමේ සම්මුතිය යටතේ, වින්දිත ආධාර කමිටුවේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව පත් කරන ලදී. එම සැසිවාරවලදී ශ්‍රී ලංකාවේ නියෝජිතයින් මැදිහත් විය.

**8.5. විද්‍යාව හා තාක්ෂණයේ බහුපාර්ශ්වික සහභාගීත්වය:** විද්‍යා-තාක්ෂණ සහ සමාජ-ආර්ථික ක්ෂේත්‍රවල ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කරන බහුපාර්ශ්වික සංසදවල ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම මෙම අංශය විසින් සිදු කරන ලදී.

**8.6. සමාජ-ආර්ථික ක්ෂේත්‍රවල බහුපාර්ශ්වික සහභාගීත්වය:** 2024 අප්‍රේල් 22 සිට 26 දක්වා තායිලන්තයේ බැංකොක් හි එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ පැවති ආසියා සහ පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසමේ (ESCAP) අසූවන සැසිවාරයේ රැස්වීම්වලට, 2024 ජූලි 08

සිට 17 දක්වා නිව්යෝර්ක් හි පැවති තිරසාර සංවර්ධනය පිළිබඳ ඉහළ මට්ටමේ දේශපාලන සංසදයට (HLPF) සහ 2024 නොවැම්බර් 26 සිට 27 දක්වා තායිලන්තයේ බැංකොක් හි පැවති IOM, UNHCR, RSO/ බාලි ක්‍රියාවලිය සහ ICRC එක්ව සංවිධානය කරන ලද ආසියාවේ භයානක මාර්ග ඔස්සේ අතුරුදහන් වන පුද්ගලයින්ට ප්‍රතිචාර දැක්වීම වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රතිපත්ති වටමේසයට ශ්‍රී ලංකා නියෝජිත පිරිස සහභාගී විය.

ශ්‍රී ලංකාව යුනෙස්කෝවේ සාමාජිකත්වය ලබා වසර 75 ක් පිරීම සැමරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ (යුනෙස්කෝ) අධ්‍යක්ෂ ජනරාල් ඕඩ්‍රි අසූලේ මහත්මිය 2024 ජූලි 16 සිට 19 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. අධ්‍යක්ෂ ජනරාල් අසූලේ මහත්මිය ඉහළ පෙළේ දේශපාලන සම්භාවනීය අමුත්තන් සමඟ රැස්වීම් පැවැත්වූ අතර සංචාරය අතරතුරදී අනුස්මරණ ප්‍රකාශනයක් දියත් කිරීම ද ඇතුළත් විය. මෙම සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස, පුරාණ අනුරාධපුර නගරයේ ලෝක උරුම අඩවිය සංවර්ධනය කිරීම, සංරක්ෂණය බලමුලු ගැන්වීම සඳහා විශේෂඥ සමුළුවක් සංවිධානය කිරීම, විද්‍යාත්මක සහාය, විශේෂඥයින් පුහුණු කිරීම සහ අනුරාධපුරය සඳහා අරමුදල් සැපයීම, අනුරාධපුරය සහ සීගිරිය වැනි ලෝක උරුම ස්ථානවල ඩිජිටල් ලේඛනගත කිරීම (3D භූ සිතියම්කරණය) සහ සීගිරි බිතුසිතුවම් සංරක්ෂණය කිරීම සඳහා යුනෙස්කෝවෙන් සහාය ඉල්ලන ලදී. 2025 පෙබරවාරි මාසයේ බැංකොක්හි පැවැත්වීමට නියමිත දෙවන ආසියා-පැසිෆික් කලාපීය සමාලෝචනයට පූර්වගාමියෙකු ලෙස, 2024 නොවැම්බර් 5-6 දිනවල කොළඹදී, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය (IOM) සමඟ ආරක්ෂිත, ක්‍රමවත් සහ නිත්‍ය සංක්‍රමණ සඳහා වන ගෝලීය ගිවිසුම (GCM) පිළිබඳ දකුණු ආසියානු උප කලාපීය උපදේශනයට අමාත්‍යාංශය විසින් සම සත්කාරකත්වය දරන ලදී. මෙම උපදේශනය දකුණු ආසියානු රටවල (බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්ථානය ඇතුළුව) රජයන් සහ සිවිල් සමාජය මෙන්ම බහු දේශීය පාර්ශවකරුවන් සහ එක්සත් ජාතීන්ගේ ආයතන අතර සංවාද සහ සාකච්ඡා සඳහා වේදිකාවක් ලෙස සේවය කළ අතර, එය බැංකොක්හි පැවැත්වීමට නියමිත කලාපීය සමාලෝචනය සඳහා ප්‍රතිඵල ලේඛනයක් වාර්තා කරනු ඇත. අංශය IOM සමඟ සහයෝගයෙන් වැඩසටහන සම්බන්ධීකරණය කළේය.

**8.7. අපේක්ෂකත්වයන්:** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල විවිධ ආයතන සඳහා අනෙකුත් රාජ්‍යයන් විසින් යෝජනා කරන ලද අපේක්ෂකත්වයන්ට සහාය දීමෙන්, බහුපාර්ශ්වික සංසද තුළ අර්ථවත් හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව දරන උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම මෙම අංශය අඛණ්ඩව සිදු කළේය.

**8.7.1.** විදේශයන්හි සිටින ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල මඟින් පාර්ශවකරුවන්ගේ සහය ලබා ගැනීමට සහ කොළඹ පදනම් කරගත් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සම්බන්ධ වීමට මඟ පෙන්වීමෙන්, 2024 දී පැවති පහත මැතිවරණ තුනට අදාළ මැතිවරණ ව්‍යාපාර දියත් කරන ලදී.

**8.7.2.** ඇඩ් සහයෝගිතා ක්‍රියාමාර්ග තුළින්, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) එක්සත් ජාතීන්ගේ ආයතන සහ ජාත්‍යන්තර සංවිධානවලට (2025-2027 වාරය සඳහා) තේරී පත්වීමට සමත් විය: 2024 ජූනි 07 වන දින ඡන්දය දුන් සාමාජික රටවල් 189 න් , ශ්‍රී ලංකාව ඡන්ද 182 ක් ලබා ගනිමින්, කලාපයෙන් 2 වන ඉහළම ඡන්ද සංඛ්‍යාව සහ UNGA වෙතින් සමස්තයක් වශයෙන් 7 වන ඉහළම සංඛ්‍යාව, ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ UN කොමිසම (UNCITRAL) (2025-2031 වාරය සඳහා): 2024 නොවැම්බර් 20 දින තේරී පත්විය.

**8.7.3.** එම මැතිවරණයේදී ශ්‍රී ලංකාව ඡන්ද 177 ක් ලබා ගත් අතර, එය ආසියා පැසිෆික් සමූහය තුළ 2 වන ඉහළම ඡන්ද සංඛ්‍යාව සහ තේරී පත් වූ සාමාජිකයින් තිස් එක් දෙනා අතර සමස්තයක් වශයෙන් 2 වන ඉහළම අගය ලබා ගත්තේය. ඇගයීම් ආයතනය - 2003 අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වූ යුනෙස්කෝ සම්මුතිය (2025-2028 කාලය සඳහා) - 2024 දෙසැම්බර් 07 දින තේරී පත්විය.

**8.7.4.** පැරගුවේහි අසුන්සියොන් හි පැවති ICH කමිටු රැස්වීමේ 19 වන සැසිවාරයේදී, ශ්‍රී ලංකාවේ අපේක්ෂක ආචාර්ය බී. ඩී. නන්දදේව මහතා, යුනෙස්කෝවේ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වූ 2003 සම්මුතියේ කීර්තිමත් ඇගයීම් ආයතනයට විශේෂඥයෙකු ලෙස තේරී පත් විය. ශ්‍රී ලංකාවේ අපේක්ෂකයා ඡන්දය ප්‍රකාශ කළ සාමාජික රටවල් 23 න් ඡන්ද 16 ක් ලබා ගත්තේය. ද්විපාර්ශ්වික සාකච්ඡා සහ රැස්වීම් සඳහා භාවිතා කිරීම සඳහා 2024 දී රටවල් 262 කට අදාළව අමාත්‍යාංශයේ දේශපාලනික කටයුතු අංශවලින් ලැබුණු ඉල්ලීම් 159 ක් සඳහා අපේක්ෂකත්ව විස්තර පිළිබඳ අංශය විසින් තොරතුරු ලබා දී ඇත.

**8.8. අක්තපත්‍ර:** 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නිකුත් කරන ලද අක්තපත්‍ර ගණන: 53

**8.9.වීසා:** 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහසුකම් සපයන ලද වීසා සංඛ්‍යාව: 406

# අංශවල කාර්යසාධන සමාලෝචනය: දේශපාලන කටයුතු අංශ

## 9. අප්‍රිකානු කටයුතු අංශය

**9.1. දේශපාලන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකා රජයේ "අප්‍රිකාව දෙස බලන්න" ප්‍රතිපත්තියට අනුකූලව, අප්‍රිකානු කටයුතු අංශය, G77 සහ නොබැඳි ජාතීන්ගේ සමුළුවලට සමගාමීව දකුණු අප්‍රිකාව, ඉතියෝපියාව, ටැන්සානියාව, බෙනින් සහ උගන්ඩාව යන රටවල නායකයින් සමඟ ජනාධිපතිවරයා කළ සාකච්ඡා සඳහා පුළුල් විස්තර ලබා දුන්නේය. ඊට අමතරව, ලෝක ආර්ථික සංසදයේ අන්තර්ක්‍රියා අතරතුර ඝානාවේ පාර්ශවකරු සමඟ ඔහුගේ කටයුතු සඳහා සවිස්තරාත්මක තොරතුරු සපයන ලදී. G77 සහ නොබැඳි ජාතීන්ගේ සමුළුවට සමගාමීව ඇල්ජීරියාව, සීෂෙල්ස්, ඝානාව සහ කෙන්යාවේ ජනාධිපතිවරයාගේ පාර්ශවකරුවන් සමඟ රැස්වීම් පැවැත්විණි. තවද, දේශපාලන සබඳතා වැඩි දියුණු කිරීම සඳහා, ඝානාවේ විදේශ කටයුතු සහ කලාපීය ඒකාබද්ධතා අමාත්‍ය, සීෂෙල්ස්, මොරිෂස් සහ සියෙරා ලෝන්හි මහ කොමසාරිස්වරුන් සහ ඇල්ජීරියාවේ තානාපතිවරයා සමඟ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ රැස්වීම් සඳහා අංශය පහසුකම් සැලසීය.

කොළඹ පිහිටි අදාළ දූත මණ්ඩල ප්‍රධානීන් සමඟ එවකට රාජ්‍ය අමාත්‍යවරයාගේ රැස්වීම් සහ ටැන්සානියාවේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය නීති අමාත්‍යවරුන්ගේ රැස්වීමට ගරු අධිකරණ අමාත්‍යවරයාගේ සහභාගී වීම සම්බන්ධීකරණය කරන ලදී. නයිරෝබි හි පැවති එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ හයවන සැසිවාරයට රුවන් විජේවර්ධන මහතා (දේශගුණික විපර්යාස පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක) සහභාගී වූ අතර සහ මොරිෂස් හි පැවති බටහිර ඉන්දීය සාගරයේ මත්ද්‍රව්‍ය ජාවාරම සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය පිළිබඳ අමාත්‍ය සමුළුවට ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වන ප්‍රමිත බණ්ඩාර සහ සීතා අරම්බේපොල මහත්ම මහත්මීන් සහභාගී වූහ. අප්‍රිකානු කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා සීෂෙල්ස් මහ කොමසාරිස්, ලිබියාවේ තානාපති, ඊජිප්තුවේ තානාපති, මැඩගස්කරයේ දූත මණ්ඩල ප්‍රධානී සහ මොරොක්කෝවේ නිර්වේතනික කොන්සල්වරයා හමුවී එම රටවල් සමඟ දේශපාලන සබඳතා ශක්තිමත් කළේය. ගැබොන්, දකුණු අප්‍රිකාව සහ නයිජීරියාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම කඩිනම් කිරීම සඳහා මෙන්ම සැම්බියාව, මොසැම්බික් සහ ගිනියා ජනරජයේ නිර්වේතනික කොන්සල්වරයාගේ ධුර කාලය දීර්ඝ කිරීම සහතික කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ අංශය සම්බන්ධ විය. අප්‍රිකානු කලාපය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් කිරීම සහ වෙළඳාම, ආයෝජන, සංචාරක සහ රැකියා ක්ෂේත්‍රයේ සහයෝගීතා අවස්ථා සොයා බැලීම සඳහා අප්‍රිකානු, මැදපෙරදිග සහ නැගෙනහිර ආසියාවේ අතිරේක ලේකම් සහ අප්‍රිකානු කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකාවේ අප්‍රිකානු කලාපීය රටවල නිර්වේතනික කොන්සල්වරුන් සමඟ පැවති රැස්වීමේ මුලසුන දැරීය.

**9.2. ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ඊජිප්තු සංචාරය සඳහා පහසුකම් සැලසූ අතර එහිදී අමාත්‍යතුමා කයිරෝ වාණිජ මණ්ඩලය ඊජිප්තු විදේශ අමාත්‍යතුමා, ආයෝජන සහ විදේශ වෙළඳ අමාත්‍යතුමා සමඟ රැස්වීම් පැවැත්වීය.

**9.3. ආරක්ෂක සහ ආරක්ෂක සහයෝගීතාව:** සෝමාලි මුහුදු කොල්ලකරුවන් විසින් අල්ලා ගන්නා ලද ශ්‍රී ලංකා බහුදින ධීවර යාත්‍රාවක් වන “ලොරෙන්සෝ පුතා - 4” ගලවා ගැනීමේ මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම සඳහා සීෂෙල්ස් ආරක්ෂක හමුදා සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා කෙන්යාව සහ රුවන්ඩාවට කළ සංචාරය මෙන්ම දකුණු මාර්ග හවුල්කාරිත්වය තුළ මත්ද්‍රව්‍ය සහ සමුද්‍රීය නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ප්‍රධානීන්ගේ රැස්වීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහභාගීත්වය හරහා ආරක්ෂක සහ ආරක්ෂක සහයෝගීතාව වැඩි දියුණු කිරීමට මෙම අංශය පහසුකම් සැලසීය. එසේම, සීෂෙල්ස් ආරක්ෂක හමුදා ප්‍රධානියාගේ ශ්‍රී ලංකා සංචාරයට අංශය සහාය විය.

නාවික නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සුඩානය සහ නයිජීරියාවට ගෙවීම් පදනම මත පුහුණු පාඨමාලා පිරිනමයි. තොරතුරු බෙදා හැරීම සඳහා

අංශය රටවල අදාළ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. 2025 වසර සඳහා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ඊජිප්තුව, කෙන්යාව, රුවන්ඩාව, සෙනගල්, සීෂෙල්ස්, සුඩානය, ටැන්සානියාව, උගන්ඩාව සහ සැම්බියාව යන රටවල එක් රටකින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා පිරිනමන ශිෂ්‍යත්ව පිළිබඳ තොරතුරු ද අංශය විසින් බෙදා හරින ලදී.

**9.4. සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ ජනතාව අතර සබඳතා:** එවකට විදේශ කටයුතු අමාත්‍යවරයා ඊජිප්තුවට කළ සංචාරයේදී, විදේශ කටයුතු අමාත්‍යාංශයේ BITDI සහ ඊජිප්තු විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය තාන්ත්‍රික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමේ කොටසක් ලෙස, බෙනින් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික, නිල සහ සේවා ගමන් බලපත්‍ර හිමියන් සඳහා වීසා නිදහස් කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. සීෂෙල්ස්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දින බොක්සිං තරඟාවලියට ශ්‍රී ලංකා බොක්සිං කණ්ඩායමට සහභාගී වීමට මෙම අංශය පහසුකම් සැලසීය.

**9.5. විද්‍යා හා තාක්ෂණික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ඖෂධ නිෂ්පාදන අංශයේ ද්විපාර්ශ්වික සහයෝගීතාව ශක්තිමත් කරමින්, 2024 පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකාවේ කළ සංචාරයේදී සීෂෙල්ස් මහ කොමසාරිස්වරිය ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදකයින් සමඟ හමුවීමට අංශය පහසුකම් සැලසීය.

## 10. නැගෙනහිර ආසියානු අංශය

**10.1. දේශපාලන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** 2024 මාර්තු මාසයේදී බෝඕ ආසියා සංසදයේ වාර්ෂික සමුළුවට සහභාගී වීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ චීන නිල සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. සංචාරය අතරතුර අග්‍රාමාත්‍යවරයා චීන ජනාධිපති අතිගරු ෂී ජින්පින් සහ අගමැති ලී කියැං යන මහත්වරුන් සමඟ සමුළු රැස්වීමක් පැවැත්වීය. 2024 මාර්තු මාසයේදී අග්‍රාමාත්‍යවරයාගේ සංචාරයෙන් පසුව නිකුත් කරන ලද චීන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රකාශය පාඨය පිළිබඳව ද අංශය චීන පාර්ශවය සමඟ සාකච්ඡා කළේය. මෙම සංචාරයේදී ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය, කාර්මික සහයෝගීතාව, වෙළඳ ප්‍රවර්ධන සහයෝගීතාව, මාධ්‍ය සහයෝගීතාව සහ අධ්‍යාපන ඩිජිටල්කරණය වැනි ක්ෂේත්‍රවල අවබෝධතා ගිවිසුම් 09 ක් අත්සන් කිරීම අංශය සම්බන්ධීකරණය කළේය.

නොවැම්බර් මාසයේදී චීන කොමියුනිස්ට් පක්ෂ මධ්‍යම කාරක සභාවේ ජාත්‍යන්තර දෙපාර්තමේන්තුවේ උප අමාත්‍ය සන් හයියන් මහත්මියගේ සංචාර, චීන මහජන දේශපාලන උපදේශන සමුළුවේ (CPPCC) 14 වන ජාතික කමිටුවේ උප සභාපතිනිය ලෙස තේරී පත් වූ අතිගරු ක්වින් බෝයොන්ග් මහත්මියගේ සංචාරය සහ දෙසැම්බර් මාසයේදී සමස්ත චීන කාන්තා සම්මේලනයේ උප සභාපතිනි ෂැං ඩොංමෙයි මහත්මියගේ සංචාරය සම්බන්ධීකරණය කර පහසුකම් සපයන ලදී. සංචාරය කරන ලද නියෝජිතයින් සඳහා අතිගරු ජනාධිපතිතුමන්, ගරු අගමැතිතුමන්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමන් සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමන් සමඟ ප්‍රධාන රැස්වීම් සංවිධානය කරන ලදී.

2024 දී ජපානයෙන් ඉහළ මට්ටමේ සංචාර කිහිපයක් සඳහා ජනවාරි මාසයේ මුදල් අමාත්‍යතුමන් සුසුකි ෂුනිචි සහ පෙබරවාරි මාසයේ කෘෂිකර්ම, වන වගා සහ ධීවර රාජ්‍ය අමාත්‍යතුමන් නොරිකාසු සුසුකි යන මහත්වරුන්ගේ සංචාර ඇතුළුව පහසුකම් සපයන ලදී. තවද, 2024 මැයි මාසයේදී ජපානයේ විදේශ කටයුතු අමාත්‍යතුමන් වන ගරු කමිකාවා යෝකෝ මහත්මියගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. සංචාරය අතරතුර ජනාධිපතිවරයා, අගමැතිතුමන් සහ විදේශ අමාත්‍යතුමන් සමඟ රැස්වීම් පැවැත්විණි. සංචාරය අතරතුර විදේශ අමාත්‍යවරුන් දෙදෙනා විසින් ඒකාබද්ධ මාධ්‍ය හමුවක් ද පවත්වන ලදී.

2024 ජූලි මාසයේදී විදේශ කටයුතු අමාත්‍යතුමන් ජපානයට කළ නිල සංචාරය සඳහා මෙම අංශය පහසුකම් සපයන ලදී. සංචාරය අතරතුර, ජපානය සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරමින් ජපානයේ විදේශ කටයුතු අමාත්‍යතුමන් වන ගරු කමිකාවා යෝකෝ මහත්මිය සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වන ලදී. අධිකරණ අමාත්‍ය, ඩිජිටල් පරිවර්තන අමාත්‍ය, ජපාන විදේශ වෙළඳ සංවිධානය (JETRO), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) සහ ජපාන ජාත්‍යන්තර අභ්‍යාසලාභී සහ පුහුණු සේවක සහයෝගිතා සංවිධානය (JITCO) සමඟ ප්‍රධාන රැස්වීම් ද සංවිධානය කරන ලදී.

චීන මහජන සමූහාණ්ඩුව සමඟ රාජ්‍ය තාන්ත්‍රික උපදේශනවල 13 වන වටය 2024 ජූනි 17 වන දින බීජිංහිදී එවකට ශ්‍රී ලංකාවේ විදේශ ලේකම් සහ චීනයේ විදේශ කටයුතු පිළිබඳ උප අමාත්‍ය ගරු සන් වයිඩොං යන මහත්වරුන්ගේ සම සභාපතිත්වයෙන් පැවැත්විණි. 2024 ජූලි මාසයේදී නවසීලන්ත පාර්ලිමේන්තුවේ කථානායක ගරු ජෙරී බ්‍රවුන්ලි මහතාගේ සංචාරය සම්බන්ධීකරණය කරන ලදී. නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ අගමැතිතුමා, කථානායකතුමා සහ විදේශ අමාත්‍යතුමා සමඟ රැස්වීම් පැවැත්විය.

සෝල් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන්, 2024 අප්‍රේල් සහ මාර්තු මාසවලදී අග්‍රාමාත්‍යතුමා සහ කථානායකතුමා පිළිවෙලින් කොරියානු ජනරජයට කළ නිල සංචාරය සඳහා පහසුකම් සපයන ලදී. මෙම සංචාර දෙකේදීම කොරියානු අගමැතිතුමා, කථානායකතුමා, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා සමඟ ඉහළ මට්ටමේ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්විණි.

**10.2**. **ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල මගින් ව්‍යාපාර අන්තර්ක්‍රියා, ප්‍රදර්ශන සහ අථත්‍ය වේදිකා හරහා ශ්‍රී ලංකා නිෂ්පාදන සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන ලදී. කොරියානු ජනරජය: ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණයන්, පොහොසත් සංස්කෘතික උරුමයන්, ආහාර සහ අත්කම් නිර්මාණ කොරියානු ජනරජයේ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සෝල් මිත්‍රත්ව උළෙලට සහ කොරියානු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වීම. කොරියානු ජනරජයේ ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකා අපනයන හඳුන්වා දීම සඳහා මාර්ගගත B2B රැස්වීම් 14 ක් සංවිධානය කිරීම.

බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ලංකා තේ සඳහා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් ආරම්භ කළ අතර, චීන බිස්කට් සමඟ ලංකා තේ හඳුන්වා දීම කරන ලදී. අන්නාසි නවසීලන්තයට අපනයනය ආරම්භ කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කරන ලද අතර අඹ අපනයනය කිරීම ද ඉදිරියට ක්‍රියාත්මක කරනු ඇත.

**10.3**. **ආරක්ෂක සහ ආරක්ෂණ සහයෝගීතාව:** ශ්‍රී ලංකාව සහ චීනය අතර චීනයෙන් හමුදා ආධාර ලබා ගැනීම සඳහා රු. මිලියන 52 ක ප්‍රදානයක් ලබා දුන් අතර ශ්‍රී ලංකාවට නොමිලේ හමුදා ආධාර සැපයීම සඳහා ගිවිසුමක් අත්සන් කිරීම සම්බන්ධීකරණය කරන ලදී. එම ප්‍රදානයෙන් කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ මුර සංචාර යාත්‍රාවක් අලුත්වැඩියා කිරීම සඳහා යොදා ගැනීම සඳහා වූ පසුකාලීන ප්‍රොටෝකෝලයක් ද මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. චීනයේ පුහුණු වැඩසටහන් සහ ආරක්ෂක සහයෝගීතා වැඩසටහන් සඳහා හමුදා නිලධාරීන්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කරන ලදී. 2025 දී ටෝකියෝ හි පැවැත්වෙන "ඉන්දු-පැසිෆික් නාවික විද්‍යාල සම්මන්ත්‍රණය", නියෝජිත කණ්ඩායමේ සංචාරය සහ ඕස්ට්‍රේලියානු රජයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බීච්ක්‍රාෆ්ට් KA350 සමුද්‍ර නිරීක්ෂණ ගුවන් යානය ප්‍රදානය කිරීමේ උත්සවය සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම අංශය ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

**10.4**.**කොන්සියුලර් සහාය සහ සංක්‍රමණික රැකියා සුභසාධනය:** ශ්‍රී ලාංකිකයන්, නීතිවිරෝධී සංක්‍රමණිකයන්, පිටුවහල් කරන්නන් නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ වීසා දීර්ඝ කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන විවිධ දුක්ගැනවිලි විසඳීම, විශේෂයෙන් චීනයේ අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කරන වෛද්‍ය සිසුන්, මරණ පිළිබඳ සොයා බැලීම, ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය, කොරියානු ජනරජය සහ අනෙකුත් පිළිගත් ගමනාන්තවල

පදිංචි ශ්‍රී ලාංකිකයන්ගේ ශ්‍රමය සහ සුභසාධනයට අදාළ නඩු විසඳීම, බන්ධනාගාරවල සහ රැඳවුම් කඳවුරුවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය සහ අනෙකුත් අවශ්‍යතා සොයා බැලීම සඳහා දූත මණ්ඩල/ කාර්යාල මගින් කොන්සියුලර් සහාය සාර්ථකව ලබා දෙන ලදී.

EPS සංක්‍රමණික සේවකයින්ගේ වර්තමාන නැවත ඇතුල්වීමේ සීමාව වැඩි කිරීමට මෙන්ම ශ්‍රී ලංකාව සඳහා දැනට පවතින රැකියා කෝටාව ඉහළ නැංවීමට අදාළ දකුණු කොරියානු බලධාරීන් සමඟ මෙම අංශය අඛණ්ඩව සම්බනධතාවන්හි නිරත විය.

**10.5**. **සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ ජනතාව අතර සබඳතා:** 2024 මාර්තු මාසයේදී අග්‍රාමාත්‍යවරයා බීජිං වෙත කළ සංචාරයේදී චීනයෙන් ශ්‍රී ලංකාවට හදිසි මානුෂීය ආධාර (සහල්, ධීවර දැල් සහ නිවාස පහසුකම්) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලිපි හුවමාරුව සම්බන්ධීකරණය කරන ලදී. විදේශ අමාත්‍යවරයා ජූලි මාසයේදී ජපාන සංචාරයේදී 2024 මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ජපන් ප්‍රදාන ආධාර සඳහා ලිපි හුවමාරුව සම්බන්ධීකරණය කරන ලදී. ඊට අමතරව, එම සංචාරයේදීම ශ්‍රී ලංකාව සහ ජපානය අතර ආර්ථික හා සමාජීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සටහන් හුවමාරු කර ගැනීමට මෙම අංශය පහසුකම් සැලසීය.

චීනයේ ගුවැන්ඩොං බෞද්ධ ප්‍රජාවෙන් කොළඹ උතුරු අක්මා රෝග මධ්‍යස්ථානය (CNCLD) සඳහා ගිලන් රථයක් මිලදී ගැනීම සඳහා රු. 580,000 ක පරිත්‍යාගයක් සහ කොරියානු මහාවිහාරයෙන් CNCLD වෙත රුපියල් මිලියන 6 ක පරිත්‍යාගයක් සම්බන්ධීකරණය කරන ලදී. ගංවතුරෙන් පීඩාවට පත් වූවන්ට හදිසි සහන සැලසීම සඳහා ඔසාකා හි 2025 EXPO සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිසට සහභාගී වීමට සහ ජපානයෙන් මානුෂීය ආධාර ලබා දීමට දූත මණ්ඩලය සහ අදාළ පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ගංවතුර නිසා ඇති වූ අභියෝගවලට මුහුණ දීම සඳහා චීනයෙන් ඔක්තෝබර් මාසයේදී ඇමරිකානු ඩොලර් 100,000 ක මුදල් සහ යුවාන් මිලියන 10 ක් වටිනා හදිසි මානුෂීය ද්‍රව්‍ය ප්‍රදානයක් සම්බන්ධීකරණය කරන ලදී.

**10.6**. **වෙනත් ක්‍රියාකාරකම්:** ශ්‍රී ලංකාවේ සිසුන් සහ රජයේ නිලධාරීන් සඳහා ඕස්ට්‍රේලියාව, චීනය, ජපානය සහ කොරියානු ජනරජයෙන් ලැබුණු උපාධි, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සහ පුහුණු අවස්ථා ගණනාවක් සම්බන්ධීකරණය කරන ලදී. විශේෂ කුසලතා සේවක වැඩසටහන යටතේ ශ්‍රී ලාංකිකයින් සඳහා නව රැකියා කාණ්ඩ තුනක් එකතු කිරීමට ජපන් බලධාරීන්ට නියෝජනයන් සිදු කිරීමේදී මෙම අංශය ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට සහාය විය. 2024 දී, නවාතැන් කර්මාන්තය, ගොඩනැගිලි පිරිසිදු කිරීමේ අංශය සහ ගුවන් සේවා කර්මාන්තය ඇතුළත් කිරීමත් සමඟ මෙම සංඛ්‍යාව කාණ්ඩ හතක් දක්වා පුළුල් විය.

## 11. ලතින් ඇමරිකානු සහ කැරිබියානු අංශය

ලතින් ඇමරිකාව සහ කැරිබියානු කලාපයේ රටවල් 33 ක් ඇත. ශ්‍රී ලංකාව රටවල් 31 ක් සමඟ විධිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වන අතර එම රටවල ශ්‍රී ලංකාවේ කාර්යභාරය බ්‍රසීලයේ බ්‍රසීලියා(ආර්ජන්ටිනාව, බොලිවියාව, චිලී, කොලොම්බියාව, ගයනාව, පැරගුවේ, පේරු, සුරිනාම් සහ උරුගුවේ යන රටවලට සමගාමීව ප්‍රතීතනය කර ඇති), කියුබාවේ හවානා (ඩොමිනිකා, ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, ඉක්වදෝරය, හයිටි, හොන්ඩුරාස්, ජැමෙයිකාව, පැනමාව, වෙනිසියුලාව යන පොදුරාජ්‍ය මණ්ඩලවලට සමගාමීව ප්‍රතීතනය කර ඇති), වොෂින්ටන් ඩීසී (මෙක්සිකෝව සහ ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ යන රටවලට සමගාමීව ප්‍රතීතනය කර ඇති) සහ නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත (බහාමාස් වෙත සමගාමීව ප්‍රතීතනය කර ඇති) ලෙස පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල හතරක් මගින් සම්බන්ධීකරණය කරයි. ශ්‍රී ලංකාවේ එම රටවල කාර්යයන් සම්බන්ධීකරණය සඳහා බ්‍රසීලය සහ කියුබාව කොළඹ ඔවුන්ගේ තානාපති කාර්යාල පිහිටුවා ඇත. ලතින් ඇමරිකාවේ සහ කැරිබියානු කලාපයේ තවත් බොහෝ රටවල් නවදිල්ලියේ පිහිටි ඔවුන්ගේ දූත මණ්ඩල හරහා ශ්‍රී ලංකාවේ කාර්යයන් සම්බන්ධීකරණය කරයි. වියට්නාමයේ පැනමා තානාපති කාර්යාලය ශ්‍රී ලංකාව සඳහා සමගාමීව ප්‍රතීතනය කර ඇත.

2012 දී රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාව මගින් අනුමත කරන ලද රටවල් 13 න් රටවල් 11 ක් සමඟ මේ දක්වා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර ඇත. කොළඹ ලතින් ඇමරිකාව සහ කැරිබියන් කලාපයෙන් ගෞරවනීය කොන්සල්වරුන් 10 දෙනෙකු සිටී. (චිලී, කොලොම්බියාව, ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, ග්වාතමාලාව, ගයනාව, මෙක්සිකෝව, පැනමාව, පේරු සහ උරුගුවේ) සහ ශ්‍රී ලංකාව මෙම කලාපය සඳහා නිර්වෙතනික කොන්සල්වරුන් 14 දෙනෙකු පත් කර ඇත. (බහමාස්, බ්‍රසීලය, චිලී, කොලොම්බියාව, ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, ඉක්වදෝරය, හයිටි, හොන්ඩුරාස්, ජැමෙයිකාව, මෙක්සිකෝව, පැනමාව, පේරු සහ සුරිනාම්).

බ්‍රසීල සහයෝගිතා ඒජන්සියේ (ABC) විශේෂඥයින්ගේ සංචාරයේ අනුප්‍රාප්තිකයක් ලෙස, කිරි නිෂ්පාදන අංශයේ සංවර්ධනය සහ උක් ව්‍යාපෘති සඳහා අංශය 2024 ජූලි 18 වන දින ජාතික විද්‍යා පදනම, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ උක් පර්යේෂණ ආයතනය සමඟ රැස්වීම් පැවැත්වීය. මෙම ව්‍යාපෘති දෙක අත්සන් කිරීමේ ක්‍රියාවලියේ මෙම අංශය නිරතව සිටී.

### 11.1. ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:

**11.1.1.** බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2024 ජනවාරි 12 සහ 13 යන දිනවල "ශ්‍රී ලංකාව ගවේෂණය කරන්න" යන තේමාව යටතේ බ්‍රසීලයේ/ලතින් ඇමරිකාවේ ප්‍රථම තනි රටක ප්‍රදර්ශනය බ්‍රසීලයේ ෆෙඩරල් දිස්ත්‍රික්කයේ ජාත්‍යන්තර සබඳතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ එක්ව සංවිධානය කළේය. කොලොම්බියාවේ බොගෝටා වාණිජ මණ්ඩලය සහ ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට පහසුකම් සපයන ලදී. 2024 මාර්තු මාසයේදී බ්‍රසීලයේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සමඟ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී. 2024 ජූනි මාසයේදී බ්‍රසීලියානු මෘදුකාංග සමාගම් සංගමයේ ජාත්‍යන්තර කටයුතු සම්බන්ධීකාරක ක්ලාරා සැවෙලි මහත්මිය සහ SLASSCOM නිලධාරීන් අතර, බ්‍රසීලියානු තොරතුරු තාක්ෂණ සමාගම් සංගමයේ සභාපති ක්‍රිස්ටියන් ටඩියු මහතා සමඟ සහ 2024 ජූනි 12 වන දින රියෝ ද ජැනයිරෝ හි විදේශ වෙළඳ මණ්ඩල සම්මේලනයේ (FCCE) පළමු උප සභාපති මාර්කෝ ඕරේලියෝ කුන්හර් මහතා සමඟ, එමිරේට්ස් සඳහා රියෝ ද ජැනයිරෝ හි විකුණුම් කළමනාකරු මාර්සෙලෝ අබෲ මහතා සමඟ සහ 2024 ජූනි 13 වන දින රියෝටර් හි සභාපති පැට්‍රික් කොරියා මහතා සමඟ රැස්වීම්/මාර්ගගත රැස්වීම් සඳහා පහසුකම් සපයන ලදී. 2024 ජූනි 01 වන දින ජාත්‍යන්තර ආහාර සහ සංස්කෘතික ප්‍රදර්ශනය, 2024 සැප්තැම්බර් 26 සිට 28 දක්වා පැවති ABAV Expo 2024 ප්‍රදර්ශනය සහ 2024 ඔක්තෝබර් 01 සිට 03 දක්වා චිලියේ සන්තියාගෝ හි පැවති Espacio ආහාර සහ සේවා ප්‍රදර්ශනයට සහභාගී විය. ජාතික අපනයන මණ්ඩලය ශ්‍රී ලංකා රජය සහ බ්‍රසීලයේ බ්‍රසීල-ආසියානු වාණිජ මණ්ඩලය 2024 අගෝස්තු මාසයේදී ඩිජිටල් ක්‍රමයට අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර 2024 සැප්තැම්බර් 03 වන දින පළමු නිල රැස්වීම (මාර්ගගතව) පැවැත්වීමට පහසුකම් සපයන ලදී. 2024 මාර්තු මාසයේ පැරගුවේ සංචාරයේදී තානාපතිවරයා පැරගුවේ සංචාරක සහ සංචාරක සමාගම් සංගමයේ (ASATUR) සභාපතිනී මොනිකා කොස්තා මහත්මිය සහ අනෙකුත් නිලධාරීන් හමුවී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා රටවල් දෙක අතර සහයෝගීතාවයේ හැකියාව සොයා බැලීය.

**11.1.2. කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය** හවානාහි කියුබානු වාණිජ මණ්ඩලය හරහා කියුබාවට සහ පිළිගත් රටවලට නව ශ්‍රී ලාංකික අපනයනකරුවන් හඳුන්වා දුන්නේය. දූත මණ්ඩලය කියුබානු රජයේ බලධාරීන්, සංචාරක අමාත්‍යාංශය, කියුබානු වාණිජ මණ්ඩලය, කියුබානු සංචාරක නියෝජිතයන් සහ ප්ලැටිනම් සමාගම් සමූහය සමඟ රැස්වීම් පැවැත්වීය. කියුබාවේ සංචාරක අංශයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික සමාගමක් යෝජනා ඉදිරිපත් කර ඇති අතර දූත මණ්ඩලය විසින් කියුබානු බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපාරික යෝජනා පහ ප්‍රතිවිපරම් කරමින් සිටී. දූත මණ්ඩලය විසින් 2024 ජූලි 23 වන දින හවානා හිදී "සිලෝන් ටී ටයිම්" නමින් තේ ප්‍රවර්ධන උත්සවයක් පවත්වන ලද අතර එය හිඩ්න් හිල්ස් තේ සමාගම සහ එල් සැල්වදෝරයේ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතාවයක් සඳහා පහසුකම් සපයන ලදී. තානාපතිවරයා විදේශ වෙළඳ අමාත්‍යවරයා හමුවී දෙරට අතර විභව වෙළඳ අවස්ථා සාකච්ඡා කළේය. දූත මණ්ඩලය ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය සහ ජැමෙයිකාවේ සිටින නිර්වෙතනික කොන්සල්වරයා අතර සම්බන්ධතාවයක් ඇති කළේය. දූත මණ්ඩලය 2024 නොවැම්බර් 04 සිට 09 දක්වා පැවති හවානා ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී විය. රාජ්‍ය තාන්ත්‍රික, නිල සහ සේවා ගමන් බලපත්‍ර හිමියන් සඳහා වීසා අවශ්‍යතා නිදහස් කිරීම සහ අන්‍යෝන්‍ය පරිපාලන සහාය සහ රේගු කටයුතු පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අපේක්ෂිත ද්විපාර්ශ්වික ගිවිසුම් ඉක්මනින් අවසන් කිරීම

සඳහා වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මෙක්සිකානු පාර්ශවය සමඟ සම්බන්ධ වෙමින් සිටී.

**11.2. දේශපාලන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** කියුබාවේ වෛද්‍ය අධ්‍යයන සඳහා ශිෂ්‍යත්ව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ කියුබානු තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරන ලදී. 2024 වර්ෂයේදී ශ්‍රී ලාංකික ශිෂ්‍යයෙකු ශිෂ්‍යත්වය සඳහා තෝරා ගන්නා ලදී. ග්වාතමාලාවේ තානාපති ඕමාර් කැස්ටනෙඩා සොලාරෙස්, කොලොම්බියාවේ තානාපති වික්ටර් හියුගෝ එචෙවරි ජරමිලෝ, පැරගුවේ තානාපති ෆ්ලෙමින් ඩුආර්ටේ සහ කියුබාවේ තානාපති ඇන්ඩ්‍රෙස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගැරිඩෝ යන මහත්වරුන් විසින් 2024 පෙබරවාරි 04, ජූනි 06 සහ ජූලි 01 යන දිනවල විදේශ කටයුතු අමාත්‍යවරයා වෙත කරන ලද හමුවීම් සඳහා කථන සටහන් සකස්කර පහසුකම් සපයන ලදී.

ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් කලාපයේ රටවල් සමඟ එළඹීමට අපේක්ෂිත ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 64 ක් පසු විපරම් කරන ලදී. 2024 ඔක්තෝබර් 02 වන දින ශ්‍රී ලංකාවේ කියුබාවේ තානාපති ඇන්ඩ්‍රෙස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගැරිඩෝ මහතා විසින් අභිනවයෙන් තේරී පත් වූ ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මහතා වෙත කරන ලද පළමු සාකච්ඡාව සඳහා මෙම අංශය පහසුකම් සපයනු ලැබ කථන සටහන් සකස් කළේය. 2024 දෙසැම්බර් 26 වන දින ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සුනිල් කුමාර ගමගේ මහතා හමුවීමට මෙම අංශය පහසුකම් සැලසීය. කියුබානු තානාපති ඇන්ඩ්‍රෙස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගැරිඩෝ මහතා 2024 නොවැම්බර් 2 වන දින ලතින් ඇමරිකාව සහ කැරිබියන් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් චමින්ද අයි. කොලොන් මහත්මිය හමුවිනි. කියුබාවේ තානාපති ඇන්ඩ්‍රෙස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගැරිඩෝ මහතා 2024 නොවැම්බර් 2 වන දින ලතින් ඇමරිකාව සහ කැරිබියන් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් චමින්දා අයි. කොලොන්නේ මහත්මිය හමුවිය. 2024 නොවැම්බර් 06 වන දින නවදිල්ලියේ ඩොමිනිකන් ජනරජයේ තානාපති අතිගරු ඩේවිඩ් පුයිග් මහතා සහ ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් චමින්දා අයි. කොලොන්නේ මහත්මිය අතර අතථ්‍ය හමුවක් මෙම අංශය විසින් සංවිධානය කරන ලදී. මෙම අංශය ඉහළ සම්බාවනීය අමුත්තන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් සඳහා කථන සටහන්, කෙටි සටහන් සහ දේශන, ඉහළ සම්භාවනීය අමුත්තන් සමඟ, ජාතික දින සැමරුම් සඳහා උපහාර පණිවිඩ සහ කලාපයේ අලුතින් තේරී පත් වූ නායකයින් සඳහා උපහාර පණිවිඩ සකස් කළේය. 2024 ඔක්තෝබර් 15 වන දින ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති ඇන්ඩ්‍රෙස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගැරිඩෝ විසින් ශ්‍රී ලංකාවේ අලුතින් පත් කරන ලද අග්‍රාමාත්‍ය ගරු ආචාර්ය හරිනි අමරසූරිය මෙනවිය සමඟ පැවති පළමු හමුව සඳහා මෙම අංශය පහසුකම් සැලසූ අතර කථන සටහන් සකස් කළේය.

රාජ්‍ය තාන්ත්‍රික නියෝජනය පුළුල් කිරීම; (මෙක්සිකෝව, එල් සැල්වදෝරය, හොන්ඩුරාස් සහ ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ) නිර්වෙතනික කොන්සල්වරුන් සිව් දෙනෙකු (04) පත් කිරීම සහ නිර්වෙතනික කොන්සල්වරුන් හත් (07) දෙනෙකුගේ (බහමාස්, චිලී, බ්‍රසීලය (සඕපවුලෝ), කොලොම්බියාව, ඩොමිනිකන් ජනරජය, පැනමාව සහ සුරිනාම්) කාලය දීර්ඝ කිරීම සලකා බැලීම.

බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපතිවරයා 2024 ජූනි 13 වන දින රියෝ ද ජැනයිරෝ නුවර මහ නගර සභාවේ විදේශ සබඳතා කමිටුවේ උප සභාපති එලිසූ කෙස්ලර් මහතා සහ සිවිල් මන්ත්‍රී මණ්ඩලයේ මහ නගර ලේකම් කාර්යාලයේ ලේකම් ලූකස් පඩිහා මහතා හමුවී කොළඹ සහ රියෝ ද ජැනයිරෝ මහ නගර සභා අතර සහෝදර නගර ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම පිළිබඳව සාකච්ඡා කළේය. ආර්ජන්ටිනාව, කොලොම්බියාව, චිලී සහ සුරිනාම් සමඟ දේශපාලන උපදේශන සහ ආර්ථික සහයෝගීතාව පැවැත්වීමට පියවර ආරම්භ කර ඇති අතර ගිවිසුම්/සංදේශ සහ අවබෝධතා කෙටුම්පත අදාළ රජයන් විසින් සමාලෝචනය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ 76 වන නිදහස් සංවත්සරය සැමරීම සඳහා කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2024 පෙබරවාරි 05 වන දින හොටෙල් නැෂනල් හිදී රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමේ උත්සවයක් පැවැත්වීය. තානාපතිවරයා 2024 ජූලි 24 වන දින කියුබාවේ ජනාධිපති මිගෙල් ඩයස්-කැනල් බර්මියුඩෙස් මහතා හමුවී ශ්‍රී ලංකා-කියුබා ද්විපාර්ශ්වික සබඳතාවල 65 වන සංවත්සරයට සුබ පැතුම් එක් කළේය. ශ්‍රී ලංකා-කියුබා ද්විපාර්ශ්වික සබඳතාවල 65 වන සංවත්සරය සැමරීම සඳහා 2024 අගෝස්තු 07 වන දින ඉහළ මට්ටමේ සහභාගීත්වයෙන් වැඩසටහනක් පවත්වන ලදී.

වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, වොෂින්ටන් ඩීසී හි ඔවුන්ගේ නේවාසික දූත මණ්ඩල සහ අදාළ විදේශ අමාත්‍යාංශ හරහා මෙක්සිකෝව, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ රජයන් සමඟ ශ්‍රී ලංකාවේ ධනාත්මක වර්ධනයන්, විශේෂයෙන් සංහිඳියාව සහ ආර්ථික ප්‍රකෘතිය, පාලනය යනාදිය බෙදා ගත්තේය. වොෂින්ටන් ඩීසී හි ඇමරිකානු රාජ්‍ය සංවිධානයේ ලේකම් කාර්යාලය (ශ්‍රී ලංකාව නිරීක්ෂක රාජ්‍යයක් ලෙස සිටින) සහ සාමාජික රටවල් ඔවුන්ගේ නේවාසික දූත මණ්ඩල හරහා සමීපව සහයෝගයෙන් කටයුතු කළේය. ප්‍රයෝජනවත් සිදුවීම්, සංඛ්‍යාලේඛන, යහපත් පිළිවෙත් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා ශ්‍රී ලංකා රජයේ ආයතන සමඟ බෙදා ගන්නා ලදී.

**11.3 බහුපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:**

**11.3.1.** 2024 මාර්තු 04 වන දින පැවති UNHRC හි 55 වන සැසිවාරයේදී සහ 2024 සැප්තැම්බර් 09 වන දින පැවති 57 වන සැසිවාරයේ අන්තර්ක්‍රියාකාරී සංවාදයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ වාචික යාවත්කාලීන කිරීම සඳහා බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය බ්‍රසීලය, ආර්ජන්ටිනාව, චිලී සහ පැරගුවේ රජයන්ගෙන් සහයෝගය සහ ඵලදායී මැදිහත්වීම ඉල්ලා සිටියේය. තානාපතිවරයා සමඟ පැවති රැස්වීම් අතරතුර කියුබාවේ සහ අනෙකුත් පිළිගත් රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ජාත්‍යන්තර සංසදයේදී ශ්‍රී ලංකාවට ඔවුන්ගේ සහයෝගය සහතික කර ඇත. 2024 මැයි සහ සැප්තැම්බර් මාසවල පැවති UNHRC සැසිවාරවලදී ශ්‍රී ලංකාව වෙනුවෙන් සහාය ලබා ගැනීම සඳහා ප්‍රතිතනය කරඇති රටවල දූත මණ්ඩල සමඟ රැස්වීම් පැවැත්විණි.

**11.3.2. වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය:** ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මුලපිරීම් සහ අපේක්ෂකත්වයන් බලාපොරොත්තුවෙන් මෙක්සිකෝව සහ ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝහි සහාය සඳහා දූත මණ්ඩලය බලපෑම් කළේය: දේශගුණික යුක්තිය සඳහා ඵලදායී, ඇතුළත් සහ තිරසාර බහුපාර්ශ්වික ක්‍රියාමාර්ග පිළිබඳ ශ්‍රී ලංකාවේ යෝජනාව කෙන්යාවේ නයිරෝබි හි පැවති එක්සත් ජාතීන්ගේ පාරිසරික සභාවේ (UNEA) 6 වන සැසිවාරය 2024 පෙබරවාරි 26 සිට මාර්තු 01 දක්වා පැවැත්විණි. 2024 ජුනි 07 වන දින නිව්යෝර්ක් හි පැවති මැතිවරණයේදී 2025-2027 වාරය සඳහා ECOSOC සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය පැවැත්විණි. නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත: තානාපති/PRUN, දකුණු-දකුණු සහ ත්‍රිකෝණාකාර සහයෝගීතාව පිළිබඳ ඉහළ මට්ටමේ රැස්වීමේ මූලසුන දැරූ අතර දකුණු-දකුණු සහයෝගීතාව සඳහා එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් පවත්වන ලද රැස්වීම් කිහිපයකට සහභාගී විය.

2024 සැප්තැම්බර් 25 වන දින නිව්යෝර්ක් හි පැවති විසි දෙනාගේ කණ්ඩායමේ (G20) විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීමට එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත/නිව්යෝර්ක් සහභාගී විය. ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් කලාපයේ රටවල් කණ්ඩායමක් වන ආර්ජන්ටිනාව, බහමාස්, බාබඩෝස්, බ්‍රසීලය, බොලිවියාව, චිලී, කොලොම්බියාව, කොස්ටාරිකාව, කියුබාව, ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, ඉක්වදෝරය, හයිටි, ග්වාතමාලාව, ගයනාව, හොන්ඩුරාස්, ජැමෙයිකාව, මෙක්සිකෝව, නිකරගුවාව, පැනමාව, පැරගුවේ, පේරු, ශාන්ත ලුසියා, ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩින්ස්, ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ සුරිනාම් සහ උරුගුවේ ජුනි 07 වන දින නිව්යෝර්ක් හි පැවති මැතිවරණයේදී 2025-2027 වාරය සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට සහාය දක්වා ඇත. 2024 නොවැම්බර් 20 වන දින පැවති මැතිවරණයේදී, කියුබාව, ඩොමිනිකන් ජනරජය, එල් සැල්වදෝරය, මෙක්සිකෝව, පැනමාව සහ පේරු යන රටවල් 2025-2031 කාලසීමාව සඳහා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ කොමිසම (UNCITRAL) සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට සහාය දක්වා ඇත. 2024 දෙසැම්බර් 07 වන දින පැවති මැතිවරණයේදී, 2025-2028 කාලසීමාව සඳහා අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් (ICH) ආරක්ෂා කිරීම සඳහා වූ 2003 යුනෙස්කෝ සම්මුතියේ ඇගයීම් ආයතනයට ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වයට ඩොමිනිකන් ජනරජය සහාය ලබා දුන්නේය.

**11.4. මහජන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය පිළිබඳ වාර්තා චිත්‍රපටයක් රූගත කිරීම සඳහා 2024 සැප්තැම්බර් 3 සිට 30 දක්වා බ්‍රසීලියානු රූපවාහිනී වැඩසටහනක් වන "ග්ලෝබෝ රිපෝටර්" හි සිව් දෙනෙකුගෙන් යුත් රූපවාහිනී කණ්ඩායමකට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට පහසුකම් සැලසූ අතර, වාර්තා චිත්‍රපටයේ

පළමු කලාංගය 2024 දෙසැම්බර් මාසයේදී විකාශනය විය. බ්‍රසීලයේ ෆෙඩරල් දිස්ත්‍රික්කයේ ජාත්‍යන්තර සබඳතා මාසික ප්‍රකාශනයේ පෘතුගීසි භාෂාවෙන් ශ්‍රී ලංකාව පිළිබඳ ලිපියක් මෙම දූත මණ්ඩලය ප්‍රකාශයට පත් කළේය. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික් ෆෙඩරල් (GDF) රජයේ “මිනුටෝ ඩෝ එම්බයික්සාඩෝර්” නම් මාධ්‍ය ව්‍යාපාරයට ද සහභාගී විය. 2024 ජූලි 01 වන දින ශ්‍රී ලංකාවේ ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාව අතර බ්‍රසීල වෙළඳපොළ අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම සඳහා “ශ්‍රී ලංකාව සම්බන්ධ කරන්න” රූපවාහිනී වැඩසටහනට සහභාගී විය. කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා වෛද්‍ය සිසුන්ගේ සුභසාධනය ගැන සොයා බැලූ අතර ශ්‍රී ලාංකික සිසුන්ට ගෙවනු ලබන මාසික දීමනාව 2024 ජූලි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඇමරිකානු ඩොලර් 15.00 සිට ඇමරිකානු ඩොලර් 40 දක්වා වැඩි කර ඇත.

**11.5. කොන්සියුලර් සහාය සහ සංක්‍රමණික රැකියා සුභසාධනය:** බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය: බ්‍රසීලයේ සහ අනෙකුත් සමගාමීව පිළිගත් රටවල ජීවත් වන (200 ට අඩු) විදේශීය ශ්‍රී ලාංකිකයන් පිළිබඳ දත්ත දූත මණ්ඩලය යාවත්කාලීන කළේය. කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කියුබාවේ සහ අනෙකුත් ප්‍රතීතනය කරඇති රටවල ජීවත් වන ශ්‍රී ලාංකිකයින්ට කොන්සියුලර් සහාය ලබා දුන්නේය. දූත මණ්ඩලය හවානා හි තුර්කි ගුවන් සේවය සමඟ සම්බන්ධ වී කේමන් දූපත් සහ අනෙකුත් කැරිබියන් රටවලට ගමන් කරන ශ්‍රී ලාංකික සේවකයින්ට ඉස්තාන්බුල් ගුවන්තොටුපළට ගොඩවීමට අනුමැතිය ලබා ගත්තේය (ප්‍රවාහනය සඳහා තුර්කි ගුවන් සේවයේ අනිවාර්ය අවශ්‍යතාවය). වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය: මෙක්සිකෝව හරහා ශ්‍රී ලාංකිකයින්ගේ නීති විරෝධී හෝ සැක සහිත සංක්‍රමණ පිළිබඳ වාර්තා සහ තොරතුරු දූත මණ්ඩලයට අඛණ්ඩව ලැබෙමින් පවතී. මෙක්සිකෝව නීතිවිරෝධී සංක්‍රමණිකයන් සඳහා ජනප්‍රිය සංක්‍රමණ මධ්‍යස්ථානයකි. කාලෝචිත තොරතුරු හුවමාරු කර ගැනීමට සහ එවැනි නීති විරෝධී සිදුවීම් අඩු කිරීමට හෝ නැවැත්වීමට දෙපාර්ශ්වයම සමීපව කටයුතු කරයි. මෙක්සිකෝවේ ශ්‍රී ලංකා ගෞරවනීය කොන්සල්වරයා පුද්ගලික හේතූන් මත ඉල්ලා අස් වූ අතර වොෂින්ටන් ඩීසී හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සුදුසු අපේක්ෂකයෙකු හඳුනා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

**11.6. සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ ජනතාව අතර සබඳතා:** කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, 2025 වසරේ 77 වන නිදහස් දිනයට සමගාමීව, ශ්‍රී ලංකාව ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රදර්ශනය කිරීම සඳහා කියුබානු ජාතික පුස්තකාලයේදී ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට නියමිතව ඇත.

**11.7. විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, විද්‍යා, තාක්ෂණ හා පරිසර අමාත්‍යවරයා හමුවී ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සහ 2023 දී කල් ඉකුත් වූ විද්‍යා හා තාක්ෂණ අවබෝධතා ගිවිසුම අලුත් කිරීම පිළිබඳව සාකච්ඡා කළේය. ශ්‍රී ලංකාවට අඩු වියදමකින් ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ෆාමා සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා තානාපතිවරයා කියුබාවේ ජෛව තාක්‍ෂණ හා ඖෂධ කර්මාන්ත සමූහය වන බයෝකියුබා ෆාමා හමුවිය. අදාළ වෙළඳ නාවික ආයතන සමඟ සම්බන්ධ වීම සඳහා CINEC කැම්පස් ලෙසද හැඳින්වෙන කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය, හවානා හි හොන්ඩුරාස් සහ පැනමා තානාපති කාර්යාල වෙත හඳුන්වා දෙන ලදී.

**11.8. මානව සම්පත්, මෙහෙවර කළමනාකරණය සහ විදේශීය වත්කම් කළමනාකරණ සංවර්ධනය:** රටේ මූල්‍යමය සීමාවන් සැලකිල්ලට ගනිමින්, බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මසකට ඇමරිකානු ඩොලර් 15000 ක් පමණ ඉතිරි කර ගන්නා ලදී, තානාපතිවරයා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකුගේ (SLFS) සහ තානාපතිවරයාගේ පුද්ගලික සහකාර තනතුර හිස්ව තබා ගැනීමට තීරණය කිරීමෙන් පසුව. දූත මණ්ඩලයේ සියරට සේවයේ කාර්ය මණ්ඩලය බ්‍රසීලියාවේ SECE සමඟ ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වී ඇති අතර, එය ඇතැම් රසායනාගාර පරීක්ෂණ සඳහා 50% ක වට්ටමක් ලබා දෙයි. කියුබාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය නිල නිවසේ නව ජනක යන්ත්‍රයක් සවි කළේය. හවානාහි පවතින නිතර නිතර විදුලි කප්පාදුව සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලයේ ප්‍රතිදානය වැඩි කිරීමට උපකාරී වන චාන්සරි ගොඩනැගිල්ල සඳහා ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇත. රජයේ ආයතනයක් වන ඉඩම් හිමියා වන PALCO විසින් තානාපතිවරයාගේ ඉල්ලීම පරිදි නිල නිවස පින්තාරු කරන ලදී. චාන්සරි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර තීන්ත ආලේප කිරීමට PALCO එකඟ විය.

## 12. මැද පෙරදිග අංශය

**12.1.ද්විපාර්ශ්වික සබඳතා:** ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, විදේශයන්හි පිහිටි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහය ඇතිව, පහත සඳහන් ඉහළ පෙළේ සංචාර සඳහා මැද පෙරදිග අංශය පහසුකම් සැලසීය. ඉරාන ඉස්ලාමීය ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය හුසේන් අමීර් අබ්දුල්ලාහියන් මහතා, හිටපු විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතාගේ ආරාධනය පරිදි 2024 පෙබරවාරි 19-21 දිනවල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී අමාත්‍යවරයා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ හිටපු අගමැති දිනේෂ් ගුණවර්ධන යන මහත්වරුන් හමුවූ අතර විදේශ කටයුතු අමාත්‍යාංශයේදී හිටපු විදේශ අමාත්‍ය අලි සබ්රි මහතා සමඟ නිල සාකච්ඡා පැවැත්වූයේය. ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරාධනයෙන්, ඉරාන ඉස්ලාමීය ජනරජයේ ජනාධිපති අතිගරු ඊබ්‍රහිම් රයිසි මහතා, 2024 අප්‍රේල් 24 වන දින උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඒකාබද්ධව විවෘත කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම සංචාරයේදී ශ්‍රී ලංකාව සහ ඉරානය පහත සඳහන් ගිවිසුම් පහකට අත්සන් තැබීය.

- ශ්‍රී ලංකාව සහ ඉරානය අතර සංස්කෘතික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතා, ජනමාධ්‍ය, තාරුණ්‍ය හා ක්‍රීඩා වැඩසටහන පිළිබඳ ගිවිසුම
- ශ්‍රී ලංකාවේ ජාතික චිත්‍රපට සංස්ථාව සහ ඉරානයේ සංස්කෘතික හා ඉස්ලාමීය මාර්ගෝපදේශන අමාත්‍යාංශය අතර චිත්‍රපට කර්මාන්තයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකාවේ ජාතික සමුපකාර කවුන්සිලය සහ ඉරාන සහයෝගීතා මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය සහ ඉරානයේ ජාතික පුස්තකාල සහ ලේඛනාගාරය අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකාව සහ ඉරානය අතර මාධ්‍ය සහ සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

එසේම හිටපු කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා, 2024 අප්‍රේල් 26 සිට මැයි 01 දක්වා පැවැති 6 වැනි ඉරාන ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා ඉරානය වෙත ගිය නියෝජිත පිරිසට නායකත්වය ලබා දුන්නේය. 2024 මැයි 22 වන දින ටෙහෙරානයේ පැවැති, අභාවප්‍රාප්ත ජනාධිපති ආචාර්ය සෙයිද් ඊබ්‍රහිම් රයිසි, විදේශ අමාත්‍ය ආචාර්ය හුසේන් අමීර් අබ්දුල්ලාහියන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ ඉරාන නිලධාරීන්ගේ රාජ්‍ය අවමංගල්‍යයට සහභාගී වීම සඳහා හිටපු විදේශ කටයුතු අමාත්‍ය එම්.යූ.එම්. අලි සබ්රි මහතාගේ නායකත්වයෙන් යුත් ඉහළ පෙළේ නියෝජිත පිරිසක් ටෙහෙරානය වෙත ගියහ. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ හිටපු අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක මහතා සෞදි අරාබියේ ජෙඩා නුවරට ගොස් 2024 ජනවාරි 07 වන දින සෞදි අරාබියේ හජ් සහ උම්රා අමාත්‍ය ආචාර්ය තව්ෆික් අල්-රබියා සමඟ හජ් ගිවිසුම අත්සන් කළේය.

ආසියානු සහයෝගිතා සංවාදයේ (ACD) සාමාජික රටවල විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 19 වැනි රැස්වීමට සහභාගී වීම සඳහා හිටපු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු තාරක බාලසූරිය මහතා ටෙහෙරානයට ගිය නියෝජිත පිරිසකට නායකත්වය දෙන ලදී. එසේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා 2024 ජූලි 30 වැනි දින අතිගරු ජනාධිපති මසූඩ් පෙසෙෂ්කියන්ගේ පදවි ප්‍රාප්ති උත්සවයට සහභාගී වීම සඳහා ඉරානයේ සංචාරයක නිරත විය. තවද සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව, වර්ධනය සහ බලශක්තිය පිළිබඳ ලෝක ආර්ථික සංසදයේ විශේෂ රැස්වීමට සහභාගී වීම සඳහා හිටපු විදේශ අමාත්‍යවරයා අප්‍රේල් 28 සිට 29 දක්වා සෞදි අරාබියට ගිය අතර, විදේශ කටයුතු අමාත්‍ය අතිගරු ෆයිසාල් බින් ෆර්හාන්, සැලසුම් හා ආර්ථික අමාත්‍ය අතිගරු ෆයිසාල් අල් ඉබ්‍රාහිම් සහ ඩිජිටල් සහයෝගිතා සංවිධානයේ මහලේකම් අතිගරු ඩීමා අල් යහියා යන මහත්වරුන් මෙහිදී හමුවිය. 2024 පෙබරවාරි 26 සිට 29 වැනි දින දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි නුවර පැවැති 13 වැනි ලෝක වෙළෙඳ සංවිධාන (WTO) අමාත්‍ය සමුළුවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය ගරු නලින් ප්‍රනාන්දු මහතා අබුඩාබිහි සංචාරයක නිරත විය. ශ්‍රී ලංකාව සහ ජෝර්දානය

අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම 2024 ජූලි 10 වැනි දින ජෝර්දානයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේදී අත්සන් කරන ලද අතර 2025 ආරම්භයේදී දේශපාලන උපදේශනවල පළමු වටය පැවැත්වීමට යෝජනා කෙරිනි. එසේම ශ්‍රී ලංකාව සහ ඕමානය අතර සංචාරක සහයෝගීතා ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුම සහ ශ්‍රී ලංකාව සහ ඕමානය අතර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුම පිළිවෙලින් 2024 අප්‍රේල් 02 සහ ජූනි 10 යන දිනවල කොළඹදී අත්සන් කරනු ලැබිණි.

තවද මෙම අංශය විසින් ශ්‍රී ලංකාවේ සහ කුවේට්හි විදේශ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙක අතර ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ උදර්පන ගිවිසුම, ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර දඬුවම් ලබන තැනැත්තන් භාරදීම සඳහා වන අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා පහසුකම් සලසන ලදී.

**12.2. සංක්‍රමණික කම්කරු සුභසාධනය, විදේශගත ශ්‍රී ලාංකිකයන්:** ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමඟ සහයෝගයෙන්, ටෙල් අවිව්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2024 ජූලි 23 සිට අගෝස්තු 02 වැනි දින දක්වා ඊශ්‍රායලයේ NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) 3 සහ 4 මට්ටම සඳහා ලිඛිත හා ප්‍රායෝගික විභාග සංවිධානය කරන ලදී. මැදපෙරදිග කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් කම්කරු ආශ්‍රිත සේවාවන් කාලෝචිත ආකාරයකින් සැපයීම සඳහා කටයුතු සිදු කර ඇත. විශේෂයෙන් බේරූට් සහ ටෙල් අවිව් හි ශ්‍රී ලංකා දූත මණ්ඩල, මැදපෙරදිග පවතින ආතතීන් හේතුවෙන් පීඩාවට පත් ශ්‍රී ලාංකිකයින්ට සහාය වීම සඳහා කටයුතු කරමින් සිටී. කුවේට්හි සහ ශ්‍රී ලංකාවේ බලධාරීන් සමඟ සහයෝගයෙන් කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, 2007 වසරේදී දෙරට අතර අත්සන් කරන ලද දඬුවම් ලබන තැනැත්තන් මාරු කිරීම පිළිබඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව, 2024 නොවැම්බර් 25 වැනි දින කුවේට් සිට ශ්‍රී ලාංකික දඬුවම් නියම වූ සිරකරුවන් 32 දෙනෙකුගෙන් යුත් පළමු කණ්ඩායම මාරු කිරීමට පහසුකම් සපයන ලදී.

**12.3.සංස්කෘතික/ මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය:** මැදපෙරදිග කලාපය පදනම් කරගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල ශ්‍රී ලංකා ප්‍රජා සංවිධාන සමඟ එක්ව අලුත් අවුරුදු සැමරුම, ඉෆ්තාර්, වෙසක්, පොසොන්, දීපවාලි සහ නත්තල් වැඩසටහන් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ අබුඩාබි තානාපති කාර්යාලය විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පාර්ශවයට (අමාත්‍ය අතිගරු ෂෙයික් මුබාරක් අල් නහියන් සහ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය අතිගරු නූරා අල් කාබි) ඉදිකිරීමට යෝජනා කර ඇති බෞද්ධ විහාරස්ථානයේ සැලසුම හා සංකල්ප සටහන අවසන් කර ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් බෞද්ධ රටවල තානාපති කාර්යාල නියෝජිතයින් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටි අනෙකුත් සියලුම බෞද්ධ ප්‍රජාවන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

**12.4.ආරක්ෂක සහයෝගීතාව:** ශ්‍රී ලංකා පාර්ශවයේ ඉල්ලීම පරිදි විදේශ සහ ආරක්ෂක අමාත්‍යාංශ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම සඳහා බේරූට්හි ශ්‍රී ලංකා තානාපතිතුමා 2024 සැප්තැම්බර් 24 වැනි දින සිරියාව් සංචාරයක නිරතවිය.

**ඒකාබද්ධ සමුද්‍රීය හමුදා:** මැනමාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය බහරේනයේ ඒකාබද්ධ සමුද්‍රීය හමුදාවට ශ්‍රී ලංකා නාවික හමුදාවේ අණදෙන නිලධාරී ජයමුණි සංජය දිනේෂ් සිල්වා මහතා පත් කිරීමට පහසුකම් සැලසූ අතර, 2024 අප්‍රේල් 15 සිට 19 වැනි දින දක්වා පැවැති ඒකාබද්ධ සමුද්‍රීය හමුදා ආරක්ෂක සමුළුවට (MSC 24) ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියර් අද්මිරාල් එම්.එච්.එන්. පීරිස් මහතාට සහභාගී වීමටද සහය දක්වන ලදී.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ අබුඩාබිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එක්ව, 2024 සැප්තැම්බර් 02-11 දක්වා ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන චාරිකාව සඳහා පහසුකම් සලසන ලදී. ද්විපාර්ශ්වික ආරක්ෂක උපදේශන සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජිත කණ්ඩායම් දෙකක් ඊශ්‍රායලයට ගියහ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත පළමු දූත පිරිස 2024

නොවැම්බර් 11 සිට 15 දක්වා ඊශ්‍රායලයේ පැවති ස්ථායී විද්‍යුත් දෘශ්‍ය උපාංග දහයක් ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පැවති කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ සඳහා (FAT) සහ කර්මාන්තශාලා සංචාරයට සහභාගී විය. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත දෙවන දූත පිරිස 2024 දෙසැම්බර් 02 සිට 10 දක්වා කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණ (FAT) සඳහා ඊශ්‍රායලයේ සංචාරයක නිරත වූහ.

**12.5.මානව සම්පත්, දූත මණ්ඩල කළමනාකරණය, විදේශීය වත්කම් කළමනාකරණ සංවර්ධනය:** හයිෆා සහ උතුරු ඊශ්‍රායලයේ වෙළෙඳාම, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා හයිෆා සහ උතුරු ඊශ්‍රායලයේ ශ්‍රී ලංකාව සඳහා නිර්වේතනික කොන්සල්වරයෙකුගේ පත්වීම් ලිපිය 2024 මාර්තු 01 වන දින නිකුත් කරනු ලැබිණි.

## 13. යුරෝපා සහ උතුරු ඇමරිකානු අංශය

**13.1. ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** එක්සත් රාජධානියේ නව GSP යෝජනා ක්‍රමය වන සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය) DCTS) සම්බන්ධීකරණය කරන ලදී .2024 ජූලි 22-23 දිනවල කොළඹ පැවති එක්සත් රාජධානියේ විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලය විසින් සංවිධානය කරන ලද DCTS කලාපීය සම්මන්ත්‍රණයෙන් පසුව, ශ්‍රී ලංකාව DCTS හි මූලාරම්භක නිර්ණායක රීති පිළිබඳව අදහස් පළ කළේය .මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, අමාත්‍යාංශය විශේෂයෙන් ඇඟලුම් අංශය සඳහා ඉන්දුනීසියානු ජනරජය සමඟ DCTS අන්තර් කලාපීය සමුච්චය සඳහා ඉල්ලීමක් ආරම්භ කර ඇත .මෙම ක්‍රියාවලිය දැන් එහි අවසන් අදියරේ පවතින අතර, යෝජනාව අත්සන් කිරීම සඳහා ඉන්දුනීසියානු පාර්ශවයට යොමු කර ඇත.

**යුරෝපා සංගමය (**EU): බොහෝවිට 2025 දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකාවට ලැබීමට නියමිත මීළඟ GSP Plus අධීක්ෂණ මෙහෙයුම සම්බන්ධීකරණය කරන ලදී. රටේ රබර් අපනයනවල තිරසාර අනාගතයක් සඳහා අලුතින් ක්‍රියාත්මක කරන ලද වන විනාශය පිළිබඳ EU නියාමනයේ) EUDR) අවශ්‍යතා සහ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීය .මේ සම්බන්ධයෙන්, අමාත්‍යාංශය 2024 මාර්තු 18 වන දින EU සමඟ මාර්ගගත තොරතුරු සැසියක් සංවිධානය කළේය.

එසේම මෙම අංශය විසින් 2024 ජූලි මාසයේදී දියත් කරන ලද GTEX –II මුලපිරීම නිරීක්ෂණය කරන ලද අතර, තිරසාරභාවය සහ සදාචාරාත්මක නිෂ්පාදනයේ වර්ධනය වන වෙළඳපොළට ගැලපෙන පරිදි ශ්‍රී ලංකා අපනයනකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම සඳහා රෙදිපිළි කර්මාන්තයේ තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බලගැන්වීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2024 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ ආරක්ෂාව සහ බලගැන්වීම සහතික කරමින් ශ්‍රී ලංකාවේ වසර 14 ක් තිස්සේ ස්විස් සංවර්ධන සහයෝගීතාවයෙන් අරමුදල් සපයන ලද ආරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන භාරදීමේ උත්සවය සම්බන්ධීකරණය කරන ලදී.

තවද ජර්මනියේ හඳුනාගත් රැකියා පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම පිළිබඳ නියමු ව්‍යාපෘතියක් සාකච්ඡා කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් කැඳවීම සඳහා මූලික සාකච්ඡාවක් පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පළමුව, ජර්මානු පාර්ශ්වකරුවන්ට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘති යෝජනාවක් සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පැවැත්වීමට නියමිතය.

**13.2. ගිවිසුම්:** ශ්‍රී ලාංකික හෙදියන්ගේ රැකියා සඳහා එක්සත් රාජධානිය සමඟ සෞඛ්‍ය සේවා අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා රැස්වීම් සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ සිට ජර්මනියට වයෝවෘද්ධ හෙදියන් ලෙස පුහුණුව සඳහා පිරිස් සාධාරණ ලෙස බඳවා ගැනීම පිළිබඳ 2017 දී අත්සන් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදී.

රැකියා සඳහා ඉදිකිරීම් අංශයේ පෝලන්තය සමඟ G2G ගිවිසුම අවසන් කිරීම සඳහා සාකච්ඡා, කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා රුමේනියාව සමඟ අවබෝධතා ගිවිසුම, සංක්‍රමණ සහ සංචලන හවුල්කාරිත්වය පිළිබඳ ඉතාලිය සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් සහ රියදුරු බලපත්‍රය අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා එක්සත් රාජධානිය සමඟ රියදුරු බලපත්‍ර/අවබෝධතා ගිවිසුම්, දකුණු ආසියාවේ ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ කලාපීය මූලස්ථානය ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට ගෙනයාම සඳහා අන්තර් රාජ්‍ය ගිවිසුම සම්බන්ධීකරණය කරන ලදී.

**13.3. තාක්ෂණික සහාය:** එක්සත් රාජධානියේ රාජකීය ආදායම් සහ රේගු ඒකකය සමඟ සහයෝගයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා තාක්ෂණික සහාය සම්බන්ධීකරණය කරන ලදී. ජර්මානු ෆෙඩරල් ජනරජය, හෙල්මට් කෝල් මාතෘ රෝහල ගාල්ල පදනම සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ලද, 2024 මාර්තු 27 වන දින ගාල්ලේදී කාන්තාවන් සඳහා වූ ජර්මානු - ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහල විවෘත කිරීම විදේශ කටයුතු අංශය සම්බන්ධීකරණය කළේය. දූෂණ සහ අනෙකුත් මූල්‍ය අපරාධ හරහා අයථා ලෙස පරිහරණය කරන ලද නීති විරෝධී වත්කම් ආපසු අයකර ගැනීම සඳහා අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ වත්කම් ප්‍රතිසාධනය සඳහා වූ ස්විස් ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICAR) අතර ශක්‍යතා සංවර්ධන/තාක්ෂණික සහාය සඳහා මූලික සාකච්ඡා සම්බන්ධීකරණය කළේය. කෘෂිකර්මාන්තය, ඩිජිටල් පරිවර්තනය, කාන්තා සවිබල ගැන්වීම සහ ශ්‍රී ලාංකික ඩයස්පෝරා සහභාගීත්වය වැනි ක්ෂේත්‍රවල පුළුල් සහාය ලබා ගැනීම සඳහා වත්මන් රජය සහ බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනමේ නියෝජිතයින් අතර මූලික සාකච්ඡා සම්බන්ධීකරණය කළේය. සමුද්‍රීය සහයෝගීතාවයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා බලධාරීන් විසින් ප්‍රංශයට පුහුණුවීම් සහ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික මට්ටමේ සංචාර/ සහභාගීත්වය සම්බන්ධීකරණය කරන ලදී.

2024 අප්‍රේල් මාසයේදී ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරී/දේශගුණික විපර්යාස කාර්යාලයේ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සහ එවකට පරිසර, දේශගුණික සහ හරිත මූල්‍ය පිළිබඳ ජනාධිපතිගේ උපදේශක ආචාර්ය ආනන්ද මල්ලවතන්ත්‍රි මහතා විසින් ප්‍රංශයේ අරමුදල් සපයන ලද තාක්ෂණික මට්ටමේ සංචාරයකට පහසුකම් සලසන ලදී. සඳහා දේශගුණය සහ හරිත මූල්‍යකරණය පිළිබඳ ප්‍රංශ පාර්ශවයේ ප්‍රධාන මැදිහත්කරුවන් සමඟ සාකච්ඡා පැවැත්විය. මෙම රැස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ දේශගුණික සහ පාරිසරික මුලපිරීම් සඳහා සහාය වීමට ප්‍රංශ බලධාරීන්ගේ අවධානය යොමු විය. 2025 එක්සත් ජාතීන්ගේ සාගර සමුළුවට සහ ඒක-ජල සමුළුවට සහභාගී වීම සඳහා ප්‍රංශය සමඟ හවුල් වීමට ශ්‍රී ලංකාවට ආරාධනා කරන ලදී.

**13.4. දේශපාලන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකාව යුරෝපයේ සහ උතුරු ඇමරිකාවේ රටවල් සමඟ ක්‍රියාශීලීව සම්බන්ධ වී ප්‍රතිඵල කේන්ද්‍ර කරගත් අන්තර්ක්‍රියා සහ වැඩිදුර සම්බන්ධතා සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරයි. විදේශ අමාත්‍යාංශ උපදේශන, ඉහළ මට්ටමේ සංචාර සහ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ඇතුළු මෙම කටයුතු අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගීතාවයට පහසුකම් සපයා ඇත. මෙම ප්‍රවේශය ගැඹුරු සාකච්ඡා සඳහා පහසුකම් සැලසීමට, හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමට සහ ශ්‍රී ලංකාවට කැපී පෙනෙන ප්‍රතිලාභ සහ අධ්‍යාපනික හා තාක්ෂණික සහාය ලබා දී ඇත.

**13.5. ද්විපාර්ශ්වික උපදේශන:** මෙම කාල සීමාව තුළ, අංශය එක්සත් රාජධානිය (2 වන උපායමාර්ගික සංවාදය), එස්තෝනියාව (සමාරම්භක), ලැට්වියාව (සමාරම්භක), ස්විට්සර්ලන්තය (4 වන වටය) සහ එක්සත් ජනපදය (5 වන වටය) සමඟ ද්විපාර්ශ්වික උපදේශන කැඳවීය.

**13.6.** මෙම අංශය විසින් පහසුකම් සපයන ලද ඉහළ මට්ටමේ සංචාර: 2024 ජනවාරි 13-18 දිනවල ස්විට්සර්ලන්තයේ ඩාවෝස් හි පැවති ලෝක ආර්ථික සංසදයේ (WEF) වාර්ෂික රැස්වීමට ජනාධිපතිවරයා සහභාගීවිය, එහිදී ස්විට්සර්ලන්ත පාර්ශවය සමඟ සාකච්ඡාවල නිරත විය. ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ද්විපාර්ශ්වික සබඳතාවල 75 වන සංවත්සරය සැමරීම සඳහා 2024 ජනවාරි 10-13 දිනවල ඈන් රාජකීය කුමරිය සහ ශ්‍රීමත් ටිම් ලෝරන්ස් මහතා මෙරට සංචාරයක නිරත වූහ.

එවකට විදේශ කටයුතු අමාත්‍යවරයා සිදුකල සංචාර:  වසර 30 කට පසු පෝලන්තයට ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයෙකු සිදුකල සංචාරය සනිටුහන් කරමින් 2024 ජූලි 18 සිට 21 දක්වා පෝලන්තයට සිදුකල සංචාරය, මියුනික් ආරක්ෂක සමුළුවේ 60 වැනි සංස්කරණයට (MSC) සහභාගී වීම සඳහා 2024 පෙබරවාරි 16-18 දක්වා ජර්මනියට සිදුකල සංචාරය, රුමේනියාවේ බුකාරෙස්ට් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විවෘත කිරීම සඳහා 2024 ජූලි 16 දින රුමේනියාවට කල සංචාරය, 3 වන යුරෝපා සංගම්  ඉන්දු-පැසිෆික් අමාත්‍ය සංසදයට සහභාගීවීම සඳහා 2024 පෙබරවාරි මාසයේදී බෙල්ජියමට සිදුකල සංචාරය

2024 අප්‍රේල් මාසයේ පැවති රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 70 වන සංවත්සරයට සමගාමීව විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා ඔස්ට්‍රියාවේ සංචාරයක් සිදුකරන ලදී. එම සංචාරය අතරතුර, දෙරට අතර සහයෝගීතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඔස්ට්‍රියානු පාර්ශවකරුවන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්විණි. 2024 මාර්තු මාසයේදී ඇන්ටාලියා රාජ්‍ය තාන්ත්‍රික සංසදයේ) ADF) තුන්වන සංස්කරණයට සහභාගී වීම සඳහා හිටපු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා තුර්කියේ සංචාරය කිරීම.

විවිධ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහ සම්භාවනීය අමුත්තන්ගේ ශ්‍රී ලංකා සංචාර, විශේෂයෙන් කළමනාකරණ සහ සම්පත් පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් තානාපති රිචඩ් වර්මා; රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන රාජ්‍ය තාන්ත්‍රික හා මහජන කටයුතු පිළිබඳ උප ලේකම් එලිසබෙත් ඇලන්; එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙළඳ හා විදේශ කෘෂිකර්ම කටයුතු පිළිබඳ උප ලේකම් ඇලෙක්සිස් ටේලර්; දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු කාර්යාංශයේ සහකාර ලේකම් ඩොනල්ඩ් ලූ සහ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී ස්කොට් නේතන්.

ප්‍රංශ ජනාධිපතිවරයා සමඟ හිටපු ජනාධිපතිවරයාගේ රැස්වීම්වල දිගුවක් ලෙස, 2024 ජනවාරි මාසයේදී එවකට ජනාධිපතිවරයාගේ මාණ්ඩලික ප්‍රධානියා සහ ප්‍රංශයේ ජාතික ආරක්ෂක උපදේශක විසින් තාක්ෂණික මට්ටමේ සංචාරයක් ප්‍රංශයේ සිදු කරන ලද අතර ආසියාව සහ ඕෂනියා සහ ගෝලීය කටයුතු පිළිබඳ ප්‍රංශ ජනාධිපති උපදේශක සහ දේශගුණය / COP 28 පිළිබඳ උපදේශක සමඟ එලිසී මාලිගයේදී සාකච්ඡා පැවැත්වීය .ප්‍රංශයේ යුරෝපය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහලේකම් ඇන්-මාරි දෙස්කොටෙස් (විදේශ ලේකම්වරයාට සමාන) මහත්මිය 2024 දෙසැම්බර් 10-11 දිනවල ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වූ අතර, 2024 දෙසැම්බර් 11 වන දින ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ (KDU) සමුද්‍රීය අධ්‍යයන සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය .දකුණු ආසියාව සඳහා වූ ජර්මානු පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ නියෝජිත පිරිසක් 2024 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණ ගරු කථානායකතුමා, අලුතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා-ජර්මන් පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය, ව්‍යාපාර සහ සිවිල් සමාජ සංවිධාන සමඟ රැස්වීම් පැවැත්වීය .මෙම කාලය තුළ, මෙම අංශය කලාපයේ නිල රාජකාරි සඳහා නියෝජිතයින් සඳහා කෙටි කාලීන සංචාර වීසා 1287 ක් සඳහා පහසුකම් සැලසූ අතර, ඉන් 1032 ක් එක්සත් ජනපද විදේශ ගමන් බලපත්‍ර හිමියන් විය.

**13.7. ගිවිසුම්:** මෙම අංශය අත්සන් කිරීමට පහසුකම් සැලසූ බොහෝ ගිවිසුම් අතර, වඩාත් වැදගත් වන්නේ ශ්‍රී ලංකාව සහ ප්‍රංශය අතර ශ්‍රී ලංකාවේ සමුද්‍රීය අධ්‍යයන සඳහා කලාපීය මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වන ගිවිසුමයි. එය ප්‍රංශය අයෝරා සාමාජිකයෙකු වන බැවින් එරට සමඟ සබඳතා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පරිසරය සැකසීමට මෙන්ම ඉන්දියානු සාගර කලාපයේ පුහුණු සහ අධ්‍යයන සහයෝගීතාවන් සඳහා මධ්‍යස්ථානයක් වනු ඇත. 2024 මැයි 17 වන දින එක්සත් රාජධානියේ නිල් ග්‍රහලෝක අරමුදල යටතේ සමුද්‍ර දේශ හවුල්කාරිත්ව වැඩසටහන සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 2024 ඔක්තෝම්බර් මාසයේදී එක්සත් රාජධානියේ ෆ්ලෙමින් අරමුදල් වැඩසටහන හරහා ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධයේ ගෝලීය තර්ජනයට ප්‍රතිචාර දැක්වීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධයේ නිරීක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා - එක්සත් රාජධානිය එක්ව කටයුතු කරනු ඇත. තාක්ෂණික සහයෝගීතාවය තුළින් න්‍යෂ්ටික සහ විකිරණශීලී ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම හඳුනාගෙන තහනම්

කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සහ එක්සත් ජනපද ජාතික න්‍යෂ්ටික ආරක්ෂක පරිපාලනය අතර අවබෝධතා ගිවිසුම. රේගු කටයුතුවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය පිළිබඳ රුසියානු සමූහාණ්ඩුවේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රජය අතර අවබෝධතා ගිවිසුම.

**13.8.** **වෙනත්** - මොස්කව්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, වුවාෂ් කලාපය, බුරියාටියා කලාපය සහ රුසියාවේ නිශ්නි නොව්ගොරොඩ් හි නිර්වේතනික කොන්සල් කාර්යාල පිහිටුවීමට පියවර ගෙන තිබේ. කොළඹ මෝල්ටාවේ නව නිර්වෙතනික කොන්සල් කාර්යාලයක් විවෘත කිරීම සඳහා පහසුකම් සැලසීය. 2024 ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ පුද්ගල ජාවාරම් වාර්තාවට ශ්‍රී ලංකා රජය ඉදිරිපත් කිරීම සහ පසු විපරම් ප්‍රශ්නවලට පිළිතුරු අවසන් කිරීම සඳහා ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකා රැස්වීම්වලට සහභාගී විය. එක්සත් ජනපද 2023 TIP වාර්තාව සම්බන්ධයෙන් එක්සත් ජනපද සහ ශ්‍රී ලංකා බලධාරීන් (වොෂින්ටන් ඩී.සී. හි අමාත්‍යාංශය සහ දූත මණ්ඩලය යන දෙකම) සමඟ සිදුකල පුළුල් උපදේශනවලින් පසුව, ශ්‍රී ලංකාවේ තත්ත්වය 'ස්ථර 2' මට්ටමින් නොවෙනස්ව පැවතුනි.

සත්‍යය පැවසීම, වගවීම, බලය බෙදා හැරීම සහ සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව සහ එකමුතුකම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ට්‍රොයිකා යෝජනාව (ස්විට්සර්ලන්තය, ජපානය, දකුණු අප්‍රිකාව විසින් ඒකාබද්ධ මුලපිරීමක්) ක්‍රියාත්මක කිරීමේදී කොළඹ ස්විස් තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

**13.9.** **බහුපාර්ශ්වික රාජ්‍යතාන්ත්‍රිකභාවය**

**13.9.1.** **යුරෝපීය සංගමය :**මෙම කාලය තුළ වෙළඳ හා ආර්ථික සබඳතා පිළිබඳ යුරෝපා සංගම් - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම, සංවර්ධන සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම සහ පාලනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම, නීතියේ ආධිපත්‍යය සහ මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම කැඳවීම සම්බන්ධීකරණය කර පහසුකම් සැලසීය .2024 පෙබරවාරි මාසයේදී බ්‍රසල්ස් හි යුරෝපා සංගමය සමඟ පැවති 26 වන ඒකාබද්ධ කොමිසමේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සහභාගීත්වයට පහසුකම් සැලසීය .යුරෝපා සංගමය මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම, EU මැතිවරණ විශේෂඥ මෙහෙයුම, පොදුරාජ්‍ය මණ්ඩලීය මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම) COG) ඇතුළු මෑතකදී අවසන් වූ ජනාධිපතිවරණ සහ මහ මැතිවරණය සඳහා මැතිවරණ නිරීක්ෂකයින් කිහිප දෙනෙකුගේ පැමිණීම සම්බන්ධීකරණය කළ අතර ඔවුන්ගේ වාර්තා ශ්‍රී ලංකා මැතිවරණ ක්‍රියාවලිය අතිශයින්ම ධනාත්මකව දැක තිබේ.

**13.9.2.** **පොදුරාජ්‍ය මණ්ඩලය :**2024 සැප්තැම්බර් 03-06 දක්වා ලන්ඩනයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සහ සමස්ත කමිටු රැස්වීම සඳහා විදේශ කටයුතු ලේකම්ගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක් සහභාගී වූහ .2024 සැප්තැම්බර් 23 වන දින නිව්යෝර්ක් හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීමට නිල මට්ටමේ දූත පිරිසක් සහභාගී වූහ .2024 ඔක්තෝම්බර් මාසයේදී සැමෝවාහි අපියා හි පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමේදී (CHOGM) ඉදිරිපත් කරන ලද CHOGM ප්‍රකාශනය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය සාගර ප්‍රකාශනය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සම්බන්ධ විය .ශ්‍රී ලංකාවේ නිල මට්ටමේ දූත පිරිසක් CHOGM සඳහා සහභාගී වූහ .දේශගුණික මූල්‍යකරණය මුදා හැරීමට රටට උපකාර කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය දේශගුණික මූල්‍ය ප්‍රවේශ මධ්‍යස්ථානය (CCFAH) හරහා ශ්‍රී ලංකාව සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ජාතික දේශගුණික මූල්‍ය උපදේශකයෙකු පොදුරාජ්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.

**13.10.** **ආරක්ෂක සහ ආරක්ෂණ සහයෝගීතාව :**ත්‍රිවිධ හමුදාවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා, වොෂින්ටන් ඩී.සී .හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තුව (DoD) සමඟ සමීපව කටයුතු කළේය .මෙම කටයුතු හේතුවෙන්, එක්සත් ජනපද හමුදාව ජෝර්ජියාවේ ෆෝර්ට් මුවර් හි එක්සත් ජනපද හමුදා පාබල පාසලේ උපාමාරු කපිතාන් වෘත්තීය

පාඨමාලාවේ (MCCC) වාර්ෂිකව ශ්‍රී ලංකා හමුදාවට පුහුණු අවස්ථා දෙකක් ලබා දී ඇත .ශ්‍රී ලංකාවට කැලිෆෝනියාවේ මොන්ටෙරේ හි නාවික පශ්චාත් උපාධි පාසලේ අවස්ථා දෙකක් ද පිරිනමනු ලැබේ .එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට සිව්වන එක්සත් ජනපද වෙරළාරක්ෂක කටර් යානය ප්‍රදානය කර ඇති අතර එය ලබන වසරේ ලැබෙනු ඇත .එක්සත් ජනපදය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට Beechcraft King Air 360 ER යානයක් ප්‍රදානය කර ඇති අතර එක්සත් ජනපද වෙරළාරක්ෂක බලකාය ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් සඳහා MK 75 අවි මෙහෙයුම් සහ නඩත්තු පුහුණුව ලබා දීම ආරම්භ කර ඇත.

මොස්කව් දූත මණ්ඩලය 2023/2024 පුහුණු වර්ෂය සඳහා රුසියානු ආරක්ෂක අමාත්‍යාංශය (MOD) විසින් හමුදා ආයතනවල ශ්‍රී ලංකා හමුදාවට පිරිනමන පුහුණු පාඨමාලා දොළහක් ලබා ගත්තේය .ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ජල විද්‍යාත්මක විද්‍යාව පිළිබඳ අඛණ්ඩ සහයෝගීතාව සම්බන්ධීකරණය කිරීම / 2025 ජනවාරි මාසයේදී එක්සත් රාජධානියේ ජල විද්‍යාත්මක කාර්යාලයේ සංචාරය, ශ්‍රී ලංකා ජාතික ජල විද්‍යාත්මක කාර්යාලය සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම/2025 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර ජල විද්‍යාත්මක අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා කාලසටහන්ගත කිරීම.

**13.11. මහජන රාජ්‍ය තාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති, ආයෝජන සහ සංචාරක මුලපිරීම් පිළිබඳව අදාළ රටවල් වල පිළිගත් ගමනාන්තවල අදාළ පාර්ශ්වකරුවන්ට යාවත්කාලීන කිරීම් සන්නිවේදනය කිරීම සඳහා දූත මණ්ඩල විසින් විවිධ සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කර ඇත. මෙම අංශය සහ අදාළ දූත මණ්ඩලවල ඵලදායී මැදිහත්වීම් හේතුවෙන් එක්සත් ජනපදය, කැනඩාව සහ යුරෝපය තුළ එල්ටීටීඊයේ තහනම් තත්ත්වය අඛණ්ඩව පැවතීමට හේතු වී තිබේ.

තවද, 2024 මැයි 18 වන දින දෙමළ ජන සංහාර සැමරුම් දිනයේදී සහ 2024 ජූලි 23 වන දින කළු ජූලියේ 41 වන සංවත්සරයේදී කැනේඩියානු අග්‍රාමාත්‍යවරයා විසින් "ජන සංහාරය" යන යෙදුම භාවිතා කිරීමෙන් ද්වේෂසහගත සාවද්‍ය තොරතුරු සහ ඡන්ද බැංකු දේශපාලනය සඳහා ගොතන ලද කරුණු මත පදනම් වූ අතිශය අසත්‍ය ආඛ්‍යානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අපගේ බරපතල විරෝධය දැක්වීම සඳහා අමාත්‍යාංශය සහ ඔටාවා සහ ටොරොන්ටෝ ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය සහ කැනඩාවේ ගෝලීය කටයුතු සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය. 2024 පෙබරවාරි 28 වන දින ඔන්ටාරියෝ හි බ්‍රැම්ප්ටන් නගර සභාව විසින් ඊනියා "දෙමළ ජන සංහාරයක්" සැමරීම සඳහා ස්මාරකයක් ඉදිකිරීමට ගත් ක්‍රියාමාර්ගයට සහ ද්වේෂසහගත සාවද්‍ය තොරතුරු සහ ඡන්ද බැංකු දේශපාලනය සඳහා ගොතන ලද ප්‍රචණ්ඩකාරී අසත්‍ය ආඛ්‍යානය පවත්වාගෙන යාමට ගත් ක්‍රියාමාර්ගයට අමාත්‍යාංශය සහ දූත මණ්ඩල දැඩි විරෝධය පළ කළහ. ඊනියා "ජන සංහාර" චෝදනාව මත පදනම්ව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අධිකරණයට ගෙන යන ලෙස ෂෝන් චෙන් මන්ත්‍රීවරයා විසින් කැනේඩියානු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පෙත්සම සම්බන්ධයෙන් ද අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සමීපව සම්බන්ධීකරණය කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ අභියාචනයට ප්‍රතිචාර වශයෙන්, වොෂින්ටන් ඩී.සී. හි දූත මණ්ඩලය එක්සත් ජනපද රාජ්‍ය නොවන සංවිධාන වලින් හදිසි ඖෂධීය පරිත්‍යාග සඳහා පහසුකම් සැලසූ අතර 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා, ඇමරිකානු ඩොලර් 258,808.32 (රුපියල් මිලියන 77) ක ඖෂධ පරිත්‍යාග සෞඛ්‍ය අමාත්‍යාංශයට භාර දෙන ලදී.

**13.12. කොන්සියුලර් සහාය සහ සංක්‍රමණික රැකියා සුභසාධනය:** විදේශීය ශ්‍රී ලාංකික ප්‍රජාවට ඵලදායී කොන්සියුලර් සේවාවන් ලබා දීම සඳහා අදාළ දූත මණ්ඩල නිසි ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. මොස්කව්හි දූත මණ්ඩලය සහ විදේශ කටයුතු අංශය, කොන්ත්‍රාත් පදනමක් මත රුසියානු සන්නද්ධ හමුදාවන්ට සම්බන්ධ වූ ශ්‍රී ලාංකිකයින් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කිරීම සඳහා කොළඹ රුසියානු තානාපතිවරයා සහ රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් කිහිප වතාවක් හමුවිය. ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුත් ඉහළ පෙළේ දූත පිරිසක් 2024 ජුනි 26 සිට 27 දක්වා රුසියාවේ සංචාරය කළ අතර, මෙම ශ්‍රී ලාංකිකයින්ගේ දුක්ඛිත තත්ත්වය සහ මියගිය/තුවාල ලැබූවන් සඳහා වන්දි ගෙවීම සහ කලින් නිදහස් කිරීම ඇතුළු ගැටළු

පිළිබඳව රුසියාවේ විදේශ කටයුතු සහ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරුන් හමුවී සාකච්ඡා කරන ලදී. ඒ අනුව රුසියානු සන්නද්ධ හමුදාවන්හි යොදවා සිටි ශ්‍රී ලාංකිකයින් 94 දෙනෙකු ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමට මොස්කව්හි දූත මණ්ඩලය පහසුකම් සලසා ඇත. මේ වන විට, අමාත්‍යාංශය සහ මොස්කව්හි දූත මණ්ඩලය, රුසියානු හමුදාවේ සේවය කරමින් සිටියදී මියගිය ශ්‍රී ලාංකිකයන් 23 දෙනෙකුගේ අවසන් කටයුතු සිදු කිරීම සහ ඔවුන්ගේ මරණ වන්දි ගෙවීම සම්බන්ධීකරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරමින් සිටී.

ඒ හා සමානව, යුක්රේනයේ යුද සිරකරුවන්ට සහ යුක්රේනයේ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති රැඳවියන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට අදාළ කරුණු අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරමින් සිටී. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සහ කොළඹ රුමේනියානු තානාපති කාර්යාලය සමඟ එක්ව විදේශ රැකියා නියෝජිතයින් සඳහා දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කිරීම ඇතුළුව රුමේනියාවේ සහ ඉතාලියට රැකියා වීසා බලපත්‍ර පිළිබඳ ගැටළු සම්බන්ධීකරණය කරන ලදී. අන්කාරා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සැප්තැම්බර් මාසයේදී තුර්කියේ අභ්‍යන්තර කටයුතු නියෝජ්‍ය අමාත්‍ය මුනීර් කරලොග්ලු හමුවී අන්‍යෝන්‍ය සහයෝගීතාවයන් මෙන්ම ඉහළ වීසා ප්‍රතික්ෂේප කිරීම් අනුපාතයක් සහ පදිංචි බලපත්‍ර අලුත් කිරීමේදී තුර්කියේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන් (ඉගෙනීම හෝ රැකියා කිරීම) මුහුණ දෙන ගැටළු පිළිබඳව සාකච්ඡා කළේය.

**13.13. සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ පුද්ගල සම්බන්ධතා :**නෙදර්ලන්තයෙන් ලැබුණු කෞතුක වස්තු ප්‍රතිස්ථාපනය කිරීමේ දෙවන අදියර සම්බන්ධීකරණය කරන ලදී .මෙම අදියර යටතේ, කෞතුක වස්තු 06ක් නැවත ලබා දීමට අපේක්ෂා කෙරේ .විදේශ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, කොළඹ ඇලියෝන්ස් ෆ්‍රොන්සෙස් සමඟ ප්‍රංශ තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා ප්‍රංශ භාෂාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව 08ක් පිරිනමන ලදී .2025 ජනවාරි මාසයේදී එය ආරම්භ කෙරේ .මොස්කව්හි දූත මණ්ඩලය විසින් පිළිවෙලින් වුචාෂ් රාජ්‍ය අධ්‍යාපනික විශ්ව විද්‍යාලය විසින් හෙලේනා විජයවර්ධන බාලිකා විද්‍යාලයේ සහ යූරල් රාජ්‍ය ආර්ථික විද්‍යා විශ්ව විද්‍යාලය විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පිළිවෙලින් විවෘත කරන ලද රුසියානු භාෂා මධ්‍යස්ථාන 02ක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී .පුළුල් සහභාගීත්වයක් සහිතව ධවල මන්දිරයේ වෙසක් සැමරීමේදී වොෂින්ටන් ඩී.සී .හි දූත මණ්ඩලය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය . වොෂින්ටන් ඩීසී සහ හවායි හි එක්සත් ජනපද කලාපීය රජයන් විසින් 2024 මැයි 23 වන දින වෙසක් උත්සව දිනය ලෙසත් 2024 පෙබරවාරි 04 වන දින ශ්‍රී ලංකා ජාතික දිනය ලෙසත් නම් කරමින් ප්‍රකාශන නිකුත් කිරීමට ද දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

යුනෙස්කෝවේ ජාත්‍යන්තර වෙසක් දිනය සැමරීම සඳහා 219 EX/27 තීරණය ඓතිහාසිකව සම්මත කිරීමේදී පැරිසියේ දූත මණ්ඩලය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. වෙසක් දිනයේදී පැරිසියේ යුනෙස්කෝ මූලස්ථානයේදී "චලනයේ සමගිය: නර්තනය, සංගීතය සහ සංස්කෘතික ප්‍රකාශනය හරහා වෙසක් සැමරීම" යන මාතෘකාව යටතේ සංස්කෘතික සන්ධ්‍යාවක් ද දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

**11.14. විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය තාන්ත්‍රිකභාවය :**අදාළ රේඛීය අමාත්‍යාංශ, විශ්ව විද්‍යාල සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල ආයතන සඳහා අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා අදාළ දූත මණ්ඩල හරහා මුලපිරීම් කිහිපයක් ගන්නා ලදී .ඒ අනුව, වොෂින්ටන් ඩී.සී .හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2024 ජනවාරි 16 වන දින ජනාධිපති අතිගරු ජනාධිපතිතුමන් සහ ස්විට්සර්ලන්තයේ ඩාවෝස් හි හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රිකාඩෝ හවුස්මන් අතර සාකච්ඡාවක් සහ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් කාර්යාලය/දේශගුණික කණ්ඩායම සහ ජෝර්ජියා විශ්ව විද්‍යාලය අතර සාකච්ඡාවක් සඳහා පහසුකම් සපයන ලදී .එක්සත් ජනපද විශ්ව විද්‍යාල සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය/රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන) කෘෂිකර්ම අමාත්‍යාංශය, NSBM හරිත විශ්ව විද්‍යාලය, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සහ බෞද්ධයන් සඳහා වූ නාගානන්ද ජාත්‍යන්තර ආයතනය (අතර විභව STEM සහ අනෙකුත් අධ්‍යාපනික/පර්යේෂණ හවුල්කාරිත්වයන් සඳහා ද මෙම දූත මණ්ඩලය පහසුකම් සපයන ලදී.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ඔස්ට්‍රියාවේ ජාත්‍යන්තර උසස් අධ්‍යාපන සහයෝගීතා දෙපාර්තමේන්තුවේ (OeAD) ප්‍රධානියා අතර ශ්‍රී ලාංකික සිසුන්ට/ශාස්ත්‍රඥයින්ට ඔස්ට්‍රියානු විශ්ව විද්‍යාලවල අවස්ථා ගවේෂණය කිරීම සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රියාව අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මාර්ගගත රැස්වීමක් සම්බන්ධීකරණය කරන ලදී. ERASMUS+ සහ Horizon Europe රාමුව යටතේ උසස් අධ්‍යාපනය, පර්යේෂණ සහ තාක්ෂණික සහයෝගීතාව සහ ජීන් මොනට් වැඩසටහනට ශ්‍රී ලාංකික සහභාගීත්වය සඳහා අවස්ථා වැඩි කිරීම සඳහා සමාලෝචනයට භාජනය වන කාලය තුළ මෙම අංශය යුරෝපා සංගමය සමඟ අඛණ්ඩව සම්බන්ධ විය.

මෙම අංශයේ සම්බන්ධීකරණයෙන්, මොස්කව්හි තානාපති කාර්යාලය ශ්‍රී ලංකා සහ රුසියානු විශ්ව විද්‍යාල 12 ක් අතර සහයෝගීතාව ස්ථාපිත කිරීම ආරම්භ කර ඇති අතර විශ්ව විද්‍යාල අතර අවබෝධතා ගිවිසුම් 03 ක් අත්සන් කිරීමට පහසුකම් සපයන ලදී .කෘෂිකර්මය, මහජන සෞඛ්‍ය සහ ප්‍රජා සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල පර්යේෂණ සහයෝගීතාව සඳහා මාර්ග ගවේෂණය කිරීම සඳහා ඔටාවාහි මහ කොමසාරිස් කාර්යාලය කැනඩාවේ විශ්ව විද්‍යාලවල සහකාර උප සභාපති සහ ජ්‍යෙෂ්ඨ ශ්‍රී ලාංකික මහාචාර්යවරුන් සමඟ මාර්ගගත සහ පුද්ගල රැස්වීම් පවත්වා ඇත .කැනඩාව සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යයන සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා දූත මණ්ඩලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කැනේඩියානු ශ්‍රී ලංකා අධ්‍යයන (CANSLA) ජාලය ද දියත් කළේය .ශ්‍රී ලාංකිකයින් සඳහා වැඩි අවස්ථාවන් විවිධත් කිරීම සඳහා 2024 ජූලි මාසයේදී රුමේනියාව සමඟ අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, මාධ්‍ය, තරුණ හා ක්‍රීඩා යන ක්ෂේත්‍රවල සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 14. දකුණු ආසියානු අංශය

දකුණු ආසියානු අංශය සහ දකුණු ආසියානු රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, සමාලෝචිත කාල සීමාව තුළදී ආර්ථික මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම, මිත්‍රශීලී සබඳතා වර්ධනය කිරීම, ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලාංකික සංස්කෘතිය හා රුචිකත්වයන් ප්‍රදර්ශනය කිරීම සිදු කොට ඇත. මේ හා සම්බන්ධයෙන් වන ප්‍රධාන කරුණු කිහිපයක් පහත පරිදි වේ:

**14.1.ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා නිෂ්පාදන සහතිකය ඩිජිටල්කරණය කිරීමට මෙම අංශය විසින් පහසුකම් සැලසීය. 2024 ජනවාරි 03 වැනි දින ඩකා නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, බංග්ලාදේශ වාණිජ අමාත්‍යාංශයේ විදේශ වෙළෙඳ ගිවිසුම් අංශයේ අතිරේක ලේකම් සහ ප්‍රධානී නූර් මහබුබුල් හක් මහතා හමුවිය. එසේම බංග්ලාදේශයේ පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු සමඟ රැස්වීම් සංවිධානය කරමින් ශ්‍රී ලංකාවේ OREL IT සමාගමට ව්‍යාපාර ප්‍රවර්ධන සංචාරයක් සඳහා බංග්ලාදේශය වෙත යෑමට පහසුකම් සලසන ලදී. තවද 2025 වසරේදී ව්‍යාපාරික ප්‍රවර්ධන සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම සංවිධානය කිරීම සම්බන්ධයෙන් 2024 නොවැම්බර් 24 වැනි දින ඩකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ (DCCI) මහලේකම් අෆ්සාරුල් අරිෆීන් මහතා සහ අනෙකුත් ඉහළ පෙළේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. යෝජිත බංග්ලාදේශ-ශ්‍රී ලංකා වරණීය වෙළෙඳ ගිවිසුමට (BSPTA) අදාළ කරුණු දෙරටේ අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කරනු ලැබිණි. 2024 නොවැම්බර් 14 වැනි දින ඩකා හි බංග්ලාදේශ ආයෝජන සංවර්ධන අධිකාරි කාර්යාලයේදී එම අධිකාරිය සඳහා අලුතින් පත් කරන ලද විධායක සභාපති අෂික් චෞද්රි මහතා සමඟ රැස්වීමක් පැවැත්විය. ශ්‍රී ලංකාවේ ඖෂධ සහ සැපයුම් සේවා අංශවල ආයෝජනය කිරීමට බංග්ලාදේශ සමාගම්වලට ඇති අවස්ථාවන් පිළිබඳව බංග්ලාදේශ ආයෝජන

සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කල අතර ද්වි-මාර්ග ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේ හැකියාව පිළිබඳවද එහිදී සාකච්ඡා කරනු ලැබිණි.

එසේම නේපාලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා Sri Lanka Luxury Holidays Asia (PVT) LTD හි සංචාරක ක්‍රියාකරුවෙකු සහ නේපාලයේ කීර්තිමත් සංචාරක ක්‍රියාකරුවන් 10 දෙනෙකු සමඟ රැස්වීමක් සංවිධානය කෙරිනි. ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය සඳහා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) සහ නේපාලයේ අධ්‍යාපන සංගමයේ සාමාජිකයින් සමඟ රැස්වීමක් පැවැත්වීම සඳහා පහසුකම් සපයනු ලැබිණි. නේපාලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ප්‍රධාන ව්‍යාපාරික නායකයින්, නේපාලයේ මැණික් හා ස්වර්ණාභරණ අංශයේ වෘත්තිකයන් සහ නේපාල වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් සමඟ 2025 ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී. තවද ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ සභාපති සහ සාමාජික මණ්ඩලය සමඟ රැස්වීම් දෙකක් පැවැත්වූ අතර එහිදී දෙරට අතර වෙළෙඳ අවස්ථා පිළිබඳව සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ නියෝජිත පිරිසකගේ සංචාරයට පහසුකම් සැලසීම සඳහා පාකිස්තාන සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ පාකිස්තාන සංචාරක මාර්ට් හි ප්‍රධාන විධායක නිලධාරී සමඟ රැස්වීමක් පැවැත්විය. 2025 ජනවාරි 31 සිට පෙබරවාරි 5 වැනි දින දක්වා කරච්චි සහ ඉස්ලාමාබාද් හි පැවැත්වීමට නියමිත පාකිස්තාන සංචාරක මාර්ට් විසින් සංවිධානය කරනු ලබන සංචාරක ප්‍රදර්ශනය සහ මාර්ග සංදර්ශනයට නියෝජිත පිරිස සහභාගී වනු ඇත. පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳ විසම්මුතිය සාකච්ඡා
කිරීම සහ දෙරට අතර වෙළෙඳ පරිමාව ශක්තිමත් කිරීම සඳහා වැඩබලන මහ කොමසාරිස්වරයා පාකිස්තාන වාණිජ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ හමුවක් පැවැත්විය.

මාලේ හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය: 2024 ජනවාරි 31 වැනි දින මාලදිවයිනේ සංචාරක අමාත්‍ය අතිගරු ඊබ්‍රහිම් ෆයිසාල් මහතා හමුවී සංචාරක ප්‍රවර්ධනය පිළිබඳ කරුණු සාකච්ඡා කළේය. 2024 මැයි 12 සිට 16 වැනි දින දක්වා ශ්‍රී ලංකා-මාලදිවයින් ව්‍යාපාරික කවුන්සිලයේ නියෝජිත පිරිසට මාලදිවයිනට යැමටද දූත මණ්ඩලය සහය දුන්නේය. මාලදිවයිනේ වෙසෙන ශ්‍රී ලාංකික සේවකයින් සඳහා මාලදිවයින් රුෆියා ශ්‍රී ලංකාව වෙත යැවීමත් මාලදිවයින් රුෆියා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමත් පහසු කිරීමේ යාන්ත්‍රණය දියත් කිරීමේ හැකියාව පිළිබඳව දූත මණ්ඩලය පර්යේෂණ කර ඇත. එසේම 2024 නොවැම්බර් 12 වැනි දින මාලදිවයිනේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය ආරම්භ කරන ලදී. තවද නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් වෙළෙඳ ප්‍රදර්ශන 15ක් හා ව්‍යාපාර අතර රැස්වීම් 50 ක් සංවිධානය කිරීම, වෙළෙඳ විමසීම් 141 ක් සඳහා විසඳුම් ලබාදීම, වෙළඳ නියෝජිතයින් අට දෙනෙකුට සහය වීම යනාදි කටයුතු සිදු කොට ඇත. මීට අමතරව, නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් විවිධ ව්‍යාපාරික ආයතන, වෙළෙඳ මණ්ඩල සහ රජයේ නිලධාරීන් සමඟ රැස්වීම් 140 ක් වර්ෂය පුරා පවත්වා ඇත. එසේම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ සංචාරක ප්‍රදර්ශන දෙකකට සහ මාර්ග සංදර්ශනවලට ද සහභාගී වන ලද අතර සංචාරක විමසීම් 51 කට ප්‍රතිචාර දක්වා ඇත. මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකන් ගුවන් සේවය 2024 නොවැම්බර් 23 වැනි දින මහ කොමසාරිස් කාර්යාලයේදී රාමායණ සංචාරක පැකේජය දියත් කළේය.

චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය: 2024 අප්‍රේල් 28 සිට මැයි 4 වැනි දින දක්වා ඉන්දියාවේ සංචාරක නියෝජිත සම්මේලනයේ සාමාජිකයින් 38 දෙනෙකු සඳහා දින 6 ක ශ්‍රී ලංකා සංචාරයක් සඳහා පහසුකම් සැලසීය. ජෝන් කීල්ස් ෆුඩ් පුද්ගලික සමාගමේ මස්, සොසේජස්, හැම් බර්ගර් යන ආහාර නිෂ්පාදන ආනයනකරුවන් සහ බෙදාහරින්නන් තිදෙනෙකුට හඳුන්වා දෙන ලදී. එස්.එස් සලීම් බිරියානි, සුභාෂි රෙඩ්ඩි විලාස් සහ අඩයාර් ආනන්ද බවන් යන

ව්‍යාපාරවලට ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා මෙම කාර්යාලය පහසුකම් සලසා ඇත. එසේම මුම්බායි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකා සංචාරක මාර්ග සංදර්ශන සහ ඉන්දෝර්, බරෝඩා, සූරත් සහ මුම්බායි හි ජාලකරණ වැඩසටහන්, ඉන්දු-ශ්‍රී ලංකා සමුළුවක්, ශ්‍රී ලංකා ආහාර උත්සව දෙකක් සහ ශ්‍රී ලංකා වනජීවී ඡායාරූප ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. තවද ඔක්තෝබර් 17 සිට 18 වැනි දින දක්වා මුම්බායි හි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ පැවති ලෝක වෙළෙඳ ප්‍රදර්ශනයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සඳහා නොමිලේ කුටි ලබා ගැනීමට පහසුකම් සැලසීය. දකුණු ගුජරාට් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, සූරත් (SGCCI) හි Maritime Summit: Voyage Sri Lanka යන මැයෙන් පැවැති සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 10 දෙනෙකුගෙන් යුත් වෙළඳ නියෝජිත කණ්ඩායමක් සහභාගී කරවීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා හැකියාව ඇති උත්සව කළමනාකරණ සමාගම්, විවාහ මංගල් උත්සව සැලසුම්කරුවන්, රූස්වීම්, දිරි දීමනා, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන ප්‍රවර්ධකයින්, චිත්‍රපට/වාණිජ නිෂ්පාදකයින්, සුවතා සංචාරක අංශයේ සමාගම් සමඟ රූස්වීම් 06 ක් පවත්වනු ලැබිණි.

ඍජු විදේශ ආයෝජන පහසුකම් සැලසීම අරමුණු කරමින් කරච්චි නුවර ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය, 2024 ඔක්තෝබර් 28 සිට 31 වැනි දින දක්වා පාකිස්තාන-ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය (PSLBF) සමඟ සහයෝගයෙන්, සමාගම් 15 කින් හා සාමාජිකයින් 18 කින් සමන්විත ව්‍යාපාරික දූත පිරිසක් ශ්‍රී ලංකාව වෙනුවෙන් සංවිධානය කරන ලදී. තවද කොළඹ වරාය නගර ආර්ථික කොමිසම සහ කරච්චි නුවර ව්‍යාපාරික ප්‍රජාව එක්රැස් කරමින් කරච්චි කොන්සල් ජනරාල් කාර්යාලය මැතකදී මාර්ගගත ජාලකරණ සැසියක් පවත්වන ලදී.

### 14.2. දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය:

**14.2.1. ඉහළ පෙළේ සංචාර:** 2024 දෙසැම්බර් මස 15 සිට 17 දක්වා අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දීය රාජ්‍ය සංචාරය අතරතුර, ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රකාශය නිකුත් කරන ලද අතර, ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ශ්‍රී ලාංකික සිවිල් සේවකයින් සඳහා පුහුණු සහ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පිළිබඳ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් දෙකක් සම්බන්ධව මෙහිදී කටයුතු සිදුකරන ලදී. එසේම ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ දිවුරුම් දීමේ උත්සවයට සහභාගී වීම සඳහා 2024 ජුනි මස 09 වන දින සිට 10 දක්වා අතිගරු හිටපු ජනාධිපතිතුමාගේ ඉන්දීය සංචාරය, 2024 ජුනි මස 03 වන දින සිට 06 දක්වා මාලදිවයිනේ විදේශ අමාත්‍ය මූසා සමීර් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය, 2024 ජුනි මස 20 සහ 2024 ඔක්තෝබර් මස 04 යන දිනවල ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය එස්. ජයශංකර් මහතාගේ ශ්‍රී ලංකා සංචාරය, 2024 පෙබරවාරි මස 20 සිට 23 දක්වා නවදිල්ලියේදී පැවති රයිසිනා සංවාදයේ 9 වැනි සංස්කරණය සඳහා එවකට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මහතාගේ සහ එවකට රාජ්‍ය මුදල් අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා සිදු කළ සංචාරය මෙන්ම එවකට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර යෝජිත සම්බන්ධතා කොරිඩෝව පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සඳහා එවකට මාණ්ඩලික ප්‍රධානී සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සාගල රත්නායක මහතා ප්‍රමුඛ දූත පිරිස 2024 මාර්තු 27 සිට 28 දක්වා නවදිල්ලි නුවරට ගිය සංචාරය 2024 වර්ෂය තුළදී සිදුවූ ඉහළ පෙළේ සංචාර වේ.

**14.2.2. සුහද හමුවීම්:** ඩකාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා 2024 ජනවාරි 8 වැනි දින එවකට බංග්ලාදේශ අගමැතිනි අතිගරු ෂෙයික් හසීනා මහත්මිය සහ 2024 මාර්තු 11 වන දින එවකට බංග්ලාදේශ විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවී ද්විපාර්ශ්වික සහයෝගීතා ක්ෂේත්‍ර සහ අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් අනෙකුත් කරුණු පිළිබඳව සාකච්ඡා කරන ලදී. 2024 ඔක්තෝබර් 29 වැනි දින

අභිනවයෙන් පත් කරන ලද බංග්ලාදේශයේ විදේශ ලේකම් එම්. එම්. ජෂිම් උද්දීන් මහතා හමුවී ශ්‍රී ලංකා-බංග්ලාදේශ බහුවිධ ද්විපාර්ශ්වික සම්බන්ධතාවේ වත්මන් මට්ටම පිළිබඳවද සාකච්ඡා කළේය.

කත්මණ්ඩුහි ශ්‍රී ලංකා තානාපතිතුමා, අභිනවයෙන් පත් කරන ලද විදේශ අමාත්‍ය ගරු ආචාර්ය අර්සු රානා ඩියුබා මහතා හමුවී ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සුබ පැතුම් එක් කරන ලදී. එසේම ශ්‍රී ලංකාවේ නේපාල තානාපතිතුමා නේපාල විදේශ ලේකම්වරයා සමඟ සුහද හමුවක්ද පවත්වා ඇත.

පාකිස්තාන විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "From Gandara to the World: The Legacy of Gandara Buddhism" යන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකාවේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක මහතාගේ සංචාරයට පෙර ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් එරට ජාතික උරුම සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්, ආගමික කටයුතු සහ අන්තර් ආගමික සහයෝගීතා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී. මීට අමතරව තමිල්නාඩුවේ නැවත පදිංචි කරන ලද ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් චෙන්නායිහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මුලපිරීම් ගණනාවක් සිදු කළ අතර, ඒවාට සියලුම රටවල විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ දැනුවත් කිරීම සහ සරණාගතයින් සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමද ඇතුළත් විය.

**14.2.3. වෙනත්:** 2024 ඔක්තෝබර් මස 22 සහ 23 දිනවල රුසියාවේ කසාන් හි පැවති Outreach/BRICS Plus සමුළුවට සමගාමීව, එවකට විදේශ ලේකම්වරිය සහ ඉන්දීය විදේශ ලේකම් වික්‍රම් මිස්රි සමඟ, ශ්‍රී ලංකාව BRICS සංවිධානයට සම්බන්ධ වීමට ගත් තීරණය සම්බන්ධයෙන් පැවති හමුවක් සම්බන්ධීකරණය කර පහසුකම් සලසන ලදී. එසේම නවදිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් බැංගලෝරයේ නිර්වේතනික කොන්සල්වරයා පත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

2024 අගෝස්තු මාසයේදී නවදිල්ලියේ සුෂ්මා ස්වරාජ් විදේශ සේවා ආයතනයේ අලුතින් බඳවා ගත් විදේශ සේවා නිලධාරීන් 10 දෙනෙකු සහ සමාන්තර සේවාවන්ට අයත් තවත් රජයේ නිලධාරීන් 13 දෙනෙකු පුහුණු කිරීම සඳහා පහසුකම් සැලසීය.

එසේම පාකිස්තානයේ ඉස්ලාමාබාද් හි විදේශ සේවා ඇකඩමියේ 30 වන කනිෂ්ඨ රාජ්‍යතාන්ත්‍රික පාඨමාලාව සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට අලුතින් බඳවා ගත් විදේශ සේවා නිලධාරීන් අතුරින් නිලධාරීන් දෙදෙනෙකු යොමු කිරීමට මෙම අංශය පහසුකම් සපයන ලදී. 2024 අගෝස්තු මාසයේදී ඉන්දීය රජය විසින් පවත්වන ලද The Voice of Global South Summit සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මාර්ගගත සහභාගීත්වයට අවශ්‍ය පහසුකම් සලසන ලදී. ඒ අතරම ඉන්දියාවේ ශ්‍රී ලාංකික ධීවරයින් සහ යාත්‍රා නිදහස් කිරීමටද මෙම අංශය පහසුකම් සලසන ලදී.

**14.2.4. අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම්:** 2024 දෙසැම්බර් 15 සිට 17 දක්වා අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දීය රාජ්‍ය සංචාරය අතරතුර, ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ශ්‍රී ලාංකික සිවිල් සේවකයින් සඳහා පුහුණු හා ශක්‍යතා වර්ධන වැඩසටහන් පිළිබඳ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් දෙකක් හුවමාරු කර ගන්නා ලදී.

**14.2.5. උපදේශන:** දකුණු ආසියානු අංශය, ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන්, 2024 ජූලි මස 30 වන දින ඉස්ලාමාබාද්හිදී ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අතර

විදේශ ලේකම් මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශනවල හත්වැනි වටයට පහසුකම් සපයන ලදී.

**14.2.6. ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම: ධීවර කටයුතු**: පවතින ධීවර ගැටලුව විසඳීම සඳහා, අමාත්‍යාංශය විසින් 2024 ඔක්තෝබර් 29 වන දින කොළඹදී පැවැති 6 වැනි the joint working group සමුළුවට පහසුකම් සපයන ලදී. මෙම රැස්වීමේ සම සභාපතිත්වය දරන ලද්දේ ඉන්දියාවේ ධීවර දෙපාර්තමේන්තුවේ ලේකම් සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් විසිනි.

**14.3. සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ පුද්ගල-පුද්ගල සබඳතා: මෙම අංශය විසින්** ශ්‍රී ලංකාවට පැමිණෙන දකුණු ආසියානු රටවල සංස්කෘතික කණ්ඩායම් සඳහා වීසා පහසුකම් සලසා දීමට අදාල පහසුකම් ලදී. ඩකාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය බංග්ලාදේශයේ ශ්‍රී ලංකා සංගමය (SLAB) සහ ශ්‍රී ලංකා - බංග්ලාදේශ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (SLBCCI) සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික හා ප්‍රජා ආශ්‍රිත සිදුවීම් සංවිධානය කිරීමට පහසුකම් සපයන ලදී. බංග්ලාදේශයේ ශ්‍රී ලංකා සංගමය (SLAB) ඩකාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන් 2024 නොවැම්බර් 22 වන දින Sheraton Dhak හෝටලයේදී ශ්‍රී ලංකා ගාලා රාත්‍රියක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලාංකිකයින්, බංග්ලාදේශ ව්‍යාපාරිකයින් සහ සුභ පතන්නන් 400 කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගී විය.

කත්මණ්ඩු නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා ප්‍රජාව සහ බෞද්ධ රටවල රාජ්‍යතාන්ත්‍රිකයින් සමඟ "වෙසක්" උත්සවය සමරන ලදී. තවද, ලුම්බිණියේ ශ්‍රී ලංකා මහා විහාරයේ කඨින පින්කම්, දීපවාලි සහ දශෛයින් උත්සව යනාදිය කාර්යාල පරිශ්‍රයේදී සමරනු ලැබීය. තවද 2024 Bhakatapur Cultural festival සඳහා දූත මණ්ඩල ප්‍රධානී සහභාගී විය. පාකිස්තානයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් බෞද්ධ රටවල සංස්කෘතික මධ්‍යස්ථාන සමඟ මිත්‍රත්ව සංස්කෘතික මධ්‍යස්ථාන ස්ථාපිත කර ගැනීම පිණිස සාකච්ඡාවක් සඳහා ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ මහ කොමසාරිස්තුමන් සහ පාකිස්තාන ජාතික උරුමයන් සහ සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ හමුවක් පැවැත්වීය.

එසේම ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා දිල්ලි පොදුරාජ්‍ය මණ්ඩලීය කාන්තා සංගමය (DCWA) විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනයට නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය. එහිදී දෙරට අතර රංගන කලා (නාට්‍ය) ක්ෂේත්‍රයේ සම්බන්ධතා ඇති කර ගැනීමේ හැකියාව සහ විශේෂඥතා වැඩසටහනක් සඳහා පහසුකම් සැලසීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා මහ කොමසාරිස් කාර්යාලය ජාතික නාට්‍ය පාසල (NSD) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. තවද 2025 පෙබරවාරි මාසයේදී පැවැත්වීමට නියමිත ඉන්දියාවේ ප්‍රමුඛ ජාත්‍යන්තර නාට්‍ය උළෙලක් වන Bharat Rang Mahotsav 2025 සඳහා සහභාගී වන ලෙස ඉන්දීය ජාතික නාට්‍ය පාසල විසින් ශ්‍රී ලාංකික සහභාගිවන්නන්ට ආරාධනා කරන ලදී.

ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉන්දියානු සංස්කෘතික සබඳතා කවුන්සිලය (ICCR) විසින් සංවිධානය කරන ලද ඉන්දියානු ජාත්‍යන්තර ජන උළෙලේ 8 වැනි සංස්කරණයට 2024 නොවැම්බර් 27 වැනි දින මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය. ශ්‍රී ලංකාව, කොලොම්බියාව, ස්ලොවැකියාව සහ ඉරාකය යන රටවල ජාත්‍යන්තර සංස්කෘතික කණ්ඩායම් මෙම උත්සවයට සහභාගී වූහ.

**14.4.විද්‍යා හා තාක්ෂණ රාජ්‍යතාන්ත්‍රිකභාවය**: බංග්ලාදේශයේ ශ්‍රී ලාංකා මහ කොමසාරිස්තුමා 2024 මාර්තු 10 වන දින ඪකාහි කෘෂිකර්ම අමාත්‍යාංශයේදී එවකට බංග්ලාදේශ කෘෂිකර්ම අමාත්‍ය ආචාර්ය එම්. අබ්දුස් ෂාහිඩ් මහතා හමුවිය. විශේෂයෙන් ඉහළ අස්වැන්නක් ලබා දෙන බීජ ප්‍රභේද භාවිතා කරමින් සහල් නිෂ්පාදනය සඳහා බංග්ලාදේශයේ පවතින හොඳම පිළිවෙත්, තාක්ෂණික විශේෂඥතාව සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම සඳහා නව විද්‍යාත්මක මුලපිරීම් හුවමාරු කරගැනීම යනාදිය කෙරෙහි මෙම සාකච්ඡාවලදී අවධානය යොමු විය.

තවද පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යයන හුවමාරු වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා පාකිස්තාන උසස් අධ්‍යාපන කොමිෂන් සභාවේ (HEC) සභාපතිවරයා සහ මහ කොමසාරිස්තුමා හමුවක් පවත්වන ලදී. එසේම ශ්‍රී ලාංකික සිසුන් 1000 ක් සඳහා වන අල්ලාමා ඉක්බාල් ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ එන විවිධ කරුණු සම්බන්ධයෙන් දූත මණ්ඩලය HEC හි ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සමඟ රැස්වීම් 06 ක් පවත්වන ලදී. නවදිල්ලියේ මහ කොමසාරිස් කාර්යාලය විසින් විවිධ NAM S&T Centre courses ශ්‍රී ලංකාවේ අදාල ආයතන වලට කාලෝචිත ලෙස බෙදා හැරීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. චෙන්නායි හි නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා 2024 ජූලි 5 වැනි දින වෙල්ලූර් තාක්ෂණ ආයතනයේ (VIT) අධ්‍යක්ෂ සහ ජාත්‍යන්තර සබඳතා ආචාර්ය නිත්‍යා වෙන්කේෂන් මහතා සමඟ හමුවක් පැවැත්වූ අතර ශ්‍රී ලාංකික සිසුන්ට ලබා ගත හැකි ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් සහ ශිෂ්‍යත්ව අවස්ථා පිළිබඳව එහිදී සාකච්ඡා කරන ලදී.

කත්මණ්ඩු හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දූත මණ්ඩල ප්‍රධානී පොක්‍රා හි පවත්වන ලද PHEWA සංවාදයට සහභාගී විය. නේපාලය සහ චීනය අතර සහයෝගීතාව සනිටුහන් කරමින් සහ කලාපීය සමෘද්ධිය සහ සාමය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති දිරිමත් කිරීම අරමුණු කරගත් ෆෙවා සංවාද මාලාව මෑතකදී ආරම්භ කරන ලදී. එමගින් කාර්මික වෙනස්කම් සහ නැගී එන අවශ්‍යතා ඇතුළුව දකුණු ආසියාවට බලපාන තීරණාත්මක ගැටලු සහභාගිවන්නන් සාකච්ඡා කිරීමට නියමිතව ඇත. මෙම මුලපිරීම කලාපය තුළ ආර්ථික ඒකාබද්ධතාව වැඩි දියුණු කිරීම සඳහා මනා කැපවීමක් පිළිබිඹු කරයි.

**14.5.ආරක්ෂක සහයෝගීතාව:** මෙම අංශය විසින් 2024 අගෝස්තු 30 වන දින කොළඹ ආරක්ෂක සමුළුවේ ආරම්භක ලියකියවිලි අත්සන් කිරීම, අනෙකුත් දකුණු ආසියානු රටවල ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් පුහුණු කිරීම, 2024 මැයි මාසයේදී පාකිස්තාන ජාතික ආරක්ෂක විද්‍යාලයේ නියෝජිත පිරිසක් සහ 2024 සැප්තැම්බර් මාසයේදී නවදිල්ලියේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීම යනාදී කටයුතු සඳහා පහසුකම් සපයන ලදී.

බංග්ලාදේශයේ ඪකාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන විවිධ හමුදා පුහුණු පාඨමාලා සඳහා බංග්ලාදේශ හමුදා නිලධාරීන්ට සහභාගී වීමට සහ බංග්ලාදේශයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ සහ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පැවති විවිධ හමුදා පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා හමුදා නිලධාරීන්ට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. තවද ආරක්ෂක සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා නේපාලයේ කත්මණ්ඩු හි තානාපතිවරයා නේපාල හමුදාවේ හමුදා මාණ්ඩලික ප්‍රධානියා හමුවිය. ශ්‍රී ලංකාවට පරිත්‍යාග කිරීමට සැලසුම් කර ඇති FT7 නියමු පුහුණු ප්‍රහාරක යානයේ අත්පත් කර ගැනීම අවසන් කිරීම, භෞතික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා 2024 සැප්තැම්බර් 25 සිට 29 දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිව් දෙනෙකුගෙන් යුත් දූත පිරිසකට පාක්ස්තානයට පැමිණීමට ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී. එසේම 2024 ඔක්තෝබර් 22 සිට 2024 ඔක්තෝබර් 26 දක්වා පාකිස්තානයේ පස් දින සංචාරයක් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් ආර්.ඒ.යූ.පී. රාජපක්ෂගේ සංචාරයක් සඳහා පහසුකම් සලසන ලදී.

නවදිල්ලි නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ජොෂ්ඨ හමුදා නිලධාරීන්ගේ ඉහළ මට්ටමේ සංචාර, හමුදා පුහුණු සහ අධ්‍යයන චාරිකා සඳහා පහසුකම් සපයන ලදී. ඉහළ මට්ටමේ ආරක්ෂක සහයෝගීතාවයේ කොටසක් ලෙස, ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි අතර, ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා දෙවන කාර්තුවේදී ඉන්දියාවට ගියේය. දෙරටේ ජාතික ආරක්ෂක උපදේශකයින් ද්විපාර්ශ්වික ආරක්ෂක සංවාද වැඩිදියුණු කරගැනීම සඳහා අන්‍යෝන්‍ය සංචාරවල නිරත විය. මීට අමතරව, හමුදාවන් අතර කාර්ය මණ්ඩල සාකච්ඡා සහ වාර්ෂික IMBL රැස්වීම ශ්‍රී ලංකාවේදී පැවැත්විණි. රියර් අද්මිරල් එම්.ඩී.කේ විජේවර්ධනගේ නායකත්වයෙන් යුත් සිව් දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා නාවික හමුදා දූත පිරිසක් 2024 දෙසැම්බර් 18 සිට 20 දක්වා නවදිල්ලියේ පැවති දෙරට අතර නාවික මාණ්ඩලික සාකච්ඡාවලට සහභාගී වූහ.

තවද මෙම අංශ විසින් ශ්‍රී ලංකා හමුදාව සහ අනෙකුත් දකුණු ආසියානු රටවල හමුදාව අතර ඒකාබද්ධ හමුදා අභ්‍යාස සඳහා පහසුකම් සපයන ලදී. එසේම ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හමුදා සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව ඉන්දියාවේ මිලාන් සහ තරංග ශක්ති අභ්‍යාස යනාදිය සඳහාද සහභාගී වීමට අවශ්‍ය පහසඅකම් සලසන ලදී. ඊට සමගාමීව, ඉන්දීය හමුදාවේ සාමාජිකයින් 106 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ මිත්‍ර ශක්ති අභ්‍යාසයට සහභාගී විය. මීට අමතරව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ SLNS Sayura නෞකාව 2024 දෙසැම්බර් 16 වන දින ශ්‍රී ලංකා ඉන්දීය නාවික අභ්‍යාසය සඳහා විශාකාපට්නම් වරායට පැමිණියේය. ශ්‍රී ලංකාව සහ දකුණු ආසියානු රටවල් අතර ආරක්ෂක සංවාද, හමුදා අතර සාකච්ඡා, IMBL රැස්වීම සඳහා පහසුකම් සපයන ලදී. චෙන්නායි වරාය අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් පිලිපීනයෙන් ශ්‍රී ලංකාවට පතොරම් තොගයක් ප්‍රවාහනය කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට සහාය විය.

## 15. අග්නිදිග ආසියාව සහ මධ්‍යම ආසියානු අංශය

ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතම විදේශ ප්‍රතිපත්ති මූලධර්මවලින් එකක් වන්නේ අග්නිදිග සහ මධ්‍යම ආසියානු කලාප සමඟ සහයෝගීතාව පුළුල් කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචනයට භාජනය වන කාලය තුළ, එනම් 2024 ජනවාරි 01 සිට 2024 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ මෙම කලාප දෙක සමඟ සම්බන්ධතාව වර්ධනය කිරීමට ඒකාබද්ධ උත්සාහයන් ගන්නා ලදී. ආසියාන් කලාපය සමඟ සමීප දේශපාලන, ආර්ථික සහ සමාජීය සබඳතා ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ආසියාන් කලාපය සමඟ සම්බන්ධතාවය වැඩි කළේය. අග්නිදිග ආසියාවේ භූ දේශපාලනික භූ දර්ශනය හැඩගස්වන වැදගත් කලාපීය මධ්‍යම බලවතෙකු ලෙස ආසියාන් නැගී සිටී. 2023 දී ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 3.8 ක ඒකාබද්ධ දළ දේශීය නිෂ්පාදිතයක් සමඟ ආසියාන් ලෝකයේ 5 වන විශාලතම ආර්ථිකය ලෙස ස්ථානගත වී ඇති අතර ගෝලීය වශයෙන් සිදුවන වර්ධනයේ බලපෑම සමඟ සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට ද පත්ව ඇත.

ඓතිහාසික හා නූතන සන්දර්භයන් තුළ ශ්‍රී ලංකාව සහ ආසියාන් සාමාජික රටවල් අතර සම්බන්ධතාව ඉතා වැදගත් වේ. අග්නිදිග ආසියාව සමඟ ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සම්බන්ධතා එහි ශක්තිමත් කලාපීය සබඳතා පිළිබඳ සාක්ෂියක් ලෙස පවතී, සමහර විට එය ඉන්දියාව සහ මාලදිවයින සමඟ ඇති සම්බන්ධතා වලට පමණක් දෙවැනි විය හැකිය. ගෝලීය අවකාශය තුළ මධ්‍යම ආසියානු රටවල් කෙරෙහි වර්ධනය වන වැදගත්කම සැලකිල්ලට ගෙන, සමීප සබඳතා ඇති කර ගැනීමට ද මෙම කාලය තුළ උත්සාහයන් ගෙන ඇත. ශ්‍රී ලංකාව ක්‍රි.පූ. 3 වන සියවසේ සිට මධ්‍යම ආසියාව සමඟ දිගුකාලීන සබඳතා භුක්ති විඳි අතර, එම කාලයේ සමුද්‍රීය සේද මාර්ගයේ වැදගත් නැවතුමක් ලෙස සඳහන් කලහැක. මධ්‍යම ආසියාව යනු තෙල්, ගෑස් සහ දුර්ලභ ඛනිජ අඩංගු ලොව ප්‍රමුඛතම බලශක්ති ගබඩාවකි.

**15.1. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** අග්නිදිග ආසියාව සමඟ ආර්ථික ඒකාබද්ධතාව වර්ධනය කිරීම සඳහා සිදු කරන ලද පුළුල් කාර්යයේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචනයට භාජනය වන කාලය තුළ ශ්‍රී ලංකාව - තායිලන්තය නිදහස් වෙළඳ ගිවිසුම 2024 පෙබරවාරි 03 වන දින අත්සන් කරන ලදී. 2024 මාර්තු 14 වන දින, ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ ඉන්දුනීසියාවේ වෙළෙඳ උප අමාත්‍යවරයා අතර පැවති මාර්ගගත රැස්වීමකදී ශ්‍රී ලංකා - ඉන්දුනීසියානු වරණීය වෙළෙඳ ගිවිසුම (PTA) සඳහා සාකච්ඡා විධිමත් ලෙස දියත් කරන ලද අතර, මැලේසියාව සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළැඹීම පිළිබඳ සාකච්ඡා පැවැත්වෙමින් පවතී. ඉන්දුනීසියාවේ වෙළෙඳ සාකච්ඡා කමිටුවේ පළමු රැස්වීම 2024 අප්‍රේල් මාසයේදී පවත්වන ලද අතර, දෙවන වටයේ සාකච්ඡා 2024 ජූලි මාසයේදී කොළඹදී පැවැත්විණි. තායිලන්තය, ඉන්දුනීසියාව සහ මැලේසියාව ඇතුළු රටවල් 35 ක් සඳහා නිදහස් වීසා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගත් අතර එය නැවත දැනුම් දෙන තුරු දීර්ඝ කර ඇත. තායිලන්තය 2024 ජූලි මාසයේ සිට ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍ර හිමියන් සඳහා දින 60ක වීසා රහිත කාලයක්ද ක්‍රියාත්මක කර ඇත. සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර හිමියන් සඳහා දින 60ක රැඳී සිටීමේ කාලයක් සඳහා වීසා රහිත ගිවිසුමක් සඳහා දෙරට සාකච්ඡා කරමින් සිටී.

තවද, අග්නිදිග ආසියානු කලාපයට ව්‍යාපාරික නියෝජිතයින්, වාණිජ මණ්ඩල සහ අපනයනකරුවන් කිහිප දෙනෙකුගේ සංචාර සමඟ ව්‍යාපාර අතර සම්බන්ධතා පහසු කරන ලදී. රටේ ආයෝජන විභවය හඳුන්වා දීමට ද අඛණ්ඩ උත්සාහයන් ගන්නා ලදී. කලාපයේ වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සහභාගීත්වයට පහසුකම් සපයන ලදී. උපායමාර්ගික භූ-ආර්ථික ප්‍රවේශ, බලශක්තිය, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් එහි භූ දේශපාලනික වැදගත්කම හේතුවෙන් මෙම අංශය මධ්‍යම ආසියාව සමඟ සම්බන්ධ වීමට ප්‍රමුඛත්වය දෙයි. 2024 අප්‍රේල් මාසයේදී, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා අපනයන, ආයෝජන, සංචාරක සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා කසකස්තානය සහ කිර්ගිස්තානය සමඟ විදේශ කාර්යාල උපදේශන (FOC) මෙහෙයවීය. 2024 මැයි මාසයේදී ටර්ක්මෙනිස්තානය සමඟ අධ්‍යක්ෂ ජනරාල් මට්ටමින් මාර්ගගත ක්‍රමයට උපදේශනයක් පවත්වන ලද අතර ඉහත සඳහන් මුලපිරීම් ඉදිරියට ගෙන යෑම සඳහා ටර්ක්මෙනිස්තානයේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ දෙරටේ වරාය බලධාරීන් අතර මාර්ගගත ක්‍රමයට රැස්වීම් පවත්වන ලදී. ඊට අමතරව, කලාපයේ නිර්වේතනික කොන්සල්වරු මධ්‍යම ආසියානු කලාපයේ ශ්‍රී ලංකා තේ සහ අනෙකුත් අපනයන නිෂ්පාදන ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරති.

**15.1.1. සංචාර**: බැංකොක්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, 2024 පෙබරවාරි මස 3 සහ 4 යන දිනවල තායිලන්ත අගමැති ශ්‍රෙතා තාවිසින්ගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා පහසුකම් සැලසූ අතර, එහිදී ඔහු 76 වන නිදහස් දින සැමරුම් උත්සවයේ ගෞරවනීය ආරාධිත අමුත්තෙකු ලෙසද සහභාගී විය. මෙම සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස, වැදගත් සන්ධිස්ථානයක් වන තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) අත්සන් කිරීම, ගුවන් සේවා ගිවිසුම අලුත් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම යනාදිය සිදු විය. සහයෝගීතාව සඳහා හඳුනාගත් ප්‍රධාන අංශ අතර ධීවර කර්මාන්තය, පුනර්ජනනීය බලශක්තිය සහ ආහාර සැකසීම ඇතුළත් විය. එසේම, ධීවර හා පුනර්ජනනීය බලශක්ති අංශවල අවස්ථා ගවේෂණය කිරීම සඳහා තායිලන්ත නියෝජිතයින් තිදෙනෙකු 2024 අප්‍රේල්/මැයි සහ අගෝස්තු මාසවලදී ශ්‍රී ලංකාවට පැමිණි අතර, තායිලන්ත ආහාර සැකසුම් සමාගමක් ද ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීමේ හැකියාව සාකච්ඡා කිරීම සඳහා තායිලන්ත අසල්වැසි රටවල ආර්ථික සංවර්ධන සහයෝගීතා ඒජන්සියේ (NEDA) නියෝජිත පිරිසක් 2024 අප්‍රේල් මාසයේදී සංචාරය කළහ.

**15.1.2. ශ්‍රී ලාංකේය නිෂ්පාදන හඳුන්වාදීම**: ජකර්තාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය උසස් ටයර් නිෂ්පාදකයෙකු වන Atire (Pvt) Ltd, ඉන්දුනීසියානු වෙළෙඳපොළට හඳුන්වා දීමට පහසුකම් සැලසූ අතර, ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ ඉන්දුනීසියාවේ ඉදිකිරීම් සහ බලශක්ති අංශවල ආයෝජන අවස්ථා ඉස්මතු කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය

කළේය. තවද 2024 සැප්තැම්බර් මාසයේදී පිලිපීනයට හේකාබ් නියෝජිත පිරිසේ සංචාරය සඳහා මැනිලා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය පහසුකම් සැලසූ අතර, එම කාලය තුළ ඉඩම් බදු දීම පිළිබඳ ගිවිසුමකට එළඹුණු අතර, ගිවිසුම සම්බන්ධයෙන් ඔක්තෝබර් මැද භාගයේදී පසු විපරම් සංචාරයක් සැලසුම් කරන ලදී. මීට අමතරව, 2024 අගෝස්තු මස 1-3 දක්වා MediPharm Expo 2024 සඳහා Astron Ltd., Morison Ltd. සහ Gamme Interpharm (Pvt) යන සමාගම් සහභාගී කරවීමට හැනෝයි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහාය විය.

**15.1.3. වරාය සහ සමුද්‍ර ආයෝජන සහ සංවර්ධන:** සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ප්‍රධාන මුලපිරීම් කිහිපයක් සම්බන්ධීකරණය කිරීමෙන් වරාය සංවර්ධනය සහ ඒ ආශ්‍රිත ආයෝජන සක්‍රියව ප්‍රවර්ධනය කර ඇත. 2024 පෙබරවාරි 27-29 දක්වා, මහ කොමසාරිස් කාර්යාලය කොළඹ වරාය නගරයේ ආයෝජන ප්‍රවර්ධන අධ්‍යක්ෂවරයාගේ සංචාරය සඳහා පහසුකම් සැලසූ අතර, සිංගප්පූරු වාණිජ මණ්ඩල නිලධාරීන් සහ විභව ආයෝජකයින් සමඟ රැස්වීම් සංවිධානය කළේය. 2024 මාර්තු මාසයේදී, ආයෝජන අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා සිංගප්පූරුව පදනම් කරගත් ගැනුම්කරුවන් සමඟ රැස්වීම් සංවිධානය කරමින්, ආසියා පැසිෆික් සමුද්‍ර ප්‍රදර්ශනයට කොළඹ ඩොක්යාර්ඩ් සහභාගී වීමට සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහය විය. මීට අමතරව, 2024 අප්‍රේල් 22 වන දින, බෝට්ටු සහ යාත්‍රා කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා එක්ව කටයුතු කිරීමේ අරමුණින්, සිංගප්පූරු බෝට්ටු කර්මාන්ත සංගමය (SBIA) සහ ශ්‍රී ලංකා සමුද්‍ර කර්මාන්ත මණ්ඩලය (CMISL) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

**15.1.4. මැණික් සහ ස්වර්ණාභරණ:** ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සහ තායිලන්තයේ මැණික් හා ස්වර්ණාභරණ ආයතනය අතර 2024 පෙබරවාරි මාසයේදී අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලද අතර, එම අංශ දෙක අතර සහයෝගීතාව වැඩි දියුණු කරන ලදී. 2024 ජූනි/ජූලි මාසවල රත්නපුර ජාත්‍යන්තර මැණික් ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා කිර්ගිස් ජනරජයේ නියෝජිත පිරිසකගේ සංචාරය ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ඊට අමතරව, හැනෝයි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ජාත්‍යන්තර ආභරණ වියට්නාමය 2024 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික සමාගම් පහක සහභාගීත්වයට සහාය වූ අතර, වියට්නාම මැණික් ගල් සංගමයේ (VAG) අට දෙනෙකුගෙන් යුත් නියෝජිත පිරිසක් රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය 2024 සඳහා සහභාගී විය.

**15.1.5. ගුවන් සේවා ගිවිසුම් සහ වීසා පහසුකම් සැපයීම:** ශ්‍රී ලංකාවට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා, අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශය සහ දූත මණ්ඩල සම්බන්ධීකරණයෙන් වීසා ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැලසීම සහ ගුවන් සේවා ගිවිසුම් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. 2024 පෙබරවාරි මාසයේදී, තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර ගුවන් සේවා ගිවිසුම අලුත් කරන ලද අතර, එමඟින් තායිලන්ත ගුවන් සේවයට 2024 මාර්තු 31 වන දින සිට ශ්‍රී ලංකාවට දිනපතා ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට ඉඩ සැලසේ. මීට අමතරව, කසකස්තානයේ ජාතික ගුවන් සේවය වන එයාර් ඇස්ටානා, 2023 දෙසැම්බර් මාසයේදී සෘජු කුලී මෙහෙයුම් නැවත ආරම්භ කළ අතර, එමඟින් කසකස්තානයෙන් සංචාරකයින්ගේ පැමිණීම් වැඩි වූ අතර එය 2024 අප්‍රේල් අවසානය වන විට 8,450 දක්වා ළඟා විය. තවද, කසකස්තානයේ සහ තායිලන්තයේ සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර හිමියන් සඳහා සංචාරක පැමිණීම් පහසු කිරීම සඳහා අන්‍යෝන්‍ය වීසා රහිත විධිවිධානයක් සඳහා සාකච්ඡා දැනට සිදුවෙමින් පවතී.

**15.1.6. කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව:** කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය අදාළ කලාපවල දූත මණ්ඩල සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. 2024 අප්‍රේල් මාසයේදී, සිංගප්පූරු ආහාර ඒජන්සියේ සහකාර ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය අබ්දුල් ජලීල් අබ්දුල් කාර්ඩර්ගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක්, සිංගප්පූරුව සඳහා අනුමත කුකුළු නිෂ්පාදන ආශ්‍රිත දේශීය සමාගම් ඇගයීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ. එම දූත පිරිස සහල් සැකසුම් කම්හලක්, පලතුරු සහ එළවළු සැකසුම් මධ්‍යස්ථානයක් සහ මුහුදු ආහාර අපනයන සමාගමක් නැරඹීමට ගිය අතර, විභව සේවාදායකයින් විසින් ඇගයීම

සඳහා විවිධ සහල් සැකසුම් කම්හල්වලින් සාම්පල ඉදිරිපත් කළහ. වියට්නාමයේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය ගරු මින් හෝන් ලී සහ මැලේසියාවේ කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය ගරු මොහොමඩ් බින් සාබු යන මහත්වරු 2024 පෙබරවාරි 21 වන දින FAO හි ආසියාව සහ පැසිෆික් කලාපීය සමුළුවේ 37 වන සැසිවාරයට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ. සමුළුවට සමගාමීව, 2024-2026 සඳහා කෘෂිකාර්මික සංවර්ධන සහයෝගීතාව සඳහා වැඩ සැලැස්මක් වියට්නාමය සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කරන ලදී.

**15.1.7. ඩිජිටල් ආර්ථිකය:** 2024 ජුනි 25 වන දින පැවති Digi Econ ගෝලීය ආයෝජන සමුළුව 2024 ට සහභාගී වීම සඳහා සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරියේ ප්‍රධාන මූල්‍ය තාක්ෂණ නිලධාරී සහ Board of Elevandi හි සභාපතිවරයාගේ නායකත්වයෙන් යුත් දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණීමට සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය පහසුකම් සැලසීය. මෙම සංචාරයේ අරමුණ වූයේ විශේෂයෙන් ඩිජිටල් ආර්ථිකයට අනුකූල ක්ෂේත්‍රවල කුසලතා සංවර්ධනය සඳහා සහයෝගීතා හැකියාව ගවේෂණය කිරීමයි. මීට අමතරව, බැංකොක්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් 2024 ජුනි 23-25 දිනවල ශ්‍රී ලංකාවට පැමිණීමට තායිලන්ත වාණිජ මණ්ඩලයේ සහ තායිලන්ත වෙළෙඳ මණ්ඩලයේ සභාපති සනන් අන්ගුබොල්කුල්ගේ ප්‍රධානත්වයෙන් යුත් හත් දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් සංවිධානය කරන ලදී. ජුනි 19-23 දක්වා පැවති 2024 ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනයට සහ DigiEcon ගෝලීය ආයෝජන සමුළුවට සහභාගී වීම සඳහා ඔවුන් 2024 ජුනි 23-25 දිනවල ශ්‍රී ලංකාවට පැමිණියහ.

**15.1.8. රැකියා අවස්ථා:** ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා සොයා ගැනීමට මෙම අංශය සහ එහි දූත මණ්ඩල ප්‍රමුඛත්වය දුන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස, සිංගප්පූරු සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, සිංගප්පූරු මහජන සෞඛ්‍ය සේවා පද්ධතියට ශ්‍රී ලාංකික හෙදියන් 420 ක් පමණ බඳවා ගැනීම ආරම්භ කළ අතර, 2024 මාර්තු 15 වන දින හෙදියන් 100 ක් පැමිණියහ. ඊට අමතරව, නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවෙන් සහායක පොලිස් නිලධාරීන් 250 ක් බඳවා ගැනීමට සිංගප්පූරුව කැමැත්ත පළ කළ අතර, නිලධාරීන් 25 දෙනෙකු දැනටමත් යොදවා ඇති අතර බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. තවද, ක්වාලාලම්පූර් හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය , ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය (SLBFE) සමඟ හවුල්කාරිත්වයෙන්, මැලේසියාවේ ඉදිකිරීම්, නිෂ්පාදන, වතු සහ ආරක්ෂක අංශවල ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා සක්‍රියව සොයමින් සිටින අතර, මෙම ක්ෂේත්‍රවල සේවකයින් 500,000 සිට 750,000 දක්වා පමණ හිඟයක් පවතී. සේවකයින් බඳවා ගැනීම, රැකියාවල යෙදවීම සහ නැවත මෙරටට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් (MoU) සම්බන්ධ කටයුතුද දෙරට කටයුතු කරමින් සිටී.

**15.2.දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකභාවය:** අග්නිදිග ආසියාව සහ මධ්‍යම ආසියානු කලාප සමඟ දේශපාලනික වශයෙන් සබඳතා වර්ධනය කර ගැනීමට ගත් තීරණයට අනුකූලව, සමාලෝචනයට භාජනය වන කාලය තුළ සැලකිය යුතු පියවර කිහිපයක් ගන්නා ලදී. කලාපීය සබඳතා ශක්තිමත් කිරීම සඳහා සහ ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව (CICA) සමඟ සබඳතා ශක්තිමත් කිරීම සඳහා 2025 දී අස්තානා, කසකස්තානය සහ කොළඹ යන නගරවල අන්‍යෝන්‍ය රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල විවෘත කිරීමට මෙම අංශය පහසුකම් සැලසීය. මධ්‍යම ආසියාව සමඟ දේශපාලන සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, CICA මහලේකම්වරයෙකුගේ ශ්‍රී ලංකාවේ පළමු සංචාරය සනිටුහන් කරමින් CICA මහලේකම් තානාපති කයිරත් සාරිබේගේ සංචාරය 2024 පෙබරවාරි මාසයේදී සංවිධානය කරන ලදී. 2024 අප්‍රේල් මාසයේදී කසකස්තානය සහ කිර්ගිස්තානය සමඟ සහ 2024 මැයි මාසයේදී ටර්ක්මෙනිස්තානය සමඟ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන ද පවත්වන ලදී.

**15.2.1. ඉහළ පෙළේ සංචාර**: කලාපයේ දූත මණ්ඩල සමඟ සහයෝගයෙන්, රාජ්‍යතාන්ත්‍රික සබඳතා වැඩි දියුණු කිරීම සඳහා 2024 දී ඉහළ මට්ටමේ සංචාර කිහිපයක් සංවිධානය කරන ලදී. විශේෂයෙන්, හිටපු ජනාධිපති වික්‍රමසිංහ මහතා මැයි මාසයේදී ඉන්දුනීසියාවේ පැවති 10 වන ලෝක ජල සංසදයට සහභාගී වූ අතර, එහිදී ඔහු ලෝක ජල සංසදයට සමගාමීව ඉන්දුනීසියානු ජනාධිපති ජෝකෝ

විඩෝඩෝ සහ සමුද්‍රීය කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පැවැත්විය. 2025 පළමු කාර්තුවේදී ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර වරණීය වෙළඳ ගිවිසුමක් (PTA) අවසන් කිරීම කෙරෙහි සාකච්ඡා කේන්ද්‍රගත විය. ජල රාජ්‍ය තාන්ත්‍රිකභාවය බලගැන්වීම සහ නිවර්තන තීරය, සමුද්‍ර ආර්ථිකය සහ මුහුදු පැලෑටි කර්මාන්තය සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා ද්විපාර්ශ්වික කාර්ය සාධක බලකායක් පිහිටුවීම, කඩොලාන වගාව පිළිබඳ පර්යේෂණ සහයෝගීතාව ද මෙම සාකච්ඡාවලට ඇතුළත් විය. දේශගුණික ක්‍රියාකාරකම් සහ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා කැපවීමක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකාව තවත් රටවල් 09 ක් සමඟ අභිප්‍රාය ලිපිය (Leter of Intent (LoI)) අත්සන් කිරීමෙන් ගෝලීය මිශ්‍ර මූල්‍ය සන්ධානයට (GBFA) සම්බන්ධ විය. ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර සමුද්‍රීය සංවාදයක් ස්ථාපිත කිරීම පිළිබඳව ද දෙපාර්ශ්වය සාකච්ඡා කළහ.

ඊට සමගාමීව, සිංගප්පූරුව සමඟ ද්විපාර්ශ්වික සහයෝගීතාවයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. 2024 මුල් භාගයේදී සිංගප්පූරුවේ අනේවාසික මහ කොමසාරිස්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු අලි සබ්රි මහතාගේ පළමු නිල සංචාරය 2024 ජූලි 7 වන දින සිදු විය. විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සිංගප්පූරු සංචාරය අතරතුර, සිංගප්පූරුවවිදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය විවියන් බාලක්‍රිෂ්ණන්, ස්වදේශ කටයුතු සහ නීති අමාත්‍ය ගරු කේ. ෂන්මුගම් සහ සිංගප්පූරුවේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ලී හ්සියන් ලූං ඇතුළු සිංගප්පූරු ඉහළ පෙළේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විණි.

මීට අමතරව, මැනිලාහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ සම්බන්ධීකරණ උත්සාහයන් හරහා, ශ්‍රී ලංකාව 2024 දී විවිධ අංශ හරහා පිලිපීනය සමඟ සහයෝගීතාව වැඩි දියුණු කළේය. ආසියා සහ පැසිෆික් ආහාර සුරක්ෂිතතා සංසදයට සහභාගී වීම, කාන්තා නායකත්වය වැඩිදියුනු කල ක්‍රියාකාරකම් සහ ආපදා කළමනාකරණය පෝෂණය කළ ක්‍රියාකාරකම් සැලකිය යුතු ක්‍රියාකාරකම් අතර විය. අන්‍යෝන්‍ය නීති ආධාර ගිවිසුමක් (MLAT) සහ දඬුවම් නියම වූ පුද්ගලයින් මාරු කිරීමේ ගිවිසුම (TTSP) සඳහා වූ පළමු සාකච්ඡා නීතිමය සහයෝගීතාවයේ සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම මුලපිරීම්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පිළිබඳ කටයුතු සමඟින්, ශ්‍රී ලංකාව සහ පිලිපීනය අතර ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික හවුල්කාරිත්වය තවත් වර්ධනය කළේය. තවද, 2024 අගෝස්තු මාසයේදී තායිලන්ත විදේශ කටයුතු අමාත්‍යාංශයේ දකුණු ආසියාව, මැදපෙරදිග සහ අප්‍රිකානු කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකාවට කළ සංචාරය කලාපයේ අඛණ්ඩ රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාකාරකම් ඉස්මතු කළේය.

**15.2.2. අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අත්සන් කිරීම:** අග්නිදිග සහ මධ්‍යම ආසියාවේ දූත මණ්ඩල සමඟ එක්ව විවිධ අංශ හරහා ද්විපාර්ශ්වික ගිවිසුම් ආරම්භ කිරීමට, අවසන් කිරීමට සහ අලුත් කිරීමට පියවර ගන්නා ලදී. 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත සඳහන් අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් අත්සන් කරන ලදී. ශ්‍රී ලංකාව - තායිලන්තය නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA) 2024 පෙබරවාරි 03 වන දින අත්සන් කරන ලදී, තායිලන්තය සමඟ ගුවන් සේවා ගිවිසුම අලුත් කරන ලද අතර එය 2024 පෙබරවාරි 03 වන දින අත්සන් කරන ලදී. ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම 2024 පෙබරවාරි 03 වන දින අත්සන් කරන ලදී.

2024-2026 වසර සඳහා රටවල් දෙකක් අතර කෘෂිකාර්මික සංවර්ධන සහයෝගීතාව සඳහා වැඩ සැලැස්මක් ලෙස අභිප්‍රාය ලිපියක් වියට්නාමයේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා වැවිලි අමාත්‍යාංශය අතර 2024 පෙබරවාරි 21 වන දින අත්සන් කරන ලදී. එසේම වියට්නාම් බෞද්ධ සංඝයා සහ සමස්ත ලංකා බෞද්ධ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. 10 වන ලෝක ජල සංසදයට සහභාගී වූ හිටපු ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉන්දුනීසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කොංගෝව, ෆීජී, ලක්සම්බර්ග්, කැනඩාව සහ කෙන්යාව සමඟ ගෝලීය මිශ්‍ර මූල්‍ය සන්ධානයේ (GBFA) ආරම්භක සාමාජිකයෙක් ලෙස අභිප්‍රාය ලිපිය 2024 මැයි මස 20 වන දින අත්සන් කරන ලදී. 1988 දී අත්සන් කරන ලද තායිලන්ත වෙළඳ මණ්ඩලය සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම අලුත් කිරීම. සිංගප්පූරු බෝට්ටු කර්මාන්ත සංගමය (SBIA) සහ ශ්‍රී ලංකා සමුද්‍ර කර්මාන්ත මණ්ඩලය (CMISL) සමඟ අවබෝධතා ගිවිසුම 2024 අප්‍රේල් 22 වන දින අත්සන් කරන ලදී. ශ්‍රී

ලංකාව සහ කිර්ගිස්තානය අතර 2024 අප්‍රේල් 15 වන දින අත්සන් කරන ලද ද්විපාර්ශ්වික උපදේශන පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

### 15.3.බහුපාර්ශ්වික සබඳතා

**15.3.1. ආසියාන් කලාපීය සංසදය (ARF):** ශ්‍රී ලංකාව නිරායුධකරණය, ප්‍රගුණනය නොකිරීම, ආපදා සහන සහ ආරක්ෂක විශ්ව විද්‍යාල සහයෝගීතාව වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් ආසියාන් කලාපීය සංසදය (ARF) සමඟ ඇති සම්බන්ධතාවය සැලකිය යුතු ලෙස ශක්තිමත් කළේය. 2024 අප්‍රේල් මාසයේදී වියට්නාමය සහ බංග්ලාදේශය සමඟ සහයෝගීතාවයෙන් මාර්ගගතව පැවති ආපදා සහන පිළිබඳ 22 වන ARF අන්තර්-සැසිවාර රැස්වීමේ ශ්‍රී ලංකාවේ සම-සභාපතිත්වය සඳහා මෙම අංශය පහසුකම් සැලසීය. ඊට අමතරව, තායිලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය සමඟ එක්ව ඇමරිකා එක්සත් ජනපදයේ හොනොලුලු හි පැවති ප්‍රගුණනය නොකිරීම සහ නිරායුධකරණය පිළිබඳ 15 වන ARF අන්තර්-සැසිවාර රැස්වීමේ සම-සභාපතිත්වය ශ්‍රී ලංකාව විසින් දරන ලදී. 2024 ජුනි මාසයේදී ලාඕසයේ පැවති ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමෙන් (SOM) පසුව, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2024 ජූලි මාසයේදී ලාඕසයේ වියන්ටියාන් හි පැවති 31 වන ARF හි ශ්‍රී ලංකාව නියෝජනය කළේය. 2025 ජනවාරි මාසයේදී කාම්බෝජය සමඟ එක්ව, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන 26 වන ARF ආරක්ෂක විශ්වවිද්‍යාල, විද්‍යාල සහ ආයතන ප්‍රධානීන්ගේ රැස්වීම (HDUCIM) සඳහා ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය සපයනු ලැබේ.

**15.3.2. ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව (CICA):** ආසියාවේ සාමය සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමේ සංසදයක් වන ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුව (CICA) සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා මෙම අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. 2018 දී පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු, ශ්‍රී ලංකාව CICA සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වී ඇති අතර, එම අංශය දැනට ක්‍රියාත්මක වන විශේෂ ක්‍රියාකාරී කණ්ඩායම (SWG) සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටු (SOC) රැස්වීම්වලට සහභාගී වීමට පහසුකම් සපයයි. 2024 පෙබරවාරි මාසයේදී CICA මහලේකම් තානාපති කයිරත් සාරිබේගේ සංචාරය ද මෙම අංශය සංවිධානය කළ අතර අගෝස්තු මාසයේදී පරිසරය පිළිබඳ CICA අමාත්‍ය සමුළුවට මාර්ගගත සහභාගීත්වය ලබා දුනි. මීට අමතරව, 2024 ඔක්තෝබර් මාසයේදී ස්වේච්ඡා ව්‍යාපාර නායකයින්ගේ රැලියට සහභාගී වූ තරුණ ස්වේච්ඡා සේවකයින් තිදෙනෙකු සමඟින්, ශ්‍රී ලංකාව CICA තරුණ කවුන්සිලයට සාමාජිකයෙකු නම් කළේය. බීජිං හි පැවති පතල් ආරක්ෂාව අවදානම් වැළැක්වීම සහ පාලනය පිළිබඳ 2 වන CICA ජාත්‍යන්තර සමුළුවේදී පතල් ආරක්ෂාව පිළිබඳ විශේෂඥයෙකු ද ශ්‍රී ලංකාව නියෝජනය කළේය. මීට අමතරව, ශ්‍රී ලංකාව ක්‍රියාකාරකම් දෙකක් යෝජනා කළේය, එනම් කාන්තා සහ ස්ත්‍රී පුරුෂ අයිතිවාසිකම් සහතික කිරීම පිළිබඳ වෙබිනාර් සාකච්ඡාවක්, ව්‍යවස්ථාදායක පියවර බෙදා ගැනීම සහ CICA සාමාජික රටවල භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා පොදු විද්‍යුත් වාණිජ්‍ය අලෙවිකරණ වේදිකාවක් සංවර්ධනය කිරීම ඇතුළුව 2025 සඳහා විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ CICA නාමාවලියට ඇතුළත් කිරීම. මෙම මුලපිරීම ශ්‍රී ලංකාවේ කාන්තා, ළමා හා යෞවන කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සිදු කෙරේ.

**15.3.3. මධ්‍යම ආසියානු සංසදය:** මෙම අංශය, think tank Geopolitical Cartographer සමඟ සහයෝගයෙන්, 2024 අගෝස්තු 21 වන දින කොළඹදී මධ්‍යම ආසියානු සංසදයක් සංවිධානය කළ අතර, ශ්‍රී ලංකාව මධ්‍යම ආසියාව සමඟ ඇති සම්බන්ධතාව වැඩි දියුණු කිරීම සඳහා එහි උපායමාර්ගික හා ආර්ථික වැදගත්කම අවධාරණය කළේය. ගෝලීය සම්බන්ධතාව සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස කලාපයේ තීරණාත්මක භූමිකාව ඉස්මතු කරමින්, මධ්‍යම ආසියාවේ පොහොසත් ස්වාභාවික සම්පත් සහ භූ දේශපාලනික ගතිකත්වය ශ්‍රී ලංකාවට වැදගත් අවස්ථා ලෙස ඉස්මතු කළේය.

**15.4.7 වැනි CICA අමාත්‍ය මණ්ඩල රැස්වීම:** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා 2024 දෙසැම්බර් 17 වන දින මාර්ගගතව පැවති ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) 7 වැනි අමාත්‍ය මණ්ඩල රැස්වීම අමතමින්, CICA සංවිධානය පූර්ණ ජාත්‍යන්තර සංවිධානයක් බවට පරිවර්තනය කිරීමට ශ්‍රී ලංකාවට ඇතිකැපවීම සහ CICA සමඟ වර්ධනය වන සම්බන්ධතාව ඉස්මතු කළේය. සාමූහික උත්සාහයන් තුළින් ආසියාව පුරා ස්ථාවරත්වය, සමෘද්ධිය සහ ආර්ථික සංවර්ධනය සහතික කිරීමේදී CICA ආයතනයට ඉටු කළ හැකි වැදගත් කාර්යභාරය අමාත්‍ය හේරත් මහතා අවධාරණය කළේය. ආහාර සුරක්ෂිතතාව, දේශගුණික මූල්‍යකරණය, කාන්තා සවිබල ගැන්වීම සහ නාගරීකරණය ඇතුළු කලාපයේ ප්‍රධාන අභියෝගවලට මුහුණ දීම සඳහා පිහිටුවන ලද CICA ව්‍යාපෘති සමාලෝචන කමිටුව යටතේ අරමුදල් මාර්ගයක් සංවර්ධනය කිරීම ද අමාත්‍යවරයා පිළිගත්තේය.

**15.5.කොන්සියුලර් රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ සංක්‍රමණික කම්කරු සුභසාධනය**: පිලිපීනයේ රැඳවුම් මධ්‍යස්ථානයකින් ශ්‍රී ලාංකිකයන් තිදෙනෙකු නිදහස් කිරීම සඳහා මැනිලා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ආගමන කාර්යාංශය (BI) සමඟ සම්බන්ධීකරණය කරන ලදී. මේ අතර, මොස්කව් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කොන්සියුලර් සහාය ලබා දෙමින් උස්බෙකිස්තානයේ රඳවා තබා සිරගත කර සිටි ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කළේය. ඊට අමතරව, සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් 406 දෙනෙකු සඳහා සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාරයාලය සාර්ථකව රැකියා අවස්ථා ලබා දුන්නේය.

**15.5.1. මියන්මාරයේ ජාවාරම් කරන ලද ශ්‍රී ලාංකිකයන් බේරා ගැනීම සහ නැවත සිය රට ගෙන්වා ගැනීම:** මෙම අංශය තායිලන්තයේ සහ මියන්මාරයේ දූත මණ්ඩල සමඟ සහයෝගයෙන් මියාවාඩි දිස්ත්‍රික්කයේ සයිබර් අපරාධ මධ්‍යස්ථානවල සේවය කිරීම සඳහා මියන්මාරයට ජාවාරම් කරන ලද ශ්‍රී ලාංකිකයන් බේරා ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නවල ක්‍රියාකාරීව නිරත විය. මෙම මුලපිරීම් අතරට මියන්මාරයේ සහ තායිලන්තයේ රජයන් සමඟ සාකච්ඡා පැවැත්වීම සහ 2024 ජනවාරි සහ අප්‍රේල් මාසවලදී ශ්‍රී ලංකා විදේශ අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අගමැති සහ දෙරටේ විදේශ අමාත්‍යවරුන් අතර සාකච්ඡා ආරම්භ කිරීම ඇතුළත් විය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයාද මැදිහත් වීම අපේක්සා කරමින් මියන්මාරයේ අග්‍රාමාත්‍යවරයා හා සම්බන්ධවිය. 2024 ජුනි මාසයේදී, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සිරවී සිටින ශ්‍රී ලාංකිකයන් නිදහස් කිරීම වෙනුවෙන් පෙනී සිටීම සඳහා දෙරටටම ගියේය. ජාවාරම් කරන ලද ශ්‍රී ලාංකිකයන් නිදහස් කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තායිලන්තයේ සහ මියන්මාරයේ කළ සංචාරයක් සඳහා ද අමාත්‍යාංශය පහසුකම් සැලසීය. මෙම උත්සාහයන් 2024 අප්‍රේල් මාසයේදී පුද්ගලයින් 8 දෙනෙකු සහ 2024 සැප්තැම්බර් මාසයේදී තවත් 20 දෙනෙකු බේරා ගැනීම සහ නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා සාර්ථකව පහසුකම් සැලසීය. ඉතිරි ශ්‍රී ලාංකිකයන් 40 දෙනා බේරා ගැනීම සඳහා මෙම අංශය මියන්මාරය සහ තායිලන්තය සමඟ අඛණ්ඩව කටයුතු කරයි. 2024 ජූලි මාසයේදී ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහභාගී වූ BIMSTEC ජාතික ආරක්ෂක ප්‍රධානීන්ගේ සිව්වන රැස්වීමේදී ද මෙම ගැටලුව සාකච්ඡා කරන ලදී. ඊට අමතරව, මිනිස් ජාවාරමට ගොදුරු වූ ශ්‍රී ලාංකිකයින් තිස් දෙදෙනෙකු (32) (මියන්මාරයේ මයවඩි ප්‍රදේශයේ සිටින බවට වාර්තා වූ 45 දෙනාගෙන්) සාර්ථක, සම්බන්ධීකරණ ක්‍රියාවලියකින් පසු 2024 නොවැම්බර් 25 වන දින බේරා ගන්නා ලදී. එම ශ්‍රී ලාංකික ජාතිකයන් 32 දෙනාගෙන් 05 දෙනෙකු 2024 දෙසැම්බර් 06 වන දින ශ්‍රී ලංකාවට ආපසු ගෙන එන ලද අතර ශ්‍රී ලාංකිකයින් 27 දෙනෙකු 2024 දෙසැම්බර් 16 වන දින ශ්‍රී ලංකාවට ආපසු ගෙන එන ලදී.

**15.5.2. මියන්මාරයේ සිට බෝට්ටු හරහා පැමිණීම සම්බන්ධ කටයුතු සඳහා සහාය වීම:** 2024 දෙසැම්බර් 19 වන දින ශ්‍රී ලංකාවේ ඊසානදිග වෙරළ තීරයේදී පුද්ගලයින් 102 දෙනෙකු රැගත් බෝට්ටුවක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නිරීක්ෂණය කරන ලද අතර, ශ්‍රී ලංකා රජය විසින් ඔවුන්ට මානුෂීය ආධාර ලබා දෙන ලදී. කණ්ඩායම විසින් සපයන ලද තොරතුරුවලට අනුව, ඔවුන් මියන්මාරයෙන් පැමිණ ඇති අතර, එහි පිරිමි 47 ක්, ගැබිනි කාන්තාවක් ඇතුළුව කාන්තාවන් 30 ක් සහ ළමුන් 25 ක් ඇතුළත් වේ. බෝට්ටු පැමිණීම් සම්බන්ධ කටයුතු සඳහා දේශීය ආයතන සමඟ එක්ව අංශය පහසුකම් සැලසීය. 2024 දෙසැම්බර් මස 23 දිනැති ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත්වරයාගේ අධිකරණ නියෝගයකට අනුව, බෝට්ටු පැමිණීම් 103 දෙනා මුලතිව් ගුවන් හමුදා කඳවුරේ රඳවා තබා ඇති

අතර, දැනට ආගමන පරීක්ෂණ සහ සෞඛ්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ. මෙම කාරණය සම්බන්ධයෙන් මියන්මාර බලධාරීන් සමඟ ද මෙම අංශය සම්බන්ධ වී සිටී.

**15.6.සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය:** අග්නිදිග ආසියානු දූත මණ්ඩල සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකාවේ සහ ආසියාන් රටවල විහාරස්ථාන සහ ආගමික ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කිරීම සඳහා, අන්‍යෝන්‍ය අවබෝධය සහ සංස්කෘතික හා ආර්ථික හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශය "පන්සලෙන් පන්සලට" වැඩසටහනට පහසුකම් සැලසීය. සිංගප්පූරුවෙහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවලට වසර 50 ක් සනිටුහන් කරමින් 2024 අගෝස්තු 27 වන දින ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේදී "Singapore and Sri Lanka at 50: Perspectives from Sri Lanka" පර්යේෂණ ප්‍රකාශනය එළිදැක්වීම සඳහා මෙම අංශය කටයුතු සංවිධානය කළේය. මීට අමතරව, හැනෝයි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මධ්‍යම සංස්කෘතික අරමුදල සමඟ එක්ව, ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර සමීප බෞද්ධ සංස්කෘතික සහයෝගීතාව සංකේතවත් කරමින්, ශ්‍රී ලාංකික සහ වියට්නාම ගෘහ නිර්මාණ ශෛලීන් ඇතුළත්, බායි ඩින් පගොඩ හි බෝධි ගස වටා පිටත බිත්තියක් ඉදිකිරීමට ද සහාය විය.

**15.7.ආරක්ෂක සහයෝගීතාව**: 2024 ජූනි මාසයේදී සිංගප්පූරුවේ පැවති ආසියාවේ ප්‍රමුඛතම ආරක්ෂක සමුළුව වන 21st IISS Shangri-La Dialogue සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා සහ ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා සහභාගී වීම සඳහා මෙම අංශය සම්බන්ධීකරණය සහ පහසුකම් සපයන ලදී. බැංකොක් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ආරක්ෂක සේවා අණදෙන සහ කාර්ය මණ්ඩලයේ ගුවන් අංශයේ ප්‍රධාන උපදේශක ගුවන් කොමදෝරුගේ නායකත්වයෙන් යුත් ආරක්ෂක දූත පිරිසක් 2024 සැප්තැම්බර් 2 සිට 11 දක්වා තායිලන්තයට අධ්‍යයන චාරිකාවක් සඳහා පහසුකම් සපයන ලදී. මීට අමතරව, පිලිපීනයේ සිට ශ්‍රී ලංකාවට පතොරම් තොගයක් නැව්ගත කිරීම සම්බන්ධයෙන් මැනිලා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා නාවික හමුදාවට සහාය ලබා දුන්නේය. ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම (MOU) අවසන් කිරීම සඳහා සාකච්ඡා මේ වන විට සිදුවෙමින් පවතින අතර, ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ අභිප්‍රාය ලිපිය (LOI) අවසන් කර ඇති අතර අත්සන් කිරීමට සූදානම්ය.

සිංගප්පූරුවේ ආගමන හා මුරපොල අධිකාරියේ නියෝජිත පිරිසක්, ශ්‍රී ලංකාවේ ආගමන පද්ධතිය සඳහා තාක්ෂණික වැඩිදියුණු කිරීම් ගවේෂණය කරමින්, සිංගප්පූරුවේ ප්‍රමිතියට සමාන ප්‍රමිතියක් අත්කර ගැනීමේ අරමුණින්, උසස් තාක්ෂණය ඒකාබද්ධ කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ආගමන පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහයෝගීතාව සඳහා අවස්ථා ගවේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ. ඊට අමතරව, සිංගප්පූරුවේ ස්වදේශ කටයුතු අමාත්‍ය සහ නීති අමාත්‍ය ගරු කේ. ෂන්මුගම් මහතාගේ සංචාරය 2024 අගෝස්තු මාසයේදී සිදු වූ අතර, එමඟින් දෙරට අතර නීතිමය සහ ආරක්ෂක සහයෝගීතාව වැඩි දියුණු විය.

**15.8.විද්‍යාව හා තාක්ෂණය:** අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශය, කලාපවල ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සහයෝගයෙන්, විද්‍යා හා තාක්ෂණ අංශවලට අදාළ කටයුතු සිදු කළේය. මෙම සන්දර්භය තුළ, 2024–2026 කාලය සඳහා ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර අධ්‍යාපනික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමක් 2024 අගෝස්තු 20 වන දින විධිමත් ලෙස අත්සන් කරන ලදී.

# අංශවල ප්‍රගති සමාලෝචනය: මෙහෙයුම් අංශ

## 16. කොන්සියුලර් කටයුතු අංශය

කොන්සියුලර් කටයුතු අංශය සහ යාපනය, මාතර, මහනුවර, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල යන නගරවල පිහිටා ඇති එහි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල 1981 අංක 04 දරන කොන්සියුලර් කාර්යයන් පනතට සහ 2006 අංක 18 දරන සංශෝධිත පනතට අනුකූලව ක්‍රියාත්මක වේ. මෙම අංශය රට තුළ සහ විදේශයන්හි පදිංචිව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ට සේවා සපයන අතර, විදේශයන්හි ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ කාර්යාල හරහා ක්‍රියාත්මක වේ. මහජනතාව සඳහා කොන්සියුලර් සේවා සැපයීම ප්‍රධාන අංශ පහක් ඔස්සේ සිදු කෙරේ: ඒවා ලේඛන සත්‍යාපනය, සියරට ගෙන්වා ගැනීම, වන්දි, මරණ (විදේශයන්හි සිදුවන මරණවලට අදාළ) සහ කොන්සියුලර් කටයුතු හා සම්බන්ධ විවිධ කරුණු යන අංශ වේ.

### 16.1.ලේඛන සත්‍යාපනය සහ ඩිජිටල්කරණ ක්‍රියාවලිය

**16.1.1.** අදාළ කාල සීමාව තුළ කොන්සියුලර් අංශය සහ එහි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල මගින් අයදුම්කරුවන් 221,803 දෙනෙකු සඳහා ලේඛන 459,246 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 546,974,000.00 ක ඒකාබද්ධ ආදායමක් උපයා ඇත. මෙම ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල අතරින්, යාපනය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 13,246 දෙනෙකු සඳහා ලේඛන 25,856 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 31,882,800.00 ක් උපයා ඇත. මාතර කොන්සියුලර් කාර්යාලය විසින් අයදුම්කරුවන් 14,899 දෙනෙකු සඳහා ලේඛන 23,688 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 28,339,200.00 ක් රැස් කරන ලදී. මහනුවර කොන්සියුලර් කාර්යාලය විසින් අයදුම්කරුවන් 17,097 දෙනෙකු සඳහා ලේඛන 27,203 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 32,432,400.00 ක් ලබා දෙන ලදී. ත්‍රිකුණාමලය කොන්සියුලර් කාර්යාලය අයදුම්කරුවන් 7,477 දෙනෙකු සඳහා ලේඛන 11,856 ක් සත්‍යාපනය කිරීමෙන් රුපියල් 14,128,800.00 ක් උපයා ඇත.

**16.1.2.** විභාග දෙපාර්තමේන්තුව සමඟ හවුල්කාරිත්වයෙන්, කොන්සියුලර් කටයුතු අංශය 2023 අගෝස්තු මාසයේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික සඳහා මාර්ගගත සත්‍යාපන පද්ධතියක් දියත් කළේය. මෙම ක්‍රමය මඟින් අයදුම්කරුවන්ට සහතික සත්‍යාපනය සඳහා මාර්ගගතව අයදුම් කිරීමට හැකියාව ලැබෙන අතර එමඟින් කොළඹ කොන්සියුලර් අංශයට පැමිණීමේ අවශ්‍යතාව ඉවත් කෙරේ. 2024 ජනවාරි 1 වන දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික 46,520 ක් මාර්ගගතව සත්‍යාපනය කරන ලදී. මෙම මුලපිරීම කොන්සියුලර් අංශය තුළ ලේඛන සත්‍යාපන සේවා ඩිජිටල්කරණය කිරීමේ ප්‍රධාන පියවරක් නියෝජනය කරයි. දෛනික සත්‍යාපනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සහතික වන අතර එය සකසන ලද මුළු ලේඛනවලින් 30-40% ක් පමණ වේ.

**16.1.3.** ලේඛන සත්‍යාපනය ඩිජිටල්කරණය කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නයේ කොටසක් ලෙස, e-DAS සහ e-BDM (රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව) දත්ත සමුදායන් ඒකාබද්ධ කිරීම 2024 සැප්තැම්බර් 2 දින ක්‍රියාත්මක කරන ලදී. මෙම ඩිජිටල් ඒකාබද්ධ කිරීම අයදුම්කරුවන්ට ඔවුන්ගේ උප්පැන්න, විවාහ සහ මරණ සහතික සහතික කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ඉඩ සලසයි.

**16.1.4.** රජයේ ලේඛන නිකුත් කිරීමේ ප්‍රධාන බලධාරීන් e-DAS වේදිකාවට ඒකාබද්ධ කිරීම අරමුණු කරගත් ශාඛා මොඩියුල හඳුන්වාදීමත් සමඟ e-DAS පද්ධතියේ සංවර්ධනය ප්‍රගතියක් ලබා ඇත. මෙම ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘති යටතේ දේශීය විශ්වවිද්‍යාල, වෛද්‍ය සභාව, ශ්‍රී ලංකා පොලිසිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම, බ්‍රිතාන්‍ය කවුන්සිලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වැනි ආයතනවල දත්ත සමුදායන් සහ ලේඛන නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටි e-DAS සමඟ ඒකාබද්ධ කෙරේ. මෙම ප්‍රධාන ආයතන සමඟ ඒකාබද්ධ කිරීම අවසන් වූ පසු, අංශය විසින් දිනපතා සත්‍යාපනය කරන ලද ලේඛනවලින් 80% කට වඩා අන්තර්ජාලය හරහා සැකසෙනු ඇතැයි

අපේක්ෂා කෙරේ.

**16.1.5.** අංශයේ ලේඛන සත්‍යාපන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම මගින් මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී මාර්ගගත සේවාවක් ලබා දීම අරමුණු කෙරේ. සත්‍යාපනය සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන අවම මානව සහභාගීත්වයෙන් යුතුව, නිකුත් කරන බලධාරීන්ගෙන් සෘජුවම ලැබෙන බැවින්, මාර්ගගත සත්‍යාපන ලේඛනවල සත්‍යතාව සහතික කෙරේ. මීට අමතරව, මාර්ගගත සත්‍යාපන පද්ධතිය මඟින් බත්තරමුල්ලේ කොන්සියුලර් අංශයට සහ එහි ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාල පහට පැමිණෙන අයදුම්කරුවන් 1000 කට අධික සංඛ්‍යාවකගේ වර්තමාන දෛනික ප්‍රවාහය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**16.2.විදේශ රටවලදී තුළ සිදුවන මරණ සම්බන්ධීකරණය:** සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ, විදේශයන්හි ශ්‍රී ලාංකික ජාතිකයින්ගේ මරණ 690 ක් වාර්තා විය. මෙම අංශය පුද්ගලයින් 440 දෙනෙකුගේ දේහ සියරට ගෙන්වා ගැනීමට පහසුකම් සැලසූ අතර, 203 දෙනෙකු භූමදාන කරන ලද අතර, 47 දෙනෙකු ඔවුන්ගේ සමීපතම ඥාතියාගේ කැමැත්ත ඇතිව විදේශයන්හි ආදාහනය කරන ලදී. විදේශයන්හි මියගිය ශ්‍රී ලාංකිකයින්ගේ සමීපතම ඥාතීන් විසින් කොන්සියුලර් මරණ ලියාපදිංචි කිරීම් සඳහා සිදු කරන ලද ඉල්ලීම් 295 ක් මරණ අංශය විසින් ක්‍රියාවට නංවන ලදී. මීට අමතරව, මෙම කාලය තුළ මියගිය ශ්‍රී ලාංකිකයින් 28 දෙනෙකුගේ පෞද්ගලික බඩු බාහිරාදිය ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ සමීපතම ඥාතීන් වෙත භාර දෙන ලදී.

**16.3.විදේශයන්හිදී සිදුවන ආපදා සඳහා වන්දි සම්බන්ධීකරණය:** සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, වන්දි අංශය විසින් ශ්‍රී ලාංකික පුරවැසියන් විදේශගතව සිටියදී ඔවුන් මරණයට පත් වීම, හදිසි අනතුරුවලට ලක් වීම, තුවාල වීම ආදිය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින්, මරුමුවට පත් අයකු වෙනුවෙන් හිමිවන වන්දි මුදල සහ වෙනත් විවිධ හිමිකම් සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන 382 ක වන්දි (මහා භාරකාර හරහා රුපියල් 382,035,944.31 ක් බෙදා හරින ලදී) ලැබීම සම්බන්ධීකරණය කරන ලදී. මෙම වන්දි මුදල ස්ථාපිත ක්‍රියා පටිපාටියට අනුකූලව පවුල් 121 ක් සහ වින්දිතයින් අතර බෙදා හරින ලදී.

තවද, අදාළ කාල සීමාව තුළ අංශයට නව වන්දි ඉල්ලීම් 363 (මරණ වන්දි 245 + මරණ නොවන වන්දි 118) ලැබී ඇති අතර, මෙම සියලු ඉල්ලීම්වල ඉදිරි කටයුතු සඳහා විදේශයන්හි අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල වෙත යොමු කර ඇත.

**16.4.සියරට ගෙන්වා ගැනීමේ අංශය:** සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ, සමීපතම ඥාතීන් , රජයේ බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් කරන ලද සියරට ගෙන්වා ගැනීමේ ඉල්ලීම් 1324 ක් (සිරගත කරන ලද පුද්ගලයින් සම්බන්ධ 286 ක්, සාමාන්‍ය සිදුවීම් 911 ක් සහ මියන්මාරයේ සයිබර් අපරාධ සංයෝගවල පුද්ගලයින් සම්බන්ධ 127 ක්) නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අංශය විසින් ක්‍රියාවට නංවන ලදී. විවිධ හේතූන් මත විදේශයන්හි අතරමං වූ ශ්‍රී ලාංකිකයන් 1788 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීම මෙම අංශය සම්බන්ධීකරණය කළේය. කලාපීය වශයෙන්, මැද පෙරදිගින් ශ්‍රී ලාංකිකයන් 179 දෙනෙකු, මියන්මාර සයිබර් අපරාධ මධ්‍යස්ථානවලින් 98 දෙනෙකු ඇතුළු ආසියානු රටවල් 1304 දෙනෙකු, යුරෝපයෙන් සහ බටහිර රටවලින් 251 දෙනෙකු සහ අප්‍රිකාවෙන් 38 දෙනෙකු සියරට ගෙන්වා ගන්නා ලදී. ඊට අමතරව, එම කාලය තුළ බ්‍රිතාන්‍ය ඉන්දියානු සාගර ප්‍රදේශය (BIOT) වෙතින් පුද්ගලයින් 3 දෙනෙකු සහ රියුනියන් දූපතෙන් 13 දෙනෙකු සියරට ගෙන්වා ගන්නා ලදී. සියරට ගෙන්වා ගැනීමේ අංශය අතරමං වූ ධීවර යාත්‍රා සම්බන්ධ සිද්ධීන් 28 ක් කළමනාකරණය කළ අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් 91 දෙනෙකු සහ ධීවර යාත්‍රා 9 ක් නැවත මෙරටට ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීය. SAFE පදනම විසින් සංවිධානය කරන ලද මිනිස් ජාවාරම සහ ආරක්ෂිත සංක්‍රමණය පිළිබඳ දැනුවත්භාවය සහ ප්‍රතිචාරය පිළිබඳ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ සැසි සඳහා සම්පත් ආයතනයක් ලෙස මෙම අංශය දායක විය. පුද්ගල ජාවාරම - 2025 වාර්තාව සඳහා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ලැබුණු යෙදවුම් සම්බන්ධීකරණය කිරීම මෙම අංශය විසින් සිදු කරන ලදී.

**16.5. විවිධ කටයුතු අංශය:** සමාලෝචිත කාලය තුළ, කොන්සියුලර් කටයුතු අංශයේ විවිධ කටයුතු අංශය, ශ්‍රී ලංකාවෙන් පිටත උපත ලැබූ පුද්ගලයින්ට උප්පැන්න සහතිකවල මුල් පිටපත් 760 ක් සැකසීම සහ බෙදා හැරීම සිදු කළේය. ඊට අමතරව, පුරවැසි සහතික 47 ක් නිකුත් කිරීමට පහසුකම් සැලසූ අතර විදේශ ගමන් බලපත්‍ර ආශ්‍රිත කරුණු 217 ක් පිළිබඳව කටයුතු කළේය. විදේශයන්හි පදිංචි ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශීය පොලිස් නිෂ්කාශන සහතික 75 ක් ලබා ගැනීම ද මෙම අංශය සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. තවද, රජයේ නිලධාරීන්ට නිකුත් කරන ලද විදේශීය උපාධි සහතික 282 ක් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ කාර්යාල හරහා සත්‍යාපනය කරන ලද අතර, තවත් 415 ක් දැනට සැකසෙමින් පවතී. අදාළ කාලය තුළ විදේශයන්හී පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් කොන්සියුලර් ජංගම සේවා 22 ක් පැවැත්වීම සඳහා නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට අවශ්‍ය පරිදි විවිධ විමසීම් සහ විමර්ශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ තම පවුල් සමඟ සම්බන්ධතා අහිමි වූ පුද්ගලයන් සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ කටයුතු කළේය. ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය (SLBFE) සමඟ සහයෝගයෙන්, මෙම අංශය ශ්‍රමය ආශ්‍රිත ගැටලුවලටද විසඳුම් ලබා දෙන ලදී.

විදේශයන්හි සිටින ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය හරහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මුලදී, රටවල් 21 ක දූත මණ්ඩල/කාර්යාල 29 ක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගෙන ඇත. ජපාන රජය, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය (IOM) හරහා, පරිගණක, ස්කෑනර් සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර වැනි තාක්ෂණික උපකරණ ලබා දීමෙන් මෙම ව්‍යාපෘතියට අරමුදල් සැපයීමට නියමිත අතර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මෙහෙයුම් පද්ධතිය සැලසුම් කර සපයනු ඇත.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 2024 පෙබරවාරි 17-18 දිනවල මොනරාගල පැවති GLOCAL ප්‍රදර්ශනය 2024 සඳහා කොන්සියුලර් කටයුතු අංශය සහභාගී විය. මෙම ප්‍රදර්ශනය අතරතුර, ලේඛන සත්‍යාපනය, මිනිස් ජාවාරම් පිළිබඳව ගැටලු විසඳීම, සියරට ගෙන්වා ගැනීම සහ වන්දි ආශ්‍රිත කරුණු හැසිරවීම ඇතුළු කොන්සියුලර් සේවාවන් පිළිබඳ තොරතුරු අංශය නරඹන්නන්ට ලබා දුන්නේය.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ e-BMD දත්ත පද්ධතිය හරහා උප්පැන්න, විවාහ සහ මරණ සහතිකවල සහතික කළ පිටපත් නිකුත් කිරීම තෝරාගත් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවල දියත් කිරීම සඳහා මෙම අංශය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

## 17. සාමාන්‍ය පරිපාලන අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන අංශය ශ්‍රී ලංකා විදේශ සේවය හැර, දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා සහ දෙපාර්තමේන්තු සේවා නිලධාරීන් සඳහා පරිපාලන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් සහ නඩත්තු රාජකාරි සහ මානව සම්පත් කළමනාකරණය සඳහා වගකිව යුතුය. මීට අමතරව, අමාත්‍ය මණ්ඩල සංදේශ කළමනාකරණය කිරීම, පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සහ පාර්ලිමේන්තු කාරක සභා සහ උපදේශක කාරක සභාවලට සහභාගී වීම සිදු කරයි. 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංශය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

## 17.1.මානව සම්පත් කළමනාකරණය

i. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමය (IORA) සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රතිපත්ති සැලසුම්) තනතුරක් සඳහා තාවකාලික සේවක තනතුරක් නිර්මාණය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් (DMS) අනුමැතිය ලබා ගැනීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (PSC) නීති උපදේශක, විධායක සහකාර (සන්ධාන) සහ සන්ධාන සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියට සංශෝධන ඉදිරිපත් කරන ලදී.

iii. ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKIIRSS) සඳහා සේවක මණ්ඩලයක් නිර්මාණය කිරීම අනුමත කළ අතර තනතුරු 18 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

iv. නීති නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම.

v. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ශඛ්‍යතා වර්ධන වැඩසටහන් සාර්ථකව නිම කරන ලද අතර, SLIDA සමඟ සහයෝගයෙන් කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සහ රියදුරන් සඳහා පැය 100 ක කථන ඉංග්‍රීසි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම. එහි පිරිවැය රු. 840,000 කි.

## 17.2. පාර්ලිමේන්තු කටයුතු

i. අමාත්‍ය මණ්ඩල සංදේශ 29 ක්, අමාත්‍ය මණ්ඩල සටහන් 18 ක් සහ අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 84 ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කරන ලදී.

ii. පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සහ උපදේශක කමිටුවට වාර්තා ඉදිරිපත් කිරීම කළමනාකරණය කරන ලදී.

iii. කාර්ය සාධන සමාලෝචන සහ ක්‍රියාත්මක කිරීමේ අංශය හරහා රාජ්‍ය ගිණුම් කාරක සභාවට (COPA) වාර්තා ඉදිරිපත් කරන ලදී.

## 17.3. ප්‍රසම්පාදනය සහ නඩත්තුව

i. 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා රුපියල් මිලියන 9.3 ක් සහ දේශීය අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 86.90 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කරන ලදී.

ii. එම කාලය තුළ රුපියල් මිලියන 7.8 ක වියදමින් ජනරජ ගොඩනැගිල්ල එහි පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කරමින් නඩත්තු කරන ලදී.

iii. කොන්සියුලර් කටයුතු අංශය රුපියල් මිලියන 17.37 ක වියදමින් සුහුරුපායේ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 16 වන මහලේ ස්ථානගත කරන ලදී.

iv. රුපියල් මිලියන 1.8 ක වියදමින් අලුත්වැඩියාවන් සමඟ නිල නිවාස 27 ක නඩත්තුව කළමනාකරණය කරන ලද අතර අමාත්‍යාංශයේ කම්හල සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 8 ක් වියදම් කරන ලදී.

**17.4. සැපයුම් සේවා;** වාහන වාර්තා සහ ඒ ආශ්‍රිත නඩත්තුව පවත්වා ගැනීම සඳහා වත්කම් කළමනාකරණ පද්ධතිය (AMS) යටතේ සංරචකයක් සංවර්ධනය කරන ලදී. අමාත්‍යාංශයේ වාහන ඇණිය 85 (අමාත්‍යාංශ වාහන 72 ක් සහ කල්බදු වාහන 13 ක්) කාර්යක්ෂමව භාවිතා කරන ලද අතර, නව වාහන මිලදී ගැනීම් සඳහා අමතර වියදම් දැරීමෙන් තොරව පවතින වාහන ඇණිය නඩත්තු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

**17.5. විදේශයන්හි දූත මණ්ඩල/කාර්යාල සඳහා පොදු වෙබ් අඩවිය:** තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් පසු, විදේශයන්හි දූත මණ්ඩල/කාර්යාල සඳහා පොදු වෙබ් අඩවි සංවර්ධකයා ලෙස එලිසියන් ක්‍රෙස්ට් (පුද්) සමාගම තෝරාගෙන ඇත. කොන්ත්‍රාත් ගිවිසුම සමඟ ඉදිරියට යාම සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් අනුමැතිය ලබා ගැනීමෙන්

පසු, පොදු වෙබ් අඩවි නිර්මාණය ආරම්භ කෙරේ. ඊට අමතරව, සත්කාරක විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පොදු වෙබ් අඩවියට අදාළ සත්කාරක සේවා සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර ඇත.

**17.6.තොරතුරු තාක්ෂණ ධාරිතා වර්ධනය සහ සයිබර් ආරක්ෂාව:** අමාත්‍යාංශ මෙහෙයුම් සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සයිබර් ආරක්ෂණ පියවරයන් සහතික කිරීම.

- අමාත්‍යාංශයේ ෆයර්වෝලය කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු නිලධාරීන් සඳහා ෆයර්වෝල් පුහුණුවක් පවත්වන ලදී.
- ආරක්ෂාව සහ හොඳම භාවිතයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා පුළුල් විද්‍යුත් තැපැල් භාවිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදී.

**17.7.ශාලා වෙන්කරවා ගැනීමේ පද්ධතිය:** වර්තමානයේ, ශාලා වෙන්කරවා ගැනීමේ ක්‍රියාවලිය අතින් කළමනාකරණය කරනු ලබන අතර, බොහෝ විට කාලසටහන්ගත කිරීමේ ගැටුම් ඇති කරයි. මෙම ගැටලුව විසඳීම සඳහා, පිරිවැය-ඵලදායී ශාලා වෙන්කරවා ගැනීමේ පද්ධතියක් සංවර්ධනය වෙමින් පවතී. දැන් එහි අවසන් අදියරේ පවතින මෙම පද්ධතිය, වෙන්කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ ශාලා වෙන්කරවා ගැනීම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා තත්‍ය කාලීන තත්ව යාවත්කාලීන කිරීම් සැපයීමට සැලසුම් කර ඇත.

**17.8.මාසිකව ස්කෑන් කරන ලද වවුචර් පොදු ධාවකයට සංවිධානය කර උඩුගත කිරීමේ ක්‍රියාවලිය:** අමාත්‍යාංශය දැනට දූත මණ්ඩල/කාර්යාලවලින් අමාත්‍යාංශයට වවුචර් සහ බිල්පත් මාරු කිරීමට රාජ්‍යතාන්ත්‍රික බෑගය හරහා සිදුකරන අතර, එම ක්‍රියාවලියට සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුවේ. මෙයට පිළියමක් ලෙස, නිරවද්‍යතාව, ප්‍රවේශ්‍යතාව සහ නිසි ලියකියවිලි සහතික කරමින්, මාසිකව ස්කෑන් කරන ලද වවුචර් පොදු ධාවකයකට උඩුගත කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා දී ඇත. මෙම පද්ධතිය ගිණුම් අංශය සඳහා විශේෂයෙන් සකස් කර ඇති අතර, නියමු පද්ධතියක් ලෙස කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් පොදු ධාවකයට ස්කෑන් කරන ලද වවුචර් (රිසිට්පත් සහ ගෙවීම්) එකතු කර උඩුගත කිරීම සඳහා පියවරෙන් පියවර මාර්ගෝපදේශයක් සපයන පුළුල් අත්පොතක් අවසන් කර ඇත.

## 18. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට අවශ්‍ය ප්‍රමාණවත් මානව සම්පත් පහසුකම් කාලෝචිත ආකාරයකින් සැපයීම සහතික කිරීම මානව සම්පත් සහ කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. තවද, විදේශයන්හි පිහිටි සෑම ශ්‍රී ලංකා දූත මණ්ඩලයකම මානව සම්පත් සහ අදාළ පරිපාලන අවශ්‍යතා කළමනාකරණය කිරීමේ අරමුණින් විදේශයන්හි පිහිටි සියලුම ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට අවශ්‍ය ප්‍රතිපත්තිමය නියෝග ලබා දීමට මෙම අංශයට බලය පවරා ඇත.

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හැට දෙකක (62) සංයුතිය පහත පරිදි වේ;

- තානාපති කාර්යාල - 35
- මහ කොමසාරිස් කාර්යාල - 13
- එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩල - 02
- නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාල - 01

- කොන්සල් ජනරාල් කාර්යාල - 10
- නියෝජිත කාර්යාල - 01

**18.1. විශේෂ ජයග්‍රහණ**

**18.1.1. රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල පිහිටුවීම/නැවත විවෘත කිරීම:** ඇස්තානා/කසකස්තානයේ නේවාසික ශ්‍රී ලාංකික දූත මණ්ඩල පිහිටුවීමට සහ බැග්ඩෑඩ්/ඉරාකය, නිකොසියා/සයිප්‍රසය සහ ෆ්‍රැන්ක්ෆර්ට්/ජර්මනියේ දූත මණ්ඩල/කාර්යාල නැවත විවෘත කිරීමට අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත. ඒවා පිහිටුවීම/නැවත විවෘත කිරීම පිළිබඳ විධිමත් කටයුතු සිදුවෙමින් පවතී.

වෙලින්ටන්/නවසීලන්තයේ ශ්‍රී ලාංකික දූත මණ්ඩල 2024.11.25 දින ස්ථාපිත කර ඇත.

**18.1.2. නව දූත මණ්ඩල ප්‍රධානීන්/කාර්යාල ප්‍රධානීන් පත් කිරීම:** විදේශ ලේකම්වරයාගේ නියෝග මත, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා දූත මණ්ඩල ප්‍රධානීන් / කාර්යාල ප්‍රධානීන් දහසය දෙනෙකු (16) පත් කිරීම සඳහා කටයුතු කර පහසුකම් සපයන ලදී.

**18.1.3. වෘත්තීය නොවන දූත මණ්ඩල ප්‍රධානීන් / රාජ්‍යතාන්ත්‍රික ලේකම්වරුන් ඇතුළු කාර්යාල ප්‍රධානීන්ගේ ධූර කාලය අවසන් කිරීම:** රාජ්‍ය නායකයාගේ නියෝගය පරිදි, පත් කරන ලද වෘත්තීය නොවන දූත මණ්ඩල ප්‍රධානීන්/කාර්යාල ප්‍රධානීන් තිස් දෙදෙනෙකුගේ (32) ධූර කාලය අවසන් කිරීමට අංශය පියවර ගත්තේය.

**18.1.4. ශ්‍රී ලංකා විදේශ සේවයේ (SLFS) නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්:** 2024 දී ශ්‍රී ලංකා විදේශ සේවයේ මාරු මණ්ඩල දෙකක් (02) යටතේ රාජ්‍ය තාන්ත්‍රික පත්වීම් මත තෝරාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල/තනතුරු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් තිස් දෙනෙකු (30) මාරු කර ඇති අතර ඔවුන් අදාළ දූත මණ්ඩල/තනතුරුවල රාජකාරි භාරගෙන ඇත. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය, ඔවුන්ගේ ගෘහ සහායකයින්ගේ කටයුතු, සාම්ප්‍රදායික සහ දේශීය නිලයන්, තනතුරේ වැටුප් සහ දීමනා ගෙවීම් ආදිය සඳහා කටයුතු කරන අතරතුර, විශේෂයෙන් වෛද්‍ය සහ ආරක්ෂක නිෂ්කාශනය ලබා ගැනීමට පහසුකම් සපයන ලදී.

විදේශ සේවා නිලධාරීන්ගේ මාරුවීම් සඳහා 2024 අවසාන කාර්තුව සඳහා තුන්වන මාරු මණ්ඩලය ක්‍රියාත්මක වෙමින් පවතී.

**18.1.5. විදේශ සේවා නිලධාරීන් උසස් කිරීම සහ විශ්‍රාම ගැනීම:** ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා නිලධාරීන් පහළොස් දෙනෙකු (15) සහ ශ්‍රී ලංකා විදේශ සේවයේ II සිට I දක්වා නිලධාරීන් හත් දෙනෙකු (07) උසස් කිරීමට අදාළ අවශ්‍ය ක්‍රියා පටිපාටි මෙම අංශය විසින් සකස් කරන ලදී.

තවද, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් දෙදෙනෙකු (02) විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලීන්ට අදාළ අවශ්‍ය විධිවිධාන සම්පූර්ණ කර ඇත.

**18.1.6. ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :** විශේෂ ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් පත් කිරීමේ ක්‍රියාවලිය මෙම අංශයෙහි සිදුවෙමින් පවතී. ශ්‍රී ලංකා විදේශ සේවයේ (I) ශ්‍රේණියේ නිලධාරීන් විසි හත් දෙනෙකු (27) සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් අතර, නිලධාරීන් 15 දෙනෙකුගේ නිර්දේශ දැන් රාජ්‍ය සේවා කොමිසම විසින් සකස් කරනු ලැබේ.

**18.2.ශ්‍රී ලංකා විදේශ සේවයට නව නිලධාරීන් බඳවා ගැනීම:** අමාත්‍යාංශයට නව ශ්‍රී ලංකා විදේශ සේවා කණ්ඩායම (2024 බඳවා ගැනීම්) බඳවා ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධන, පර්යේෂණ සහ පුහුණු අංශයට පහසුකම් සපයන ලද අතර, ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු මෙම අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.

**රාජ්‍යතාන්ත්‍රික තනතුරු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන රාජ්‍ය අංශයේ නිලධාරීන් පත් කිරීම**: ආරක්ෂක අමාත්‍යාංශය (06), කම්කරු දෙපාර්තමේන්තුව (07), ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) (05), ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (SLAcctS) (01)) සහ ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය (SLBFE) (30) නියෝජනය කරමින් රාජ්‍ය සේවයේ විදේශ සේවයේ නොවන නිලධාරීන් හතළිස් නව දෙනෙකු (49) විදේශයන්හි තෝරාගත් ශ්‍රී ලංකා දූත මණ්ඩල/තනතුරු සඳහා පත් කරන ලදී.

අතිරේක ලේකම්වරුන් (ශ්‍රී.ලං.වි.සේ) පත් කිරීම**:** සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, විදේශ කටයුතු අමාත්‍යාංශයට වැඩ බලන අතිරේක ලේකම්වරුන් තිදෙනෙකු (03) පත් කිරීමට මානව සම්පත් සහ කළමනාකරණ අංශය විසින් කාලෝචිත පියවර ගන්නා ලදී.

**විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය:** පසුගිය තරඟ විභාගයෙන් සුදුසුකම් ලැබූ හැත්තෑ පස් දෙනාගෙන් (75) කැමැත්ත පළ කළ සියරට පේරුවේ කළමනාකරණ සේවා නිලධාරීන් හැත්තෑ දෙදෙනෙකු (72) විදේශයන්හි දූත මණ්ඩල/කාර් යාල සඳහා පත් කර ඇත.

පසුගිය තරඟ විභාගයෙන් තෝරාගත් දහහත (17) දෙනාගෙන් (13) කැමැත්ත පළ කළ සියරට පේරුවේ පුද්ගලික සහායකයින් ද දූත මණ්ඩල/කාර්යාල සඳහා පත් කර ඇත.

තවද, විදේශ ලේකම් විසින් පත් කරන ලද ස්ථාන මාරු මණ්ඩල හරහා තෝරාගත් සියරට පේරුවෙන් සන්ධාන නිලධාරියෙකු (01), සියරට පේරුවෙන් තොරතුරු තාක්ෂණ නිලධාරීන් තිදෙනෙකු (03) සහ සියරට පේරුවෙන් යතුරු ලියනය කරන්නන් හතර දෙනෙකු (04) 2024 දී දූත මණ්ඩල/කාර්යාලවල රාජකාරි භාරගෙන ඇත.

**18.3.කොන්ත්‍රාත් පදනම මත සියරට පේරුවෙන් බඳවා ගන්නා කාර්ය මණ්ඩලය පත් කිරීම**: සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ සියරට පේරුවෙන් රියදුරන් දෙදෙනෙකු (02) පත් කිරීම සිදු කරන ලදී.

ඒ හා සමානව, සියරට පේරුවෙන් බඳවා ගන්නා ලද කොන්ත්‍රාත් (HRC) සේවක කාණ්ඩයේ පුරප්පාඩු වූ තනතුරු සඳහා රියදුරන් සහ කාර්යාල සේවකයින් සඳහා පුරප්පාඩු පිරවීමේ තේරීම් ක්‍රියාවලියක් අවසන් කරන ලදී. ඒ අනුව, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්යාල සේවකයින් දාහතක් (17) සහ රියදුරු තනතුරු දහනවයක් (19) පත්කිරීමට කටයුතු කර ඇත. තවද, සමාලෝචිත කාල සීමාව තුළ ලිපිකරු තනතුරු හයක් (06) පුරවා ඇත.

**18.4. නිල සංචාර සඳහා පහසුකම් සැලසීම:** මෙම කාලය තුළ මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය නිල සංචාර 149 ක් සඳහා පහසුකම් සැලසීය.

**18.5. රාජ්‍ය වියදම් පාලනය කිරීම**: විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල වල කටයුතු කළමනාකරණය කිරීමේදි වියදම් අඩු කිරීම සඳහා අමාත්‍යාංශයේ විවිධ ක්‍රියාකාරී මූලපිරීම් සඳහා මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයද සහභාගී විය.

ඒ අනුව, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සඳහා අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සියරට පේරුව පදනමින් හෝ අනියම් පදනම මත බඳවා ගැනීම සඳහා අදාළ දූත මණ්ඩල/කාර්යාල ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර වඩාත් ප්‍රායෝගික පියවර ගන්නා ලදී.

**18.6.වගකීම් වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීම:** විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ දීමනා ගෙවීම සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල වියදම් ක්‍රියා පටිපාටිවලට අදාළ පැහැදිලි කිරීම් ආදිය පිළිබඳ නිවැරදි වාර්තා සකස් කිරීමට අදාළ සියලු අවශ්‍යතා කාලෝචිත ආකාරයකින් ඉටු කිරීමට මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශය සෑම උත්සාහයක්ම ගත්තේය.

ජනාධිපති ලේකම් කාර්යාලය, විගණකාධිපති, අල්ලස් කොමිසම, මහලේකම්/පාර්ලිමේන්තුව, නීතිපති සහ ජනාධිපති කොමිෂන් සභා ආදියෙන් ලැබුණු විමසීම්වලට ද මෙම අංශය ප්‍රතිචාර දැක්වීය.

විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත කර ඇති රාජ්‍යතාන්ත්‍රික සහ රාජ්‍යතාන්ත්‍රික නොවන නිලධාරීන්ට එරෙහි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ විමසීම්, පාර්ලිමේන්තු ප්‍රශ්න සහ පැමිණිලි සඳහා පිළිතුරු අදාළ බලධාරීන් සහ දූත මණ්ඩල ප්‍රධානීන්/තැපැල් ප්‍රධානීන් සමඟ කාලෝචිත හා රහසිගත ආකාරයකින් සම්බන්ධීකරණය කරන ලදී.

අංශයේ අපේක්ෂිත ඵලදායිතාව සහතික කිරීම සඳහා. මානව සම්පත් සහ දූත මණ්ඩල කළමනාකරණ අංශයේ විෂය පථයට අයත් සියලුම අදාළ කරුණු සහ අඛණ්ඩ ක්‍රියාකාරකම් ලේකම්/විදේශ කටයුතු පිළිබඳ නියෝග අනුව ස්ථාපිත රෙගුලාසි/ක්‍රියා පටිපාටිවලට අනුකූලව සහ අදාළ බලධාරීන්/අංශවල කැමැත්ත/නිරීක්ෂණ/නිර්දේශ සමඟ සිදු කරන ලදී.

## 19.අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය

මෙම අංශයේ ප්‍රධාන වගකීම් අතරට: අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය, ශ්‍රී ලංකා දූත මණ්ඩල / විදේශ කාර්යාල සහ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් අනෙකුත් ආයතන අධීක්ෂණය සහ ඇගයීම සහ සමස්ත කාර්ය සාධනය සහ අනුකූලතාව පිළිබඳ මාර්ගෝපදේශ සමඟ උපායමාර්ග සැපයීම ඇතුළත් වේ.

**වාර්ෂික විගණන සැලැස්මේ ප්‍රගතිය – 2024 (දෙසැම්බර් 31 වන දිනට)**

| | කාර්තුව 1 | කාර්තුවQ2 | කාර්තුව 3 | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් | √ | √ | √ | 75 |
| | | | | |
| | වාර්ෂික ඉලක්කය | සම්පූර්ණ කරන ලද ප්‍රමාණය | | |
| විගණන විමසුම් | 26 | 22 | | 85 |
| සමුච්චිත ප්‍රගතිය | | | | 80 |

## 20. නීති අංශය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ජාත්‍යන්තර නීතියට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට නීති උපදෙස් ලබා දීමයි. නීති අංශය ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් තැන්පතු ආයතනය ද වේ. නීති අංශය සියලු ප්‍රතිපත්ති තීරණවල නීතිමය අංශ සහ විශේෂයෙන් භෞමික හිමිකම් සහ සීමාවන්, ත්‍රස්තවාදයට අදාළ ගැටළු, ගිවිසුම් සබඳතා පිළිගැනීම, රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය සහ වරප්‍රසාද, එක්සත් ජාතීන්ගේ සම්බාධක තන්ත්‍රය සහ ඒකපාර්ශ්වික සම්බාධක, සංවිධානාත්මක අපරාධ (මිනිස් ජාවාරම සහ ජාවාරම) ඇතුළු සංක්‍රමණය වැනි වරින් වර පැන නගින ජාත්‍යන්තර ගැටළු පිළිබඳව උපදෙස් සපයයි. නීති අංශයේ නිලධාරීන් විවිධ විශේෂඥ කමිටුවල අමාත්‍යාංශය නියෝජනය කරයි. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාල රාමුව තුළ, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක: PS/SP/SB/චක්‍රලේඛය/06/2023 ප්‍රකාරව, නීති අංශය ආසන්න වශයෙන් අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් 350 ක් සඳහා නීතිමය නිරීක්ෂණ/නීතිමය නිෂ්කාශන ලබා දී ඇත. ඉහත කරුණු වලට අමතරව, නීති අංශය පහත සඳහන් වැදගත් ප්‍රධාන කාර්ය සාධනයන් සිදු කර ඇත.

**20.1. සාගර නීතිය** : ජාතික සාගර කටයුතු කමිටුවේ (NOAC) කටයුතු නීති අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකයේ සීමාවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම (UNCLCS) විසින් පත් කරන ලද උප කොමිසම, ශ්‍රී ලංකාවේ මහාද්විපික ආන්තිකය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක හතර ශ්‍රී ලංකාව සපුරා ඇති බව පිළිගත්තේය.

ඉන්දියාව විසින් ඉදිරිපත් කරන ලද විරෝධතාව මත පදනම්ව, උප කමිටුව විසින් ඉදිරිපත් කිරීම සලකා බැලීම අත්හිටුවා ඇත. මේ සම්බන්දයෙන් ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා දින ඉන්දියාවෙන් ඉල්ලා ඇත.

**20.2. ජාතික අධිකරණ බල ප්‍රදේශයෙන් ඔබ්බට සමුද්‍ර ජෛව විවිධත්වය පිළිබඳ යෝජිත ජාත්‍යන්තරව නීත්‍යානුකූලව බැඳීමේ ගිවිසුම පිළිබඳ අන්තර් රාජ්‍ය සාකච්ඡා (BBNJ):** නීති අංශය එම සාකච්ඡාවලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කළ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උනන්දුව සුරක්ෂිත කළේය.ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දැනටමත් ලබාගෙන ඇත. එය ඉක්මනින් අනුමත කිරීම සඳහා නීති කෙටුම්පත් කිරීම සඳහා සාගර කටයුතු අංශය සමඟ සාකච්ඡා කර පියවර ගෙන ඇත.

**20.3.**ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ මුහුදු යාත්‍රා, විදේශ හමුදා හෝ රාජ්‍ය ගුවන් යානා සහ ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කරන ගුවන් යානා සඳහා සහ ප්‍රභූ සංචාරයක් අතරතුර ආයුධ නිෂ්කාශනය, පතොරම් සහ සන්නිවේදන උපකරණ නිෂ්කාශනය කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික අවසරය ලබා දීමේ සම්මත මෙහෙයුම් පටිපාටිය: ජාතික බුද්ධි ප්‍රධානියාගේ කාර්යාලය සමඟ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය අවසන් කරන ලද අතර, එයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

**20.4.නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා කිරීම (FTA):** නීති අංශය නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා සඳහා සම්බන්ධ වූ අතර නිදහස් වෙළඳ ගිවිසුම්වල ආයෝජන, නෛතික සහ වෙළඳ පිළියම් පරිච්ඡේද සාකච්ඡා කරන වැඩ කණ්ඩායම්වලද සේවය සපයයි. තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් අත්සන් කිරීමට පෙර නිදහස් වෙළඳ ගිවිසුම්හි සියලුම පරිච්ඡේද දහහතර (14) නීති අංශය විසින් නීත්‍යානුකූලව පරීක්ෂා කරන ලදී. ඉන්දියාව සමඟ ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුම පිළිබඳව සාකච්ඡා සිදුවෙමින් පවතින අතර ආයෝජන සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නීති අංශය සම්බන්ධ වේ

තවද, චීනය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සඳහා ඉදිරි මාවත සැකසීම සහ සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් නීති අංශය ජාතික වෙළඳ සාකච්ඡා කමිටුව සමඟ ද සම්බන්ධ විය.

**20.5.ආයෝජනය:** එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ IPPA හි ඇතැම් වගන්ති නැවත සාකච්ඡා කෙරෙමින් පවතී. නිදහස් වෙළඳ ගිවිසුම් ආයෝජන පරිච්ඡේද පිළිබඳ සිදුවෙමින් පවතින සාකච්ඡා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ නව ආයෝජන ආකෘතිය සමාලෝචනය කෙරෙමින් පවතී.

**20.6. ශ්‍රී ලංකාවේ බලශක්ති පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීම:** ඉහත සඳහන් පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීමේදී අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු සෝභිත රාජකරුණා මහතාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂඥ කමිටුවේ නීති අංශය විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය නියෝජනය කරයි. මෙම පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීම අවසන් වෙමින් පවතී.

**20.7.මුක්තීන් සහ වරප්‍රසාද** : 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතට අනුව පහත සඳහන් සංවිධානවලට ලබා දී ඇති විනිර්මුක්තීන් සහ වරප්‍රසාද ගැසට් කිරීමට සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගෙන ඇත,
ගෝලීය හරිත වර්ධන ආයතනය (GGGI), ආර්ගෝ වන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය (ICRAF)

**20.8.පුද්ගල ජාවාරම (TIP):** ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය (NAHTTF) සඳහා අමාත්‍යාංශ සම්බන්ධීකාරක වන්නේ නීති අංශයයි. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තාව මෙම වසරේ ශ්‍රී ලංකාව දෙවන ස්ථරයට ඇතුළත් කළේය.

**20.9. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (APG) (AML/CFT):** මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) විසින් ශ්‍රී ලංකාව පිළිබඳ 2025 අන්‍යෝන්‍ය ඇගයීම 2025 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ අතර එහිදී ආයතනික වශයෙන් කාල සීමාවක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් විදේශ අමාත්‍යාංශයට ලබා දෙනු ලැබේ. APG ඇගයීම සඳහා සූදානම් වීම සඳහා නීති අංශය FIU සමඟ කටයුතු කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා අන්‍යෝන්‍ය ඇගයීම සඳහා APG විසින් දීර්ඝ කිරීමක් ලබා දී ඇති අතර එය තවමත් FIU විසින් තහවුරු කර නොමැත.

නීති අංශය දැනට ප්‍රධාන ක්‍රියාකාරී කරුණු ඉටු කිරීමට සම්බන්ධ වී සිටී, එනම් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1373, 1267, 1540 සහ ඉරානය සහ DPRK මත නියාමනය කරන ලද අදාළ UNSC යෝජනා සහ විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් (FTFs) සහ ප්‍රචණ්ඩකාරී අන්තවාදය පිළිබඳ UNSCR ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ පවතින රෙගුලාසි සංශෝධනය කිරීම. FTF පිළිබඳ නීති සම්පාදනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත යුතුය.

නීති අංශය ආරක්ෂක ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් TFS කමිටුවට ක්‍රියාකාරීව සහභාගී වන අතර මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ව්‍යාප්තියට එරෙහිව සටන් කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශය සහ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සම්බන්ධීකරණය කරයි.

නව උපායමාර්ගික වෙළඳ කළමනාකරණ පනතක් කෙටුම්පත් කිරීම මගින් UNSCR 1540 ක්‍රියාත්මක කිරීමේදී නීති අංශය නීති කමිටුව නියෝජනය කරයි.

**20.10. නැවත ඇතුළත් කිරීම:** බෙනෙලක්ස් වෙනුවෙන් ඉතාලිය, ප්‍රංශය සහ නෙදර්ලන්තය සමඟ EU නැවත ඇතුළත් කිරීමේ ප්‍රොටෝකෝල පිළිබඳ සාකච්ඡා අවසන් කරන ලද අතර, අත්සන් කිරීම සඳහා ප්‍රොටෝකෝල අවසන් කළ හැකිය. අත්සන් කිරීම සඳහා ප්‍රොටෝකෝලට එළඹීමට අවසන් කිරීම සඳහා දැනට නෙදර්ලන්තය සහ ප්‍රංශය සමඟ සම්බන්ධ වෙමින් සිටී. 2018 දී ජෝර්ජියාව සමඟ නව නැවත ඇතුළත් කිරීමේ ගිවිසුමක් පිළිබඳ සාකච්ඡා අවසන් කරන ලද අතර අත්සන් කිරීමට නියමිත ඇතැම් ප්‍රතිසංස්කරණය කරන ලද විධිවිධාන පිළිබඳව තවමත් එකඟ වී නොමැත. අත්සන් කිරීම සඳහා රුසියාව සමඟ නැවත ඇතුළත් කිරීමේ ගිවිසුම ඉක්මනින් අවසන් කිරීමට නියමිතය.

**20.11. ද්විත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ ගිවිසුම්:** 2024 අගෝස්තු මාසයේදී ඔස්ට්‍රියාව සමඟ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම (DTAA) අත්සන් කිරීමට කැබිනට් අනුමැතිය ඉල්ලා සිටියේය.2024 අග භාගයේදී මාලදිවයින සමඟ තුන්වන වටයේ සාකච්ඡා ආරම්භ කිරීමට සහ බංග්ලාදේශය සමඟ පවතින DTAA සංශෝධනය කිරීමට ශ්‍රී ලංකාව විසින් දින යෝජනා කර ඇත.

**20.12. ජාත්‍යන්තර මානුෂීය නීති කරුණු:** නීති අංශයේ ප්‍රධානත්වයෙන් යුත් IHL කමිටු රැස්වීමක් ජාතික IHL කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් කැඳවන ලදී. "අවිනිශ්චිතතාවය මඟ හරින්න - මනුෂ්‍යත්වය ශක්තිමත් කරන්න" යන තේමාව යටතේ රතු කුරුස සහ රතු අඩ සඳ සංවිධානයේ 34 වන ජාත්‍යන්තර සමුළුවට අදාළ IHL කමිටු සාමාජිකයින් සූදානම් කිරීමේ රැස්වීමක් 2024 ජුනි 27 වන දින පැවැත්විණි.

ICRC හි මූල්‍ය ආධාර ඇතිව නීති අංශය, අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ජීව විද්‍යාත්මක අවි සම්මුතියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය නීති සම්පාදනය කිරීම සඳහා කෙටුම්පත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීය. ICRC සමඟ සහයෝගයෙන්, "ගෝලීය සහ ශ්‍රී ලාංකික ඉදිරිදර්ශන" යන තේමාව යටතේ ජිනීවා සම්මුතීන්හි 75 වන වසර 2024 අගෝස්තු 14 වන දින BMICH හිදී සමරනු ලැබූ අතර ඉන් පසුව කමිටු සාකච්ඡාවක් සහ ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්විණි.

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින් ජිනීවා සම්මුතීන්හි සිංහල සහ දෙමළ පරිවර්තන සඳහා නිල අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය නීති අංශය ආරම්භ කර ඇත. ජාත්‍යන්තර මානුෂීය නීතිය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව දක්වන අඛණ්ඩ කැපවීම සැලකිල්ලට ගනිමින්, නීති අංශය විසින් රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ 34 වන ජාත්‍යන්තර සමුළුවේදී "ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුකූල වීමේ විශ්වීය සංස්කෘතියක් කරා" යන තේමාව යටතේ ශ්‍රී ලංකා රජයේ නිශ්චිත ප්‍රතිඥාව කෙටුම්පත් කරන ලදී.

**20.13. ගුවන් සේවා ගිවිසුම්:** නීති අංශය ගුවන් සේවා සඳහා රජයේ ද්විපාර්ශ්වික සාකච්ඡා කණ්ඩායමේ සාමාජිකයෙකි, තායිලන්තය සමඟ නව ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කරන ලද අතර වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ ගුවන් සේවා ගිවිසුම බලාත්මක කිරීමට පියවර ගෙන ඇත, ඊශ්‍රායලය සමඟ ගුවන් සේවා ගිවිසුම සඳහා වන ප්‍රොටෝකෝලය අවසන් කර අත්සන් කිරීමට සූදානම්ය. ඉන්දුනීසියාවේ ජාතික සෙවුම් සහ මුදාගැනීමේ ඒජන්සිය සහ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය අතර සෙවුම් සහ මුදාගැනීමේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අලුත් කිරීම සඳහා නීති අංශය පියවර ගෙන ඇත. මියන්මාරය සමඟ ගුවන් සේවා ගිවිසුම ගුවන් සේවා සඳහා රජයේ ද්විපාර්ශ්වික සාකච්ඡා කණ්ඩායම විසින් සාකච්ඡා කරන ලද අතර ඔවුන්ගේ එකඟතාවය සඳහා මියන්මාර පාර්ශවයට යැවීමට ශ්‍රී ලංකා රජයේ නිරීක්ෂණ ලබාදී ඇත. හංගේරියාව සමඟ නව ගුවන් සේවා ගිවිසුමක් ආරම්භ කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කර ඇති අතර කෙටුම්පත් ආකෘතියක් හංගේරියානු බලධාරීන් සමඟ බෙදාගෙන ඇත.

**20.14. බිම්ස්ටෙක්** : නීති අංශය බිම්ස්ටෙක් ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් සඳහා නිරීක්ෂණ ලබාදී අනුමත කර ඇත. ඒ අතර BIMSTEC සමුද්‍රීය සහයෝගීතාව පිළිබඳ ගිවිසුම, ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානය (IORA) සහ බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක මුලපිරීම (BIMSTEC) අතර අවබෝධතා ගිවිසුම, බිම්ස්ටෙක් බලශක්ති මධ්‍යස්ථානයේ (BEC) සත්කාරක රට ගිවිසුම, බිම්ස්ටෙක් සාමාජික රටවල් අතර වසංගත වැළැක්වීම, සූදානම සහ ප්‍රතිචාර දැක්වීම සහ සෞඛ්‍ය පද්ධති ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා බිම්ස්ටෙක් සහ ලෝක බැංකුව අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම ඇතුළත් වේ. ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානය (IORA) සහ බිම්ස්ටෙක් අතර අවබෝධතා ගිවිසුම. ආසියා සහ පැසිෆික් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP) සහ බිම්ස්ටෙක් අතර අවබෝධතා ගිවිසුම. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සහ BIMSTEC අතර අවබෝධතා ගිවිසුම. එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS) සහ BIMSTEC අතර අවබෝධතා ගිවිසුම.

**20.15. IAEA කරුණු:** නීති අංශය 2024 අගෝස්තු 19-21 දිනවල ලාඕ පී.ඩී.ආර්. හි ලුආන් ප්‍රබාං හි පැවති න්‍යෂ්ටික ද්‍රව්‍ය භෞතික ආරක්ෂාව පිළිබඳ සම්මුතියට (CPPNM) සංශෝධනය විශ්වීයකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ IAEA කලාපීය වැඩමුළුවේදී අමාත්‍යාංශය නියෝජනය කළේය. නීති අංශය න්‍යෂ්ටික නීති සම්පාදනයේ ජාතික නීති රාමු සංවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද කමිටුව ද නියෝජනය කරන අතර 2024 වර්ෂය තුළ එම කමිටුවට එහි සේවාවන් ලබා දී ඇත.

**20.16. සයිබර් ආරක්ෂාව සහ සයිබර් අපරාධ වැළැක්වීම:** අපරාධ අරමුණු සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් (ICT) භාවිතය වැළැක්වීම සඳහා වූ පුළුල් ජාත්‍යන්තර සම්මුතියක් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා UNODC තාවකාලික කමිටුවේ සාකච්ඡා සඳහා නීති අංශය ක්‍රියාකාරීව සහභාගී විය. අවසානයේ, 2024 අගෝස්තු මාසයේදී සයිබර් අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය; තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මගින් සිදු කරන ලද ඇතැම් අපරාධ මැඩපැවැත්වීම සඳහා සහ බරපතල අපරාධවල සාක්ෂි ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් බෙදා ගැනීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම සම්මත කරන ලදී.

**20.17. අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ:** 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ නීති අංශය විසින් ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ කැබිනට් නිරීක්ෂණ 90 ක් සකස් කරන ලදී.

**20.18. පූර්ණ බලතල:** වර්ෂය තුලදී නීති අංශය විසින් සම්පූර්ණ බල සහිත නීතිමය ලියවිලි 45ක් සකස් කර ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ අත්සන සඳහා ඉදිරිපත් කර ඇත.

**20.19. විදේශීය සිතාසි:** නීති අංශය අධිකරණ අමාත්‍යාංශය, අදාළ අධිකරණ සහ විදේශ දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් විදේශ රටවල සිතාසි 235 ක් සඳහා පහසුකම් සපයන ලදී. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනතට සහාය වීම සඳහා, ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාව හරහා විදේශයන්හි ජීවත්වන එම නඩු වල අදාළ පාර්ශවයන්ගෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා අධිකරණ නඩු 52 ක් සඳහා පහසුකම් සපයන ලදී. නීති අංශය ශ්‍රී ලංකාවේදී ඔවුන්ගේ සිතාසි භාර දීම සඳහා විදේශ රටවලින් ලැබුණු ඉල්ලීම් 263 ක් සඳහා පහසුකම් සපයන ලදී.

**20.20. අක්තපත්‍ර**: නීති අංශය විසින් එක්සත් ජාතීන්ගේ අංශය විසින් ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අත්සන් සඳහා කෙටුම්පත් කරන ලද සියලුම අක්තපත්‍ර පරීක්ෂා කරන ලදී.

**20.21. අන්‍යෝන්‍ය නීති ආධාර (MLA), වැරදිකරුවන් පිටුවහල් කිරීම සහ මාරු කිරීම (PTA) ඉල්ලීම්:** 2024 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අන්‍යෝන්‍ය නීති ආධාර ඉල්ලීම් 43 ක්, පිටුවහල් කිරීමේ ඉල්ලීම් 23 ක් සහ වැරදිකරුවන් මාරු කිරීමේ ඉල්ලීම් 09 ක් සඳහා පහසුකම් සපයා ඇත. ලැට්වියාව සහ සෞදි අරාබිය සමඟ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ අත්‍යව්‍ය සාකච්ඡා අවසන් කරන ලදී. පිලිපීනය, සෞදි අරාබිය සමඟ අන්‍යෝන්‍ය නීතී අධාර වැරදිකරුවන් පිටුවහල් සහ මාරු කිරීම පිළිබඳ සාකච්ඡා අවසන් කරන ලදී.

**20.22. සාර්ක් බේරුම්කරණ කවුන්සිලය (SRCCO):** 2024 දෙසැම්බර් මාසයේදී කොළඹ පැවති සාකච්ඡාවලදී ශ්‍රී ලංකාවේ ස්ථාවරය ඉදිරිපත් කරමින් ඉහත කලාපීය සංස්ථා සංවිධානයේ අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන්නනේ නීති අංශයයි.

**20.23. අත්සන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්:** 2024 ජනවාරි 1 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා නීති අංශයේ ගිවිසුම් තැන්පතුවෙහි ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 43 ක් අත්සන් කර තැන්පත් කරන ලදී.

**20.24. නීතිමය අදහස් ලබා දීම:** විදේශ ලේකම්වරයාට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශවලට, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවලට මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත නීතිමය අදහස් 225 කට වඩා ලබා දී ඇත.

**20.25. නීති අංශයේ නිලධාරීන් කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ඇතැම් කමිටුවල සහ අනෙකුත් කමිටුවල සාමාජිකයින් ලෙස පත් කරනු ලැබේ.**

i. ත්‍රස්ත විරෝධී පුළුල් නීති සම්පාදනය සංවර්ධනය කිරීමේ කමිටුව.

ii. ජාතික සාගර කටයුතු කමිටුව.

iii. උපායමාර්ගික වෙළඳ පාලනය (STC) පිළිබඳ UNSCR 1540 ක්‍රියාත්මක කිරීම සහ STC පිළිබඳ නීති කෙටුම්පත් අවසන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ නීති කමිටුව.

iv. මූල්‍ය බුද්ධි ඒකකය, ජාතික සම්බන්ධීකරණ කමිටුව සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (APG) සහ මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) සම්බන්ධ සියලුම අමාත්‍යාංශ කටයුතු සිදු කරයි.

v. APG අන්‍යෝන්‍ය ඇගයීම සඳහා අවශ්‍යතාවයක් වන මූල්‍ය බුද්ධි ඒකකය විසින් පවත්වනු ලබන ජාතික අවදානම් තක්සේරු කමිටුව.

vi. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ඉලක්කගත මූල්‍ය සම්බාධක (TFS) කමිටුව.

vii. 1373 (2012 අංක 1 නියාමනය) ලැයිස්තුගත කිරීමේ කමිටුව

viii. ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධක බලකාය

ix. 1996 අංක 02 ධීවර හා ජලජ සම්පත් පනත අවලංගු කිරීම පිළිබඳ කමිටුව

x. න්‍යෂ්ටික නීති පිළිබඳ ජාතික නීති සම්පාදනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව.

xi. CDS සභාපතිත්වය දරන සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව.

xii. ජාතික ජල විද්‍යාත්මක කවුන්සිලය පිළිබඳ කමිටුව

xiii. නව න්‍යෂ්ටික පනත සමාලෝචන කමිටුව

xiv. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත සමාලෝචන කමිටුව

xv. විදේශීය ආයතන සමඟ උසස් අධ්‍යාපන අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටුව

xvi. සයිබර් අපරාධ පිළිබඳ ගෝලීය ක්‍රියාමාර්ග වැඩිදියුණු කළ (GLACY-e) නීති ව්‍යාපෘති කණ්ඩායම

xvii. ජාතික ප්‍රතිපත්ති සහ සංක්‍රමණික රැකියා පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මේ තාක්ෂණික මෙහෙයුම් කමිටුව - ශ්‍රී ලංකාව 2023-2027

xviii. තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ ශ්‍රී ලංකාවේ සංක්‍රමණ ආශ්‍රිත ඉලක්කවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ SDGS සඳහා සංක්‍රමණයේ දායකත්වය තක්සේරු කිරීම සඳහා අන්තර් ආයතන කමිටුව.

**20.26. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම් සහ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්:** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු - 2024 ජනවාරි 1 වන දින සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ 2016 අංක 12 දරන RTI පනත යටතේ RTI ඉල්ලීම් 90 ක් ලැබී ඇත. එම ඉල්ලීම් 90 න් ඉල්ලීම් 34 ක් සඳහා පහසුකම් සලසා ඇති අතර, ඉල්ලීම් 27 ක් ප්‍රතික්ෂේප කර ඇති අතර ඉල්ලීම් 29 ක් විභාග වෙමින් පවතී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසමට අභියාචනා පහක් ඉදිරිපත් කර ඇති අතර, සියලුම අභියාචනා කොමිසම විසින් විසඳා ඇත.

**20.27. ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්:** 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නීති අංශය ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 790 ක් පමණ පරීක්ෂා කර ඇති අතර විවිධ ක්ෂේත්‍ර සඳහා උපදෙස් 195 ක් පමණ ලබා දී ඇත."උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ" ක්ෂේත්‍රයේ ගිවිසුම්/අවබෝධතා ගිවිසුම් 59 ක් සඳහා නීති අංශය නිරීක්ෂණ ලබා දී ඇත.

නීති අංශයේ ගිවිසුම් තැන්පතුවෙහි ඇති වාර්තාවලට අනුව, නීති අංශයේ නිදහස් වෙළඳාම, සංවර්ධන සහයෝගීතාව, ගුවන් සේවා, රේගු කටයුතු, ආරක්ෂක සහයෝගීතාව, සංවර්ධන සහයෝගීතාව, ආයෝජන සහයෝගීතාව, වෙළඳ ප්‍රවර්ධනය, ද්විත්ව බදුකරණය, වීසා නිදහස් කිරීම්, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා, සංස්කෘතික සහයෝගීතාව, අධ්‍යාපන හා සංචාරක අංශය, චිත්‍රපට සහයෝගීතාව, බෞද්ධ සබඳතා සහ ක්‍රීඩා අංශය යන ක්ෂේත්‍රවල ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්/සන්ධාන 43 ක් තැන්පත් කර ඇත.

## 21.විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශය

මෙම අංශයේ ප්‍රධාන වගකීම වන්නේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල / විදේශ තනතුරු වලට අදාළ විදේශීය වත්කම් කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. අමාත්‍යාංශයේ සංචාරක ඒකකය, සයිෆර් සහ ආරක්ෂක තැපැල් අංශය ද අධීක්ෂණය කරයි.

**21.1. 2024 දී විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල පිහිටුවීම සහ නැවත විවෘත කිරීම:** වෙලින්ටන්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ස්ථාපිත කර ඇති අතර මහ කොමසාරිස් කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන සම්පූර්ණ කර ඇත. දූත මණ්ඩල ප්‍රධානියා සහ කාර්ය මණ්ඩලය පත් කර ඇත. සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන සහ මූලික කටයුතු සම්පූර්ණ කර ඇත. පත්වීමෙන් පසු කාර්ය මණ්ඩලයට සේවය ආරම්භ කළ හැකිය.

**21.2. බර ගමන් මලු සහ ගුවන් ගමන් පහසුකම් සැපයීම:** නියමිත කාල සීමාව තුළ මාණ්ඩලික නිලධාරීන් 166 දෙනෙකු සහ නිලධාරීන්ගේ පවුලේ සාමාජිකයින් 224 දෙනෙකු ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අනුයුක්ත කරන ලදී. ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර, වීසා, ගුවන් ටිකට්පත්, බර ගමන් මලු ලබා ගැනීමට පහසුකම් සපයන ලදී. එකවර දීමනා 77 ක් හා ගමන් හිමිකම් 93 සඳහා පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ශ්‍රී ලංකාවට මාරු කරන ලද නිලධාරින් 205 දෙනෙකුගේ සංචලනය සම්බන්ධයෙන් අවශ්‍ය විධිමත් කටයුතු සහ පරිපාලන කටයුතු හසුරුවන ලදී. (බර ගමන් මලු / එකවර දීමනා, ගුවන් ටිකට්පත් මිලදී ගැනීම, ගමන් හිමිකම් ආදිය)

**21.3.චංචල ප්‍රාග්ධන අයිතම ප්‍රසම්පාදනය සහ නඩත්තුව:** සම්පූර්ණ මිලදී ගැනීමේ පදනම මත (වාහන 09) සහ මෙහෙයුම් කල්බදු පදනම මත (වාහන 03) වන පරිදි වාහන සංඛ්‍යාව 12ක් ප්‍රසම්පාදනය

කර ඇත. ප්‍රාග්ධන අයිතම මිලදී ගැනීම සඳහා විදේශ දූත මණ්ඩල/තනතුරු වලින් ලැබුණු මුළු ඉල්ලීම්/ඇණවුම් 341ක් (එනම් ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ වෙනත්) අංශය විසින් අවධානයට භාජනය කරන ලදී. නියමිත වර්ෂයේදී ප්‍රාග්ධන අයිතම මිලදී ගැනීම සඳහා වූ මුළු වියදම රු. 80, 788,356.93ක් වූ අතර එය ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් 269,294.52ක් විය (සාමාන්‍ය සමානාත්මතා අනුපාතය ඇමරිකානු ඩොලර් 300ක් ලෙස).

**21.4. වාන්සරි / නිවාස කුලියට දීම / බදු දීම:** කුලී පදනම මත නව නිල නිවාස 87 ක් සහ ගිවිසුම් අලුත් කිරීමේ 148 ක් කුලියට දීම අංශය විසින් සිදු කරන ලදී.

**21.5.විදේශයන්හි ශ්‍රී ලංකා රජයට අයත් දේපළ නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම:** විදේශ ලේකම්වරයාගේ නියෝග මත, නවදිල්ලි, කැන්බරා, බැංකොක්, චෙන්නායි, ජකර්තා, බීජිං යන නගරවල ශ්‍රී ලංකා රජයට අයත් දේපළවල ප්‍රතිසංස්කරණ කටයුතු මෙහෙයවීම සහ පහසුකම් සැලසීම මෙම අංශය විසින් සිදු කරන ලදී.

**21.6.අමාත්‍යාංශයට අයත් කොළඹ පිහිටි කාර්ය මණ්ඩල නිවාස වෙන් කිරීම:** නැවත පැමිණෙන ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ගේ නිවාස / නවාතැන් අවශ්‍යතා සපුරාලීම සඳහා, නිවාස ඒකක 14 ක් වෙන් කිරීම අංශය විසින් සිදු කරන ලදී.

**21.7.විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම:** අභ්‍යන්තර විගණන සහ රජයේ විගණන අංශය විසින් මතු කරන ලද විගණන විමසුම්වලට වලට කාලෝචිත ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම. ඒ අනුව විගණන විමසුම් 18 කට ප්‍රතිචාර දක්වන ලදී.

**21.8. විදේශ දූත මණ්ඩලවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**: ශ්‍රී ලංකා රජයේ දේපළවලට සිදුවන පාඩු හා හානි වැළැක්වීම සඳහා, විදේශයන්හි සියලුම දූත මණ්ඩල විසින් කාලෝචිත ආකාරයකින් සමීක්ෂණ මණ්ඩල වාර්තා (2023) ඉදිරිපත් කළ යුතු බවට අංශය නියෝග කළේය. සියලුම දූත මණ්ඩල/කාර්යාල හැට එකම 2024 වර්ෂය සඳහා මෙම නියෝගයට අනුකූල වී ඇත.

**21.9.වගකීම් වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීම:** සංචාරක හිමිකම්, එකවර දීමනා සහ ප්‍රාග්ධන අයිතම ප්‍රසම්පාදනයට අදාළ සියලුම වාර්තා නිවැරදිව හා කාලෝචිත ලෙස සකස් කිරීම සහතික කිරීම. ජනාධිපති ලේකම් කාර්යාලය, විගණකාධිපති, තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම් සහ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අංශය නිසි කලට ප්‍රතිචාර දක්වා ඇත. ඊට අමතරව, අපි අදාළ බලධාරීන් සහ විදේශයන්හි දූත මණ්ඩල/කාර්යාල සමඟ ඵලදායී සම්බන්ධීකරණයක් කාලෝචිත හා රහසිගත ආකාරයකින් පවත්වා ගෙන ගොස් ඇත. මෙම අංශයේ විෂය පථය තුළ ඇති සියලුම කටයුතු ලේකම්/විදේශ කටයුතු සහ ස්ථාපිත රෙගුලාසි/ක්‍රියා පටිපාටි සහ සම්මත පිළිවෙත් දැඩි ලෙස පිළිපැදීමෙන් ක්‍රියාත්මක කර ඇත.

ඵලදායී විදේශීය වත්කම් කළමනාකරණ සංවර්ධනය සහතික කිරීම සඳහා, විදේශ වත්කම් කළමනාකරණ සහ සංවර්ධන අංශයේ අතිරේක ලේකම් සහ මාණ්ඩලික නිලධාරීන් විසින් අංශයේ විෂය පථයට අයත් කරුණු පිළිබඳ නිතිපතා ප්‍රගති ඇගයීම් සහ තක්සේරු කිරීම් සිදු කර ඇත. අමාත්‍යාංශයේ අරමුදල් කාර්යක්ෂමව හා ආර්ථික වශයෙන් භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා, අවශ්‍ය පරිදි විදේශ දූත මණ්ඩල සඳහා අංශය කාලෝචිත චක්‍රලේඛ සහ සම්මත් මෙහෙයුම් ක්‍රියාපටිපාටි නිකුත් කර ඇත.

**21.10. සංචාරක ඒකකය:** සංචාරක අංශය අමාත්‍යාංශයේ ප්‍රභූවරුන් සහ නිලධාරීන් සඳහා වීසා සැකසීම, සංචාරක වෙන්කරවා ගැනීම් සහ විදේශ දීමනා ගෙවීම් ඇතුළුව සියලුම නිල සංචාරක විධිවිධාන කළමනාකරණය කරයි. ඊට අමතරව, රාජ්‍ය තාන්ත්‍රිකයින්, නිලධාරීන් සහ මහජනතාව සඳහා වීසා අයදුම්පත් පහසු කිරීම සඳහා සංචාරක අංශය තෙවන පාර්ශවීය සටහන් (TPN) නිකුත් කරයි. නිශ්චිත කාල සීමාව තුළ, සංචාරක අංශය අමාත්‍යාංශ නිලධාරීන් 215 දෙනෙකු සඳහා වීසා සහ ගුවන් ගමන් සඳහා පහසුකම් සැලසූ අතර, නිල සංචාර 100 කට සහාය විය. තවද, විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල රජයේ නිලධාරීන්ට වීසා ලබා ගැනීමේදී සහාය වීම සඳහා තෙවන

පාර්ශවීය සටහන් 1713 ක් නිකුත් කරන ලදී.

**21.11. තොරතුරු තාක්ෂණ අංශය / සයිෆර්:** සයිෆර් අංශය අමාත්‍යාංශයේ ප්‍රධාන සන්නිවේදන මධ්‍යස්ථානය වන අතර, අමාත්‍යාංශය එහි සියලුම විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, අමාත්‍යාංශවලින් පිටත සහ අනෙකුත් රජයේ ආයතන සහ ආයතන ආදිය සමඟ සම්බන්ධ කර සන්නිවේදනය කරයි. ආසන්න වශයෙන් අභ්‍යන්තර සන්නිවේදන 34,780 ක් සහ බාහිර සන්නිවේදන 21408 ක් ශ්‍රී ලංකා දූත මණ්ඩල / විදේශ කාර්යාල වෙත සකසා ඇත.

**21.12. ආරක්ෂක තැපැල් අංශය:** ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල 61 කින් සහ ඒ වෙත රාජ්‍ය තාන්ත්‍රික බෑග් හැසිරවීම. ඊට අමතරව, ඖෂධ, ප්‍රවර්ධන අයිතම අඩංගු විශේෂ රාජ්‍ය තාන්ත්‍රික තොග හැසිරවීම සිදු කරනු ලබන අතර ලැබුණු ලේඛන අදාළ අංශ වෙත බෙදා හැරීම ද අංශය විසින් සිදු කරනු ලැබේ.

**I. අදාළ කාලය තුළ පිටතට ගිය රාජ්‍ය තාන්ත්‍රික බෑග් චලනයන්**

| | |
|---|---|
| ශ්‍රී ලංකන් ගුවන් සේවය හරහා | 683 |
| DHL හරහා | 787 |

**II. අදාළ කාලය තුළ පැමිණි රාජ්‍ය තාන්ත්‍රික බෑග් චලනයන්**

| | |
|---|---|
| ශ්‍රී ලංකන් ගුවන් සේවය හරහා | 224 |
| DHL හරහා | 103 |

## 22. සන්ධාන අංශය

සන්ධාන අංශයේ කාර්යය, උත්සවාකාර කාර්යයන් සම්බන්ධීකරණය කිරීම, විදේශීය රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි විශේෂිත ආයතන සහ ශ්‍රී ලංකාවට අනුබද්ධ ජාත්‍යන්තර සංවිධාන සඳහා ලබා දී ඇති රාජ්‍ය තාන්ත්‍රික විනිර්මුක්තිය සහ වරප්‍රසාද සඳහා පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම, ශ්‍රී ලංකාවට අනුබද්ධ දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා (කොළඹ පදනම් කරගත් සහ අනෙකුත් දූත මණ්ඩලවලින් සමගාමී ප්‍රතිතන) විධිවිධාන පහසුකම් සැලසීම සහ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සැපයුම් සහ සන්ධාන විධිවිධාන පහසුකම් සැලසීම ලෙස දැක්විය හැක.

සමාලෝචන කාලය තුළ, මෙම අංශය පහත පහසුකම් සපයා ඇත.

**ශ්‍රී ලංකාවට සිදුකරන ලද (අභ්‍යන්තර) සංචාර:** රාජ්‍ය නායකයින්ගේ/රජයේ නායකයින්ගේ සංචාර හයක් (06), විදේශ අමාත්‍යවරුන්ගේ සංචාර හතක් (07), කථානායකවරුන්ගේ/අනෙකුත් අමාත්‍යවරුන්ගේ සංචාර හතර (04) සහ අනෙකුත් විදේශීය සම්භාවනීය අමුත්තන්ගේ සංචාර අටක් (08) ඇතුළුව අභ්‍යන්තර සංචාර විසිපහක් (25).

**බාහිර සංචාර:** අතිගරු ජනාධිපතිතුමාගේ සංචාර හයක් (06), ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංචාර දෙකක් (02), ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාර පහළොවක් (15) සහ ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ සංචාර අටක් (08).

**සම්මන්ත්‍රණ සහ රැස්වීම්:** සමාලෝචන කාලය තුළ කොළඹ ආරක්ෂක සමුළුව සඳහා පහසුකම් සපයන ලද්දේ මෙම අංශය විසිනි. ඊට අමතරව, ඒකාබද්ධ කොමිෂන් සභා, දේශපාලන උපදේශන, රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා සහ විවිධ විෂයයන් පිළිබඳ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සඳහා පහසුකම් සපයන ලදී.

**සන්ධාන අංශය විසින් සංවිධානය කරන ලද විශේෂ සමාජ උත්සව:** සමාලෝචිත කාලය තුළ මෙම අංශය ජනතාව අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා උත්සව **හතරක් (**04) සංවිධානය කළේය.

**පත්වීම්**: පහත සඳහන් රාජ්‍යතාන්ත්‍රික පත්වීම් සිදු කරන ලදී:-

I. අක්තපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව පැවැත්වීම - 06
II. ශ්‍රී ලංකාවට විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම - 32
III. ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් පත් කිරීම - 12
IV. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම - 07
V. ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන්මගේ සේවා කාලය දීර්ඝ කිරීම - 35
VI. ශ්‍රී ලංකාවේ විදේශ රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත් කිරීම සඳහා පහසුකම් සැලසීම -01

**විනිර්මුක්තීන් සහ වරප්‍රසාද:** තවද, රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ විනිර්මුක්තීන් සහ වරප්‍රසාද සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම මෙම අංශය විසින් සිදු කර ඇත.

**වීසා:** වීසා 1610 ක් නිකුත් කරන ලදී

රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශනය; ගුවන් ගමන් 167 ක් සහ නැව් 33 ක් සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාශනය ලබා දෙන ලදී.

# අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ

**සේවක සංඛ්‍යා කළමනාකරණය**

**2024 දෙසැම්බර් 31** වන දිනට අමාත්‍යාංශයේ (කොළඹ) කාර්ය මණ්ඩලය*

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්තය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ [1] | 105 | 90 | 15/* |
| තෘතියික [2] | 09 | 05 | 04/* |
| ද්විතියික [3] | 448 | 401 | 47/* |
| ප්‍රාථමික [4] | 128 | 127 | */01 |

මෙම අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

**2024 දෙසැම්බර් 31** වන විට දූත මණ්ඩලවල කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්තය |
|---|---|---|---|
| **සියරට පේරුවෙන්** | | | |
| ජ්‍යෙෂ්ඨ / තෘතියික [5] | 239 | 152 | 87 |
| ද්විතියික [6] | 247 | 190 | 57 |
| ප්‍රාථමික [7] | 07 | 06 | 01 |
| **දේශීව වශයෙන් බඳවා ගන්නා ලද** | | | |
| ද්විතියික [8] | 240 | 182 | 58 |
| ප්‍රාථමික [9] | 309 | 242 | 67 |

1 ජ්‍යෙෂ්ඨ - ශ්‍රී ලංකා විදේශ සේවය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ගණකාධිකාරී සේවය, නීති නිලධාරීන්, විගණක සේවය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ඇතුළු විධායක මට්ටමේ නිලධාරීන්.

2 කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්, භාෂා පරිවර්තක සේවය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය

3 සංවර්ධන නිලධාරී සේවයේ, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ, පුස්තකාලයාධිපති, පිළිගැනීමේ නිලධාරි සහ අනෙකුත් දෙපාර්තමේන්තු සේවා නිලධාරීන්

4 රියදුරන්, කාර්යාල සේවකයින්, සනීපාරක්ෂක කම්කරුවන්, විදුලි කාර්මිකයන් ආදී නිලධාරීන්.

5 දූත මණ්ඩල ප්‍රධානියා, මිනිස්ටර් කවුන්සලර්, , පළමු ලේකම්, දෙවන ලේකම්, තෙවන ලේකම්

6 සංවර්ධන සහකාර, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්

7 රියදුරන්, කාර්යාල සේවකයින්, සනීපාරක්ෂක කම්කරුවන් ඇතුළු නිලධාරීන්

8 ලිපිකරුවන්, පිළිගැනීමේ නිලධාරීන්, ලඝුලේඛකයින්, භාෂා පරිවර්තකයින්, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු නිලධාරීන්

9 කාර්යාල සේවකයින්, රියදුරන් සහ සනීපාරක්ෂක කම්කරුවන් ඇතුළු නිලධාරීන්

## මූල්‍ය වාර්තා

**ප්‍රතිපාදන භාවිතයේ කාර්ය සාධනය (2024 දෙසැම්බර් 31 දිනට)** ශ්‍රී ලංකා රුපියල් '000

| ප්‍රතිපාදන වර්ගය | ප්‍රතිපාදන වෙන් කිරීම 2024 | | තථ්‍ය වියදම (2024 දෙසැම්බර් 31 වන විට) | ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපානයේ %ක් ලෙස (2024 දෙසැම්බර් 31 වන විට) |
|---|---|---|---|---|
| | තත්‍ය | අවසන් | | |
| පුනරාවර්තන | 18,874,025 | 18,736,075 | 16,528,076 | 88% |
| ප්‍රාග්ධන | 738,000 | 875,950 | 443,205 | 51% |
| එකතුව | **19,612,025** | **19,612,025** | **16,971,281** | 87% |

**ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2024**

| අයවැය යෝජනාව අංකය. | යෝජනාව (කෙටියෙන්) | වෙන් කළ ප්‍රතිපාදන | අපේක්ෂිත ප්‍රතිලාභය (අදාළ නම්) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | භෞතික % | මූල්‍ය % % |
| නොමැත | නොමැත | නොමැත | නොමැත | නොමැත | නොමැත |

**මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය** ශ්‍රී ලංකා රුපියල් '000

| වත්කම් කේතය | කේත විස්තරය | 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය | ගිණුම්ගත කිරීමට | % ලෙස ප්‍රගතිය වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහය | | 10,555,257 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | | 1,987,678 | | 100% |
| 9153 | ඉඩම් | | 1,010,362 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 55,803 | | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරෙමින් පවතින වැඩ | | - | | - |
| 9180 | බදු වත්කම් | | - | | - |

ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - 2024 (2024 දෙසැම්බර් 31 වන විට) ශ්‍රී ලංකා රුපියල් ‘000

| ආදායම් කේතය | ආදායම් කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව 2024 | | එකතු කළ ආදායම (2024 දෙසැම්බර් 31 වන විට) | |
|---|---|---|---|---|---|
| | | තත්‍ය | අවසන් | ප්‍රමාණය | අවසාන ආදායම ඇස්තමේන්තුවෙන් % ක් ලෙස |
| 1003-07-02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 10,000 | 12,800 | 34,684 | 271% |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලියට දීම | 3,000 | 3,000 | 3,772 | 126% |
| 2002-02-99 | අනෙකුත් පොලී | 5,000 | 9,100 | 12,050 | 132% |
| 2003-02-07 | ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු | 3,600,000 | 3,800,000 | 3,643,095 | 96% |
| 2003-02-13 | විභාග සහ අනෙකුත් ගාස්තු | 25 | 25 | 1 | 4% |
| 2003-02-14 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 30,000 | 36,000 | 35,203 | 98% |
| 2003-02-99 | කොන්සියුලර් ගාස්තු | 2,000,000 | 2,200,000 | 2,119,938 | 96% |
| 2003-99-00 | වෙනත් ලැබීම් | 325,000 | 350,000 | 258,271 | 74% |
| 2004-01-00 | සමාජ ආරක්ෂණ දායකත්වයන්) (මධ්‍යම රජය) | 35,000 | 40,000 | 39,299 | 98% |
| 2004-02-00 | සමාජ ආරක්ෂණ දායකත්වයන්) (පළාත් සභා) | 600 | 675 | 697 | 103% |
| 2006-02-01 | ප්‍රාග්ධන වත්කම් (වාහන) විකිණීම | 6,000 | 6,000 | 1,479 | 25% |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්) | 200 | 200 | 118 | 59% |
| **එකතුව** | | **6,014,825** | **6,457,800** | **6,148,607** | **95%** |

# ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKIIRSS)

**ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනයේ කාර්ය භාරය**

මෙම ආයතනයෙහි කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අවශ්‍යතා පිළිබඳ ස්වාධීන පර්යේෂණවල නිරත වීම වන අතර එමඟින් රටේ බුද්ධිමය පැතිකඩ ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ අමාත්‍ය කදිර්ගාමර් මහතාගේ දැක්ම පිළිබිඹු වේ. මේ සඳහා, සමකාලීන ගෝලීය ගතිකතාවන් මගින් දැනුවත් කරන ලද, හොඳම භාවිතයන් සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතිපත්ති ප්‍රමිතීන් උපයෝගී කර ගනිමින්, වර්තමාන සහ කාලෝචිත පර්යේෂණ සිදු කිරීමට උත්සාහ කර ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා රජයට වඩාත් පුළුල් ලෙස කරුණු සහ පර්යේෂණ මත පදනම්ව තීරණ ගැනීමට සහාය වන ප්‍රතිපත්තිමය වශයෙන් අදාළ පර්යේෂණ සිදු කිරීමේදී මෙම ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය, විදේශ කටයුතු අමාත්‍යාංශයට ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පුළුල් විදේශ ප්‍රතිපත්ති අදාළ ප්‍රජාව වෙත ළඟා විය හැකි මාර්ගයක් ලෙසද ක්‍රියා කරයි.

විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් (BOM) මගින් මෙය පාලනය වන අතර සාමාජිකයින් 8 දෙනෙකු ඊට ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී, කළමනාකරණ මණ්ඩලය 2024 ජනවාරි 11 වැනි දින රැස්විය.

**ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ පර්යේෂණ වැඩසටහන සහ ප්‍රකාශන**

සංශෝධිත 'LKI පර්යේෂණ වැඩසටහන' කොටස් තුනක් යටතේ ව්‍යුහගත කර ඇත: ඒ ගෝලීය සබඳතා, ගෝලීය පාලනය සහ ගෝලීය ආර්ථිකය යනුවෙනි. කළමනාකරණ මණ්ඩලය විසින් 2023 ජූලි මාසයේදී එය අනුමත කරන ලදී. 'ගෝලීය සබඳතා' කොටස යනු ගෝලීය ගතිකතාවයන් මගින් දැනුම් දෙන ලද, එහි කාර්යයේ දී අව්‍යාජ 'ශ්‍රී ලාංකික විදේශ ප්‍රතිපත්ති ඉදිරිදර්ශනයක්' පරිණාමය කිරීම සඳහා ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයට වඩාත් ක්‍රියාකාරීව දායක වීමට හැකි වන පරිදි සිදු කරන ලද නව එකතු කිරීමකි. එක් එක් කොටස යටතේ පර්යේෂණයේ නිශ්චිත ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර, පර්යේෂණ සහායකයින් සහ පර්යේෂණ අභ්‍යාසලාභීන්ට අවධානය යොමු කිරීමට නිශ්චිත ගැටලු ක්ෂේත්‍ර පවරා ඇත.

වෙබ් අඩවියේ ප්‍රචාරය වන මාධ්‍ය නිවේදන, සමාජ මාධ්‍ය පළ කිරීම් සහ අර්ධ වාර්ෂික LKI යාවත්කාලීන කිරීම් වලට අමතරව, එහි පර්යේෂණවලින් ලැබෙන ප්‍රධාන ශාස්ත්‍රීය දායකත්වය වන්නේ ශ්‍රී ලංකාවට සහ සමකාලීන ලෝකයට බලපාන ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයන 'LKI ප්‍රතිපත්ති සංක්ෂිප්තයන්' මාලාවයි. එහි සාරාංශ සිංහල සහ දෙමළ භාෂාවෙන් ලබා ගත හැකිය. මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සංක්ෂිප්තයන් පහත පරිදි වේ:

1. විධායක අධ්‍යක්ෂ, තානාපති රවිනාථ ආර්යසිංහ මහතා විසින් සම්පාදිත - Straddling the major power rivalry in the Indian Ocean Region (IOR): Sri Lanka's quest to navigate in an Increasingly 'Zero-Sum' Environment,

2. පර්යේෂණ සහකාර, දුලනක ජයසිංහ මහතා විසින් සම්පාදිත, Sri Lanka's Role in UN Peacekeeping: Possibilities and Challenges for a Mutually Beneficial Process

3. පර්යේෂණ සහකාර, පර්යේෂණ අභ්‍යාසලාභිනී තේෂානි වැලිගමගේ මහත්මිය විසින් සම්පාදිත Countering Maritime Crime in the Indian Ocean: Evaluating the Effectiveness of IORA, Research Assistant,

4. පර්යේෂණ සහකාර දිල්මිණි අබේරත්න මහත්මිය විසින් සම්පාදිත Borrowing Wisely: Gaining Insights from Debt Restructuring in Ghana, Sri Lanka and Zambia,

5. පර්යේෂණ සාමාජික මයිකල් අයිවිසන් මහතා විසින් සම්පාදිත 'Debt-for-Renewables' Swaps: How to Address Climate, Debt and Energy Sector Vulnerabilities in Sri Lanka

6. පර්යේෂණ සහකාර මිහින් පෙරේරා මහතා විසින් සම්පාදිත Sri Lanka's Path to Economic Integration: An Assessment of Past Efforts and Prospects through the Regional Comprehensive Economic Partnership (RCEP),

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙහිදී ශ්‍රී ලංකාවේ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැසිරීම, වන්දි ගෙවීමේ කාර්යාලය, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය, හෙජින් ව්‍යාඛ්‍යානය, එක් තීරයක් එක් මාවතක් මුලපිරීමේ උපායමාර්ගික මාරුවීම් සංචාලනය කිරීම, ශ්‍රී ලංකාව සඳහා නව GSP ප්‍රතිසංස්කරණ සහ ඇඟවුම්, ඉන්දු-පැසිෆික් කලාපයේ න්‍යෂ්ටික නිරායුධකරණය සහ ප්‍රගුණනය නොකිරීම, ස්වයංක්‍රීය අවි පද්ධතිවල (AWS) නැගී එන ප්‍රවණතා, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ ආරක්ෂාව සහ නවෝත්පාදනය, BRICS හි සාමාජිකත්වය සඳහා ශ්‍රී ලංකාවේ ලංසුව, කොළඹ ආරක්ෂක සමුළුව, කලාපීය සහයෝගීතාවයේ සාර්ක් හි වත්මන් ගතිකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති ද 2024 වසරේදී ආරම්භ කරන ලදී.

**ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ ප්‍රමුඛ වැඩසටහන්**

විදේශ ප්‍රතිපත්තියට අදාළ සමකාලීන ගැටලුවක් ඇගයීමට ලක් කරන, මහජනතාවට විවෘත මණ්ඩල සාකච්ඡා පැවැත්වෙන *LKI* විදේශ ප්‍රතිපත්ති සංසදය, (ධ්‍රැවීකරණය වූ ලෝකයක නොබැඳි පිළිවෙතේ අදාළත්වය) *2024* පෙබරවාරි *21* සහ (ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලය සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය) *2024* ජූලි *11* යන දිනවල පැවැත්විණි.

වැතම් හවුස් නීති මත පදනම් වූ නිශ්චිත කරුණු පිළිබඳ කුඩා කණ්ඩායම් උපදේශන වන *LKI* විශේෂඥ වටමේස සාකච්ඡාව *2024* පෙබරවාරි *01* වන දින "ශ්‍රී ලංකාව - ඕස්ට්‍රේලියානු සබඳතා ශක්තිමත් කිරීම" යන මාතෘකාව යටතේ සහ *2024* ජුනි *13* වන දින සාර්ක් මහලේකම්වරයා සමඟ පැවැත්විණි.

විදේශ තානාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන, අධ්‍යයන/පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් සංවිධානය කරන ලද **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි** සහයෝගීතා වැඩසටහන් විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් බිම්ස්ටෙක් මහලේකම්වරයාගේ සහභාගීත්වයෙන් 2024 අප්‍රේල් 09 දින පැවැත්වූ "බිම්ස්ටෙක් හරහා කලාපීය සහයෝගීතාව" යන මැයෙන් පවත්වන ලද අන්තර් ක්‍රියාකාරී සැසිය, ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය සහ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝගයෙන් "ශ්‍රී ලංකාවේ සමුද්‍රීය වසම් දැනුවත්භාවය ගොඩනැගීම" යන මැයෙන් 2024 ජූනි මස 06 වන දින පවත්වන ලද වැඩමුළුව, "ඉන්දියානු සාගර කලාපයේ ආර්ථික ආරක්ෂාව; ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර සහයෝගීතාවයේ අපේක්ෂාවන්"යන මාතෘකාව යටතේ 2024 අගෝස්තු මස 21 වන දින කොරියානු ජනරජය සමඟ සංවිධානය කල ඒකාබද්ධ සම්මන්ත්‍රණය, "කෘතිම බුද්ධිය (AI), ස්වයංක්‍රීය අවි පද්ධති (AWS) සහ සමකාලීන අභියෝග" පිළිබඳ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සමඟ එක්ව 2024 දෙසැම්බර් 19 වන දින සංවිධානය කල සම්මන්ත්‍රණය. මෙම සැසිවලදී සාකච්ඡා කල කරුණු මත පදනම්ව ප්‍රකාශන ද සිදු කර ඇත.

ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා පොහොසත් සංස්කෘතිය සැමරීම සඳහා **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය** සංස්කෘතික සිදුවීම් ඇතුළත් වේදිකාවක් සපයන අතර, 'ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස: පෞරාණිකත්වයෙන් නූතනත්වයට' (2024 ජනවාරි) සහ 'ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයට මාටින් වික්‍රමසිංහගේ බලපෑම' (2024 ජනවාරි) යන මාතෘකා යටතේ විද්වත් මණ්ඩල සාකච්ඡා පැවැත්විණි.

ගරු ලක්ෂ්මන් කදිරගාමර් මහතාට ගෞරව කිරීම සඳහා වාර්ෂික අනුස්මරණ උත්සවය
(2024 අගෝස්තු).

**විදේශ කටයුතු අමාත්‍යාංශයට සහ අනෙකුත් රජයේ ආයතනවලට ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි දායකත්වය:** රජයට ප්‍රතිපත්ති නිර්දේශ ලබා දීමේ වගකීම ඉටු කරමින්, ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි

පර්යේෂණ ප්‍රතිඵල ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයාට, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ අමාත්‍යාංශ සහ ආයතනවල සහ විදේශ තානාපති කාර්යාලවල ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයින්ට ලබා දෙනු ලැබේ.

**ශ්‍රී ලංකා සහ බාහිර අධ්‍යාපන ජාල සඳහා ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි දායකත්වය:** ශ්‍රී ලංකා රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතනවල ජාත්‍යන්තර සබඳතාවලට අදාළ දෙපාර්තමේන්තු සමඟ සබඳතා ශක්තිමත් කර ඇති අතර, එහි පුස්තකාල පහසුකම් ඇතුළුව ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි සේවාවන් සිසුන්ට සහ අනෙකුත් පර්යේෂකයන්ට ලබා දී ඇත. විධායක අධ්‍යක්ෂවරයා නිරන්තරයෙන් බාහිර සැසි සඳහා කථිකයෙකු ලෙස සහභාගී වන අතර, විදේශ ප්‍රතිපත්ති සහ ඒ ආශ්‍රිත අධ්‍යයන ක්ෂේත්‍ර ගැඹුරින් අධ්‍යනය කිරීමට උනන්දුවක් දක්වන විශ්වවිද්‍යාල/වෙනත් ආයතනවල සිසුන් සඳහා සම්මන්ත්‍රණ/ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම ආයතනය ආරම්භ කර ඇත. 2024 දී පාකිස්තානයේ ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ ගේට්වේ හවුස්, චීන කොමියුනිස්ට් පක්ෂයේ ජාත්‍යන්තර දෙපාර්තමේන්තුව, එක්සත් ජනපද කොන්ග්‍රස් පර්යේෂණ සේවය, ඇමරිකා එක්සත් ජනපද-ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසම, යුරෝපීය සංගමය, ඇග්ඩර්-නෝර්වේ විශ්වවිද්‍යාලය, පෝලන්ත ජාත්‍යන්තර කටයුතු ආයතනය සහ ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය යන රටවල නියෝජිතයින් ඇතුළු සංචාරක කණ්ඩායම් සමඟ ක්‍රමික සැසි පවත්වා ඇත.

**ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි රැස්වීම් සහ සංචාර:** ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටින සහ සංචාරය කරන රාජ්‍යතාන්ත්‍රිකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ශාස්ත්‍රඥයින්, වෘත්තිකයන් සහ ක්‍රියාකාරීන් සඳහා සත්කාරකත්වය සැපයීම සඳහා ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය වේදිකාවක් ලෙස සේවය කරයි. ප්‍රජා සම්බන්ධතා රැස්වීම් මගින් හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීමට සහ එහි පර්යේෂණ සහ තීක්ෂ්ණ බුද්ධිය දේශීය හා ගෝලීය වශයෙන් ප්‍රේක්ෂකයින් සමඟ බෙදා ගැනීමට ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය සතු ක්‍රියාකාරී ප්‍රවේශය පිළිබිඹු වේ.

**පරිපාලනය:** 2001 දී විදේශ අමාත්‍යාංශයට අනුබද්ධ පර්යේෂණ ආයතනය ආරම්භ කිරීමේදී මුලින් ලබා දුන් දින සිට සේවක සංඛ්‍යාව සංශෝධනය කර නොතිබුණි. එම ආයතනය විධායක අධ්‍යක්ෂවරයෙකු සහ තවත් නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත විය. 2023 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද සාකච්ඡා ක්‍රියාවලියකින් පසුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මෙම විෂමතාව නිවැරදි කරන ලද අතර, එය 2024 අප්‍රේල් 17 වැනි දින ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය විසින් ඉල්ලා සිටි සංශෝධිත සේවක සංඛ්‍යාව අනුමත කරන ලද අතර එයට විධායක අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු/පර්යේෂණ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු/පරිපාලන සහ මූල්‍ය, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු/සන්නිවේදන සහ උපායමාර්ගික ප්‍රවේශය සහ විවිධ මට්ටම්වල පර්යේෂණ කටයුතු සඳහා වෙන් කර ඇති තවත් තනතුරු 9 ක් ඇතුළත් විය.

ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි ඓතිහාසික ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලයේ දිගුකාලීන අලුත්වැඩියාවන් 2024 දී සිදු කරන ලද අතර, එහි කොටස් අබලන් විය. ඊට අමතරව, යාබද පරිපාලන ඒකකයේ වහලයේ අලුත්වැඩියාවන් ද සිදු කරන ලද අතර, 2023 දී අලුත්වැඩියා කර නැවත ප්‍රතිසංස්කරණය කරන ලද පර්යේෂණ අංශයේ බාහිර කටයුතු අවසන් කරන ලදී. LKI හි ජලාපවහන පද්ධතියේ හදිසි අලුත්වැඩියාවන් ද සිදු කරන ලදී. ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය ප්‍රධාන ආදායම් සම්පතක් වන ශ්‍රවණාගාරයේ ශබ්ද පද්ධතියද වැඩිදියුණු කරන ලදී.

මෑත කාලයේ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි 'ප්‍රදීපාගාර ශ්‍රවණාගාරය' සඳහා සිදු කරන ලද වැඩිදියුණු කිරීම් සහ ආයතනයට මහජන වසම තුළ ලැබී ඇති වැඩි දෘශ්‍යතාව හේතුවෙන්, ස්ථාන කුලියට ගැනීම 2023 දී රුපියල් මිලියන 2.7 සිට 2024 දී රුපියල් මිලියන 5.2 දක්වා දෙගුණ කරන ලදී.

**මූල්‍ය / වත්කම් කළමනාකරණය**

ආදායම

2024 වර්ෂය සඳහා, විදේශ කටයුතු අමාත්‍යාංශය (MFA) හරහා ජාතික අයවැයෙන් රුපියල් 13,787,501.72 ක (2023 වර්ෂය සඳහා ප්‍රතිපූරණය ලෙස ලැබුණු මිලියන 4 ක් ඇතුළත්) (පුනරාවර්තන) මුදලක් LKI වෙත වෙන් කර ඇත. එම විස්තර පහත දැක්වේ.

| අග්‍රිමය (භාර දුන් දිනය) | අග්‍රිමය |
|---|---|
| 04.01.2024 (2023 සඳහා ප්‍රතිපූරණය) | 4,000.000.00 |
| 09.19.2024 | 2,035,815.58 |
| 24.10.2024 | 2,532,278.93 |
| 26.12.2024 | 5,219,407.21 |
| එකතුව | 13,787,501.72 |

තවද ආයතනයට රු. 1,760,116.78 ක ප්‍රදාන ලැබුණි.

| ලැබුණු ආයතනය | මුදල රු. |
|---|---|
| ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය | 411,350.00 |
| කොරියානු ජනරජය | 866,830.78 |
| ජාත්‍යන්තර රතු කුරුස කමිටුව | 531,936.00 |
| එකතුව | 1,760,116.78 |

2024 දී, ආයතනය ලංකා බැංකුවේ පවත්වාගෙන ගිය ස්ථාවර තැන්පතු සඳහා රු. 15,485,709.19 ක පොලියක් ද ලබා ගෙන ඇත. මෙම කාලය තුළ ස්ථාන කුලියට දීමෙන්, ආයතනය රු. 5,276,000.00 ක මුළු ආදායමක් උපයා ඇත.

**වියදම**

2024 වර්ෂය සඳහා මුළු වියදම රු. 32,779,628.76 කි. මෙයින් ආසන්න වශයෙන් රු. මිලියන 1.2 ක් ප්‍රධාන ගොඩනැගිල්ල සහ පරිපාලන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා (රු. 726,930.00) සහ ජලාපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා (රු. 461,000.00) ප්‍රාග්ධන වියදම් ලෙස වැය කරන ලදී.

**LKI හි මානව සම්පත් පැතිකඩ**

**2024.12.1 දිනට LKI හි කාර්ය මණ්ඩලය**

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම (*වි.අ) | 1 | 1 | 0 |
| තෘතියික මට්ටම | 4 | 0 | 4 |
| ද්විතියික මට්ටම | 17 | 5 | 12 |
| ප්‍රාථමික මට්ටම | 4 | 1 | 3 |
| එකතුව | **26** | **7** | **19** |

***වි.අ. තනතුර - 2006 අංක 32 දරන පනත මගින් පාලනය වන වි.අ තනතුර බලාත්මක කිරීම.**

**ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි මූල්‍ය වාර්තාව**

**ප්‍රතිපාදන භාවිතයේ කාර්ය සාධනය (2024 දෙසැම්බර් 31 වන විට), ශ්‍රී.ලං.රු' 000**

| ප්‍රතිපාදන වෙන් කිරීමේ වර්ගය | වෙන් කිරීමේ 2024 | | සැබෑ වියදම (2024 දෙසැම්බර් 31 දිනට) | අවසාන වෙන්කිරීමේ %ක් ලෙස ප්‍රතිපාදන භාවිතය (2024 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | තත්‍ය | අවසන් | | |
| පුනරාවර්තන | 24,000* | 13,787 ** | 32,779*** | 237% |
| ප්‍රාග්ධන | - | - | - | - |
| එකතුව | 24,000 | 13,787 | 32,779 | 237% |

* 2024 මුල් භාගයේ සිට නව සේවක සංඛ්‍යා තනතුරු පුරවනු ඇතැයි අපේක්ෂාවෙන් මුල් ඇස්තමේන්තුව සකස් කරන ලදී. කෙසේ වෙතත්, අනුමත කරන ලද සාමාජික-සේවක සංඛ්‍යාලේඛන 26 න් ක්‍රියාත්මක වන්නේ තනතුරු 7 ක් පමණි, මන්ද නව සේවක සංඛ්‍යාලේඛන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි තවමත් අවසන් කර නොමැති බැවිනි.

** පසුගිය වසරවල **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය** වෙත ලැබුණු අවසාන භාණ්ඩාගාර ප්‍රතිපාදන **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි** මුළු වියදමෙන් 50-65% ක් විය. කෙසේ වෙතත්, 2024 දී සපයන ලද භාණ්ඩාගාර අරමුදල් වියදමෙන් ආසන්න වශයෙන් 40% ක් විය. මෙයින්, ඇත්ත වශයෙන්ම, 2023 දී සිදු කරන ලද වියදම් සඳහා ප්‍රතිපූරණය ලෙස 2024 ජනවාරි මාසයේදී රුපියල් මිලියන 4 ක් ලබා දුන් අතර, 2024 දෙසැම්බර් 24 වන දින රුපියල් මිලියන 5.2 ක් ලබා දුන් බව සටහන් වේ.

*** කාලෝචිත ලෙස මුදල් ලබා නොදීම සහ විදේශ අමාත්‍යාංශයෙන් **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය** වෙත වෙන් කරන ලද භාණ්ඩාගාර අරමුදල් කවදා ලැබේදැයි පුරෝකථනය කළ නොහැකි වීම නිසා **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි** මෙහෙයුම් වසර පුරා සීමා විය. වසරේ වැඩි කාලයක් කළමනාකරණය කරන ලද්දේ 2024 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල රුපියල් මිලියන 4.5 ක නිදහස් තැන්පතු පොලියක්, රුපියල් මිලියන 5.2 ක ස්ථානය කුලියට දීම සහ සහයෝගී ව්‍යාපාර හරහා ලැබුණු රුපියල් මිලියන 1.8 ක ප්‍රදාන සමඟිනි. දෙසැම්බර් මාසයේදී ලැබුණු භාණ්ඩාගාර මුදල් හිඟ බිල්පත් ගෙවීම සඳහා භාවිතා කර ඇත.

අනාගතයේදී, **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙ** වෙත ලබා දිය යුතු අරමුදල් කල්තියා වෙන් කර, මුදල් ප්‍රවාහය කාලානුරූපව සිදු කිරීම නිර්දේශ කරනු ලැබේ, එවිට ස්වයං-උත්පාදිත සහ භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද අරමුදල් වඩාත් කාර්යක්ෂමව යෙදවිය හැකිය. අනෙකුත් සේවක තනතුරු පුරවන විට සහ **ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයෙහි** කාර්ය භාරය තවදුරටත් වැඩි වන විට මෙය විශේෂයෙන් වැදගත් වනු ඇත.

# විදේශ රැකියා
# வெளிநாட்டு வேலைவாய்ப்பு
# Foreign Employment

**17 වන මහල "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 05**
**17 ம் மாடி "மெஹெவர பியேச", நாரஹேன்பிட்ட, கொழும்பு 05**
**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 05**

011-2331 200    011-2330 594    info@mfe.gov.    www.mfa.gov.lk

# පටුන


පටුන ....................................................................................................107
වගු නාමාවලිය ....................................................................................................109
ප්‍රස්තාර නාමාවලිය ....................................................................................................109
රූපසටහන් නාමාවලිය ....................................................................................................109
01. දැක්ම සහ මෙහෙවර ....................................................................................................110
02. ආයතනික ව්‍යුහය ....................................................................................................111
03. විධායක සාරාංශය ....................................................................................................112
04. හැඳින්වීම ....................................................................................................114
I. විදේශ රැකියා අංශයේ ප්‍රධාන කාර්යයන් ....................................................................................................114
II. විදේශ රැකියා අංශය යටතේ පවතින අංශ ....................................................................................................115
III. විදේශ රැකියා අංශය යටතේ පවතින ආයතන ....................................................................................................117
අ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ....................................................................................................117
ආ. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම ....................................................................................................117
05. විදේශ රැකියා අංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය ....................................................................................................119
I. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපත්ති රාමුව සවිමත් කිරීම ....................................................................................................119
II. ජාත්‍යන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම ....................................................................................................119
III. විදේශ රැකියා සඳහා මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය ....................................................................................................121
IV. විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම ....................................................................................................122
V. විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය සහ නියාමනය ....................................................................................................125
VI. විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය ....................................................................................................129
VII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ....................................................................................................129
VIII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මානව සම්පත් සංවර්ධනය ....................................................................................................129
IX. විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම ....................................................................................................130
06. මානව සම්පත් පැතිකඩ (කාර්ය මණ්ඩලය) ....................................................................................................132
07. මූල්‍ය වාර්තා ....................................................................................................133
I. විදේශ රැකියා අංශය ....................................................................................................133
II. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ....................................................................................................134
III. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම ....................................................................................................135

## වගු නාමාවලිය

වගුව 1 - විගමණික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය ..........................................124
වගුව 2 - විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම් ,විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම් සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් - ශ්‍රී ලං.වි.සේ.නි.කා. ............................................................125
වගුව 3 - විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා. .....................................126
වගුව 4 - විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරම් - ...........................................................................................................126
වගුව 5 - විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන්- ශ්‍රී ලං.වි.සේ.නි.කා. .......................................................................................................127
වගුව 6 - පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය - ශ්‍රී ලං.වි.සේ.නි.කා. ...................................................128
වගුව 7 - කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා. ................................129
වගුව 8 - විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරීම - ශ්‍රී.ලං.වි.රැ.ඒ. ....................................................130
වගුව 9 - විදේශ රැකියා අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය ....................................................................132
වගුව 10 - භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය .............................................................133
වගුව 11 - 2024.01.01 සිට 2024.12.31 දක්වා ආදායම් සහ වියදම් විස්තරය - ශ්‍රී ලං.වි.සේ.නි.කා. ............134
වගුව 12 - ආදායම් හා වියදම් තත්වය - ශ්‍රී.ලං.වි.රැ.ඒ. ........................................................................135

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 1 - සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සැලසුම් ..............................123
ප්‍රස්තාරය 2 - සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද රැකවරණ සැලසුම් ........................................123

## රූපසටහන් නාමාවලිය

රූපසටහන 1 - විදේශ රැකියා අංශයේ ආයතනික ව්‍යුහය .....................................................................111

# 01. දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

විදේශීය වෙළෙඳපොළ තුළ දක්ෂ මානව සම්පත් සඳහා හොඳම තේරීම ශ්‍රී ලංකාව බවට පත් කිරීම

**මෙහෙවර**

විදේශ රැකියා අවස්ථා සඳහා කාර්යශූර මානව සම්පත යොමුකිරීම හා විගමනික ශ්‍රමිකයින්ගේ පවුල්වල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය පිණිස යෝග්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති සකස්කර මෙහෙයවීම හා ඇගයීම මඟින් සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂා ඉටුකිරීම

## 02. ආයතනික ව්‍යුහය




සං.නි. - සංවර්ධන නිලධාරී
ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
කා.සේ.සේ. - කාර්යාල සේවා සේවක

*රූපසටහන 1 - විදේශ රැකියා අංශයේ ආයතනික ව්‍යුහය*

# 03. විධායක සාරාංශය

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ 2024 වර්ෂය සඳහා වන ප්‍රගති වාර්තාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා විවාද අවස්ථාව සඳහා මින් ඉදිරිපත් කෙරේ. 2024 නොවැම්බර් 28 වැනි දින සභානායක කාර්යාලය විසින් දන්වන ලද පරිදි මෙම ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරාලයි.

ශ්‍රී ලංකා ආර්ථිකයට අත්‍යවශ්‍ය වන විදේශ විනිමය ලබා ගැනීම සඳහා, රැකියා සඳහා වන සංක්‍රමණය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. 1970 දශකයේ සිට රැකියා සඳහා සංක්‍රමණය ආරම්භ වූ අතර එය ක්‍රමිකව වර්ධනය වී ඇත. 2023 වර්ෂයේදී, විදේශ ප්‍රේෂණ ලැබීම් රුපියල් බිලියන 1,950.8ක් ලෙස වාර්තා වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 9% කට ආසන්න වේ. විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම, විරැකියා අනුපාතය අඩු වීමට ඉවහල් වන අතර, 2024 වර්ෂයේදී පුද්ගලයින් 313,642 දෙනෙකුගෙන් පුරුෂයින් 185,692ක් සහ කාන්තාවන් 127,950ක් වශයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇත. මේ අනුව, රැකියා සඳහා වන සංක්‍රමණය, ශ්‍රී ලාංකීය ශ්‍රමය සඳහා ගෝලීය අවකාශයන් පුළුල් කරමින් රටේ දැක්ම සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ප්‍රමුඛස්ථානයක් ගනී.

ඒ අනුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ ප්‍රමුඛ මෙහෙවර වන්නේ විවිධ රැකියා ක්ෂේත්‍රයන්ට අදාළ රැකියා අවස්ථාවන් පුළුල් කිරීම, ආරක්ෂිත සංක්‍රමණයක් තහවුරු කිරීම හා නිපුණ මානව සම්පත් යොමු කිරීම හා විගමනික ශ්‍රමිකයින්ගේ පවුල්වල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය පිණිස යෝග්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම, මෙහෙයවීම සහ ඇගයීම මඟින් සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීමයි. මෙම මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී, තිරසාර සංවර්ධන ඉලක්ක, ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර සම්මුතීන් සහ 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැඩසටහන් පෙළගස්වා ඇත.

රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම (NP&APME) 2023-2027, ජාතික සහ ජාත්‍යන්තර නීතිමය සහ ප්‍රතිපත්ති රාමු සමඟ සමපාතව ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හතරක් ඔස්සේ සකස් කර ඇත.

විදේශ රැකියා අංශයට අනුබද්ධිත ආයතන වන, 1985 අංක 21 දරන (සංශෝධිත) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්.) සහ 1996 දී සංස්ථාපිත ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම (ශ්‍රී.ලං.වි.රැ.ඒ.) ඒකාබද්ධව රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර විගමනික ශ්‍රමිකයා මෙන්ම විගමනික ශ්‍රමික පවුල්වල සාමාජිකයින් ද මූලික කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ආරක්ෂිත සංක්‍රමණය සහතික කිරීම, මිනිස් ජාවාරම වැළැක්වීම සහ විගමනික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්මට සහාය වීම සඳහා පුළුල් සේවා පැකේජයක් ලෙස මෙම වැඩසටහන් සැලසුම් කර ඇත. මීට අමතරව, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත, 941ක් වන සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසින් විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් සඳහා ක්ෂේත්‍ර මට්ටමින්, සංවර්ධන සහ සුබසාධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව, ගමනාන්ත රටවල් 19ක් සමඟ විදේශ රැකියා ප්‍රවර්ධනය, ධාරිතා සංවර්ධනය, පුහුණු වැඩසටහන් සහ අන්‍යෝන්‍ය සබඳතා ඇතුළු විවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්/ සහයෝගීතා ගිවිසුම් 25කට එළැඹ ඇති අතර ඉන් 21ක් දැනට ක්‍රියාත්මක වේ. මීට අමතරව, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත, සියලුම පාර්ශවකරුවන් සමඟ එක්ව සංශෝධනය කර, අවසන් කෙටුම්පත සමාලෝචනය කිරීමට කටයුතු කර ඇත.

දිවයින පුරා සේවය කරන සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසින්, රැකියා සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාලවයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා 66,073ක් නිර්දේශ කර ඇති අතර සුබසාධන, ජීවනෝපාය සංවර්ධන, අධ්‍යාපනික සහ ප්‍රත්‍යානුකලනය කිරීමේ වැඩසටහන් සඳහා සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කර ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විගමන ක්‍රියාවලිය නියාමනය කිරීමේදී විදේශ රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ගෞරවය, ආරක්ෂාව සහ සාධාරණත්වය පිළිබඳ කොන්දේසි සහතික කිරීම සඳහා ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. විසින් නව බලපත්‍ර 73ක් නිකුත් කර ඇත. ශ්‍රී ලාංකිකයින් බඳවා ගන්නා විදේශ රටවල රැකියා නියෝජිතායතන සහ සමාගම්වල ලියාපදිංචි/ අලුත් කරන ලද සංඛ්‍යාව 1,268කි.

විදේශ රැකියා අපේක්ෂකයින් 84,344 දෙනෙකුගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පුහුණු වැඩසටහන් 3,037ක් පවත්වා ඇත.

නීති උල්ලංඝනය සම්බන්ධයෙන්, විදේශ රැකියා සඳහා බඳවා ගැනීම්වලට සම්බන්ධ බලපත්‍රලාභී ආයතන සහ වෙනත් බලපත්‍ර නොමැති ආයතනවලට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන පිළිබඳව ලැබුණු පැමිණිලි සඳහා විමර්ශන 4,658ක් පවත්වා පැමිණිලි 1,635ක් විසඳා ඇත. විගමනික සේවකයන්ගෙන් හෝ ඔවුන් වෙනුවෙන් ලැබුණු පැමිණිලි විසඳීම සහ මිනිස් ජාවාරමට එරෙහි ක්‍රියාමාර්ග යටතේ, ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 13,236කි. මෙම පැමිණිලි විගමනික ශ්‍රමිකයන්, ඔවුන්ගේ ව්‍යාපාර හෝ මිනිස් ජාවාරම් සම්බන්ධ ගැටලුවලට අදාළ වූ අතර ඉන් 8,974ක් විසඳා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විගමනික ශ්‍රමිකයින්ගේ සුභසාධනය වෙනුවෙන්, රක්ෂණ වාරික ගෙවීම, ආහාර, ප්‍රවාහනය, නවාතැන් සහ වෛද්‍ය ප්‍රතිකාර සැපයීම, නැවත මෙරටට ගෙන්වා ගැනීමේ වියදම් දැරීම, ස්වයං රැකියා ආරම්භ කිරීමට හෝ වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපකරණ/ද්‍රව්‍ය ලබා දීම, පාසල් උපකරණ ලබා දීම වැනි වැඩසටහන් රැසක් විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් යටතේ විගමනික ශ්‍රමිකයන් සහ පවුලේ සාමාජිකයින් 33,187 දෙනෙකුට විවිධ ප්‍රතිලාභ ලබා දී ඇති අතර සුබසාධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 380.49ක මුදලක් වැය කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ, ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. විසින් විදේශයන්හි මිය ගිය විගමනික සේවකයින් සඳහා සහන සලසා ඇත. එමෙන්ම, ශ්‍රී.ලං.වි.සේ.නි.කාර්. විසින් විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් රැකියා පොළවල් ඇතුළු වැඩසටහන් රාශියක් පවත්වා ඇත.

තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුබද්ධිත ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලාංකික පුද්ගලයින් 558 දෙනෙකුට විදේශ රැකියා සඳහා යොමු කර ඇත.

මීට අමතරව, ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සහයෝගයෙන් ආරක්ෂිත සංක්‍රමණය සහතික කිරීම සඳහා බිම් මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

2024 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් අත්කර ගත් ප්‍රගතිය මෙම ප්‍රගති වාර්තාවෙන් දක්වා ඇත. වාර්තාව කොටස් හතකින් සමන්විත වේ.

## 04. හැඳින්වීම

රැකියා සඳහා සංක්‍රමණය යන්න ආර්ථික වර්ධනයට දායක වන, මානව ප්‍රාග්ධනය ගොඩනඟන, සමාජ-ආර්ථික අසමානතා අඩු කරන සහ විවිධ සමාජ හා සංස්කෘතීන් අතර ක්‍රියාකාරීත්වයට පහසුකම් සපයන ගෝලීය සංසිද්ධියකි. රැකියා සඳහා වන සංක්‍රමණය පුද්ගලයන්ට සහ පවුල්වලට ඔවුන්ගේ සිහින සැබෑ කර ගැනීමට සහය වන අතර, විගමනික ශ්‍රමිකයන්ගේ විවිධ මානයන් සහ අත්දැකීම් පිළිගැනීමට සහ ගරු කිරීමට සමාජය ශක්තිමත් කරන අතරම ඔවුන්ගේ කුසලතා සහ නිපුණතාවලින් ප්‍රතිලාභ ලබන අතර වඩාත්ම වැදගත් ලෙස එය රටවල්, කලාප සහ සමස්ත ලෝකයෙහි සංවර්ධනයට ශක්තිය ලබා දෙයි.

ශ්‍රී ලංකාව පසුගිය දශක පහ තුළ රැකියා සඳහා සංක්‍රමණය වීමෙන් ප්‍රතිඵල / ජයග්‍රහණ රැසක් ලබා ගෙන ඇත. 1970 දශකයේ සිට රැකියා සඳහා සංක්‍රමණය ආරම්භ වූ අතර එය ක්‍රමිකව වර්ධනය වී ඇත. 2023 වර්ෂයේදී, විදේශ ප්‍රේෂණ ලැබීම් රුපියල් බිලියන 1,950.8ක් ලෙස වාර්තා වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 9% කට ආසන්න වේ. එමෙන්ම, විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම, විරැකියා අනුපාතය අඩු කිරීමට ඉවහල් වන අතර, 2024 වර්ෂයේදී පුද්ගලයින් 313,642ක්, පුරුෂයින් 185,692ක් සහ කාන්තාවන් 127,950ක් වශයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇත. මේ අනුව, රැකියා සඳහා වන සංක්‍රමණය, ශ්‍රී ලාංකීය ශ්‍රමය සඳහා ගෝලීය අවකාශයන් පුළුල් කරමින් රටේ දැක්ම සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ප්‍රමුඛස්ථානයක් ගනී.

ඒ අනුව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ ප්‍රමුඛ මෙහෙවර වන්නේ විවිධ රැකියා ක්ෂේත්‍රයන්ට අදාළ රැකියා අවස්ථාවන් පුළුල් කිරීම, ආරක්ෂිත සංක්‍රමණයක් තහවුරු කිරීම හා නිපුණ මානව සම්පත් යොමු කිරීම හා විගමනික ශ්‍රමිකයින්ගේ පවුල්වල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය පිණිස යෝග්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම, මෙහෙයවීම සහ ඇගයීම මඟින් සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීමයි. රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම (NP&APME) 2023-2027, ජාතික සහ ජාත්‍යන්තර නීතිමය සහ ප්‍රතිපත්ති රාමු සමඟ සමපාතව විගමනයේ සියලු අදියරයන් ආවරණය වන පරිදි සකස් කර ඇත.

විදේශ රැකියා අංශයට අනුබද්ධිත ආයතන වන, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම ඒකාබද්ධව, රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර විගමනික ශ්‍රමිකයා මෙන්ම විගමනික ශ්‍රමික පවුල්වල සාමාජිකයින් ද මූලික කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසින් විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා බිම් මට්ටමින් සංවර්ධන හා සුබසාධන වැඩසටහන් සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම සිදු කරයි.

ඒ අනුව, රැකියා අංශය සඳහා වන සංක්‍රමණය රටේ සංවර්ධනය සඳහා ඵලදායී හා කාර්යක්ෂමව දායක කර ගැනීම සඳහා විදේශ රැකියා අංශයේ වැඩසටහන්, තිරසාර සංවර්ධන ඉලක්ක සහ අපරානුමත කරන ලද ජාත්‍යන්තර සම්මුතීන් මත පදනම්ව 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සකස් කර ඇත.

### I. විදේශ රැකියා අංශයේ ප්‍රධාන කාර්යයන්

අ. විදේශ රැකියා සම්බන්ධ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම

ආ. විදේශ රැකියා අවස්ථා බහුල කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ එම රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතාවයන් වැඩි දියුණු කිරීමට අදාළ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

ඇ. නුපුහුණු ශ්‍රමිකයින් වෙනුවට නිපුණතා සහිත පුහුණු පිරිස් විදේශ රැකියා සඳහා යැවීමට අවශ්‍ය පියවර ගැනීම

ඇ. විදේශගත ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය සහ නියාමන ක්‍රියාවලීන් හඳුන්වා දීම

ඉ. විදේශගත ශ්‍රමිකයන් සහ විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට විදේශ විනිමය ශ්‍රී ලංකාව තුළ ඉතිරි කිරීමට සහ ආයෝජනය කිරීමට විශේෂ පහසුකම් සැලසීම

ඊ මැදපෙරදිග සහ වෙනත් රටවල සේවය කරන ගෘහ සේවිකාවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සහතික කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

උ. සංක්‍රමණික සේවා නියුක්තිකයින්ගේ වෘත්තීමය ගැටලුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය පවත්වා ගැනීම

ඌ. විදේශ රටවල දී විවිධ අනතුරුවලට ලක්වන්නන්ට හිමි වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

එ. විදේශ රැකියා නිමකර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ඒ. විදේශ රැකියා නියෝජිතායතන නියාමනය

ඔ. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම සහ විදේශ රැකියා නියෝජිත ආයතන විසින් රැකියා ස්ථාන වෙත යොමු කිරීමේදී විදේශ රැකියාවල නියුක්තවන අයගේ සුබසාධනය තහවුරු වන ලෙස කටයුතු කිරීම

## II. විදේශ රැකියා අංශය යටතේ පවතින අංශ

### අ. පාලන අංශය

විදේශ රැකියා අංශයේ මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම වෙනුවෙන් විදේශ රැකියා අංශයේ සියලුම ආයතනික හා පරිපාලන කටයුතු ඉටුකිරීම මෙම අංශයේ වගකීම වන අතර මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

මෙම අංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතනික කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙනයාම.

අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම, උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම, පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සහ ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් අමාත්‍යාංශය වෙත යොමු කරන මහජන පැමිණිලි මෙන්ම ඍජුවම ලැබෙන මහජන ගැටලු අදාළ අංශ වෙත යොමු කිරීම මෙම ඒකකය මඟින් සිදුකරයි.

අංශයට අයත් වාහන පරිපාලනය, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පුහුණු කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම සහ විමර්ශන කටයුතු සිදු කිරීම.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම යන ආයතනවල ආයතනික හා පරිපාලන කටයුතු සිදු කිරීම සම්බන්ධව වගකීම දැරීම.

ආ. සංවර්ධන අංශය

සංවර්ධන අංශය, විදේශීය සබඳතා අංශය සහ සංවර්ධන අංශය වශයෙන් උප අංශ දෙකක් යටතේ රාජකාරී කටයුතු සිදුකරයි.

විදේශීය සබඳතා අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ විගමනික ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන්වලට සම්බන්ධ කටයුතු, විදේශ කටයුතු අංශය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් සංවිධාන මඟින් වරින්වර ඉල්ලීම් කරනු ලබන විගමණික ක්ෂේත්‍රය හා සම්බන්ධ ගැටලු, යෝජනා සහ අනෙකුත් වාර්තා ලබා දීම, නව අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට එළඹීම, පවත්නා ගිවිසුම් යාවත්කාලීන කිරීම, ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව පසුවිපරම් කිරීම, ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සහ කලාපීය/ ගෝලීය සංවාද හා සම්බන්ධ සියලු කටයුතු වේ.

විගමණික ක්ෂේත්‍රයට අදාළ අණපනත්, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම, සංවර්ධන ක්‍රියාදාමයන් හා සබැඳි විදේශ රැකියා අංශයට අදාළ විෂයපථයන් පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අමාත්‍ය මණ්ඩල සටහන් පිළියෙළ කිරීම, ක්ෂේත්‍රයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ විෂයානුබද්ධ පුහුණුව සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සංවිතය පවත්වාගෙන යාම, සංවර්ධන නිලධාරීන් හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ විගමණික ශ්‍රමික කාන්තාවන් හා සම්බන්ධ පවුල් පසුබිම් වාර්තා පිළිබඳව අභියාචනා කමිටු පැවැත්වීම, කමිටු තීරණ දන්වා යැවීම හා පසුවිපරම් කිරීම සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

ඇ. සැලසුම් අංශය

සැලසුම් අංශයෙහි මූලික වගකීම වන්නේ විදේශ රැකියා අංශයට අදාළ සමස්ත සැලසුම්කරණය, මෙහෙයුම් හා අගැයුම් සහ වාර්තාකරණය වේ.

විදේශ රැකියා අංශය හා සබැඳි ආයතන සමඟ එක්ව සංවර්ධන සැලසුම් හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කර වීම, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම මූලිකවම සැලසුම් අංශය මඟින් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් මඟින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ද සහාය හා මඟපෙන්වීම සහිත ව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සැලසුම්කරණය, අධීක්ෂණය, පසුවිපරම සහ වාර්තාකරණය ද මෙම අංශය මඟින් සිදු කරයි.

විදේශ රැකියා විෂයපථයට අදාළ සංවර්ධන ව්‍යාපෘති සකස් කිරීම, වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව සකස් කිරීම ද සැලසුම් අංශය මඟින් ඉටුකරන කාර්යයන් අතර ප්‍රධාන වේ.

ඈ. මූල්‍ය අංශය

වාර්ෂික අයවැය මඟින් විදේශ රැකියා අංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.

එසේම, විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම සහ විදේශ රැකියා අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩල හා විදේශ ආධාර වැඩසටහන්වලට අදාළ මූල්‍ය කටයුතු අධීක්ෂණය, අමාත්‍යාංශය නියෝජනය කරමින් අදාළ වන්නා වූ එක් එක් කමිටු නියෝජනය කිරීම හා මූල්‍ය හා වත්කම් කළමනාකරණය කටයුතුවලට අදාළ වාර්තා මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.

### ඉ. අභ්‍යන්තර විගණන අංශය

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.

විගණන කළමනාකරණ කමිටු රැස්වීම (කාර්තුමය වශයෙන්) පැවැත්වීම, වාර්ෂික විගණන සැලසුම සකස් කිරීම, අභ්‍යන්තර විගණන පරීක්ෂණ හා විශේෂ පරීක්ෂණයන් පිළිබඳ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම හා ඉදිරිපත් කිරීම, විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් සහ විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම සම්බන්ධ වගකීම දරයි.

## III. විදේශ රැකියා අංශය යටතේ පවතින ආයතන

### අ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් කේන්ද්‍ර කර ගනිමින් 1994 අංක 4 සහ 2009 අංක 56 දරන පනත් මඟින් සංශෝධිතව 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත ආයතනයයි. විදේශ රැකියා ක්ෂේත්‍රය පාලනය කිරීම සහ නියාමනය කිරීම, ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවේ නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය මෙන්ම ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම පිළිබඳ කාර්යාංශය වගකීම දරනු ලබයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශ 33ට අමතරව පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථාන 09ක්, දිස්ත්‍රික් කාර්යාල 10ක්, පුහුණු මධ්‍යස්ථාන 02ක් සහ ගුවන් තොටුපළ ඒකක 03ක් මඟින් 1,121ක කාර්ය මණ්ඩලයක් සහිතව සේවා සැපයීම සිදු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

- විදේශ රැකියා නියෝජිත ආයතන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම/ විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම
- විගමනික ශ්‍රමිකයන් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් යොමු කරන ලබන පැමිණිලි විසඳීම
- විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම
- විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ නීති බලාත්මක කිරීම
- ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

### ආ. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම

රජයට අයත් එකම විදේශ රැකියා ඒජන්සිය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුබද්ධිතව 1996 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක ආයතනයකි. 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය 4-7ත් අතර වන අධ්‍යක්ෂ මණ්ඩලයකින් ක්‍රියාත්මක වේ.

**ප්‍රධාන කාර්යයන්**

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ වෙනත් කිසියම් ව්‍යවස්ථාපිත නීතියක් හෝ නීති පසුබිමක් යටතේ කලින් කලට බලාත්මක වන නීතිරීතිවලට අනුකූලව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම

- ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය තාක්ෂණික හා කාර්මික සනීපාරක්ෂක, පුහුණු අර්ධ පුහුණු හෝ නුපුහුණු ගෘහස්ථ නොවන සහ සියලුම රැකියා වර්ගීකරණයන්ට අදාළ සේවකයින් වෙත සුදුසුකම් තහවුරුව මත රැකියා පිරිනැමීම

- මිනිස්බලය සැපයුම් වෙළඳ, රක්ෂණ, වාණිජ හෝ කර්මාන්තවල පුද්ගලයන් ආයතන හා සංවිධානවල පුද්ගලයන් ලෙස මෙන්ම එවැනි සේවා සැපයීම සඳහා ක්‍රියාකාරීව සිටින ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම

- විදෙස් රැකියා අවශ්‍යතාවන්ට සරිලන පරිදි ශ්‍රමික පිරිස්වල හැකියාවන් ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම නිපුණතාවය ඇති කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් කළමණාකරණය කිරීම

# 05. විදේශ රැකියා අංශය විසින් අත්පත් කරගත් ප්‍රගතිය

## I. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපත්ති රාමුව සවිමත් කිරීම

**අ. රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම**

රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම (2023-2027) 2023 ඔක්තෝබර් 25 වන දින එළි දක්වන ලද අතර මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කමිටුව 2024 මාර්තු 24 දින පිහිටුවීමට කටයුතු කරන ලදී.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන හවුල්කරු වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) නිලධාරීන් හා අනෙකුත් හවුල්කරුවන් වන අදාළ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවල නිලධාරීන්, විදේශ රැකියා නියෝජිතායතන, වෘත්තීය සමිති සහ සිවිල් සමාජ කණ්ඩායම් නිලධාරීන් සඳහා දිවයිනම ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් 14ක් පවත්වන ලදී.

තවද, රැකියා සඳහා විගමනය පිළිබඳ පළාත් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නිර්මාණය කිරීමේ පළමු පියවර ලෙස සියලුම පළාත් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව නිම කරන ලද අතර, රට පුරා රැකියා සඳහා විගමනය පිළිබඳ පළාත් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

**ආ. 1985 අංක 21 දරන විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය කිරීම**

විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ක්ෂේත්‍රයට අදාළ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනයට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද පනත් කෙටුම්පත නිරීක්ෂණ ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කර ඇත.

## II. ජාත්‍යන්තර සහයෝගිතාව තුළින් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම

**අ. අවබෝධතා ගිවිසුම් / එකඟතා**

විදේශ රැකියා අංශයේ ප්‍රවර්ධනය, මානව හැකියාවන් වර්ධනය කිරීම, ජාත්‍යන්තර සමාජ ආරක්ෂක වැඩසටහන්, පුහුණු වැඩසටහන්, නීති කටයුතු සහ අන්‍යොන්‍ය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගමනාන්ත රටවල් සමඟ ගිවිසුම් ගණනාවකට එළඹ තිබේ. දැනට එවැනි අවබෝධතා ගිවිසුම්/ එකඟතා විසි එකක් (21) සක්‍රීයව ක්‍රියාත්මක කෙරේ.

- විදේශ කටයුතු අංශය හරහා අවබෝධතා ගිවිසුම්/ එකඟතා අත්සන් කිරීමට අදාළව කෙටුම්පත් හුවමාරු කර ගැනීම

පහත සඳහන් රටවල් සමඟ අවබෝධතා ගිවිසුම්/ එකඟතා අත්සන් කිරීමට අදාළව කෙටුම්පත් හුවමාරු කර ගැනීම සිදු කරන ලදී.

| | |
|---|---|
| රුමේනියාව | - රැකියා සහ මිනිස් බල ක්ෂේත්‍ර |
| ඉතාලිය | - සංක්‍රමණය සහ සංචලන හවුල්කාරිත්වය |
| තුර්කිය | - ශ්‍රම සංක්‍රමණය පිළිබඳ යෝජිත එකඟතාව |

- විදේශ රැකියා සම්බන්ධයෙන් ගමනාන්ත රටවල් සමඟ දැනට පවතින අවබෝධතා ගිවිසුම් / ද්විපාර්ශවික එකඟතා සමාලෝචනය කිරීම

පහත සඳහන් එකඟතා / අවබෝධතා ගිවිසුම් සමාලෝචනය කිරීම සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අංශය හරහා අදාළ රාජ්‍යයන් වෙත යොමුකර ද්විපාර්ශවීය ලෙස අදහස් හුවමාරු කර ගනිමින් පවතී.

කොරියානු ජනරජය - රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ ශ්‍රමිකයින් යැවීම
මැලේසියාව - ශ්‍රමිකයින් බඳවා ගැනීම, සේවා නියුක්ත කිරීම හා නැවත ගෙන්වා ගැනීම

**ආ. ගෝලීය / කලාපීය සංසද**

- **අබුඩාබි සංවාදය (Abu Dhabi Dialogue)**

අබුඩාබි සංවාදයේ හත්වන (7) අමාත්‍ය මණ්ඩල රැස්වීම 2024 පෙබරවාරි මස 10 හා 11 වන දිනයන් හිදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී පවත්වන ලදී.

එහිදී ඉදිරි වසර දෙක සඳහා පහත සඳහන් මාර්ගෝපදේශයන් (The guidelines for a collaborative thematic agenda for the upcoming two year cycle) පිළිබඳව සාකච්ඡා කරන ලදී.

  - ආසියාවේ දේශගුණික විපර්යාස සහ ශ්‍රම සංචලනය අතර සම්බන්ධය - ගල්ෆ් සහයෝගිතා කවුන්සිලය (GCC Corridor)
  - හරිත ආර්ථිකයකට පරිවර්තනයක් සඳහා ශ්‍රම සංචලනය සහ කුසලතා
  - අබුඩාබි සංවාදයේ සාමාජික රටවල විදේශගත කෙටිකාලීනව ස්වයං සේවා සපයන්නන් (Gig workers) කළමනාකරණය කිරීම
  - අබුඩාබි සංවාදයේ සාමාජික රටවල ශ්‍රම ඵලදායිතාවය සඳහා නිපුණතා හා විවිධත්වයට අවස්ථා විවර කිරීම

- **ගෝලීය ප්‍රතිපත්ති ජාලය (Global Policy Network - GPN)**

ගෝලීය ප්‍රතිපත්ති ජාලයේ (GPN) ඉහළ මට්ටමේ රැස්වීමක් 2024 ජුනි මස 10 හා 11 යන දෙදින ජිනීවාහිදී පවත්වන ලදී. එය තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

  - උගන්ඩාව ප්‍රධානත්වය දරනු ලබන බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය (Licensing and oversight) පිළිබඳ කමිටුව
  - නෝර්වේ ප්‍රධානත්වය දරනු ලබන සුපරීක්ෂණය සහ බලාත්මක කිරීම (Inspections & Enforcement) පිළිබඳ කමිටුව
  - ශ්‍රී ලංකාව ප්‍රධානත්වය දරනු ලබන ද්විපාර්ශවික සහයෝගීතා (Bilateral Cooperations) පිළිබඳ කමිටුව
  - ටියුනීසාව ප්‍රධානත්වය දරනු ලබන ශ්‍රම සංචලන පිළිබඳව කුසලතා මැනීම (Skills Dimensions of Labour Mobility) පිළිබඳ කමිටුව

- **කොළඹ ක්‍රියාවලිය (Colombo Process)**

කොළඹ ක්‍රියාවලියේ සාමාජික රටවල්වල සහභාගීත්වයෙන් තේමාත්මක ඒකාබද්ධ කමිටු රැස්වීම Joint meeting of the Thematic Area Working Group (TAWGs) 2024 නොවැම්බර් මස 26, 27 හා 28 යන දිනවල ඉන්දියාවේ සභාපතීත්වයෙන් තායිලන්තයේ බැංකොක්හි දී පවත්වන ලදී.

කොළඹ ක්‍රියාදාමයේ තාක්ෂණික ආධාරක ඒකකයේ (Colombo Process Technical Support Unit - CPTSU) පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණයෙන් පහතින් දක්වා ඇති තේමාත්මක කමිටු (Thematic Area Working Group) රැස්වීම් පවත්වන ලදී.

- ○ පිලිපීනය සභාපතිත්වය දරන පිටත්වීමට පෙර දිශානතිය සහ සවිබලගැන්වීම පිළිබඳ තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායමේ (Pre-departure Orientation and Empowerment (PDOE) - TAWG) අටවන රැස්වීම 2024 නොවැම්බර් 26 දින පවත්වන ලදී

- ○ බංගලාදේශය සභාපතිත්වය දරන සාධාරණ හා සදාචාරාත්මක බඳවා ගැනීම් පිළිවෙත් පිළිබඳ තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායමේ (Fair & Ethical Recruitment Practices (FERP) – TAWG) එකළොස්වැනි රැස්වීම 2024 නොවැම්බර් 26 දින පවත්වන ලදී

- ○ ශ්‍රී ලංකාව සභාපතිත්වය දරන නිපුණතා හා සුදුසුකම් හඳුනා ගැනීම පිළිබඳ තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායමේ (Skills and Qualification Recognition (S&Q) - TAWG) නවවන රැස්වීම 2024 නොවැම්බර් 27 දින පවත්වන ලදී

- ○ පකිස්ථානය සභාපතිත්වය දරන ලාභදායී, වේගවත් හා ප්‍රේරණ හුවමාරු පිළිබඳ තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් (Cheaper, Faster & Safer Transfer of Remittances (CFSTR) - TAWG) අටවන රැස්වීම 2024 නොවැම්බර් 27 දින පවත්වන ලදී

- **සංවර්ධනය හා සහයෝගීතාව සඳහා වන ස්විට්සර්ලන්ත නියෝජිතායතනයේ ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණ වැඩසටහන - අදියර IV**

"ශ්‍රී ලාංකිකයින් සඳහා ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය" නැමැති ව්‍යාපෘතිය විදේශ රැකියා අංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය හා එක්ව ස්විස් සංවර්ධන සහයෝගීතාවයේ මූල්‍ය ප්‍රදානය මත හතර වන අදියර යටතේ ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම ශක්තිමත් කිරීමයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ International Executive Service Corps (IESC) මෙම ව්‍යාපෘතියේ ජාතික පාර්ශවකරුවන් විය. මෙම වැඩසටහන 2024 වර්ෂයේ අගෝස්තු මාසයේදී අවසන් වූ අතර ඒ සඳහා දරන ලද මුළු වියදම රුපියල් මිලියන 498ක් වේ.

- **විගමණික සම්පත් මධ්‍යස්ථානය (Migrant Resource Centre - MRC)**

සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (International Centre for Migration Policy Development - ICMPD) හා ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමක් 2023 දෙසැම්බර් මස 11 දින අත්සන් කරන ලද අතර, ඒ අනුව 2024 අප්‍රේල් මස 26 දින සංක්‍රමණික සම්පත් මධ්‍යස්ථානය මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන ලදී. ඒ මඟින් විදේශ රැකියා සඳහා යොමුවීමට අපේක්ෂිත පුද්ගලයින් සඳහා වන සියලු සේවාවන් මෙම මධ්‍යස්ථානයෙන් සැපයේ. එහි කළමනාකරණ කටයුතු සඳහා ආධාර, නවසීලන්ත රජයේ සංක්‍රමණ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වූ අන්තර් ජාතික මධ්‍යස්ථානය විසින් සපයනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වන වියදම රුපියල් මිලියන 14.53කි.

## III. විදේශ රැකියා සඳහා මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය

- **ශ්‍රී ලංකාවේ විදේශ සහ දේශීය රැකියා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (IGRS) ඇති කිරීම**

මෙම අංශය විසින් ජාත්‍යන්තර සංක්‍රමණ ආයතනයේ (International Organization for Migration – IOM) සහාය ඇතිව විදේශ රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් අරමුණු කරගෙන ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතියක් (Integrated Guidance and Referral System -IGRS) ස්ථාපිත කරන ලදී. මෙම පද්ධතිය මඟින් විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ලබාදීම, වෘත්තීය කුසලතාවයෙන් හා පළපුරුද්දෙන් යුත් රැකියා අපේක්ෂිතයින්ගේ සංචිතයක් ඇති කිරීමත්, එම පිරිස විදේශ රැකියාවන් සඳහා යොමු කිරීමත් අරමුණ වේ.

මෙම ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය 2023 ජූලි 15 වැනි දින නිල වශයෙන් දියත් කිරීම සිදු කරන ලද අතර ඒ අනුව, ඒකාබද්ධ මාර්ගෝපදේශ සහ යොමු කිරීමේ පද්ධතිය වෙත රැකියා අපේක්ෂිතයින් විසින් යොමු කරන ලද අයදුම්පත්‍ර 678ක් අතරින් අයදුම්පත්‍ර 95ක් විදේශ රැකියා සඳහා යොමු කිරීමට සුදුසුකම් සපුරා ඇති බව හඳුනාගෙන ඇත. මෙම පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 4ක් ඔස්සේ විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් හැටපස් දෙනෙකු පුහුණු කර ඇත.

## IV. විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම, සුභසාධනය හා සවිබල ගැන්වීම

- **පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම**

විගමනික කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ට ආරක්ෂාව සැලසීම අරමුණු කර ගනිමින් "රැකියා සඳහා විදේශගතවීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාල වයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙල පිළිබඳ වාර්තා ලබාගැනීම" යටතේ වන අංක 02/2023 හා 2023.03.31 දිනැති චක්‍රලේඛය සහ එයට සංශෝධන ඇතුළත්ව 2023.04.18 දිනැතිව අංක 02/2023 (1) චක්‍රලේඛයන් නිකුත් කර ඇත. එම චක්‍රලේඛ ප්‍රකාරව, 2024 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේදී පවුල් පසුබිම් වාර්තා 66,073ක් නිර්දේශ කර ඇති අතර, එය පළමු කාර්තුවේදී වාර්තා 19,413ක් දෙවන කාර්තුවේදී 15,028ක්, තුන්වන කාර්තුවේදී 14,849ක් සහ සිවුවන කාර්තුවේදී 16,783 ක් වශයෙන් වේ. මේ අතර පවුල් පසුබිම් වාර්තා 345ක් නිර්දේශ නොකරන ලදී.

- **රැකියා සඳහා විදේශගතවීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාලවයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙළ පිළිබඳ වාර්තා සලකා බැලීමේ අභියාචනා කමිටුව**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේදී නිර්දේශ නොකරන ලද, රැකියා සඳහා විදේශගතවීමට බලාපොරොත්තු වන කාන්තාවන්ගේ බාලවයස්කාර දරුවන්ගේ රැකවරණ වැඩපිළිවෙළ පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් අයදුම්කාරියන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් අභියාචනා විදේශ රැකියා අංශය යටතේ ක්‍රියාත්මක අභියාචනා කමිටුව වෙත යොමු කළ හැකිය. ඒ අනුව, යොමු කරන ලද අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා එම කමිටුව වාර 12ක් රැස් වී ඇති අතර, එහිදී ගත් තීරණ අනුව අභියාචනා 62ක් සඳහා නිර්දේශ ලබා දෙන ලද අතර නිර්දේශ නොකරන ලද අභියාචනා සංඛ්‍යාව 23කි. අනෙකුත් අභියාචනා පිළිබඳව ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

- **විගමනික ශ්‍රමික පවුල් ඉලක්ක කර ගනිමින් පවුල් සංවර්ධන සැලසුම් හා රැකවරණ සැලසුම් සකස් කිරීම**

මෙම අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) විසින්, විදේශගත අරමුණු ඉටුකර ගැනීමට සහ විගමනික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ සුභසාධනය ඉලක්ක කර ගනිමින් විගමණික ශ්‍රමික පවුල්වල ආර්ථික තත්ත්වය නඟා සිටුවීම අරමුණු කරගෙන "පවුල් සංවර්ධන සැලසුම්" සහ විගමනික පවුල්වල සමාජයීය අවදානම් සහගත දරුවන් ඉලක්ක කර ගනිමින් "රැකවරණ සැලසුම්" සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු වේ. ඒ අනුව, 2024 වර්ෂයේ පවුල් සංවර්ධන සැලසුම් 4,930ක් සහ රැකවරණ සැලසුම් 536ක් සකස් කර ඇත.

මෙයට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක විගමනික පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් උපකරණ ලබාදීම, නැවත පැමිණි ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම, ආබාධිත පුද්ගලයින් සඳහා ස්වයං රැකියා සහ නිවාස ආධාර ලබාදීම, වෘත්තීය පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීම හා වෛද්‍ය සායන පැවැත්වීම, යනාදී වැඩසටහන් වෙත ප්‍රතිලාභීන් යොමු කිරීම ද සංවර්ධන නිලධාරින් (විදේශ රැකියා) විසින් සිදු කරයි.




*ප්‍රස්තාරය 1 - සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද පවුල් සංවර්ධන සැලසුම්*




*ප්‍රස්තාරය 2 - සංවර්ධන නිලධාරීන් විසින් සකස් කරන ලද රැකවරණ සැලසුම්*

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

විදේශ රැකියා අංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් විගමනික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර 2024 වර්ෂයේදී පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 9,003ක් පවත්වා ඇත.

*වගුව 1 - විගමණික ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය*

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සුරක්ෂිත සංක්‍රමණය | 3,052 |
| 2 | නැවත සමාජගත කිරීමේ වැඩසටහන | 780 |
| 3 | ස්වයං රැකියා කුසලතා සංවර්ධනය සහ වෘත්තීය මාර්ගෝපදේශ | 672 |
| 4 | ළමා ආරක්ෂාව | 866 |
| 5 | මත්ද්‍රව්‍ය නිවාරණය | 363 |
| 6 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සම්බන්ධ දැනුවත් බව ලබාදීම | 322 |
| 7 | මිනිස් වෙළඳාමේ ගොදුරක් නොවීම පිළිබඳ දැනුවත් කිරීම් | 1,188 |
| 8 | වෙනත් | 1,760 |
| | **එකතුව** | **9,003** |

- **විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම**

විගමනික ශ්‍රමිකයින්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සහ විදේශ රැකියා සඳහා යොමුවීමට අපේක්ෂිත පිරිස් එක්රැස් කරමින් ඔවුන් සමාජය තුළ සවිබල ගැන්වීම හා ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වැඩිදියුණු කිරීම හරහා ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස සමාජගත කිරීම අරමුණු කරගනිමින් විගමනික ශ්‍රමික සංගම් පිහිටුවීම සංවර්ධන නිලධාරින්ගේ (විදේශ රැකියා) මැදිහත්වීම මත සිදු කරන ලදී. ඒ අනුව, මේ වනවිට දිවයින පුරා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් 4,638ක් ද ප්‍රාදේශීය මට්ටමින් 315ක්ද දිස්ත්‍රික් මට්ටමින් 24ක් ලෙස විගමනික ශ්‍රමික සංගම් පිහිටුවා ඇති අතර ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් මුළු සාමාජික සංඛ්‍යාව 63,956කි.

- **සංවර්ධන නිලධාරින්ගේ (විදේශ රැකියා) රාජකාරි කටයුතු අධීක්ෂණය සඳහා වන ප්‍රගති සමාලෝචන රැස්වීම්**

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් දෙකක් විදේශ රැකියා අංශය විසින් පවත්වා ඇති අතර දිස්ත්‍රික් සංවර්ධන නිලධාරි විසින් කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 88ක් සිදු කර ඇති අතර ඉන් 20ක් මාර්ගගත ක්‍රමය ඔස්සේ සහ 68ක් නිලධාරි සහභාගීත්වය ඇතිව පවත්වා ඇති අතර ඒ සඳහා රු. 1,083,250.00ක ප්‍රතිපාදන වෙන්කර ඇත.

- **පුහුණුකරුවන් පුහුණු කිරීමේ ඒකකය**

  - **ධාරිතා සංවර්ධන වැඩසටහන් සිදු කිරිම**

සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) අනුග්‍රහයෙන් හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනයේ පහසුකම් සැලසීම මඟින්, පුහුණුකරුවන් පුහුණු කිරීමේ ඒකකයේ නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් සිංහල හා දමිළ මාධ්‍යයෙන් සංවර්ධන නිලධාරින් (විදේශ රැකියා) සමඟ දිස්ත්‍රික් මට්ටමේ අනෙකුත් සම්බන්ධිත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නැවත සමාජගතකරණය යටතේ ව්‍යවසායකත්ව සංවර්ධනය/මූල්‍ය කළමනාකරණය හා මනෝ සමාජීය සහාය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව දකුණ, සබරගමුව, මධ්‍යම හා නැගෙනහිර පළාත් ආවරණය වන පරිදි වැඩසටහන් 06ක් පවත්වා ඇත.

එමෙන්ම, සංක්‍රමණයේ හඬ (Voice of Migrants) ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් පුහුණු සංචිතයේ නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් පොළොන්නරුව, ගාල්ල, පුත්තලම, බදුල්ල, කුරුණෑගල, මහනුවර,

නුවරඑළිය හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල සංවර්ධන නිලධාරින් (විදේශ රැකියා) සඳහා විගමනික ප්‍රජාව සංවිධානගතකරණය පිළිබඳව ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 09ක් සිදු කරන ලදී.

පුහුණු ඒකකයේ කටයුතු වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) අනුග්‍රහයෙන් පුහුණු ඒකකයේ නිලධාරීන් 15 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක ලබා දීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. තවද, සංවර්ධන නිලධාරීන්ගේ (විදේශ රැකියා) ධාරිතා සංවර්ධනය සඳහා මනෝ සමාජීය සහාය පිළිබඳව පුහුණු වැඩසටහන් 17ක් අංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් මට්ටමින් සිදු කර ඇත. එමෙන්ම, විගමනික ප්‍රජාව සඳහා මනෝ සමාජීය සහාය පුහුණු වැඩසටහන් 19ක් හා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 29 ක් අංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් මට්ටමින් සිදුකර ඇත. සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) අනුග්‍රහයෙන් විගමනික ප්‍රජාව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය හා මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් 11ක් දිස්ත්‍රික් මට්ටමින් සිදුකර ඇත.

- **දැනුවත්කිරිමේ වැඩසටහන් සිදුකිරිම**

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ ඒකකයේ නිලධාරීන්ගේ සම්පත්දායකත්වයෙන් සුරක්ෂිත සංක්‍රමණය, ළමා ආරක්ෂාව හා රැකවරණය, තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම, විගමණික ශ්‍රමිකයින් නැවත සමාජගත කිරීම, මනෝ සමාජීය සහාය හා ව්‍යවසායකත්ව සංවර්ධනය යන ක්ෂේත්‍ර ඔස්සේ දිවයින පුරා දැනුවත්කිරීමේ වැඩසටහන් 640ක් 2024 වර්ෂය තුළ සිදුකර ඇත.

- **විදේශ රැකියා අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය**

විදේශ රැකියා අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා දේශීය පුහුණු වැඩසටහන් 7ක් 2024 වර්ෂය තුළ සිදු කර ඇත. ඒ අනුව, මූලික ව්‍යාපෘති කළමනාකරණ වැඩමුළුව - දෙවන අදියර, කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන්, පරිපාලන නිලධාරී ධාරිතා සංවර්ධනය පිළිබඳ පුහුණුව සහ රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සඳහා නිලධාරීන් යොමු කරන ලදී.

## V. විදේශ රැකියා ක්ෂේත්‍රයේ පාලනය සහ නියාමනය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය** ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සඳහා වන මූලික නියාමන ආයතනය වේ. එය විදේශයන්හි රැකියා අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින්ගේ අභිමානය, ආරක්ෂාව සහ සමානාත්මතාවය යන කොන්දේසි යටතේ සංක්‍රමණය වීම සහතික කරන ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් යටතේ ස්ථාපිත පුළුල් විෂයපථයකින් යුත් ආයතනයකි.

*වගුව 2 - විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත් නිකුත් කිරීම ,විදේශ රැකියා ඇණවුම් අනුමත කිරීම සහ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා.*

| | විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 99 |
| | | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව (වාර්ෂික අළුත් කිරීම) | 1,095 |
| 2 | ශ්‍රී ලාංකිකයින් බඳවා ගන්නා විදේශයන්හි පිහිටි රැකියා නියෝජිත ආයතන සහ සමාගම් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම / අලුත්කිරීම | ලියාපදිංචි කළ/ අලුත් කළ විදේශීය රැකියා නියෝජිත ආයතන/ සමාගම් සංඛ්‍යාව (ගමනාන්ත රටවල) | 1,833 |
| 3 | විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ | අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 4,102 |

| | | | |
|---|---|---|---|
| | රැකියා ඇණවුම් සහ දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම | අනුමත කරන ලද විදේශ රැකියා දැන්වීම් සංඛ්‍යාව | 2,888 |
| 4 | විදේශ රැකියා සඳහා ලියාපංදිංචි කිරීම | බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් විදේශ රැකියා ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගෙන විදේශගත කිරීම සඳහා ලබාදුන් අනුමැති සංඛ්‍යාව | 122,104 |
| | | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 81,924 |
| | | පුද්ගලික මාර්ගයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචිය අලුත් කළ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 29,026 |
| | | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 2,971 |
| | | විදේශයන්හි පිහිටි දූත මණ්ඩල කාර්යාල හරහා ලියාපදිංචිය අලුත් කළ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 5,624 |
| | | ගුවන් තොටුපළ ඒකකය මඟින් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 29,782 |
| | | ගුවන් තොටුපළ ඒකකය මඟින් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ලියාපදිංචිය අලුත් කළ විගමනික ශ්‍රමිකයන් සංඛ්‍යාව | 58,055 |

*වගුව 3 - විදේශ රැකියා සඳහා බඳවා ගැනීම් සම්බන්ධව බලපත්‍රලාභී නියෝජිත ආයතන/ බලපත්‍රලාභී නොවන වෙනත් පාර්ශවවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා.*

| | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සිදු කළ පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 4,658 |
| 2 | විසඳන ලද පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව | 1,635 |
| 3 | නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධව සිදුකරන ලද වැටලීම් සංඛ්‍යාව | 24 |
| 4 | නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධව සිදුකරන ලද වැටලීම් මඟින් අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාව | 27 |
| 5 | නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ ගොනු කළ නඩු සංඛ්‍යාව | 910 |
| 6 | නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී/ බලපත්‍රලාභී නොවන පාර්ශවයන්ට එරෙහිව අධිකරණයේ/ කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩු සඳහා පෙනී සිටි වාර සංඛ්‍යාව | 3,155 |

*වගුව 4 - විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම සහ මිනිස් වෙළඳාමට එරෙහි ක්‍රියාකාරම් - ශ්‍රී ලං.වි.සේ.නි.කා.*

| | විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | විගමනික ශ්‍රමිකයන් වෙතින් හෝ ඔවුන් වෙනුවෙන් ලැබෙන පැමිණිලි විසඳීම | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 7,478 |
| | | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 7,733 |
| 2 | ව්‍යාපාර ගැටලු නිරාකරණය කිරීමට අදාළව ලැබුණු පැමිණිලි විසඳීම | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 5,695 |
| | | විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 1,180 |
| 3 | | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 63 |

| | | | |
|---|---|---|---|
| | මිනිස් වෙළෙඳාමට එරෙහිවීමට අදාළ පැමිණිලි විසඳීම | ලැබුණු පැමිණිලිවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කළ පැමිණිලි සංඛ්‍යාව | 61 |

*වගුව 5 - විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන්- ශ්‍රී ලං.වි.සේ.නි.කා.*

| | විස්තරය | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | වැය කළ මුදල (රු.මිලි.) |
| 1 | විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම | 213,735 | 368.95 |
| 2 | විගමනික ශ්‍රමිකයන් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් (නැවත ගෙන්වා ගැනීම්, වෛද්‍ය වියදම්, මරණ වන්දි සඳහා වන වියදම් ඇතුළත්ව) | 949 | 184.34 |
| 3 | **මැදපෙරදිග කලාපයේ ගෘහස්ථ අංශයේ රැකියාවල නියුතු කාන්තා ශ්‍රමිකයින් සඳහා සේවායෝජක විසින් ගෙවනු ලබන විදේශ රක්ෂණාවරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම** | | |
| | i. විදේශ රක්ෂණාවරණයෙන් ආවරණය ලබා ඇති සේවක සංඛ්‍යාව | 70,444 | |
| | ii. රක්ෂණ වන්දි සඳහා ඉල්ලුම් කළ සේවක සංඛ්‍යාව | 309 | |
| | iii. ගෙවන ලද රක්ෂණ වන්දි සංඛ්‍යාව | 103 | 4.89 |
| 4 | උපකාර අවැසි විගමනික ශ්‍රමිකයන් වෙත ආහාර පාන, ප්‍රවාහන පහසුකම්, නවාතැන් හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීම | 11,369 | 9.63 |
| 5 | **විවිධ අපහසුතාවයන්ට පත් වූ විගමනික ශ්‍රමිකයින් විදේශ දූත මණ්ඩල වල මැදිහත්වීම මත නැවත මෙරටට ගෙන්වා ගැනීම** | | |
| | i. සේවක සුබසාධක අරමුදල මඟින් | 16 | 8.43 |
| | ii. රක්ෂණාවරණය මඟින් | 19 | |
| | iii. වෙනත් මූලාශ්‍ර මඟින් (රාජ්‍ය නොවන සංවිධාන) | 1,067 | |
| 6 | සේවක සුබසාධක අරමුදල යටතේ සහන සැලසීම | 95 | 19.86 |
| 7 | ස්වයං රැකියා ආරම්භ කිරීමට / වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රමිකයන් වෙත අවශ්‍ය උපකරණ / ද්‍රව්‍ය ලබා දීම | 529 | 25.32 |
| 8 | විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට වෛද්‍ය ප්‍රතිකාර සඳහා මූල්‍ය දායකත්වය ලබාදීම | 53 | 5.53 |
| 9 | විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම | 13,969 | 132.91 |
| 10 | විගමනික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා ඇති දූ දරුවන් සඳහා අවශ්‍ය සහය ලබා දීම | 28 | 2.29 |
| 11 | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන් සඳහා ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | 2,688 | 81.12 |
| 12 | ප්‍රථමවරට ගෘහ පාලන සහකාරවරියන් ලෙස විදෙස්ගත වන කාන්තා ශ්‍රමිකයින් හට රු.10,000.00 ක් වටිනා සතොස වවුචර්පත් ලබාදීම | 2,523 | 25.23 |
| 13 | **විගමනික ශ්‍රමිකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම** | | |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් දායකත්වය ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 5,567 | |
| | විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති විගමනික ශ්‍රමිකයින් ගණන | 99 | |
| 14 | **විදේශ දූත මණ්ඩල කාර්යාල මැදිහත්ව මෙරටට ගෙන්වන ලද රෝගීන් සංඛ්‍යාව සහ රෝහල් ගාස්තු වෙනුවෙන් කාර්යාංශයේ මැදිහත්වීම** | | |
| | i. රෝහල් ගාස්තු ගෙවීම | 06 | 5.89 |
| | ii. ගුවන් ප්‍රවේශපත්‍ර සඳහා ගෙවීම | 02 | 0.29 |
| 15 | විදේශ දූත මණ්ඩල කාර්යාලවල පවත්නා සුරක්ෂා නිවස්න මඟින් සේවය ලබාදුන් කාන්තා විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් කාර්යාංශයේ මැදිහත්වීම | 1,041 | 63.99 |
| 16 | **විදේශයන්හිදී මියගිය විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් සහන ලබාදීම** | | |
| | i. මෘතදේහ ලංකාවට ගෙන්වීම සඳහා සේවක සුබසාධක අරමුදල මඟින් සහය වීම | 16 | 7.65 |
| | ii. අවමංගල්‍ය කටයුතු සඳහා වියදම් දැරීම | 289 | 11.56 |

*වගුව 6 - පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය - ශ්‍රී ලං.වි.සේ.නි.කා*

| | වැඩසටහන | **ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගි වූ පුද්ගලයින් සංඛ්‍යාව** |
| 1 | ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක පුහුණුව - මැද පෙරදිග (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 659 | 14,516 |
| 2 | ගෘහස්ථ අංශයේ ගෘහපාලක සහායක- නැගෙනහිර ආසියාතික සහ යුරෝපා රටවල් සඳහා (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 51 | 1,091 |
| 3 | සාත්තු සේවක පුහුණුව (ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III) | 162 | 5,078 |
| 4 | පළපුරුදු ගෘහස්ථ ගෘහ පාලන සහකාරවරියන් සඳහා ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන | 90 | 1,395 |
| 5 | ගෘහස්ථ නොවන රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් සඳහා වූ පුහුණුව | 1,883 | 55,239 |
| 6 | පෙර විගමනික පුහුණුව - දකුණු කොරියාව | 80 | 3,598 |
| 7 | පෙර විගමනික පුහුණු පාඨමාලාව - ජපන් තාක්ෂණික සේවාස්ථ පුහුණු පාඨමාලාව ( TITP ) | 10 | 125 |
| 8 | විශේෂ භාෂා පුහුණුව (ජපන්) | 25 | 529 |
| 9 | විශේෂ භාෂා පුහුණුව (ඉංග්‍රීසි) | 77 | 2,773 |

## VI. විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය

### අ. අන්තර්ජාලගත රැකියා බැංකුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වාගෙන යනු ලබන අන්තර්ජාලගත රැකියා බැංකුවෙහි ලියාපදිංචි වීම සඳහා විදේශ රැකියා අපේක්ෂකයින් හට පහසුකම් සලසා ඇත.

ඒ අනුව, කාර්යාංශයේ වෙබ් අඩවිය හරහා පුද්ගලිකවම ලියාපදිංචි විය හැකි අතර ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල මඟින් ද ලියාපදිංචි විය හැක. තම අයදුම්පත රැකියා බැංකුවට යොමු කළ දින සිට උපරිම වසර 2ක කාලයක් සඳහා එය වලංගු වේ. මෙම රැකියා බැංකුව හරහා විදේශ රැකියා යෝජකයින්ට හා බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතනවලටද විදේශ රැකියා අපේක්ෂකයින් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

2024 වර්ෂය තුළ රැකියා බැංකුව හරහා ලියාපදිංචි වූ රැකියා අපේක්ෂකයන් සංඛ්‍යාව 11,033කි.

එමෙන්ම, විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා විදේශ රැකියා අපේක්ෂකයින් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් / ජංගම සේවා වැඩසටහන් 152ක් පවත්වා ඇති අතර ඒ සඳහා සහභාගී වූ සංඛ්‍යාව 7,848කි.

දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමින් රැකියා පොළ වැඩසටහන් 31ක් පවත්වා ඇති අතර ඒ සඳහා රැකියා නියෝජිත ආයතන 934ක් සහ රැකියා අපේක්ෂකයින් 54,174ක් සහභාගී වී ඇත.

## VII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම

### අ. ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ වැඩසටහන ක්‍රියාවට නැංවීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය 2012 නොවැම්බර් 06 දින ISO 9001:2008 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදී.

ISO 9001:2015 තත්ත්ව සහතිකය ඉදිරි වර්ෂයන් සඳහා නැවත සලකා බැලීමට, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් සහතික කරන විගණනය 2024 වර්ෂයේ මාර්තු මාසයේ දී ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා සිදුකරන ලදී.

ඒ අනුව, ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාලයන් සඳහා 2024 අප්‍රේල් 26 දින සිට 2027 අප්‍රේල් 25 දින දක්වා කාලයට බලපැවැත්වෙන පරිදි ISO 9001:2015 තත්ත්ව සහතිකය දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කටයුතු කර ඇත.

## VIII. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මානව සම්පත් සංවර්ධනය

### අ. කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම

*වගුව 7 - කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම - ශ්‍රී ලං.වි.සේ.නි.කා.*

| | විස්තරය | සහභාගි වූ සංඛ්‍යාව | පිරිවැය (රු. මි.) |
|---|---|---|---|
| 1 | වැඩමුළු | 43 | 0.44 |
| 2 | පාඨමාලා | 30 | 3.54 |
| 3 | පුහුණු වැඩසටහන් | 1,442 | 38.5 |

| | | | |
|---|---|---|---|
| | එකතුව | **1,515** | **42.48** |

## IX. විදේශ රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කිරීම

**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම** මගින් විදේශ රැකියා සඳහා පුද්ගලයන් බඳවා ගැනීමට අදාළ කටයුතු සැලසුම් කරමින් ඒවා ක්‍රියාවට නැංවීම සිදු කරයි. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් සිදුකර 2024 වර්ෂය තුළ ශ්‍රමිකයින් 558ක් විදේශ ගත කර ඇත.

- රැකියා ඇණවුම් සොයා ගැනීම
- රැකියා ඇණවුම් සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම
- රැකියා ඇණවුම්වලට අදාළ ප්‍රචාරයන් සඳහා අනුමැතිය ලබා ගැනීම
- සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීම
- සේවායෝජකයින්ගේ තෝරා ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීම සහ ඔවුන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම
- සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම උදෙසා සම්මුඛ පරීක්ෂණ සහ තත්ත්ව පරීක්ෂණ පැවැත්වීම
- බඳවාගැනීමට අදාළ වූ වෛද්‍ය පරීක්ෂණ කටයුතු, ගිවිසුම් අත්සන් කිරීම, ගුවන් ටිකට්පත් ලබාගැනීම වැනි කටයුතු ඉටු කිරීම
- වීසා ලබාගැනීම සඳහා වූ අදාළ ලිපි ලේඛන සකස්කර නියමිත අංශ වෙත යොමු කිරීම
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවසන් අනුමැතිය ලබාගැනීම සහ පුද්ගලයින් රැකියා සඳහා විදේශ ගත කිරීම

*වගුව 8 - විදේශ රැකියා සඳහා පුද්ගලයින් යොමු කිරීම - ශ්‍රී.ලං.වි.ර.ඒ.*

| රැකියා ක්ෂේත්‍රය | සයිප්‍රස් | රුමේනියා | ඩුබායි | සිංගප්පූරුව | ජපානය | රුසියාව | ඇමරිකාව | මාලදිවයින | කටාර් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගෘහ සේවක | 194 | | | | | | | | |
| කම්කරු | 17 | | | | | | | | |
| අරක්කැමි | 1 | | | | | 2 | | | |
| කෘෂිකාර්මික කම්කරු | | | | | | 56 | | | |
| මහන මැෂින් ක්‍රියාකරවන්නන් | | | | | | 77 | | | |
| මුළුතැන්ගෙයි සහායක | | | | | | 4 | | | |
| කටර් | | | | | | 4 | | | |
| ස්පෙෂලිස්ට් | | | | | | 2 | | | |
| අත්උදව්කරුවන් | | 23 | 4 | | | 31 | | | |
| ටුවර් ඔපරේටර් | | | | | | | | 2 | |
| සාත්තු සේවක | | | | | 2 | | | | |
| ආහාර සැපයුම් | | | | | 12 | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු - නිෂ්පාදන | | | | | 1 | | | | |
| හෙද සහායක | | | | | 6 | | 1 | | |
| පොලිස් සහායක | | | | 63 | | | | | |
| ඇසුරුම්කරුවන් | | | | | | 17 | | | |
| වේටර්වරු | | | | | | | | | 12 |
| වේටර්වරියන් | | | | | | | | | 3 |
| අශ්වාරෝහක | | 7 | | | | | | | |
| මේසන් | | 4 | | | | | | | |
| බ්ලැක්ස්මිත් | | 9 | | | | | | | |
| විදුලි කාර්මික | | 1 | | | | | | | |
| අරක්කැමි - අත්උදව් | | 1 | | | | | | | |
| මැෂින් ක්‍රියාකරවන්නන් | | | 1 | | | | | | |
| අලෙවි නිලධාරී | | | | | 1 | | | | |
| **එකතුව** | **212** | **45** | **5** | **63** | **22** | **193** | **1** | **2** | **15** |
| **මුළු එකතුව** | **558** | | | | | | | | |

## 06. මානව සම්පත් පැතිකඩ (කාර්ය මණ්ඩලය)

*වගුව 9 - විදේශ රැකියා අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය*

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1 | අමාත්‍යාංශ කාර්යාලය - විදේශ රැකියා අංශය | 11 | 10 | 2 | 2 | 1,024 | 995 | 21 | 15 | 1,058 | 1,022 | 36 |
| 2 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 137 | 91 | 197 | 173 | 692 | 639 | 251 | 218 | 1,277 | 1,121 | 156 |
| 3 | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම | 7 | 4 | 6 | 6 | 10 | 9 | 7 | 9 | 30 | 28 | 2 |
| | **එකතුව** | **152** | **105** | **208** | **181** | **1,726** | **1,643** | **279** | **242** | **2,365** | **2,171** | **194** |

## 07. මූල්‍ය වාර්තා

### I. විදේශ රැකියා අංශය

*වගුව 10 - භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය*

| **ආයතනය / අංශය** | විදේශ රැකියා අංශය | |
|---|---|---|
| **වැය විෂය** | 193 | |
| | **පුනරාවර්තන** | **මූලධන** |
| **ශුද්ධ ප්‍රතිපාදනය (රු. 000')** | 782,725 | 218,000 |
| **වියදම (රු. 000')** | 751,822 | 120,551 |
| **ඉතිරි ප්‍රතිපාදනය (රු. 000')** | 30,903 | 97,449 |
| **වියදම් ප්‍රතිශතය (%)** | **96** | **55** |

* මහා භාණ්ඩාගාර වියදම් වාර්තාව (2024.12.31) ලැබී නොමැති බැවින් මෙම වාර්තාව CIGAS වියදම් වාර්තාවට අනුව සකසා ඇත

## II. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

*වගුව 11 - 2024.01.01 සිට 2024.12.31 දක්වා ආදායම් සහ වියදම් විස්තරය - ශ්‍රී ලං.වි.සේ.නි.කා. (කෙටුම්පත)*

| *විස්තරය* | විගණනය නොකළ ගිණුම් (රු.) | අය වැය වෙන් කිරීම් (රු.) | අයවැය ළඟාකර ගැනීම් % | 2023 වර්ෂය (සත්‍ය) (රු.) |
|---|---|---|---|---|
| ආදායම | | | | |
| බදවා ගැනීමේ ගාස්තු - නියෝජිත ආයතන | 653,529,600 | 717,600,000 | 91 | 711,438,184 |
| බදවා ගැනීමේ ගාස්තු - පුද්ගලික මාර්ගයෙන් / කාර්යාංශය | 2,101,389,464 | 2,955,600,000 | 71 | 1,774,483,577 |
| බදවා ගැනීමේ ප්‍රවර්ධන ගාස්තු | 195,281,277 | 372,664,000 | 52 | 279,138,716 |
| පහසුකම් ගාස්තු | 62,633,800 | 83,000,000 | 75 | 59,549,881 |
| බලපත්‍ර ගාස්තු | 125,726,284 | 132,800,000 | 95 | 114,383,047 |
| සෙස් ආදායම | 664,222,105 | 908,922,000 | 73 | 986,018,458 |
| කොරියානු නැවතබදවා ගැනීමේ වැඩසටහනට අදාළ ගාස්තු | 128,540,589 | 184,269,000 | 70 | 171,211,541 |
| පුහුණු කිරීමේ ගාස්තු | 233,610,694 | 165,000,000 | 142 | 248,113,646 |
| සේවක සුභසාධක අරමුදලෙන් ලැබීම් | 3,035,239,024 | 3,600,000,000 | 84 | 3,622,967,476 |
| **මෙහෙයුම් ආදායම** | **7,200,172,837** | **9,119,855,000** | **79** | **7,967,304,526** |
| **එකතුකළා - වෙනත් ආදායම්** | | | | |
| විදේශ විනිමය හුවමාරුවෙන් ලැබූ වාසි / පාඩු | (400,000,000) | 125,000,000 | -320 | (680,814,066) |
| විවිධ ආදායම් | 1,602,188,810 | 967,000,000 | 166 | 2,120,601,630 |
| **මුළු වෙනත් ආදායම** | **1,202,188,810** | **1,092,000,000** | **110** | **1,439,787,564** |
| | | | | |
| ආයෝජන මත පොළී ආදායම | 1,657,350,903 | 1,698,430,827 | 98 | 2,815,501,918 |
| | | | | |
| **මුළු ආදායම** | **10,059,712,550** | **11,910,285,827** | **84** | **12,222,594,008** |
| **අඩු කළා** | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 2,295,244,578 | 3,161,005,000 | 73 | 1,875,674,039 |
| ආයතනික වියදම් | 948,043,948 | 1,261,257,574 | 75 | 782,066,919 |
| මෙහෙයුම් වියදම් | 607,283,645 | 1,086,251,000 | 56 | 528,896,940 |
| මූල්‍ය වියදම් | 25,160,099 | 10,465,780 | 240 | 18,167,656 |
| වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණ වියදම් | 162,455,063 | 498,213,000 | 33 | 115,428,265 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 567,208,178 | 910,755,000 | 62 | 82,177,391 |
| සේවක සුභ සාධන අරමුදල් වියදම් | 1,198,944,695 | 4,397,174,000 | 27 | 1,036,249,283 |
| **මුළු වියදම** | **5,804,340,206** | **11,325,121,354** | 51 | 4,438,660,493 |
| **අතිරික්තය/ ඌණතාවය** | **4,255,372,344** | **585,164,473** | **727** | **7,783,933,515** |

## III. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම

*වගුව 12 - ආදායම් හා වියදම් තත්වය - ශ්‍රී.ලං.වි.ර.ඒ. (කෙටුම්පත)*

| | විස්තරය | 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා - රු. |
|---|---|---|
| 01 | ආදායම | 277,171,923.00 |
| 02 | වියදම | 74,185,052.00 |
| 03 | ලාභය | 202,986,871.00 |

# සංචාරක
# சுற்றுலாத்துறை
# Tourism

**696/4, මරදාන පාර, කොළඹ 10.**
**696/4, மருதானை வீதி, கொழும்பு 10**
**696/4, Maradana Road, Colombo 10.**

0112 381 798/
0112 321 222

0112 436 672

secretary@tourismmin.gov.lk

www.mfa.gov.lk

සංචාරක අංශය


| **පරිච්ඡේදය** | පිටු අංකය |
|---|---|
| **සංචාරක අංශය** | |
| 1 වන පරිච්ඡේදය – සංචාරක අංශය | 139-162 |
| 2 වන පරිච්ඡේදය – ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 163 –194 |
| 3 වන පරිච්ඡේදය – ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනය | 195 - 224 |
| 4 වන පරිච්ඡේදය – ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 225-254 |
| 5 වන පරිච්ඡේදය – ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 255-286 |

# වගු පෙළගැස්ම


| වගු අංකය | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| සංචාරක අංශය | | |
| 1 | කාර්ය මණ්ඩල තොරතුරු | 145 |
| 2 | සංචාරක අංශය යටතේ සිදුකළ පුහුණු වැඩසටහන්වල තොරතුරු | 146 |
| 3-5 | මූල්‍ය ප්‍රගතිය | 148-150 |
| 6 | සංචාරක ආකර්ෂණීය ස්ථාන  සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය | 154 - 156 |
| 7 | පින්නවල කිතුල්ගල සංචාරක තීරය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රගතිය | 157-159 |
| 8 | ද්විපාර්ශ්වික සබඳතා | 160 |

## 01
## සංචාරක අංශය

### හැඳින්වීම

2024 නොවැම්බර් මස 25 වන දින අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය පිහිටුවන ලදි. මෙම අමාත්‍යාංශය යටතේ සංචාරක විෂයට අදාළ ප්‍රධාන අරමුණු අතර නිසි ප්‍රතිපත්තියක් හා නියාමන රාමුවක් සැකසීම, ප්‍රබල යටිතල පහසුකම් සංවර්ධනයක් සහතික වීම, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පරිපාලන හා මූල්‍ය විශ්ලේෂණ පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

### දැක්ම

මතකයේ රැඳෙන , අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දූපත ලෙස හඳුනා ගැනීම.

### මෙහෙවර

ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත්වීම.

### විෂයන් හා කාර්යයන්

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක විෂයන්ට සහ ගැසට් පත්‍රයේ දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපාය මාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

4. විදේශීය වෙළඳ, ආයෝජන, සංචාරක, රැකියා හා විදේශ මූල්‍ය සබඳතා කටයුතු ප්‍රවර්ධනය සඳහා අදාල අමාත්‍යංශ හා ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම .

5. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම හා උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම.

6. සංචාරක නියෝජිතායතන හා සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන් ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු සිදු කිරීම

7. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඪ ඓතිහාසික උරුමයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් ශ්‍රී ලංකාව සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස දේශීය හා විදේශීය සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම.

8. සංචාරකයින් සඳහා නිවාඩු නිකේතනයන් හා සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථාන, හෝටල් පහසුකම්, ගුවන් හා මුහුදු ගමන් පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

9. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් සහ ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

10. සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම.

11. ස්වභාවික හා සංස්කෘතික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම, සංචාරක කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය, නව සංචාරක සේවා සංවර්ධනය සහ ප්‍රමිතිකරණය, උපාය මාර්ගික ගමනාන්ත ප්‍රවර්ධනය ආදිය සඳහා කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම

12. ආයුර්වේද චිකිත්සාව ඇතුළු සමස්ත වෛද්‍ය සේවා සහ ප්‍රතිකාර ලබා දීමෙන් වෛද්‍ය සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම.

13. ක්‍රීඩා - සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම.

14. දෘ ්‍ය කලාව සඳහා වන ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොල සමඟ සංචාරක කර්මාන්තය ඒකාබද්ධ කිරීම.

15. සංචාරක කර්මාන්තය තුළ සංස්කෘතික උරුමය විශේෂ පැතිකඩක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

## සංචාරක අංශය යටතේ ඇති ආයතන

1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
4. ශ්‍රී ලංකා සම්මේලන කර්යාංශය

## සංවිධාන සටහන




තොසතානි - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
සනි - සංවර්ධන නිලධාරී
කසේනි - කළමනාකරණ සේවා නිලධාරී
තොසතාස - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර

ගිස - ගිණුම් සහකාර
විකැක්‍රි - වීඩියෝ කැමරා ක්‍රියාකරු
නිජාශි - නිශ්චල ජයාරූප ශිල්පී
විකැස - වීඩියෝ කැමරා ක්‍රියාකරු සහායක
කාසේස - කාර්යාල සේවක සහයක

## 1.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව සංස්කෘතික විවිධත්වය අතින් මෙන් ම, ස්වාභාවික උරුමයන්ගෙන් ද ආඪ්‍ය වූ රටකි. ඒහි යුනෙස්කෝ ලෝක උරුම ස්ථාන 08 ක් ද, ලෝකයේ ප්‍රධාන ජෛව විවිධත්ව ස්ථාන 36 අතුරින් එක් ස්ථානයක් ද පිහිටා ඇති අතර, කිලෝමීටර් 1340 පුරා විහිදුණු දිගු වෙරළ තීරයක් ද පවතී. ශ්‍රී ලාංකිකයන්ගේ ආගන්තුක සත්කාරය සහ මිත්‍රශීලී හැසිරීම ලොව පුරාම ඉමහත් ප්‍රසිද්ධියක් උසුලන අතර, සංචාරකයින්ගේ සමස්ත සංචාරක අත්දැකීම් බෙහෙවින් ඉහල නැංවීමට එය හේතුවේ. ශ්‍රී ලාංකිකයන් විසින් සංචාරකයින් සාම්ප්‍රදායික ව උණුසුම් අයුරින් පිළිගැනීම සංචාරකයින්ට අමතක නොවන හැඟීමක් නිරන්තරයෙන් ම ඇති කරයි. එය යළි යළිත් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට මෙන් ම, සංචාරකයින් අතර ශ්‍රී ලංකාව පිළිබඳ ව ධනාත්මක ප්‍රතිචාරයක් ඇති කිරීම ද දිරිගන්වයි. ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ආකර්ෂණය රඳා පවතින්නේ මෙම සුවිශේෂී උරුමයන් නිසාම පමණක් නොව, ඉන්දියන් සාගරයේ ප්‍රධාන ගුවන් හා මුහුදු මාර්ග මධ්‍යයේ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම ද නිසාවෙනි.

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආදායම් උත්පාදනය කරන ප්‍රධාන මූලාශ්‍රයක් වන අතර, එහි ආර්ථික වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයයි. 2024 වර්ෂයේ දී, කර්මාන්තය ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කළ අතර, සංචාරක ක්ෂේත්‍රයේ නිරත තැනැත්තන්ට නව බලාපොරොත්තුවක් ගෙන ආවේ ය. 2024 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ දෙසැම්බර් යන මාසවල දී විදේශීය සංචාරක පැමිණීම ඉතා ඉහළ අගයක් පෙන්නුම් කරනු ලදී. 2025 වර්ෂයේ මෙරට මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව මිලියන 3 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එම වර්ෂයේ දී සංචාරක අංශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 5 ක පමණ ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.




**I ප්‍රස්තාරය: ශ්‍රී ලංකාවේ මුළු විදේශීය සංචාරක පැමිණීම: 2018 – 2024 අතර කාල පරිච්ඡේදය**
*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංඛ්‍යාලේඛන*

සංචාරක ක්ෂේත්‍රය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින හෙයින්, රජය විසින් හඳුන්වා දුන් නව සංචාරක ප්‍රතිපත්තියට අනුකූලව, රේඛීය අමාත්‍යාංශය සංචාරක කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කිරීමට ක්‍රියාකාරී ව කටයුතු කරමින් සිටී. "සංගෘහිත සංචාරක ආර්ථිකයක් කරා" යන තේමාව යටතේ වූ මෙම ප්‍රතිපත්තිය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම් වේ. ඒ අනුව, මෙම අමාත්‍යාංශය රජයේ සංචාරක ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ 2025 වර්ෂයේ දී සංචාරක ගමනාන්තවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

## 1.2. අභ්‍යන්තර අංශ

සංචාරක අංශය ප්‍රධාන අංශ පහක් යටතේ ක්‍රියාත්මක වන අතර එම අංශයන්, පරිපාලන, මූල්‍ය, සංවර්ධන, සැලසුම් සහ අභ්‍යන්තර විගණන ලෙස දැක්විය හැක.

### 1.2.1. පරිපාලන අංශය

පරිපාලන අංශය අතිරේක ලේකම් (පාලන) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. සංචාරක අංශයේ මානව සම්පත් සංවර්ධනය කරමින්, සියළුම පරිපාලන කටයුතු ඵලදායි ලෙස සිදුකිරීම පාලන අංශය මඟින් සිදු කරයි. තව ද, අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන ආයතන/ දෙපාර්තමේන්තුවල පරිපාලනමය කටයුතු සඳහා අවශ්‍ය මැදිහත්වීම ද සිදුකරන අතර පාර්ලිමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලය ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

**විෂයපථය**

- කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථානගත කිරීම, විශ්‍රාම ගැන්වීම
- කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාර්යය මණ්ඩල දත්ත යාවත්කාලීනව පවත්වාගෙන යාම
- වාහන නඩත්තුව සහ ප්‍රවාහන පහසුකම් කළමනාකරණය
- සංචාරක අංශයේ යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම
- පාර්ලිමේන්තුව ඇතුළු බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කළමනාකරණය
- විනය සහ දුක් ගැනවිලි කළමනාකරණය
- සංචාරක අංශය යටතේ පවතින ආයතන සඳහා පහසුකම් සැලසීම, මඟපෙන්වීම සහ අධීක්ෂණය
- අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම
- වාචික සහ ස්ථාවර නියෝග යටතේ අසනු ලබන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම
- ආයතනික ඵලදායිතාවය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම

**කාර්යය මණ්ඩල තොරතුරු**

අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 115 වන අතර 2024.12.31 දිනට කාර්යය මණ්ඩලය 79 කි.

| සේවා මට්ටම | අනුමත කාර්යය මණ්ඩලය | පවතින කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 19 | 13 | 6 |
| තෘතියික | 5 | 3 | 2 |
| ද්විතීයික | 69 | 49 | 20 |
| ප්‍රාථමික | 22 | 14 | 8 |
| **එකතුව** | **115** | **79** | **36** |

වගුව 1 : කාර්යය මණ්ඩල තොරතුරු
මූලාශ්‍රය: පරිපාලන අංශය

**කාර්යසාධනය**

සමාලෝචිත කාලය තුළ කාර්යය මණ්ඩලයේ ධාරිතාව, දැනුම, කුසලතා ශක්තිමත් කිරීමේ අරමුණින් පුහුණුවීම් ලබාදීමට පියවර ගන්නා ලදි.

**පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර**

වගුව 2 : පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

| අනු අංකය | සහභාගී වූ පාඨමාලාව / සම්මන්ත්‍රණය /පුහුණු වැඩසටහන | සංවිධානය කළ රට | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සංචාරක කටයුතු පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුවේ (BIMSTEC) ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන රැස්වීම | නේපාලය | 02 |
| 02. | සංචාරක සංවර්ධනයේ ප්‍රධාන දිශානතීන් සහ අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වන ජාත්‍යන්තර සමුළුව | ටර්ක්මනිස්ථානය | 02 |
| 03. | ශ්‍රී ලංකාවේ තරුණ රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා වන සම්මන්ත්‍රණය | චීනය | 01 |
| 04. | BRI රටවල් සඳහා ස්වභාවික උරුම ආරක්ෂාව සහ කළමනාකරණය පුහුණු වැඩසටහන | චීනය | 01 |
| 05. | පාරිසරික සංචාරක සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 02 |
| 06. | JICA දැනුම සම-නිර්මාණය කිරීමේ වැඩසටහන: සංස්කෘතික උරුමයන් සහ ප්‍රාදේශීය ප්‍රජාව සමඟ තිරසාර සංචාරක සංවර්ධනය | ජපානය | 01 |
| 07. | සංවර්ධනය වෙමින් පවතින රටවල සංචාරක සම්පත් සුරැකුම සහ පාරිසරික ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 01 |
| 08. | දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගිතා (SASEC) වැඩසටහන් ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම | භූතානය | 01 |
| 09. | ADB: වටිනාකම් ලබා දීම - ආසියාවේ සංචාරක විසඳුම් එකතු කිරීම සහ පැසිෆික් ඉගෙනුම් වැඩසටහන | තායිලන්තය | 01 |

මූලාශ්‍රය: පරිපාලන අංශය

## 1.2.2. මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ මූල්‍ය සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් මෙම අංශය වගකීම දරයි. අයවැය ඇස්තමේන්තු ක්‍රියාකාරකම්, වැටුප් ලේඛන ක්‍රමය, මූල්‍ය මෙහෙයුම්, වත්කම් කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය සහ වෙනත් මූල්‍ය සහාය සේවා මූල්‍ය අංශය මඟින් සපහනු ලැබේ.

**විෂයපථය**

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සකස් කිරීම හා අයවැය පාලනය.
- අවසාන ගිණුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් පවත්වාගෙන යාම.
- වැටුප් සැකසීම, ගෙවීම සහ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම්වලට අදාළ ගෙවීම් සිදු කිරීම.
- අත් මුදල් අවශ්‍යතා අධීක්ෂණය හා පාලනය  සහ වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.
- වත්කම් කළමනාකරණය සහ වාර්ෂික භාණ්ඩ  සමීක්ෂණය සංවිධානය කිරීම.
- මූල්‍ය වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.
- ජාතික විගණන කාර්යාලයෙන් එවනු ලබන සියලු ම විගණන විමසුම් සිදු කිරීම.
- අමාත්‍යාංශයේ (සංචාරක අංශය) සහ සංචාරක අංශයේ විෂය පථය යටතේ ඇති ආයතනවල මූල්‍ය කළමනාකරණය සම්බන්ධව අධීක්ෂණය කිරීම හා උපදෙස් සැපයීම.
- කළමනාකරණ තොරතුරු පද්ධති පවත්වාගෙනයාම (CIGAS, ITMIS).
- පවතින නීති රීති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට අනුකූලව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

මූල්‍ය ප්‍රගතිය - 2024.12.31 දිනට

| | | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය (සංචාරක අංශය)<br>ශීර්ෂය : 122<br>01 – මෙහෙයුම් ක්‍රියාකාරකම්<br>01 – පරිපාලන හා ආයතනික සේවා | | | | |
|---|---|---|---|---|---|---|
| වැය විෂය | අයිතමය | විස්තරය | රු.<br>සංශෝධිත මුළු ප්‍රතිපාදන | රු.<br>මුළු වියදම | රු.<br>ඉතිරි ප්‍රතිපාදන | ප්‍රතිශතය |
| | | **පුනරාවර්තන වියදම්** | **32,360,000.00** | **15,408,600.37** | **16,951,399.63** | **47.62%** |
| | | **පුද්ගල පඩිනඩි** | **9,200,000.00** | **3,230,899.62** | **5,969,100.38** | **35.12%** |
| 1001 | | වැටුප් හා වේතන | 5,000,000.00 | 1,573,247.45 | 3,426,752.55 | **31.46%** |
| 1002 | | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 1,400,000.00 | 342,452.42 | 1,057,547.58 | **24.46%** |
| 1003 | | වෙනත් දීමනා | 2,800,000.00 | 1,315,199.75 | 1,484,800.25 | **46.97%** |
| | | | | | | |
| | | **ගමන් වියදම්** | **3,500,000.00** | **36,600.00** | **3,463,400.00** | **1.05%** |
| 1101 | | දේශීය | 1,000,000.00 | 36,600.00 | 963,400.00 | **3.66%** |
| 1102 | | විදේශීය | 2,500,000.00 | - | 2,500,000.00 | **0.00%** |
| | | | | | | |
| | | **සැපයීම්** | **6,380,000.00** | **3,762,105.52** | **2,617,894.48** | **58.97%** |
| 1201 | | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා | 700,000.00 | 89,307.25 | 610,692.75 | **12.76%** |
| 1202 | | **ඉන්ධන** | **5,630,000.00** | **3,672,798.27** | **1,957,201.73** | **65.24%** |
| | 002 | ඉන්ධන දීමනා | 5,530,000.00 | 3,652,833.27 | 1,877,166.73 | **66.05%** |
| | 010 | වෙනත් කටයුතු සඳහා ඉන්ධන | 100,000.00 | 19,965.00 | 80,035.00 | **19.97%** |
| 1203 | | **ආහාරපාන හා නිල ඇඳුම්** | **50,000.00** | **-** | **50,000.00** | **0.00%** |
| | 002 | නිල ඇඳුම් | 50,000.00 | - | 50,000.00 | **0.00%** |
| | | | | | | |
| | | **නඩත්තු වියදම්** | **3,970,000.00** | **2,572,612.00** | **1,397,388.00** | **64.80%** |
| 1301 | | වාහන | 3,000,000.00 | 2,305,212.00 | 694,788.00 | **76.84%** |
| 4. | කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය කිරීම (සේවකයින් සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්) | මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | <u>**ප්‍රධාන දේශීය පුහුණු වැඩසටහන්:**</u><br>01. SDFL හආයතනය මගින් අනධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකු 2024 පෙබරවාරි 15 සහ 16 යන දිනවල රියදුරු සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය පිළිබඳ වැඩමුළුව සඳහා සහභාගී වන ලදී.<br>02. 2024 අප්‍රේල් 4 වන දින PRAG ආයතනයේ ලංසු ලේඛන සකස් කිරීමේ සම්මන්ත්‍රණයට සහභාගී විය.<br>03. එක් අනධ්‍යයන සාමාජිකයෙක් 2024 ජුනි 10 සහ 11 යන දිනවල රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පරිපාලන නිලධාරීන් සහ මානව සම්පත් කළමනාකරුවන් සඳහා ඵලදායී කළමනාකරණ කුසලතා පිළිබඳ වැඩමුළුවකට සහභාගී විය.<br>04. J.P. පෙරේරා මහත්මිය - කළමනාකරණ සහකාර - SDFL විසින් පවත්වන ලද තොග කළමනාකරණය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් උපයෝජනය පිළිබඳ වැඩමුළුව සඳහා 2024 අගෝස්තු 20 සහ 21 සහභාගී වන ලදී.<br>05. නෙරංජන් පද්මකුමාර - ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) මගින් සංවිධානය කරනු ලැබූ, "විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම" එක්දින වැඩමුළුව - 2024 අගෝස්තු 27.<br>06. අචිනි නාකන්දල මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලක) - ජාතික කම්කරු අධ්‍යයන ආයතනය මගින් 2024.08.28 සිට 2024.11.29 දක්වා (මාස 4 පාඨමාලා) පවත් වූ කාර්මික සබඳතා සහ කම්කරු නීති යෙදුම් පිළිබඳ ජාතික පාඨමාලාව සඳහා සහභාගී විය.<br>ප්‍රධාන විදේශ පුහුණු වැඩසටහන්:<br>01. SLITHM හි සභාපතිවරයා 2024 ජනවාරි 09 සිට 20 දක්වා චීනයේ Chongqing හි ජාත්‍යන්තර විද්‍යුත් ග්‍රාමීය පුනර්ජීවන අධ්‍යයනය සහ සහයෝගීතා සංචාරයකට සහභාගී විය.<br>02. එක් අධ්‍යයන සාමාජිකයෙක් 2024 මාර්තු 11 සිට 15 දක්වා ඉන්දියාවේ පැවති ලෝක ආහාර තරඟය යන වැඩසටහන සඳහා සහභාගී විය.<br>03. 2024 මාර්තු මාසයේදී නේපාලයේ (කත්මණ්ඩු) මාස්ටර් පංතියේ සූපශාස්ත්‍ර කලා වැඩසටහනට අධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකු සහභාගී විය.<br>04. SLITHM හි සභාපතිවරයා 2024 අප්‍රේල් 14 සිට 19 දක්වා මැලේසියාව සමඟ සංචාරක සහයෝගීතාවයට සහභාගී විය.<br>05. අධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකු 2024 මැයි 05 සිට 10 දක්වා ඉන්දුනීසියාවේ Palemband හි පැවති Asia Tourism Forum 2024 කමිටුවට සහභාගී විය. |

| | | | |
|---|---|---|---|
| | | | 06. අධ්‍යක්ෂ ජනරාල්තුමය 2024 ජූලි 04 සිට 2024 ජූලි 23 දක්වා චීනයේ පරිසර සංචාරක සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගී විය.<br>07. 2024 ඔක්තෝබර් 7 සහ 8 යන දිනවල ඔස්ට්‍රියාවේ වියානා හි පැවති ජාත්‍යන්තර සංචාරක අධ්‍යාපන විශේෂඥයින්ගේ වැඩමුළුවට එක් අධ්‍යයන සාමාජිකාවක් (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ඩබ්ලිව් එන් බී මෙන්ඩිස් මහත්මිය) සහභාගී විය.<br>08. අධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකු 2024 නොවැම්බර් 04 සිට නොවැම්බර් 09 දක්වා ඉන්දුනීසියාවේ Barista & Coffee Art, බියර් සේවය, කොක්ටේල් සහ නිවර්තන බීම, සහ අවන්හල් සේවා කළමනාකරණය පිළිබඳ පුහුණු සැසියකට සහභාගී විය. |
| 5. | කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය (PMS) හඳුන්වා දීම | PMS දිගටම කරගෙන යාම | PMS දිගටම කරගෙන යනු ලැබේ. |
| 6. | බඳවා ගැනීම | සුදුසු අයදුම්කරුවන් සමඟ අවශ්‍ය පුරප්පාඩු පිරවීම | 01. පරිපාලන නිලධාරි 2024 ජනවාරි මස බඳවාගන්නා ලදී.<br>02. රත්නපුර සහ කොග්ගල පළාත් විද්‍යාල සඳහා සහකාර කථිකාචාර්යවරුන් 02ක්, සහකාර මුදල් අධ්‍යක්ෂ (ADF) සහ කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා එක් කාර්යාල ආධාරයක් 2024 පෙබරවාරි මස බඳවා ගන්නා ලදී.<br>03. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) 2024 අප්‍රේල් මාසයේදී බඳවා ගන්නා ලදී.<br>04. 2024 මැයි මාසයේදී කළමනාකරණ සහකාර (දෙවන පදනම) 01 ක් බඳවාගෙන ඔහුව නිදහස් කරන ලදී. 2024 සැප්තැම්බර් 06 වැනි දින නැවතත් රජයේ සේවය සඳහා නිදහස් කරන ලදී.<br>05. 2024 ජූලි මාසයේදී සහකාර අධ්‍යක්ෂ (නඩත්තු), 01 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම), වැඩසටහන් නිලධාරි 01, කළමනාකරණ සහකාර 04 (යාපනය සඳහා 01 / මානව සම්පත් ඒකකය සඳහා 01/ මූල්‍ය ඒකකය සඳහා 01/ කොළඹ රෙජිස්ට්‍රාර් කාර්යාලය සඳහා 01), සහකාර කථිකාචාර්ය පළාත් 01 මහනුවර විද්‍යාලය, 01 සහකාර කථිකාචාර්ය පළාත් විද්‍යාලය අනුරාධපුර (කොන්ත්‍රාත් පදනම), සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ HR සහ Admin (දෙවන පදනම) බඳවා ගන්නා ලදී.<br>06. 2024 අගෝස්තු මාසයේදී අධ්‍යක්ෂ මූල්‍ය (DF), කළමනාකරණ සහකාරවරුන් 02 (කුරුණෑගල සඳහා 01 / කොළඹ මූල්‍ය ඒකකය සඳහා 01), සහකාර කථිකාචාර්යවරුන් 02 කොළඹ පාසල සඳහා බඳවාගන්නා ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | 07. 2024 සැප්තැම්බර් මාසයේදී බණ්ඩාරවෙල පළාත් විද්‍යාලය සඳහා සහකාර කථිකාචාර්ය (කොන්ත්‍රාත් පදනම) සඳහා DDG අනධ්‍යයන (දෙවන පදනම) බඳවා ගන්නා ලදී. |
| 7. | SLITHM හි කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම. | කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම පද්ධතිය ඇති කිරීම. | කෙටුම්පත සම්පූර්ණ කර ඇත. |
| 8. | අධ්‍යයන සහ අනධ්‍යයන SOR සමාලෝචනය කිරීම. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම. | නව සේවක සංඛ්‍යාව යෝජනා කර කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. වැඩිදුර සාකච්ඡා පැවැත්වෙන අතර 2024.10.11 දින පවත්වන ලද රැස්වීමකදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට වාචිකව දැනුම් දෙන ලදී. |

## 5.3 තොරතුරු තාක්ෂණ අංශය

| අංකය | | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | **තොරතුරු තාක්ෂණ සංවර්ධනය** | | | |
| | 1.1 | ශිෂ්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම | ඇතුළත් කළ යුතු හඳුනාගත් සංරචක ශිෂ්‍ය කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීම | Excel ශ්‍රිත හරහා ගෙවීම් පත්‍රිකාව සහ කාලසටහන් ඇතුළත් කර ඇති අතර නව වාර්ෂික නඩත්තු ගිවිසුමක් අත්සන් කර ඇත. ඊටත් පසු වැඩිදියුණු කිරීම් කිහිපයක් හඳුනාගෙන ඇති අතර ඒවා 2025 වර්ෂයේදී සිදු කෙරේ. |
| | 1.2 | ගබඩා කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම | හඳුනාගත් සංරචක ශිෂ්‍ය කළමනාකරණ පද්ධතියට ඇතුළත් කිරීම | කරුණු කිහිපයක් සම්බන්ධයෙන් සැපයුම්කරු සමඟ අඛණ්ඩව සාකච්ඡා කර ගැලපීම් සිදු කර ඇත. උපකරණ පුවරුව සහ දැනුම්දීම් ගැටළු සම්පූර්ණ කර ඇත. තොග/හොඳ ලැබීම් සටහන් (GRN) පිළිබඳ ගැටළු කිහිපයක් ඇති අතර ඒවා නිවැරදි කරන ලදී. |
| | 1.3 | පද්ධතිය ඇති කිරීම | වෙබ් අඩවියට ඇතුළත් කළ යුතු හඳුනාගත් සංරචක ඇතුළත් කිරීම | අවශ්‍ය විටදී නවතම පුවත් සහ අන්තර්ගත යාවත්කාලීන සිදු කිරීම. |
| | 1.4 | පුස්තකාල කළමනාකරණ පද්ධතිය | පද්ධතිය ඇති කිරීම | සේවාදායකයේ Ubuntu OS යාවත්කාලීන කරන ලද අතර "Koha" පුස්තකාල පද්ධතියේ නවතම අනුවාදය ද ස්ථාපනය කරන ලදී. තවද, පද්ධතිය ක්‍රියාත්මක වීමට නියමිත පරිදි ක්‍රියාත්මක වීමට නම් පොත්වල MARC ලිපින ඇතුළත් කළ යුතු බව සැපයුම්කරු සඳහන් කර ඇත. කෙසේ වෙතත්, පොත්වල MARC ලිපින ලබා ගැනීමට SLITHM හට පොත් සඳහා ජනරජ අයිතියක් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | තිබිය යුතුය. කෙසේ වෙතත්, MARK ලිපින පද්ධතිය ක්‍රියාත්මක කිරීම 2025 දී සලකා බලනු ඇත. |
| | 1.5 | ජාල යටිතල පහසුකම් සංවර්ධනය - මහනුවර | අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| | 1.6 | CCTV සවිකිරීම - මහනුවර | CCTV සවිකිරීම අවසන් කිරීම | |
| | 1.7 | CCTV සවිකිරීම - බණ්ඩාරවෙල | CCTV සවිකිරීම අවසන් කිරීම | |
| | 1.8 | CCTV සවිකිරීම - රත්නපුර | CCTV සවිකිරීම අවසන් කිරීම | |
| | 1.9 | ජාල යටිතල පහසුකම් සංවර්ධනය - කුරුණෑගල | අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම | නව ගොඩනැගිල්ලක් අත්පත් කරගත් පසු එසේ කිරීම මෙයට ඇතුළත් වේ. කෙසේ වෙතත්, අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් අවසන් නොවීම හේතුවෙන් එය පවතී. අත්පත් කර ගැනීමේ ක්රියාවලිය අවසන් වූ පසු ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | 1.10 | CCTV සවිකිරීම - කුරුණෑගල | CCTV සවිකිරීම අවසන් කිරීම | |
| | 1.11 | කොළඹ පාසල සඳහා CCTV දිගුව ඇති කිරීම. | CCTV සවිකිරීම අවසන් කිරීම | පවතින CCTV පද්ධතියට සේවා දිගුවක් මගින් මෙය ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, 7 වන මහල් පරිශ්‍රයේ පවතින ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කිරීමෙන් පසු මෙය ආරම්භ කෙරේ. |
| | 1.12 | Smart පන්ති කාමර ඇති කිරීම - කොළඹ පාසල | smart පන්ති කාමර නිම කිරීම | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| | 1.13 | ශ්‍රවණාගාර සංවර්ධනය | තොරතුරු තාක්ෂණ සම්බන්ධ කටයුතු අවසන් කිරීම | |
| | 1.14 | Smart පන්ති කාමර - ප්‍රාදේශීය පාසල් | smart පන්ති කාමර නිම කිරීම | |
| | 1.15 | මානව සම්පත් පද්ධතිය ස්ථාපනය කිරීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | තනි පද්ධතිය ස්ථාපනය කිරීම වෙනුවට ආයතන හතර සඳහාම ERP පද්ධතියක් හඳුන්වා දීමට කළමනාකරණ මණ්ඩලය (BOM) විසින් තීරණයක් ලබා දෙන ලදී. |
| | 1.16 | විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය ඇති කිරීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| | 1.17 | උසස් පුස්තකාල පද්ධතිය ඇති කිරීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | |
| | 1.18 | MS office 365 බලපත්‍ර ස්ථාපනය | සියලු පාසල් සඳහා | |

| | | | | |
|---|---|---|---|---|
| | 1.19 | ඒකාබද්ධ ගිණුම්කරණ පද්ධතිය ඇති කිරීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | |
| | 1.20 | සමුද්‍රා සහ රෙදි සෝදන අංශයන් සඳහා ගෙවීම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | |
| | 1.21 | දේපල කළමනාකරණ පද්ධතිය මිලදී ගැනීම | පද්ධතිය ස්ථාපිත කිරීම ඇති කිරීම | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |

## 5.4 අලෙවිකරණ අංශය

| අංකය | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂ අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම. | | අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම. | **සමස්ත ශක්‍යතා අධ්‍යයනය සමඟ 2025 දී සිදු කිරීමට සැලසුම් කර ඇත.** |
| 2. | වාර්ෂිකව පුවත්පත් අතිරේක සහ අනෙකුත් අලෙවිකරණ ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කිරීම. | | | |
| | 2.1 | පුවත්පත් දැන්වීම. | සියලුම පාඨමාලාවල සියලුම බඳවාගැනීම් මෙන්ම උපාධිය ආවරණය කිරීම.- පුවත්පත් 10 ක් පළ කිරීම | පුවත්පත් 8 ක් පළ කර ඇත. |
| | 2.2 | පුවත්පත් ලිපි පළ කිරීම. | පුවත්පත් ලිපි 06 ක් පළ කිරීම | පුවත්පත් ලිපි 6ක් ප්‍රකාශයට පත් කරන ලදී - උපාධි ප්‍රදානෝත්සවය 2024 |
| | 2.3 | SLITHM සඟරා ප්‍රකාශයට පත් කිරීම. | අඩු ඉල්ලුමක් සහිත පාඨමාලා සඳහා ඉල්ලුම වැඩි කිරීම. | ක්‍රියාත්මක වෙමින් පවතී - නව විද්‍යුත් පත්‍රිකා (4 ක්) 2024 නොවැම්බර් අවසානයේ නිර්මාණය කරන ලද අතර 2025 වසරේ බඳවා ගැනීම් සංඛ්‍යාව වැඩි කිරීමට අයදුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සහ සමාජ මාධ්‍ය වේදිකා අතර බෙදා හරින ලදී. |
| 3. | වෙළඳ නාම අලෙවිකරණය | | | |
| | 3.1 | උත්සව සහ ප්‍රදර්ශන පැවැත්වීම | උත්සව සහ ප්‍රදර්ශන 10 ක් පැවැත්වීම | වැඩමුළු 07ක් පවත්වා ඇති අතර ඒ සඳහා සහභාගී විය (Glocal Fair-2024 Gampha, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විගමණික සේවකයින්ගේ ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ වැඩමුළුව, පළාත්වල සංචාරක ව්‍යාපාරයේ ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් පවත්වන ලද වැඩමුළුව, ජාතික තරුණ සභාව විසින් සංවිධානය කරන ලද මහරගම අලුත් අවුරුදු උත්සවය, සංචාරක උදාව -2024, උපාධි ප්‍රදානෝත්සවය, “Smart Youth 2024” ජාතික තරුණ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සේවා සභාව විසින් සංවිධානය කරන ලද ගාල්ලේ ප්‍රදර්ශනය, ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරන ලද "Smart Youth 2024" ප්‍රදර්ශනය - කුලියාපිටිය). |
| | 3.2 | පුවත්පත් දැන්වීම් | පුවත්පත් 6 ක් ප්‍රකාශයට පත් කිරීම | ප්‍රකාශිත ලිපි 6 - උපාධි ප්‍රදානෝත්සවය 2024 |
| | 3.3 | රූපවාහිනී දැන්වීම් | කෙටි දැන්වීම් ගණන 2 ක් විකාශනය කිරීම (අවශ්‍යතාවය අනුව/ අධ්‍යයන ඉල්ලීම් මත පදනම්ව) | දැන්වීම් 03 ක් ප්‍රකාශයට පත් කරන ලදී |
| | 3.4 | රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් | වසරකට රූපවාහිනී වැඩසටහන් 5 කට සහභාගී වීම | වැඩසටහන් 03 ක් පැවැත්වීම |
| | 3.5 | පාඨමාලා සඳහා දත්ත සමුදාය සංවර්ධනය කිරීම | පාඨමාලා තොරතුරු පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත බෙදා හැරීම | සිදුවෙමින් පවතී |
| | 3.6 | පළාත් පාසල්වල අලෙවිකරණ ව්‍යාපාර පැවැත්වීම | පාසල් 5 ක අලෙවිකරණ ව්‍යාපාර පැවැත්වීම | කුරුණෑගල, ගාල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, සහ යාපනය යන පාසල් මූලික කරගෙන පවත්වන ලදී. |
| | 3.7 | සමාජ මාධ්‍ය අලෙවිකරණය | SLITHM සහ එහි වැඩසටහන්/සේවා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ගෙන යාම | සිදුවෙමින් පවතී |
| | 3.8 | සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තකරණය, Google දැන්වීම් | වෙබ් අවකාශයේ SLITHM හි ක්‍රියාකාරී නරඹන්නන් වැඩි කිරීම | සිදුවෙමින් පවතී |
| | 3.9 | <u>ජාලකරණය සහ හවුල්කාරිත්වය:</u> පාසල්වල සංචාරක සමාජ පිහිටුවීම | පළාත් 3 ක සංචාරක සමාජ පිහිටුවීම | සංචාරක සමාජ පිහිටුවීම පිළිබඳ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. |

**5.5 නඩත්තු අංශය**

| අංකය | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | **2024.12.31 දිනට ප්‍රගතිය** |
|---|---|---|---|
| | **යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම** | | |
| 1 | කොළඹ 8 වන මහලේ පන්ති කාමරය ප්‍රතිසංස්කරණය කිරීම | 2024 දෙසැම්බර් 31 දිනට පෙර වැඩ නිම කිරීම | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 2 | 3 වන සහ 5 වන මහලේ පන්ති කාමර තත්වය වැඩිදියුණු කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 3 | ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 4 | ශ්‍රවණාගාරයේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 5 | පහළ බිම් මහල සැලසුම් කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |

| | | | |
|---|---|---|---|
| 6 | පේස්ට්‍රි සහ බේකරි මුළුතැන්ගෙයි ටයිල් වැඩ සිදුකිරීම - කොළඹ. | | සිදුවෙමින් පවතී. |
| 7 | කසළ කාමර ඉදිකිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 8 | කාර්යාල ප්‍රදේශවල AC ප්‍රතිස්ථාපන සවිකිරීම - කොළඹ | | සම්පූර්ණ කර ඇත. |
| 9 | විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම - කොළඹ | | සිදුවෙමින් පවතී - උත්පාදක යන්ත්‍රය අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය පටන් ගෙන තිබේ. |
| 10 | නව පිටාර පද්ධතිය සැපයීම සහ සවි කිරීම (දෙවන මහල) - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 11 | මූල්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 12 | ගොඩනැගිල්ලේ තීන්ත ආලේපනය කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 13 | සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කිරීම - කොළඹ | | ක්‍රියාත්මක වෙමින් පවතී- ගොඩනැගිල්ලේ සුළු නඩත්තු කටයුතු බොහොමයක් මෙම ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කරන ලදී. |
| 14 | රෙදි සෝදන උපකරණ අළුත්වැඩියා කිරීම - කොළඹ | | ඉල්ලීම මත පදනම්ව සිදු කිරීම. |
| 15 | සමුද්‍රා හෝටල් කාමර අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 16 | සමුද්‍රා ලිනන් කාමරය සහ කුඩා වෙළඳසැල ප්‍රතිසංස්කරණය කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 17 | 6 වන මහලේ නේවාසික කළමනාකරුගේ නිල නිවාසය සහ කාමර දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම (සංචාරක පොලිසිය ඉවත් කිරීමෙන් පසු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 18 | දෙවන මහලේ පුහුණු අවන්හලේ අභ්‍යන්තර සැලසුම් කිරීම - කොළඹ | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 19 | දෙවන මහලේ මුළුතැන් ගෙය ප්‍රතිසංස්කරණය කිරීම (සෝදන ප්‍රදේශ) - කොළඹ | | සම්පූර්ණ කර ඇත. |
| 20 | රෙදි සෝදන අංශයේ කවුන්ටරය අලුත්වැඩියා කිරීම | | ආරම්භ කර නැත - සංචාරක පොලිසිය ඉවත් නොකිරීම හේතුවෙන් 2025 අයවැයට ඉදිරිපත් කරන ලදී. |
| 21 | ගොඩනැගිල්ල සඳහා අකුණු සන්නායක සවි කිරීම (බණ්ඩාරවෙල) | | ආරම්භ කර නැත - 2025 දී නැවත සලකා බැලීම |
| 22 | මීටර් 1.5 ක ගැඹුරු ළිඳක කැපීම (බණ්ඩාරවෙල) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 23 | Mockup කාමර සඳහා LED TV දෙකක් (32') සවි කිරීම (බණ්ඩාරවෙල) | | සම්පූර්ණ කර ඇත. |
| 24 | ආපනශාලාවට AC දෙකක් සවි කිරීම (බණ්ඩාරවෙල) | | සම්පූර්ණ කර ඇත. |
| 25 | කාර්ය මණ්ඩලය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය සවි කිරීම (යාපනය) | | සම්පූර්ණ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 26 | පහසුකම් / උපකරණ වැඩි දියුණු කිරීම (යාපනය) | | මෙම කාර්යය මේ මොහොතේ අවශ්‍ය නොවන බව විදුහල්පති විසින් තහවුරු කර ඇත. |
| 27 | ගොඩනැගිල්ලේ භාවිතා කරනු ලබන ප්‍රදේශයේ තීන්ත ආලේපනය කිරීම (යාපනය). | | ආරම්භ කරන ලදී - ප්‍රධානය කරන ලදී |
| 28 | තාවකාලික ආහාර කාමරයක් ඉදිකිරීම - (අනුරාධපුර) | | ආරම්භ කරන ලදී - BOQ සම්පූර්ණ කරන ඇත. 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 29 | ගොඩනැගිල්ලේ බාහිර ප්‍රදේශයේ තීන්ත අලේප කිරීම - (අනුරාධපුර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 30 | නව පාසල ප්‍රතිසංස්කරණය-මාවතගම-(කුරුණෑගල) | | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු ක්‍රියාවට නැංවිය නොහැක - සමීක්ෂණ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |
| 31 | සූර්ය පද්ධති ව්‍යාපෘතිය සිදු කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 32 | කාර්යාල කොටස් වෙන් කිරීම සිදු කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 33 | අමුත්තන්ගේ කාමර අලුත්වැඩියා කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 34 | වාහන නැවැත්වීමේ ප්‍රදේශයේ වහලය සවි කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 35 | පිටාර පද්ධති ප්‍රතිසංස්කරණය (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 36 | කසළ කාමර ඉදිකිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 37 | ගොඩනැගිල්ලේ තීන්ත ආලේපනය කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 38 | පේස්ට්‍රි මුළුතැන්ගෙයි ඉදිකිරීම් අලුත්වැඩියාව සිදු කිරීම (මහනුවර) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 39 | නව දුරකථන පද්ධතිය (කොග්ගල) | | සම්පූර්ණ කර ඇත. |
| 40 | කාර්යාල සඳහා නව AC සහ විදුලි පංකා සවි කිරීම (කොග්ගල) | | සම්පූර්ණ කර ඇත. |
| 41 | විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම- (කොග්ගල) | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 42 | Mock Up කාමර අලුත්වැඩියාව සිදු කිරීම (රත්නපුර). | | ආරම්භ කරන ලදී. මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) යටතේ පවතී. |
| 43 | ආපනශාලාවේ දැනට පවතින පුටු සහ මේස බාහිර බිත්ති පින්තාරු කිරීම සහ ඔප දැමීම (රත්නපුර). | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 44 | කාර්යාලය සඳහා නව AC සවි කිරීම (මඩකලපුව). | | 2025 වර්ෂයට රැගෙන යන ලදී. |
| 45 | **2023 අයවැයෙන් ඉදිරියට ගෙන ගිය වැඩ** | | |
| 45.1 | 2 වන මහලේ වයින් රසායනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.2 | කාර්යාල ඉදිකිරීම් කටයුතු - පර්යේෂණ ඒකකය සහ බාහිර කථිකාචාර්යවරුන් සඳහා | | සිදුවෙමින් පවතී. |
| 45.3 | පහළ බිම් මහලේ අභ්‍යන්තර පින්තාරු කිරීමේ කටයුතු සිදු කිරීම | | සම්පූර්ණ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 45.4 | අත් සේදීමේ ප්‍රදේශය ඉදිකිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.5 | සමුද්‍රා හෝටලයේ බාර් ප්‍රදේශයේ අභ්‍යන්තර කටයුතු අලුත්වැඩියා කිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.6 | ආලින්ද ප්‍රදේශය (Lobby area) සඳහා නව සිවිලිමක් සැපයීම සහ සවි කිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.7 | කාපට් දැමීම සහ තිරරෙදි (Bamboo Blinds) සවි කිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.8 | ආයතනයේ ප්‍රධාන නාම පුවරුව සහ රෙදි සෝදන අංශයේ ඉදිරිපස නාම පුවරුව සවි කිරීම | | සම්පූර්ණ කර ඇත. |
| 45.9 | සිවිලිම් විදුලි පංකා 25 ක් සැපයීම සහ බෙදා හැරීම | | සම්පූර්ණ කර ඇත. |

**5.6 මූල්‍ය අංශය**

| අංකය | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | මූල්‍ය ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම | | | |
| | 1.1 | මූල්‍ය අත්පොත (FM) | PED අනුමැතිය ලබා ගැනීම සහ මුද්‍රණය කිරීම. | අත්පොත සකස් කර ඇත. |
| | 1.2 | මූල්‍ය ප්‍රකාශන - 2023 | 2024 පෙබරවාරි 28 ට පෙර රජයේ විගණක වෙත ඉදිරිපත් කිරීම. | සම්පූර්ණ කර ඇත. |
| | 1.3 | වාර්ෂික අයවැය පිළියෙළ කිරීම | 2024 නොවැම්බර් මණ්ඩල රැස්වීම සඳහා සම්පූර්ණ කිරීම සහ ඉදිරිපත් කිරීම. | සම්පූර්ණ කර ඇත. |
| | 1.4 | මාසික මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම | ඊළඟ මාසයේ 15 වැනි දින වන විට සම්පූර්ණ කර ඊළඟ මාසයේ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීම. | මාස 6 ක මූල්‍ය වාර්තා SLITHM හි BOM වෙත ඉදිරිපත් කරන ලදී. |
| | 1.5 | සමීක්ෂණ මණ්ඩලය/වත්කම් සත්‍යාපනය | 2024 මැයි 31 දිනට පෙර වැඩ නිම කිරීම | සිදුවෙමින් පවතී. |

**5.7 ලොන්ඩ්‍රි අංශය සහ සමුද්‍රා පුහුණු හෝටලය**

| අංකය | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| 5.1 | සමුද්‍රා හෝටලය ඵලදායී ලෙස භාවිතා කිරීම (හෝටල් කාමර විකිණීම, බාහිර පාර්ශවයන්ගේ උත්සව, දිවා | 1. අවම වශයෙන් මසකට අමුත්තන් සඳහා කාමර රාත්‍රී 100 ක් විකිණීම | මිලියන 22.9 ක ආදායමක් උපයා ඇත (2024.11.30 දිනට ) (ආපනශාලා ආදායම - 12.07 Mn, 48 ශ්‍රවණාගාර කාර්යයන් - 2.59 Mn, 19 |

| | | | |
|---|---|---|---|
| | ආහාර පැකට් විකිණීම, සහ ආපනශාලා සහ ශ්‍රවණාගාරය ආදිය ලබාදීම) | 2. මසකට සම්පූර්ණ උත්සව සහ අනෙකුත් රැස්වීම් ආදිය (ශ්‍රවණාගාරය - 6, මණ්ඩල කාමරය - 6)<br>3. දිවා ආහාර අලෙවි කිරීම, උත්සව සහ අනෙකුත් වැඩමුළු සඳහා අවන්හල සහ ශ්‍රවණාගාරය ආදිය මුදලට ලබාදීම | මණ්ඩල කාමර කාර්යයන් - .33 Mn, 23 බාර් කාර්යයන් - .55 Mn, 735 කාමර රාත්‍රී - 6.21 Mn) |
| 5.2 | කටයුතු වාණිජමය ලෙස සිදු කිරීම - කොළඹ | අවම වශයෙන් මසකට මිලියන 2 ක ආදායම් උත්පාදනය කොළඹ. | ආදායම රු.මි. 9.31, වියදම රු.මි. 8.22 |

**5.8 පුස්තකාල අංශය**

| අංකය | | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | ප්‍රකාශන | | | |
| | 1.1 | SLITHM සඟරා ප්‍රකාශයට පත් කිරීම - වසරකට 2 ක බැගින් | SLITHM TALK විද්‍යුත් සඟරා 2 ක් ප්‍රකාශයට පත් කිරීම. | SLITHM Talk සඟරා නිර්මාණයේ 20 වන වෙළුම නිර්මාණය කරමින් සිටී. |
| | 1.2 | SLITHM සඟරා මුද්‍රණය කිරීම | වාර්ෂික උපාධි උත්සවය ඉලක්ක කර ගනිමින් වසරකට එක් සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම. | සම්පූර්ණ කරන ලදී. (එක් සඟරාවක් 2024 දී උපාධි උත්සවය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලදී). |
| 2. | පුස්තකාල පොත්පත් එකතු කිරීමේ සංවර්ධනය | | | |
| | 2.1 | භෞතික පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම | යෝජිත උපාධි වැඩසටහන සඳහා අවශ්‍ය කියවීම් පොත්පත් හා උපකරණ මිලදී ගැනීම | 2025 වර්ෂයේ දී සිදු කරනු ලැබේ. |
| | 2.2 | විද්‍යුත් පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම | විද්‍යුත් එකතුව වැඩි කිරීම | ප්‍රධාන විෂයයන් ආවරණය කරමින් පොත් 400 (e-versions) කට වැඩි ප්‍රමාණයක් පුස්තකාල පද්ධතියට ඇතුලත් කර ඇත. |
| | 2.3 | පුස්තකාලය සමග සම්බන්ධ වීමට දුරස්ථ පිවිසුම් පහසුකම සංවර්ධනය කිරීම | දුරස්ථ පිවිසුම් පහසුකම සම්පූර්ණයෙන්ම සක්‍රිය කිරීම | සිදුවෙමින් පවතී. තොරතුරු තාක්ෂණ අංශය හරහා යම් යම් සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිතයි. |

## 5.9 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

| අංකය | | ප්‍රධාන සහ අනු ක්‍රියාකාරකම් | ඉලක්ක/ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | අධීක්ෂණය සහ ඇගයීම | | | |
| | 1.1 | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම - 2025 | 2024 දෙසැම්බර් මැද වන විට 2025 ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කිරීම | 2025 ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කර ඇත. |
| | 1.2 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 12 ක් පැවැත්වීම | රැස්වීම් 10 ක් සහ විශේෂ රැස්වීම් 4 ක් පවත්වන ලදී. |
| | 1.3 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 4 ක් පැවැත්වීම | රැස්වීම් 3 ක් පවත්වන ලදී. |
| | 1.4 | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 4 ක් පැවැත්වීම | රැස්වීම් 2 ක් පවත්වන ලදී. |
| | 1.5 | විභාග කමිටු රැස්වීම් පැවැත්වීම | රැස්වීම් 4 ක් පැවැත්වීම | රැස්වීම් 3 ක් පවත්වන ලදී. |
| | 1.6 | ප්‍රගතිය අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම | මාසික රැස්වීම් 12 ක් පැවැත්වීම | රැස්වීම් 7 ක් පවත්වන ලදී. |
| | 1.7 | වාර්ෂික වාර්තාව සකස් කිරීම | මුද්‍රිත වාර්ෂික වාර්තාව මැයි 30 වැනිදාට පෙර ඉදිරිපත් කිරීම | කෙටුම්පත් වාර්තාව අවසන් කර ඇත. |
| | 1.8 | ප්‍රගති වාර්තා සැකසීම (මාසික සහ කාර්තුමය වශයෙන්) | අමාත්‍යතුමා, අමාත්‍යාංශය, අධ්‍යක්ෂක මණ්ඩලය සහ ඉහළ කළමනාකාරීත්වය වෙත අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීම | අදාළ පාර්ශවයන් ගේ ඉල්ලීම් මත පදනම්ව සකස් කරයි. |

**අපේක්ෂිත ප්‍රතිඵල**

- ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සඳහා සත්කාරක ක්ෂේත්‍රයේ පුහුණුව සහ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම.
- සුවතා සංචාරක ව්‍යාපාරය, උරුම සංචාරක ව්‍යාපාරය සහ පාරිසරික සංචාරක ව්‍යාපාරය වැනි සංචාරක ක්ෂේත්‍රයේ නැගී එන ක්ෂේත්‍රවල පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර පුහුණුව සඳහා ප්‍රමුඛතම ආයතනය ලෙස අප ආයතනය පවත්වා ගැනීම.

**05.** මානව සම්පත් ව්‍යුහය (සේවක සංඛ්‍යාව)

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 222 ක් වන අතර එය 2018 පෙබරවාරි 22 වන දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. එය පහත වගුව මගින් පෙන්නුම් කරනු ලබයි.

<u>SLITHM හි තත්‍ය සහ අනුමත සේවක සංඛ්‍යාව</u>

| අංකය | තනතුර | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී | HM2-2 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) | HM1-3 | 01 | 01 | - |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අනධ්‍යයන) | HM1-3 | 01 | 01 | - |
| 04 | විදුහල්පති | HM1-1 | 07 | 07 | - |
| 05 | ලේඛකාධිකාරී | HM1-1 | 01 | 01 | - |
| 06 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM1-1 | 01 | 01 | - |
| 07 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | AR2 | 21 | 12 | 09 |
| 08 | සහකාර කථිකාචාර්ය/ කථිකාචාර්ය | AR1 | 60 | 47 | 13 |
| 09 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා ඉංජිනේරු) | MM1-2 | 01 | 01 | - |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (පුස්තකාලයාධිපති) | MM1-2 | 01 | 01 | - |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ(මානව සම්පත් හා පාලන) | MM1-2 | 01 | 01 | - |
| 12 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | MM1-2 | 01 | 01 | - |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | MM1-2 | 01 | 01 | - |
| 14 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | MM1-2 | 01 | 01 | - |
| 15 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර ලේඛකාධිකාරී | MM1-2 | 01 | - | 01 |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (අලෙවි) | MM1-2 | 01 | 01 | - |
| 17 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | MM1-2 | 01 | 01 | - |
| 18 | විධායක සහකාර | JM1-2 | 04 | 02 | - |
| 19 | අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික සහකාර | JM1-2 | 01 | 01 | - |
| 20 | මූල්‍ය නිලධාරී | JM1-2 | 01 | 01 | - |
| 21 | වැඩසටහන් නිලධාරී | JM1-2 | 01 | 01 | - |
| 22 | පරිපාලන නිලධාරී | JM1-2 | 01 | 01 | - |
| 23 | මිලදීගැනීමේ නිලධාරී | JM1-2 | 01 | 01 | - |
| 24 | තාක්ෂණ නිලධාරී | JM1-2 | 01 | 01 | - |
| 25 | වැඩසටහන් නිලධාරී (විභාග) | JM1-2 | 01 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | ලොන්ඩ්‍රි මෙහෙයුම් නිලධාරි | JM1-2 | 01 | - | 01 |
| 27 | පේස්ට්‍රි සහ බේකරි නිලධාරී | JM1-2 | 01 | - | 01 |
| 28 | පාලන හා මූල්‍ය නිලධාරි | JM1-2 | 03 | 03 | - |
| 29 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA2-2 | 01 | 01 | - |
| 30 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA1-2 | 38 | 36 | 02 |
| 31 | රියදුරු | PL3 | 06 | 05 | 01 |
| 32 | තාක්‍ෂණ ශිල්පීන් | PL3 | 06 | 06 | - |
| 33 | කොමිස් (පේස්ට්‍රි සහ බේකරි) (Comics – Pastry & Bakery) | PL2 | 02 | - | 02 |
| 34 | අත්කම්කරු (Handyman) | PL2 | 01 | 01 | - |
| 35 | සුපරීක්ෂක - ලොන්ඩ්‍රි | PL2 | 01 | - | 01 |
| 36 | ගබඩා සහයක | PL 2 | 01 | 01 | - |
| 37 | කාර්යාල සහයක | PL1 | 14 | 13 | 01 |
| 38 | බේකරි සහයක | PL1 | 01 | 01 | - |
| 39 | ලොන්ඩ්‍රි ක්‍රියාකරු | PL1 | 06 | 04 | 02 |
| **එකතුව** | | | **195** | **161** | **32** |

<u>සමුද්‍රා හෝටලයේ තත්‍ය සහ අනුමත සේවක සංඛ්‍යාව</u>

| අංකය | තනතුර | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | කළමනාකරු | MM 1-2 | 01 | 01 | - |
| 02 | ආහාර හා පාන නිලධාරී | JM 1-2 | 01 | - | 01 |
| 03 | කාමර අංශ නිලධාරී | JM 1-2 | 01 | - | 01 |
| 04 | පිළිගැනීමේ නිලධාරී/දුරකථන ක්‍රියාකරු | MA1-2 | 03 | 03 | - |
| 05 | ජ්‍යෙෂ්ඨ සූපවේදී | PL 3 | 02 | 01 | 01 |
| 06 | සූපවේදී/සහකාර සූපවේදී | PL 2 | 06 | 02 | 04 |
| 07 | Captain | PL 2 | 01 | - | 01 |
| 08 | බාර්මන් | PL2 | 02 | 01 | 01 |
| 09 | ගෘහ පාලන සුපරීක්ෂක | PL 2 | 01 | 01 | - |
| 10 | ස්ටුවර්ඩ් | PL1 | 04 | 03 | 01 |
| 11 | ආහාර පාන සහායක | PL 1 | 01 | 01 | - |
| 12 | බෙල් ඇටෙන්ඩන්ට් | PL 1 | 01 | 01 | - |
| 13 | කාමර සහායක | PL 1 | 01 | - | 01 |
| 14 | මුළුතැන්ගෙයි සහායක | PL 1 | 01 | 01 | - |
| 15 | පොදු ප්‍රදේශ උපස්ථායක | PL 1 | 01 | 01 | - |
| | **එකතුව** | | **27** | **16** | **11** |

**06.** මූල්‍ය ප්‍රකාශන

2024 වර්ෂයේ අනුමත වාර්ෂික අයවැය සහ 2024.11.30 දිනට තත්‍ය වියදම් පහත වගුව මගින් පෙන්නුම් කර ඇත.

| කේතය | ආදායම් හා වියදම් අයිතමය | අයවැය 2024 (රු.) | 2024.11.30 දිනට තත්‍ය ආදායම් හා වියදම් (රු.) |
|---|---|---|---|
| 400 | පාසල් ආදායම | 178,843,390.00 | 153,999,871.00 |
| 410 | හෝටල් ආදායම | 20,462,938.00 | 22,903,150.00 |
| 420 | ලොන්ඩ්‍රි ආදායම | 10,975,698.00 | 9,091,162.00 |
| 430 | ව්‍යවස්ථාපිත ආදායම | 658,734,186.00 | 436,096,711.00 |
| 440 | අනෙකුත් අදායම් | 67,954,264.00 | 33,390,089.00 |
| | ***මුළු ආදායම*** | ***936,970,476.00*** | ***650,746,983.00*** |
| 500 | වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 342,915,900.00 | 259,375,411.00 |
| 530 | සේවක නොවන අය සඳහා ගාස්තු සහ ගෙවීම් | 58,705,900.00 | 42,967,758.00 |
| 550 | සාමාන්‍ය පරිපාලන සහ ආයතනික වියදම් | 183,543,796.00 | 131,356,311.00 |
| 580 | නඩත්තු වියදම් | 48,601,176.00 | 27,029,620.00 |
| 600 | භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය | 108,313,171.00 | 86,920,803.00 |
| 700 | මූල්‍ය පිරිවැය | 495,001.00 | 476,738.00 |
| 750 | අනෙකුත් වියදම් | 2,720,000.00 | 75,684.00 |
| 770 | ආයතනයෙන් ආදායමෙන් භාණ්ඩාගාරය වෙත ගෙවීම | 100,000,000.00 | 100,000,000.00 |
| | ***මුළු පුනරාවර්තන වියදම්*** | ***845,294,945.00*** | ***646,539,127.00*** |
| | මුළු ආදායම | *936,970,476.00* | *650,746,983.00* |
| (අඩු කළා) | මෙහෙයුම් පිරිවැය | *(845,294,945.00)* | *(646,539,127.00)* |
| (අඩු කළා) | ප්‍රාග්ධන වියදම් | *(136,649,700.00)* | *(42,961,257.00)* |
| **අයවැය අතිරික්තය / හිඟය** | | **(44,974,169.00)** | **(35,682,600.00)** |

පහත වගුව මගින් 2024 වර්ෂයේ මූල්‍ය සාරාංශය පෙන්නුම් කරනු ලැබේ.

| අයිතම | අයවැය වෙන්කිරීම (රු.) | තත්‍ය වියදම් (රු.) (30.11.2024) |
|---|---|---|
| ආදායම | 936,970,476.00 | 650,746,983.00 |
| පුනරාවර්තන වියදම් | 845,294,945.00 | 646,539,127.00 |
| ප්‍රාග්ධන වියදම් | 136,649,700.00 | 42,961,257.00 |
| **අයවැය අතිරික්තය / හිඟය** | **(44,974,169.00)** | **(38,753,401.00)** |

| සහතික කළේ | | නිර්දේශ කළේ | අනුමත කළේ |
|---|---|---|---|
| ෂමිලා ප්‍රනාන්දු | සී. අද්දරවත්ත | කනිෂ්ක ජයතුංග | ජීවන්ති සේනානායක |
| අධ්‍යක්ෂ - මූල්‍ය | නියෝජ්‍ය අ. ජ. (අනධ්‍යයන) | නියෝජ්‍ය අ. ජ. (අධ්‍යයන) | අධ්‍යක්ෂ ජනරාල් |


Sri Lanka
YOU'LL COME BACK FOR MORE
ශ්‍රී ලංකා සංචාරක
ප්‍රවර්ධන කාර්යංශය

## අන්තර්ගතය


1. අන්තර්ගතය…………………………………………………………………………………… 229
2. හැඳින්වීම…………………………………………………………………………………….. 229
3. අරමුණු………………………………………………………………………………………...229
දැක්ම…………………………………………………………………………………………229
4. මෙහෙවර……………………………………………………………………………………..229
5. 2024-12-31 දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ..........................230
   - අලෙවිකරණය………………………………………………………………….....230
   - නියෝජිතයන්, බ්ලොග්කරු සහ මාධ්‍ය හුරුපුරුදු කිරීමේ චාරිකා (FAM චාරිකා)…….230
   - සංචාරක, සංචාරක ප්‍රදර්ශන, මාර්ග සංදර්ශන, මාධ්‍ය සම්මන්ත්‍රණ සහ ජාලකරණය සිදුවීම්……………………………….............................................................… 231
6. Wanderlust Reader සංචාරක සම්මාන 2024...........................................................................233
7. මෙහෙවර සහාය ක්‍රියාකාරකම් ……………………………....……………………………..234
8. මහජන සම්බන්ධතා…………………………...……………………………………………….235
9. මාධ්‍යවේදීන් සහ බ්ලොග් වැඩසටහන් (VJP&VBP).........................................................................237
10. VJP&VBP යටතේ හසුරුවන ලද උපයාගත් මාධ්‍ය ව්‍යාපෘති සහ ජයග්‍රහණ…..........................................….. 237
11. චිත්‍රපට සංචාරක ප්‍රවර්ධනයන්………………………………....…………………………… .239
12. සංචාරක තොරතුරු කවුන්ටර (TICs).........................................................................................240
   - 1912 සංචාරක ක්ෂණික ඇමතුම් අංකය කළමනාකරණය සහ නරඹන්නන්ගේ සහාය………..  240
   - කඖස් මගීන් පිළිගැනීම………………………………………………………..………………  240
   - විශේෂ සිදුවීම් සංවිධානය කිරීම…………………………………………………………….. 241
13. දේශීය මාධ්‍ය ඒකකය( ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය)........................................ ............ 242
14. ප්‍රචාරණය………………………………………………………… …………………….. 244
15. 2024  ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හි ප්‍රචාරණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්… 244
16. ශ්‍රී ලංකා සංචාරක ජාත්‍යන්තර අනුමත කිරීමේ පිටුව (යාවත්කාලීන කරන ලදී - 2024)......................  247
17. නව නිෂ්පාදන සංවර්ධනය………………...……………………………………..…………….. 248
18. බෞද්ධ මංපෙත් ප්‍රවර්ධනය…………………………………………………………………… 248
19. දකුණු MICE EXPO 2024................................................................................................................. 250
20. ගමනාන්ත විවාහ මංගල්‍යය ප්‍රවර්ධනය :……………………………………...……………….. 250
21. රාමායණ මංපෙත ප්‍රවර්ධනය ……………………………....……………………………… . 251
22. අනුමත වාර්ෂික අයවැය 2024............................................................................................................. . 252
23. ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග………………………..............……………………  253

## 04

### ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

➢ **හැඳින්වීම**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2005අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ පිහිටුවා ඇත. කාර්යාංශය දැනට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් සංචාරක සහ චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ දී සහ එම අලෙවිකරණ කාර්යයන් සිදු කිරීමේ දී කාර්යාංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රධාන වශයෙන් අලෙවිකරණය, ප්‍රචාරණය, මහජන සබඳතා, විශේෂ අවස්ථා සහ නව නිෂ්පාදන සංවර්ධනය යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් සිදු කරයි.

➢ **අරමුණු**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා ඉලක්කගත විදේශ විනිමය ඉපැයීම් සාක්ෂාත් කර ගැනීමට සහාය වන ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාව සන්නාමයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට (SLTPB) මෙම අරමුණු අදාළ වේ.

1. 2025 වර්ෂය වන විට සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන5ක විදේශ විනිමය ඉපැයීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම.
2. දැනට සිදු කරනු ලබන දෛනික සංචාරක අභ්‍යන්තරික වියදම් කිරීම් ඇමෙරිකානු ඩොලර්181 ක් වූ තලයේ සිට ඇමෙරිකානු ඩොලර් 185-225 ක් දක්වා වර්ධනය කිරීම.

➢ **දැක්ම**

"ස්මරණීය කළ හැකි, අනන්‍යවූ සහ විවිධාකාර අත්දැකීම් එක් කරන ලොව හොඳම දූපත් ගමනාන්තය ලෙස පිළිගැනීමට."

➢ **මෙහෙවර**

"ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය හුවා දක්වන අතිවිශේෂිත අත්දැකීම් ලබා දෙන, සමාජමය ඒකියබව හා පාරිසරික අගයන සහ රටට හා ප්‍රජාවට ආර්ථික ප්‍රතිලාභ අත් කර දෙන ඉහළ වටිනාකමැති ගමනාන්තය බවට පත් වීම".

- 2024.12.31 දින දක්වා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර

අලෙවිකරණය

- **සංචාරක නියෝජිතයින් සහ මාධ්‍ය ආයතන සඳහා හුරු කිරීමේ චාරිකා (FAM සංචාර)**

දිවයිනේ අසමසම ආකර්ශනය ප්‍රදර්ශනය කරමින් නියෝජිතායතන, බ්ලොග්කරුවන් සහ මාධ්‍ය හුරුකරවීමේ සංචාර කිහිපයක්ම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය තම උපක්‍රමික පියවරක් ලෙස විසින් සාර්ථකව පවත්වා ඇත. එමෙන්ම මෙම ක්‍රියාමාර්ග තුළින් සාර්ථක සංචාරක ගමනාන්තයක් ලෙස විවිධත්වයෙන් පිරි ප්‍රේක්ෂක පිරිසක් දිනා ගනිමින් ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර දැනුවත්වීම සහ ඇගයීමහට ලක් කරමින් සැළකිය යුතු ලෙස වර්ධනය කිරීමට හැකි වී ඇත.

ප්‍රධාන මාධ්‍ය ව්‍යාපෘතිය පහත පරිදි වේ,

- ශ්‍රී ලාකික කතුවරු පිළිබද අනේකවිධ සංස්කෘතික හා ස්වභාවික අවස්ථා හුවා දක්වමින්, විශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් සිදු කළ - එක්සත් රාජධානිය (contributing Editor from UK)
- ස්වභාවික ඉතිහාස රචකයා (Natural History Writer) දිවයිනේ අසමසම ජෛව විවිධත්වය පිළිබඳ අවධානය හසු කරමින් සිදු කළ ආවරණය ලබාගැනීම-ජූනි මස එක්සත් රාජධානිය
- ශ්‍රී ලංකාවට අනන්‍ය වූ වන අපූර්ව සජීවි අත්දැකීම් පිළිබඳ අවධානය හසු කරමින්-සෙලිබ්‍රිටි වයිල් ලියිෆ් රයිටර් (Celebrity Wildlife Writer), අගෝස්තු මස එක්සත් රාජධානිය
- දිවයිනට උරුම ආහාර වර්ග සහ ආහාර අධ්‍යයන විශේෂතා පිළිබඳ අවධානය යොමු කරමින් සිදු කළ මාධ්‍ය fam, ආහාර & සංචාරක සඟරාව/සැප්තැම්බර් මස එක්සත් රාජධානිය.
- මාධ්‍ය fam සංචාරය- /අගෝස්තු මස (05 pax) ඔස්ට්‍රියාව-මීඩියා fam සංචාරය (04pax) ජූනි මස ප්‍රංශය.
- පුද්ගලික තොරතුරුඅඩංගු වෙබ්අඩවිකරුවන් (02 pax) / 2024 ජනවාරි12 – 24 දක්වා පෝලන්තය.
- පුද්ගලික තොරතුරු අඩංගු වෙබ්අඩවිකරුවන් (01) pax/ 2024 මාර්තු 1–14 දක්වා පෝලන්තය.
- VIP ඉන්ස්ටර්ග්‍රෑම් & පුද්ගලික තොරතුරු අඩංගු වෙබ්අඩවිකරුවන් (01 pax) / -මාර්තු මස පෝලන්තය.
- සෙලිබ්‍රිඩි (02 pax) /මැයි මස පෝලන්තය.
- සෙලිබ්‍රිටි (02 pax) / අගෝස්තු මස පෝලන්තය.
- FAM වෙළඳ සල්පිල - 2024 නොවැ. 25 සිට දෙසැ. 01 දක්වා රුසියාව.
- මාධ්‍ය fam (01 pax), ජූලි 05 සිට11දක්වා තුර්කිය.
- TRT කෙටි වාර්තාමය නාලිකාව සඳහා FAM මාධ්‍ය, 2024 ජූලි 30 - අගෝස්තු 07 දක්වා තුර්කිය.
- බුඩිස්ට් ෆෑම් (Buddhist Fam)- May (10 pax) /ඉන්දියාව.
- JTBC TV කොරියානු මාධ්‍ය, කොරියාව.

### ➢ නිමැවුම/ප්‍රතිඵලය

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ගමනාන්ත සහ සමස්ත උපාය මාර්ගය පිළිබඳ ව දැනුවත් කිරීම. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන මෙන්ම ආකර්ෂණීය සංචාරක නිෂ්පාදන ප්‍රදර්ශනය/ප්‍රවර්ධනය කිරීම. සංචාරක වෙළඳ ක්ෂේත්‍රයේ අදාළ රටවල සහ ශ්‍රී ලංකාවේ චාරිකා මෙහෙයවන්නන් සහ සංචාරක නියෝජිතයන්ගේ ලැයිස්තු හුවමාරු කර ගැනීම. ජාත්‍යන්තර මාධ්‍ය හරහා මාධ්‍ය ආවරණය ලබාගැනීම. විභව සංචාරකයින් අතර ගමනාන්තය පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම. නිරන්තරයෙන් පැමිණෙන සංචාරකයින් සහ විභව සංචාරකයින් අතර ගමනාන්තය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම.

### ➢ **සංචාරක සහ චාරිකා ප්‍රදර්ශන සහ මාර්ග සංදර්ශන / මාධ්‍ය හමුව**

සංචාරයන් සහ සංචාරක වෙලදපලවල්, වීදි සංදර්ශන, මාධ්‍ය සාකච්ඡා සහ අන්තර් සබඳතා උත්සව වැනි විවිධ වූ අවස්ථා වල 2024 වසර පුරාම ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සක්‍රියව නිරත විය. මෙකී උත්සාහයන් මගින් විශ්ව සංචාරක ප්‍රජාව තුල සබඳතා වඩවාලීමටත් ආකර්ශනීය සුළු ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම අපේක්ෂාව විය. ප්‍රධාන පෙලේ සංචාරක වෙලදපල් වලට සහභාගී වෙමින් සහ ප්‍රධාන වෙළඳපලවල්වල වීදි සංදර්ශන පැවැත්විම මගින් ඉතා චමත්කාර මුහුදු වෙරලවල් සහ දියුණු සංස්කෘතික උරුමය දක්වා වූ දිවයිනේ අපුරුතම අවස්ථා කාර්යාංශය විසින් ඉස්මතු කර පෙන්වා දී ඇත. ශ්‍රී ලංකාව පිළිබඳ සුන්දර කථා පුළුල් රසික පිරිසක් අතරට ගෙනයාම තහවුරු කරමින් මාධ්‍ය නියෝජිතයන් සමඟ සෘජු සංනිවේදනයක් පුවත්පත් සාකච්ජා මගින් ඇති කරන ලදී.  මීට අතිරේකව, අන්තර් සබඳතා ඇති කරන උත්සව මගින් තම දැනුම බෙදා හදා ගෙන  උනන්දුවක් දක්වන්නන්, ක්ෂේත්‍රයේ සහකරුවන් සහ සංචාරක නියෝජිතයන් සඳහා වටිනා අවස්ථා සළසා දුනි. අවසාන වශයෙන් කිමිදුම් සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම හා ප්‍රධාන සංචාරක නවාතැනක් ලෙස ශ්‍රී ලංකාවේ පොහොසත්කම් පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා දීමට හැකි විය.

- Vakantiebeurs, 2024 ජනවාරි 10 සිට 14 දක්වා නෙදර්ලන්තයේ උට්රෙච්ට් හි
- FITUR, 2024 ජනවාරි 24–28 දක්වා ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හි
- BIT, 2024 පෙබරවාරි 04 සිට 06 දක්වා ඉතාලියේ මිලාන් හි
- OTM, 2024 පෙබරවාරි 08 සිට 10 දක්වා ඉන්දියාවේ බොම්බේ හි
- SATTE, 2024 පෙබරවාරි 22 සිට 24 දක්වා ඉන්දියාවේ නවදිල්ලියේ දී
- අන්තර්ජාලසැසි, 2024 පෙබරවාරි 09 හා 20 දින ඉන්දියාවේ නවදිල්ලි හා බොම්බායේ දී
- ITB, 2024 මාර්තු 05 සිට 07 දක්වා ජර්මනියේ බර්ලින් හිදී
- IMM, 2024 මාර්තු 13 දින ප්‍රංශයේ පැරිස් හිදී
- Holiday World, 2024 මාර්තු 15 සිට 17 දක්වා චෙක් ජනරජයේ ප්‍රේග් හිදී
- Ferien, 2024 මාර්තු 14 සිට 17 දක්වා ඔස්ට්‍රියාවේ වියානා හිදී
- බ්‍රිස්බේන්, මෙල්බර්න්, සිඩ්නි අන්තර්ජාල සැසි,2024 මාර්තු 19 සිට 25 දක්වා ඕස්ට්‍රේලියාවේ දී
- MITT, 2024 මාර්තු 19 සිට 21 දක්වා රුසියාවේ දී
- වීදි සංදර්ශනය(Road show), 2024 අප්‍රේල් 18 දින තුර්කියේ ඉස්තාන්බුල් හි

- නන්ජිං, වුහාන්, සියාමන් හි වීදි සංදර්ශන(Road show), 2024 අප්‍රේල් 20 සිට 26 දක්වා චීනයේ දී
- IWTE සුවතා ප්‍රදර්ශනය (Wellness Expo), 2024 මැයි 08 සිට 10 දක්වා ජපානයේ ටෝකියෝ හිදී
- SITF, 2024 මැයි 09 සිට 12 දක්වා දකුණු කොරියාවේ දී
- GITF, 2024 මැයි 06 සිට 08 දක්වා චීනයේ බීජිං හි
- RTF, 2024 මැයි 27 සිට 29 දක්වා සවුදි අරාබියාවේ දී
- ATM, මැයි මස 06–09 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී
- ඉන්දොරි, බැරෝඩා, සුරාට් අන්තර්ජාල සැසි 2024 ජූනි 10 සිට 14 දක්වා ඉන්දියාවේ දී
- කුරුළු ප්‍රදර්ශනය (Bird Fair), ජූලි මස 12–14 දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් හි
- බීජිං හා හොංකොං වල වීදි සංදර්ශන -2024ජූලි 12 සිට 17 දක්වා හොංකොං හි
- අන්තර්ජාල සැසිය - ජූලි 10 වන දින ඉන්දියාවේ කල්කටා හිදී
- TTF, ජූලි 12–14 දක්වා ඉන්දියාවේ කල්කටා හිදී
- IITM, 2024 ජූලි 26 සිට 28 දක්වා ඉන්දියාවේ බැංගලෝරයේ දී
- IITM, 2024 අගෝස්තු 02 සිට 04 දක්වා ඉන්දියාවේ චෙන්නායි හි
- IFTM, 2024 සැප්තැම්බර් 17 සිට 19 දක්වා ප්‍රංශයේ පැරිස් හි
- Leisure, 2024 සැප්තැම්බර් 17 සිට 19 දක්වා රුසියාවේ මොස්කව් හි
- JATA, 2024 සැප්තැම්බර් 26 සිට 29 දක්වා ජපානයේ ටෝකියෝ හි
- TTG, 2024 ඔක්තෝබර් 09 සිට 11 දක්වා ඉතාලියේ රිමිනි දී
- TT වෝෂෝ, 2024 නොවැම්බර් 28 සිට 30 දක්වා පෝලන්තයේ දී
- ලෝක සංචාරක අලෙවිපල (WTM), 2024 නොවැම්බර් 05 සිට 07 දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් හි
- ILTM, 2024 දෙසැම්බර් 2 සිට 5 දක්වා ප්‍රංශයේ පැරිස් හි

➢ **නිමැවුම/ප්‍රතිඵලය**

ඉලක්ක වෙළඳපොළවල් වලින් මෙරටට සිදු කරන සංචාරක පැමිණීම් ඉහළ යාම සහ සංචාරක පැමිණීම්වල ඉහළ මට්ටමේ වියදම් කරන්නන්ගේ කොටස වර්ධනය වැඩි කිරීම. ඒ අනුව යමින් ශ්‍රී ලංකාවට පැමිණෙන මාධ්‍යවේදීන් සහ නව චාරිකා මෙහෙයවන්නන්/ වෘත්තිකයන් සංඛ්‍යාව වැඩි කිරීම හා ගමනාන්තය වෙත සමාජ මාධ්‍ය අවධානය වැඩි කිරීම. සංචාරක කර්මාන්තයේ සාමාජිකයින්ට ශ්‍රී ලංකාව යෝග්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රදර්ශනය කිරීම. ශ්‍රී ලංකාවේ ගමනාන්ත කළමනාකරණ සමාගම්වලට/හෝටල් හිමියන්ට වැඩි වැඩියෙන් ව්‍යාපාරික සම්බන්ධතා ඇතිකර ගැනීමට අවස්ථාවක්නිර්මාණයකිරීම.ජාත්‍යන්තර සංචාරකයන් අතර වසර ගණනක සිට සිදුවූ නව වැඩිදියුණුවීම් සමඟ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සහ උනන්දුවක් දක්වන රටවල් හා ගමනාන්ත වල දැනුවත්භාව ඉලක්ක කර ශ්‍රී ලාංකික සංචාරක නිෂ්පාදන හඳුන්වා දෙමින් ධනාත්මක පණිවුඩයක් සංනිවේදනය කිරීම. ඍජු සබඳතා ඇති කර ගනිමින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳ මතකාවර්ජනය කරමින් ආකල්පමය තලයන් ඉහළටම වර්ධනය කිරීම.



ITB, ජර්මනිය



WTM, එක්සත්



ILTM, කැන්ස්, ප්‍රංශය

➤ **වන්ඩර්ලස්ට් රීඩර්(Wanderlust Reader) සංචාරක සම්මානය 2024**

2024 වැන්ඩර්ලස්ට් රීඩර් සංචාකර සම්මාන උළලේදී ලොව වඩාත් කදිම දිවයින යන නාමයෙන් ශ්‍රී ලංකාව ගරුත්වයට ලක් කර ඇත. අසමසම භූ විෂමතා, දියුණු ජෛව විවිධත්වය සහ විවිධාකාර වූ සංස්කෘතියකට නම් දරා සිටින මෙම රට මගින් අසම සම සංචාරක අත්දැකීම් ගොන්නක් දායද කෙරේ. මුහුදු තීරුව මත වැතිර ඇති දැකුම්කළු වෙරලවල් වල සිට මධ්‍ය කඳුකරයේ හරිතවර්ණ තේ වගාවන් සහ ජාතික උද්‍යාන වල අනේක වූ වන ජීවීන්, මෙම දිවයිනේ සෑම අස්සක් මුල්ලක්ම යනු ස්වභාව ධර්මයේ අලංකාරත්වයේ පැතිකඩකි. ස්වදේශිකයන්ගේ ආගන්තුක සත්කාරය, ප්‍රනීත ආහාරපාන, සහ පුරාණ ඓතිහාසික ස්ථාන මෙන්ම අනගි සීගිරි පර්වත රාජධානිය මෙන්ම මහනුවර පූජා නගරය මගින් සංචාරකයන් අමන්දානන්දයට පත් කරවන සුළුය. මෙම ප්‍රසිද්ධිය මගින් ශ්‍රී ලංකාවේ මන්මත්වය වැඩිදියුණු කරනවා පමණක්ම නොව සංචාරකයන් අපේක්ෂා කරන වීර වික්‍රමයන්, සාමදානය හා සංස්කෘතික සරුවත්බව සඳහා ප්‍රමුඛ ගමනාන්තයක ඇති වාසිගත තත්වයන්ගෙන් අනූන වේ.

➤ **ලොව ආකර්ශනීමය දිවයින - ශ්‍රී ලංකාව**






ශ්‍රී ලංකාව වෙනුවෙන් සභාපතිවරයා සම්මානය භාර ගැනීම

➢ මෙහෙවර දිනවන ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රවර්ධනාත්මක වැඩසටහන, 2024 අගෝස්තු මස එක්සත් රාජධානියේ දී
- සාප්පු සංකීර්ණවල පැවති පාරිභෝගික ප්‍රවර්ධන ක්‍රියාකාරකම්- මාර්තු මස ඔස්ට්‍රියාවේ දී
- 2024 ගිම්හානයේ යෙකටරිංබර්ග් හි පැවති ජාත්‍යන්තර සංචාරක වෙළඳපලට සහභාගිවීම, 2024 මැයි 17 සිට 18 දක්වා රුසියාවේ දී
- ජාත්‍යන්තර සංචාරක සතුටු සංදර්ශනයට සහභාගීවීම,2024අප්‍රේල් 17 සිට 20 දක්වා බෙලාරුස් හි දී
- ඉස්තාන්බූල් හි පැවති ශ්‍රී ලංකා ගමනාන්ත ප්‍රවර්ධන උළෙලට සහභාගිවීම, 2024 පෙබරවාරි 20 තුර්කියේ දී
- ජපානයේ ටෝකියෝ නුවර යොයොගි උද්‍යානයේ ජූනි පැවති ශ්‍රී ලංකා උළෙල
- මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන, 2024 ඔක්තෝබර් මස වියට්නාමයේ දී
- ඉරානයේ ෂිරාස්හි පැවති පාස් (Pars) ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනය
- සංචාරක ප්‍රවර්ධන උළෙල ජෝර්දාන් හි දි
- ශ්‍රී ලංකා වීදි සංදර්ශනය -ඕමාන්හි දි

➢ නිමැවුම / ප්‍රතිඵලය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳව සාධනීය පණිවඩ සංනිවේදනය කිරීම සහ ශ්‍රී ලංකා සංචාරක නිෂ්පාදන සංචාරකයන් හට ඉදිරිපත් කිරීම. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය ඉහළ නැංවීම. ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් සංවිධානය කරනු ලබන ක්‍රියාකාරකම් මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳව උපරිම මාධ්‍ය ආවරනය ලබා ගැනීම.

**2024.12.31 දින වන විට සමස්ත අලෙවි ප්‍රවර්ධන වියදම (මූල්‍ය පදනම): රු.1,532,561,911/-කි.**

**භෞතික ප්‍රගතිය: 80.77% ක් අත්පත් කර ගෙනඇත.**

**මහජන සම්බන්ධතා**

➢ සංචාරක මාධ්‍යවේදීන් **&** පුද්ගලික වෙබ් අඩවිකරුවන් සඳහා වූ වැඩසටහන් **(VJP & VBP)**



ප්‍රධාන ජාත්‍යන්තර සංචාරක උනන්දු කරවන්නන් සහ ප්‍රධාන පෙලේ මාධ්‍ය ප්‍රකාශන ඉලක්ක කරමින් - VJP & VBP ඒකකය විසින් ගමනාන්ත ප්‍රවර්ධන සම්මුඛ කිරීමේ වැඩසටහන් (කෙටිකාලීන සංචාර) සංචාරක බ්ලොගර් වැඩසටහන (VBP) යටතේ සහ 2024 වසරට සැළසුම් කළ සංචාරක ජනමාධ්‍යවේදී වැඩසටහන් (VJP) දියත් කෙරිනි.

මෙම ව්‍යාපෘති දෙක මගින්ම ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංචාරක කර්මාන්තයේ විවිධ භූගෝලීය කලාප ගැන සළකමින් සහ විවිධ සංචාරකයන් කැමති වන භූ විෂමතා සළකා සියළු අංශ වල විශ්ව සංචාරය කරන්නන් ඉලක්ක කර ප්‍රධාන වශයෙන්ම බකට් ලිස්ට් ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ඩිජිටල් වශයෙන් ස්ථානගත කිරීම කෙරෙහි අවධානය යොමු විය. දිවයින ලොවට රැගෙන යමින් සංචාරක මෙවලම් ගොන්න ප්‍රවර්ධනය කෙරේ අවධානයට හසු කිරීම ව්‍යාපෘති දෙකේම අරමුණ විය.

**ඉලක්කගත අංශයන් :**

- පවුල් සංචාරකයන්
- වීරක්‍රියාන්විත සංචාරකයන්
- සුවපහසු සංචාර හා මධුසමය ගත කරන්නන්
- ආයුර්වේද හා ශරීර සුවතා
- සංස්කෘතික සංචාර අපේක්ෂා කරන්නන්: ආහාරපාන/උරුම/පුරාවිද්‍යා/ජීවන රටා
- රාමායන හා බොදුනු වන්දනා නඩ
- සූර්යාලෝකය, වෙරළ සහ මුහුදු ආශ්‍රිත නිවාඩු ගත කරන්නන්

**ගමනාන්ත සොයා යන ප්‍රධාන රටවල්**

ඉන්දියාව, එක්සත් රාජධානිය, යුරෝපය (ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය,නෙදර්ලන්තය, ස්පාඤ්ඤය, (සියළුම දැනට ඇති හා ඇති විය හැකි වෙලඳපලවල්), ඕස්ට්‍රේලියාව,රුසියාව, ඇමෙරිකාව, මැද පෙරදිග සහ උනන්දුවක් දක්වන වෙනත් අග්නිදිග ආසියානු රටවල්

## ➢ අවධානාත්මක ප්‍රවර්ධන කලාප

- බස්නාහිර පළාත: කොළඹ/කළුතර/ මීගමුව
- ඌව පළාත: හපුතලේ/ ඇල්ල/ බණ්ඩාරවෙල/ මහියංගනය/ බදුල්ල
- සබරගමුව පළාත: රත්නපුරය/උඩවලව
- මධ්‍යම පළාත: දඹුල්ල/ මාතලේ/මහනුවර/නකල්ස් කඳුවැටිය
- උතුරුමැද පළාත: අනුරාධපුරය/ පොළොන්නරුව/ හබරන
- උතුරු පළාත: යාපනය/ වවුනියාව/ නාගදීපය
- දකුණු පළාත: බෙන්තොට/ ගාල්ල/ මාතර/යාල/ මිරිස්ස

## ➢ ප්‍රතිඵලය:

තිරසාර සංචාරක සංවර්ධනය කෙරෙහි අවධානය රඳවමින් අමතක නොවන නිවාඩු තෝතැන්න ලෙස ශ්‍රී ලංකාව වර්ධනය කිරීම සඳහා 2024 වර්ෂය තුළ VBP හා VJP විසින් සියුම් ලෙස තෝරාගත් ප්‍රධාන පෙලේ මාධ්‍ය මධ්‍යස්ථාන සහ ජාත්‍යන්තර සංචාරක ප්‍රවර්ධකයන් සඳහා "නිර්මාණශීලී ගමනාන්ත පර්යේෂන චාරිකා" සංවිධානය කෙරිනි. මෙමගින් ස්වභාව ධර්මයට, වන ජීවින්ට සහ හෙළ සංස්කෘතියට අවම නිශේධනීය බලපෑමක් ඇති සංචාරක අවස්ථා දේශීය උනන්දුවක් දක්වන්නන් අතර බෙදා හදා ගැනීමටත් හැකි වේ. ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය කෙරෙහි විවිධ වූ මතවාද පහසුවෙන් තුරන් කරන දැවැන්ත විවිධයත්වයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්බව වර්ධනය කිරීම මාධ්‍ය ව්‍යාපෘති දෙකේම අරමුණ වේ.

➢ 2024 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සමඟ සමස්ත ප්‍රගතිය

| මාධ්‍යවේදීන් සහ බලපෑම් කරුවන්ගේ (Influencers) මුළු සංඛ්‍යාව (VJP/VPB) | මාධ්‍යවේදීන් / සංචාරක බලපෑම් කරුවන්ගේ (Influencers) මුල් රටවල් | අවධානය යොමු කරන ලද ප්‍රධාන වෙළඳපළ | සිදු කරන ලද මුළු ප්‍රවර්ධන සංඛ්‍යාව (VJP/VPB) | ඒකාබද්ධ ප්‍රවේශය (සංසරණය + පාඨකත්වය + අනුගාමිකත්වය + ග්‍රාහකයින් +සාමාන්‍ය මාසික පිටු නැරඹුම් වාර) | ඒකාබද්ධ මුළු මාධ්‍ය වටිනාකම (මේ හා සමාන ප්‍රචාරණ වටිනාකම) (ශ්‍රී.ල.රු.) |
|---|---|---|---|---|---|
| 65 | එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය, රුසියාව, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඉතාලිය, ස්පාඤ්ඤය, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව | එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, යුරෝපීය රටවල් (හදිසි හා ස්ථාවර) ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව | 1172 | 633,982,356 | 258,815,975.51 |

➢ **සංචාරක බ්ලොග්කරුවන්ගේ වැඩසටහන (VBP) සහ සංචාරක ජනමාධ්‍යවේදීන්ගේ වැඩසටහන (VJP) යටතේ මෙහෙයවන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ ජයග්‍රහණ:**

- 364,900,000 ක් වූ විශ්ව පාඨක පිරිසක් වෙත ලගා වූ එක්සත් රාජධානියේ ඩේලි මේල් පුවත්පතේ සංචාරක මාධ්‍ය ආවරනය
- නැගී ඒන හා ස්ථාවර වෙළදපලවල් සහිත ප්‍රධාන පෙලේ පොළඹවන්නන් 30 කට අනුග්‍රහය දැක්විම. යුරෝපිය වෙළදපලින් මෙන්ම ස්ථාවර දේශිය වෙලදපල් ප්‍රධාන වශයෙන් 2024/ 2025 ශිම්හාන සෘතු සංචාරකයන් විශාලතම ජාත්‍යන්තර පොළඹවන්නන්ගේ හමුව හා ප්‍රවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය( ශ්‍රීලංසංප්‍ර කාර්යාංශය ) සිදු කර ඇත. ජාත්‍යන්තර සංචාරක පොළඹවන්නන්ගේ මුළු සංඛ්‍යාව 30 ක් විය.
- උතුරු හා නැගෙනහිර ආහාර සංස්කෘතින් හුවා දක්වමින් වොජ්ස්ටික් සංචාර සමග Culinary Travel Vlog Series සමාජ මාධ්‍ය අනුගාමිකයන් මීලියන 3.9 කට වැඩි පිරිසකට ලැබීමට කටයුතු කෙරිනි.




- ෆෝබ් ඉන්දියා(Forbes India) ආවරණය දැඩි උනන්දුවක් දක්වන ඉන්දියානු ඔන්ලයින් පාඨක 130,000 සීමාවට ලගා විමට හැකි විය.

- මහා පරිමාණ ජාත්‍යන්තර ඉන්ස්ටර්ග්‍රෑම් ප්‍රවර්ධනය–ගිම්හානය

| උනන්දු කරවන්නන් සංඛ්‍යාව (influencer) | කණ්ඩායමේ ප්‍රධාන නරඹන්නන් පිරිස | ඉදිරිපත් කිරීම ( IG පොස්ටු/පට | භාවිතාවන් | ROI: අපේක්ෂිත මාධ්‍ය වටිනාකම (ලං රු) |
|---|---|---|---|---|
| 07 | ඇමෙරිකාව, ඉතාලිය, ජර්මනිය, රුසියාව, එක්සත් රාජධානිය, ප්‍රංශය, ඉන්දියාව, ජපානය, ස්පාඤ්ඤය | 140 | 1,014,639 | 43,737,123 |




## ➢ එක්සත් ජනපදයේ ජාත්‍යන්තර මාධ්‍ය වෙළඳපලෙහි ජාත්‍යන්තර මාධ්‍ය අවධානයට ලක්වූ ප්‍රවර්ධනය

IMM (ප්‍රධාන ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රකාශන ඉලක්ක කර) හි ගමනාන්ත ප්‍රවර්ධනය මගින් ලොව ප්‍රධාන පෙළේ සංචාරක මාධ්‍ය ප්‍රකාශන සමඟ සම්බන්ධ වීමට සෘජු අවස්ථා උදා විය. මෙම මාධ්‍ය සම්බන්ධීකරණ අවස්ථාව 2024 බාහිර ජනමාධ්‍යවේදී වැඩසටහන යටතේ ඉහළ පෙළේ ජාත්‍යන්තර මාධ්‍ය සම්බන්ධ කර කැඳවා ගෙන ඒමේ ප්‍රධාන මූලාශ්‍රමය උපක්‍රමයක් විය. මෙම වැඩසටහන පෙබරවාරි 19 හා 20 යන දිනවල පැවැත්විනි.




**2024 TBEX-යුරෝපය:** මෙම ඉහළ පෙළේ සංචාරක උනන්දු කරවීමේ උළෙල යුරෝපයේ විශාලතම ජාත්‍යන්තර සංචාරක ප්‍රවර්ධකයා ලෙස සැළකෙන අතර ව්‍යාපාරිකත්වයට අදාළ සමුළු හා එකිනෙකා මුණ ගැසෙන හමුවීම් වලින් සමන්විත එකකි. 300 කට අධික ප්‍රධාන ජාත්‍යන්තර සංචාරක ක්‍රියාධරයන් (යූ ටියුබ්කරුවන්, ඉන්ස්ටර්ග්‍රෑම් කරුවන්, පුද්ගලික වෙබ් අඩවිකරුවන් සහ සමාජ මාධ්‍ය තලයන් සකසන්නන්) මෙම උත්සවයට සහභාගී වූහ. 2024 TBEX යුරෝප 2024 2024 මැයි 28 සිට 31 දක්වා ස්පාඤ්ඤයේ සැන් සෙබස්තියන් හි පැවැත්විනි.





- **චිත්‍රපට සංචාරක ප්‍රවර්ධන:**

- **නිමකළ ප්‍රධාන ව්‍යාපෘති:**

**IIFTC-** බොලිවුඩ් චිත්‍රපට නිෂ්පාදන ස්ථාන හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය: 2024 ඔක්තෝබර් 23 සිට 25 දක්වා බොම්බේ හි පැවති කලාපයේ විශාලතම චිත්‍රපට සංචාරක උළෙල වන ඉන්දිය ජාත්‍යන්තර චිත්‍රපට සංචාරක සංසදයේ (IIFTC) 11 වන සැසියට සහභාගි වුනි. ඉන්දියන් චිත්‍රපට නිෂ්පාදන සමාගම් 100 කට වැඩි ප්‍රමාණයකට සහ නව චිත්‍රපට කැමරාගත කරන ස්ථාන සොයමින් සිටින විවිධාකාර වූ නිෂ්පාදකයන්ට ශ්‍රී ලංකාවේ රමණීය ස්ථාන පෙන්වා දීමට මෙමගින් හැකියාව අත් විය.




**IFFI- 2024 (ඉන්දියානු ජාත්‍යන්තර චිත්‍රපට උළෙල):** නොවැම්බර් මස 20 සිට 28 දක්වා ඉන්දියාවේ ගෝවේ පැවති 55 වන ජාත්‍යන්තර චිත්‍රපට උළෙලට (IFFI) සහභාගිත්වය ලබා දුනි. ඉන්දියාවේ තොරතුරු හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ඒකාබද්ධ ලේකම් ප්‍රිතු කුමාර් මහතාගේ ආරාධනයෙන් මෙය දියත් වූ අතර බොම්බේ හි ශ්‍රී ලාංකික කොන්සල් ජනරාල්වරයා අවශ්‍ය සහාය දැක්විය.



- **සංචාරක තොරතුරු කවුළු (TICs)**

- **1912 සංචාරක ක්ෂණික ඇමතුම් අංකය & ඇමතීම හා සහාය කළමනාකරනය**

*සංචාරක තොරතුරු මධ්‍යස්ථාන (TICs) මගින් 24 පැයේ 1912 සංචාරක ක්ෂණික ඇමතුම් සේවා ඇතුළුව ශ්‍රී ලංකාවේ නිල සංචාරක ක්ෂණික ඇමතුම විශේෂ කාර්ය භාරයක් ඉටු කෙරේ. ක්ෂණික ඇමතුම් සේවාවන්ට අමතරව, TIC නිලධාරින් විසින්* ***info@srilanka.travel*** *නම් නිල විද්‍යුත් තැපැල ලිපිනය මගින් ලැබෙන විමසීම් අධීක්ෂනයට කෙරේ..*

2024 වසරේ දී සංචාරක පැමිණ කරන විමසුම් 9000 කට වැඩි ප්‍රමාණයකට සංචාරක TIC තුනක් මගින් සහාය වී ඇති අතර දුරකථන ඇමතුම් 39,000 කට වැඩියෙන් ප්‍රතික්‍රියා දක්වමින් සංචාරකයන්ට තම පූර්ණ සහාය දක්වන බව සාක්ෂාත් කර ඇත.

- **සංචාරක කණ්ඩායම් පිළිගැනීම**

**සංචාරකයන් පිළිගැනීම සඳහා නර්තන අංග ඉදිරිපත් කෙරිනි.**

1. "රිවිරා"-Riviera
2. "ලාජැක්ස් කාර්ටර්"-Le Jacques carter
3. "සෙලිබ්‍රිටි මිලේනියම්"-Celebrity Millennium
4. "සුයිඩරඩෑම්"-Zuiderdam
5. "වස්කෝදගාමා"-Vascoda Gama
6. "සිල්වවිෂ්පර්"-Silver Whisper

- **නව ගුවන් සේවා 9 ක් & විශේෂ අමුත්තන් 203 ක් & විශේෂ කණ්ඩායම් බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී පිළිගැනීම**

1. LOTපෝලන්ත ගුවන් සේවය
2. කැතේ පැසිෆික්
3. මාලදිවයින් ගුවන් සේවය
4. CHONGQING ගුවන් සේවය
5. එන්ටර් එයා
6. අසූර් එයා
7. එයා අරාබියා
8. එයා අස්ටනා
9. ස්කයිඅප් ගුවන් සේවය





විශේෂ උත්සව සංවිධානය

1. ***2024 ලෝක සංචාරක දිනය සැමරීම - කටුනායක ගුවන් තොටුපල හා මහනුවර***






2. ***දශලක්ෂපති සංචාරක පැමිණීම*** – ශ්‍රී ලංකාවට පැමිණෙන දශලක්ෂපති සංචාරකයාව පිළිගැනීමට බණ්ඩාරනායක ගුවන් තොටුපලේ 2024 ජූනි 29 දින විශේෂ උත්සවයක් සංවිධානය කෙරිනි.







***විසි ලක්ෂපති සංචාරක පැමිණීම*** – සංචාරක නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සභාපතිවරයාගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන විසි ලක්ෂපති සංචාරකයා පිළිගැනීමට බණ්ඩාරනායක ගුවන් තොටුපලේ 2024 දෙසැම්බර්26 දින විශේෂ උත්සවයක් සංවිධානය කෙරිනි.





අභ්‍යන්තර මාධ්‍ය ඒකකය - ශ්‍රීලංසංප්‍රඅ

- 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය( ශ්‍රීලංසංප්‍ර කාර්යාංශය ) දේශීය මාධ්‍ය අංශය විසින් ප්‍රධාන පුවත්පත් සාකච්ඡා තුනක් සංවිධානය කිරීමටත් විවිධ දේශීය සහ විදේශීය ප්‍රවර්ධන කටයුතු පිළිබඳව මාධ්‍ය නිවේදන 50 ක් බෙදා හැර ඇත. මෙය පළ කිරීම මෙන්ම සමාජ මාධ්‍ය ජාල වල පළ කරිමටත් 2024 පළමු කාර්තුවේදි දේශීය මාධ්‍ය කණ්ඩායමක් පින්නවල සංචාරකයට යොමු කෙරිනි. පින්නවල අලි අනාථාගාරය පිළිබඳව ධනාත්මක දැක්මක් පිළිබද නවතම තොරතුරු සමාජගත කිරීමේ අරමුණින් සිලෝන් ටුඩේ, අරුණ, ලංකාදීප සහ ඩේලි මිරර් පුවත්පත්වල ජනමාධ්‍යවේදීන් සහභාගි විය.

**2024.12.31 දින වන විට සමස්ත මහජන සබඳතා වියදම (මූල්‍ය පදනම): රු. 89,940,425/-කි.**

**භෞතික ප්‍රගතිය: 81.33% ක් අත්පත් කර ගෙන ඇත.**

- **2024 දී මුද්‍රිත මාධ්‍යවලපල කල වාර්තා කිහිපයක්**


Sri Lankan tourism, culture, food and tea promoted in Hague


විසි ලක්ෂයේ සංචාරකයා එයි


SLTPB marks World Tourism Day


Sri Lanka welcomes prominent Polish celebrity couple to boost tourism

උත්සව අවස්ථා

➢ **ගංගාරාම නවම් පෙරහැර 2024**

ශ්‍රී ලංකාව සංස්කෘතික හා ආගමික සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නාගරික හෝටල්, ගුවන් තොටුපළ ප්‍රචාරණ සහ සමාජ මාධ්‍ය නාලිකා හරහා ලබා දෙනු ලබන ප්‍රචාරණය සමඟ රුපියල් මිලියන 01 ක අනුග්‍රහකත්වයක් සපයන ලදී.

➢ **බුද්ධ රශ්මි වෙසක් මංගල්‍යය**




ජනාධිපති ලේකම් කාර්යාලය සහ ගංගාරාම විහාරස්ථානය විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය සඳහා ගාලු මුවදොර පිටියේ ගස්වල නගර ආලෝකකරණයට පහසුකම් සැලසීමේ ප්‍රචාරක වැඩසටහනක් සංවිධානය කරන ලදී.

➢ **සංචාරක උදාව**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්,ගමනාන්ත කළමනාකරණ සමාගම්,සංචාරක නියෝජිතයින් සහ සංචාරක කර්මාන්තයේ අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම,ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ සම්බන්ධතා ඇති කර ගැනීම,නව නිෂ්පාදන සහ සේවා හඳුන්වාදීම,ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක ආකර්ෂණය පිළිබඳ අත්දැකීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් බැහැරගත හා අභ්‍යන්තරගත චාරිකා මෙහෙයවන්නන්ගේ සංගමය (SLAITO) සමඟ සහයෝගයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි දෙදින ප්‍රදර්ශනයක් පවත්වා අනුග්‍රාහකත්වය පිරිනමන ලදී.



**2024.12.31 දින වන විට සමස්ත වියදම (මූල්‍ය පදනම): රු. 53,799,150/-කි.**

**භෞතික ප්‍රගතිය: 45.13% ක් අත්පත් කර ඇත.**

ප්‍රචාරණය

## ➢ 2024 වසරේදී ශ්‍රීලංසංප්‍රඅ යේ ප්‍රචාරක අංශය විසින් සිදු කර ඇති ක්‍රියාකාරකම්

### ➢ විශ්ව පරිවර්තනීය මැදිහත්වීම: 2024 ශ්‍රීලංසංප්‍රකා යේ සමාජ මාධ්‍ය මෙහෙයුම්

2024 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) සමාජ මාධ්‍ය වේදිකා රාශියක් හරහා සිය ඩිජිටල් පැවැත්ම ඉහළ නංවා ගනිමින්, 2023 වසරේ පෙරළිකාර සාර්ථකත්වය මත ගොඩනඟා ගත්තේය. නිර්මාණාත්මක කතා ඉදිරිපත් කිරිම්, සැගවුන අන්තර්ගතයන් සහ උපාය මාර්ගික ප්‍රජා සහභාගීත්වය තුළින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ගෝලීය සංචාරකයන්ගේ හද බැද ගැනීමට හැකි විය. ෆේස් බුක්, ඉන්ස්ටර්ග්‍රෑම්, ට්විචර්, යූ ටියුබ්, ටික්කොක්, පින්ටරස්ට්, වීකේ, ටෙලිග්‍රෑම් සහ ලින්කෙල්න් වැනි වේදිකා භාවිතා කරමින් කාර්යාංශය ශ්‍රී ලංකාවේ අසමසම සුන්දරත්වය, සංස්කෘතිය සහ ආගන්තුක සත්කාරය නිරන්තරයෙන් ප්‍රදර්ශනය කෙරිනි. කළේය.

මෙම වසරේ දියත් කළ වැඩසටහන් මිලියන ගණනින් ප්‍රතිලාභ උත්පාදන කළ අතර, චිත්තවේගීය සම්බන්ධතා වර්ධනය කරමින්, සංචාරක උම්මාදය වඩවාලීම සහ ගෝලීය සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛ තේරීමක් බවට සහතික කරලිමට හැකි විය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ විශ්ලේෂණ මත පදනම් වූ තීක්ෂණ බුද්ධිය සහ සමස්ත අනුකූලතාවයේ නව්‍ය භාවිතය ශ්‍රී ලංකාව සංචාරක කර්මාන්තයේ ඔරොත්තු දීමේ සහ ආකර්ෂණයේ පහන් ටැඹක් බවට පත්ව ඇත.




### ➢ වෙළඳ ප්‍රචාරන මෙවලම් සැකසීම

ශ්‍රී ලංකා නව්‍යකරන ව්‍යාපාරය සඳහා වෙළඳ ප්‍රචාරන මෙවලම් සැකසීම සඳහා සීමා. ඒරියල් වීව් (පුද්.) සමාගම නම් නිෂ්පාදන ආයතනයක් පත් කර ගන්නා ලදී.

**ප්‍රගතිය:** කොන්ත්‍රාත්තුව ලබා දිමෙන් පසුව චිත්‍රපට නිෂ්පාදන අරඹා ඇති අතර මෙහි පළමු තොගය සාර්ථක ලෙස නිම කර ඇත.

### ➢ නවීනතම වෙඩ් අඩවි සැකසීම හා නඩත්තු සහාය

වැඩිදියුණුකිරීම්, අන්තර්ගත සැකැස්ම, බහුභාෂා පහසුකම්, SEO හා ඩිජිටල් වත්කම් කළමනාකරණ පද්ධතිය ඇතුළුව උසස්තම අංග සහිතව නව වෙඩ් අඩවියක් සැකසීම සඳහා පුළුල් සැළැස්මක් අරඹන ලදී.

**ප්‍රගතිය:**මෙම ව්‍යාපෘතිය UNWTO ආයතනයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවෙන්නක් වන අතර වසර දෙකක කාලයක් පුරා සිදු වනු ඇත.

- **ජංගම යෙදවුම් නිර්මාණය කිරීම (ADB අරමුදල් සහිත)**

ජංගම යෙදවුම් නිර්මානය කිරීමේ 1 වන අදියර මේ වන විට නිමා කර ඇත.

**අංගයන්:**

සංචාරක ආකර්ශන ස්ථාන 250 ක් හා ප්‍රධාන සංචාරක ස්ථානීය කරුණු 100 කට අධිකව ඇතුළත් කර ඇත.

ශ්‍රීලංසංසං අධිකාරියේ ලියාපදිංචි වි ඇති සංචාරක උනන්දුවක් දක්වන්නන් යෙදවුමට ඇතුළත් කර ගෙන ඇත.






- **මොස්කව් MITT 2024 පැවති අන්තර් සහභාගිත්ව මාධ්‍ය සංදර්ශනය**

ශ්‍රීලංසංප්‍ර කාර්යාංශයේ පැවිලිනය අසල ඡායාරූප කුටියක් හා වීආර් වීඩියෝ ප්‍රදර්ශනයක් පැවැත්වීම මගින් වැඩි සංචාරක ප්‍රමාණයක් ගෙන්වා ගැනීමට හැකිවීම.

**ප්‍රතිඵලය:** නවීන VR තාක්ෂණය මගින් ශ්‍රී ලංකාවේ සංචාරක වැදගත් ස්ථාන හුවා දක්වන ඉහළ පෙළේ සහගාත්වයක්.






- **ආසියානු කිමිදුම් ප්‍රදර්ශනය (ADEX) 2024 හි සහභාගීත්වය**

2024 අප්‍රේල් 12 සිට 14 දින දක්වා සිංගප්පූරුවේ පැවති ආසියානු කිමිදුම් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකාව සාර්ථකව නියෝජනය කෙරිනි.

**ප්‍රතිඵලය:** සේවා ලාභීන් හා ව්‍යාපාරික ප්‍රජාවන් යන දෙවර්ගය අතර ප්‍රධාන කිමිදුම් ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කෙරිනි.නාවුක සංචාරක උනන්දුවක් දක්න පිරිසක් සමග සම්බන්ධවීම මගින් ශ්‍රී ලංකාව තුල සාර්ථක නාවුක සංචාරක ප්‍රවර්ධන අවස්ථා උදා කර ගැනීමට හැකි විය. මෙම සහයෝගීතාවය මගින් වඩා හොඳ අන්තර්ගතයක් සහ පැහැදිලි සංචාරක නිපැයුමක් ලෙස ශ්‍රී ලංකා නාවුක සංචාරක කර්මාන්තය සඳහා ප්‍රවර්ධන ද්‍රව්‍ය සකසා ගැනීමට ශ්‍රීලංසංප්‍ර කාර්යාංශයට උපකාරි විය.










- ශ්‍රී ලංකා සංචාරක ජාත්‍යන්තර සහතික කිරීමේ පිටුව යාවත්කාලීන කිරීම **- 2024** සහතික කිරීම් යාවත්කාලීන කෙරිනි.

- ලොව හොඳම 2024 ජාතික භූගෝල දසුන.

නැෂනල් ජියෝග්‍රැෆික් හි හොඳම "පුළුල් ලෝක සංචාරක ව්‍යාපෘතියේ හොඳම" ලෙස ලැයිස්තුගත කර ඇති පෙකෝ ට්‍රේල් ( Pekoe Trail). එය බ්‍රිතාන්‍ය සංචාරක ලේඛකයින්ගේ සංසදය (BGTW) විසින් එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සම්මාන උළෙලේ දී ශ්‍රී ලංකාවට Pekoe Trail සම්මානය පිරිනැමූ අතර එය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ තවත් ජයග්‍රහණයක් විය.

* Pekoe Trail - ලෝකයේ හොඳම සංචාරක අත්දැකීම් 20 - නැෂනල් ජියෝග්‍රැෆික්ස් (National Geographic's)

- UAE පදනම් කරගත් Travel Off Path 2024 දී සීඝ්‍රයෙන් වර්ධනය වන එක් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ලැයිස්තු ගත කර ඇත. ඒ අනුව, ඩිජිටල් පුවරු වල මුදලේ වටිනාකමට සරිලන ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව නිරතුරුව ස්ථාන ගත කර ඇත.

- 2024 තුළ ලොව 4 වන ජනප්‍රියතම සංචාරක ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව පත්වීම - ෆොට්පෙද් සඟරාව

- "ඔබගේ ජීවිත කාලය පුරා නැරඹිය යුතු ලොව ප්‍රමුඛ රටවල් 5 අතරට ශ්‍රී ලංකාව පත්වීම 2024-සියෝවර්ල්ඩ් ජාත්‍යන්තර සඟරාව.

- "2024 ගිම්හානය සඳහා සංචාරය කළ යුතුම ගමනාන්ත 3 අතරින් එකක් ලෙස ශ්‍රී ලංකාව පිළිගැනුමට ලක් වීම - ප්‍රවීන ෆෝබ්ස් සඟරාවට විශේෂ ලියුම්කරුවෙකු විසින්.

- බිග් 7 ට්‍රැවල්ස් -"ලොව හොඳම මධුසමය ගත කරන ස්ථාන 20 අතරට. "ලොව අලංකාරවත්ම මධුසමය ගත කරන ගමනාන්ත සොයා යැම.

- 2024 වසරේ දී ජීවිතය පුරාවට සංචාරය කළ යුතු හොඳම රටවල් ලෙස 5 වන ස්ථානය ශ්‍රී ලංකාවට ලැබීම !- ද සියොවර්ල්ඩ් සඟරාවේ වෙබ් අඩවිය.

- හොඳම ජාත්‍යන්තර මණ්ඩලය – සංචාරක ලෝක ඔන්ලයින් ව්‍යාපාරය (TWO) සංවිධානය කළ ස්වර්ණමය සංචාරක සම්මානය 2024 අත්විම

- වැන්ඩලුස්ට් (Wanderlust)- වඩාත් ගැලපෙන දිවයින (ලොවෙන්ම) ලෙස ශ්‍රී ලංකාවට ස්වර්ණ සම්මානය ලැබීම.
- 2025 වසර සඳහා වඩාත් ජනප්‍රියතම තනි සංචාරක ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව පත්විම.

**2024.12.31 දක්වා මුළු ප්‍රචාරණ වියදම් (මුදල් පදනම) - රු. 26,246,017.00 කි**
**භෞතික ප්‍රගතිය: 8.34% සම්පූර්ණයි**

නව නිෂ්පාදන සැකසීම

- **බෞද්ධ වැඩසටහන් කොටස් ප්‍රවර්ධනය**
- **මහනුවර ඇසල පෙරහැර සජීවී විකාශය 2024**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය අංශය සමඟ එක්ව මහනුවර ඇසළ පෙරහැර ගත වූ සිව් වසරක් තුළ සාර්ථකව සජිවීව  වෙබ් විකාශය කරන ලදී. 2024 වර්ෂයේ දී ජර්මන්, ප්‍රංශ,  තායි, හින්දි, මැන්ඩරින්, ජපන්, ඉංග්‍රිසි, සිංහල හා දමිල ඇතුළු භාෂා 10 කින් අවසන් රන්දෝලි පෙරහැර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සාර්ථකව විකාශය කරන ලදී. ශ්‍රී ලංකාවේ දියුණු සංස්කෘතික උරුමයේ විශ්විය ප්‍රකාශනය වර්ධණය කිරීම සහ ජාතික සම්ප්‍රදායන්හි ආශ්චර්යමත්බව ප්‍රදර්ශනය කිරිම මෙමගින් අරමුණු කෙරිනි.






වෙසක් උත්සවය සමඟින් ඉන්දියානු බෞද්ධ සංචාරක නියෝජිතයින් සඳහා බෞද්ධ FAM චාරිකාව

2024 වසරේ වෙසක් උත්සවයත් සමඟ SLTPB විසින් බෞද්ධ සහ වන්දනා චාරිකා හසුරුවන ජාත්‍යන්තර බෞද්ධ සංචාරක නියෝජිතයින්ට සහ 2024 මැයි 22 සිට මැයි 29 දක්වා ඉන්දියාවේ බෞද්ධ සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමයේ සාමාජිකයින්ට රටේ ප්‍රබෝධමත් බව ප්‍රදර්ශනය කිරීමට ආරාධනා කරන ලදී. 2024

වෙසක් සැමරුම සහ රටේ පොහොසත් සංස්කෘතිය ලොව පුරා දැනුවත් කිරීම සහ B2B පැවැත්වීම වැඩසටහන සමඟ සැසිවාරය සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් සංවිධානය කරන ලද බෞද්ධ සහ වන්දනා චාරිකා සඳහා වූ ප්‍රථම B2B උත්සවය ලෙස දේශීය සහ ජාත්‍යන්තර සංචාරක නියෝජිතයින් අතර ජාලය ශක්තිමත් කිරීම.





- **සොලොස්මස්ථාන සහ තායිලන්තය හා ශ්‍රී ලංකාව අතර සබඳතා සඳහා කෙටි වාර්තා වැඩසටහන් නිපදවීම සඳහා සහාය දැක්වීම**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවේ වැදගත් ආගමික ස්ථාන 16 ක් අළලා තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති  කාර්යාලය, තායිලන්ත සංචාරක අධිකාරිය, තායි PBS (තායිලන්ත ගුවන් විදුලි සේවය) සමඟ ඒකාබද්ධව සොලොස්මස්ථාන නමින් සැකසෙන කෙටි වාර්තා වැඩසටහන නිෂ්පාදනය කරන නියෝජිත පිරිස මෙරටට ඒමට අදාලව ගුවන් ටිකට් පත් මිලදී ගෙන ලබා දුනි. තායිලන්තය හා ශ්‍රී ලංකාව අතර බෙද්ධ ආගමික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම කෙටි වාර්තා වැඩසටහනෙහි අරමුණ වේ.





## ➢ දක්ෂිණ MICE EXPO 2024

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් 2024 මැයි 27 දින සිට 31 දක්වා දක්ෂිණ MICE EXPO 2024 සාර්ථකව සංවිධානය කෙරිනි. දකුණු පළාත තුළ සංචාරක නිෂ්පාදන ප්‍රවර්ධනයේ අලෙවි ආයතනය ලෙස ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය “ගේලා නයිට්” තේමාව යටතේ සහ සම්බන්ධ විය.






## ➢ විවාහ මංගල්‍ය ගමනාන්ත ප්‍රවර්ධනය
## ➢ තුර්කියේ EWPC 2024

EWPC නම් විචිත්‍රවත් විවාහ මංගල්‍ය සැළසුම් සමුළුව යනු විශ්ව විවාහ උත්සව සැළසුම් කර්මාන්තයේ ඉගෙනුම්, අන්තර් සබඳතා සහ ව්‍යාපාරික අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඇති දැවැන්තම විවාහ සැලසුම් සමුළු වලින් එකකි.

ගමනාන්ත විවාහ මංගල්‍යයන්හි අලෙවි අංශය ලෙස විචිත්‍රවත් විවාහ මංගල්‍ය සැළසුම් සමුළුවට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රථම වරට සහභාගී විය. ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය SLCB සමඟ ඒකාබද්ධ සාකච්ඡාවකට නිරත වීමට හැකි විය. ශ්‍රී ලංකා සංචාරක ආයතනය සමඟ අපගේ නියෝජනය තුළ ක්ෂේත්‍රයේ නිරත සාමාජිකයන් සිව් දෙනෙකු සම්බන්ධ විය.

- WOW සම්මාන ප්‍රදානය 2024

2024 අගෝස්තු මාසය තුළ පැවති WOW සම්මාන ප්‍රදානය සහ අන්තර් සබඳතා උළෙල ශ්‍රී ලංකා සංචාරක ආයතනය නියෝජනය කෙරිනි. WOW අන්තර් සබඳතාවය, පුද්ගල හමුව සහ සම්මාන ප්‍රදානය යනු සජීවී වැඩසටහන් මාලාවක ප්‍රවීනත්වයේ සැමරුමක් සහ කදිමත්මය හුවා දැක්වීමේ කැඩපතක් විය. මෙම උළෙල තම 15 වන සංවත්සරය මෙසේ සටහන් කරනු ලැබිනි. WOW උළෙල යනු කලාපයේ දැවැන්තම ව්‍යාපාරික සහ පර්යේෂණාත්මක අලෙවිකරනය, MICE සහ සජීවී රසවින්දන හා විවාහ උත්සව කර්මාන්ත මංගල්‍යයයි. 2024 වසරේ පැවති WOW සම්මාන ආසියා උළෙලේදී අමුත්තන් 4500 කට වඩා වැඩි පිරිසක් රටවල් 15 ට අධික ප්‍රමාණයකින් සහභාගි විය. උත්සවය බොම්බායේ ජියෝ විශ්ව සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විනි.






- ANANT EPCC – 2025

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ බොම්බේ ශ්‍රී ලාංකික කොන්සල් ජනරාල් කාර්යාලය එක්ව සංවිධානය කළ ANANT උත්සව සැළසුම්කරුවන්ගේ සංස්කෘතික උළෙල සහ සමුළුව (EPCC) උළෙල 2024 ඔක්තෝබර් මස 11 සිට 12 දක්වා අහමදාබද් හි ශ්‍රී ලාංකික සහභාගිත්වය ලබා දෙමින් රට නියෝජනය කරමින් සංචාරක ගමනාන්ත දැනුවත්විම් කරන ලදී. මෙම දෙදින උත්සව අවස්ථාව තුළ ඉදිරිපත් කිරිම්, සම්මුඛ සාකච්ඡා සහ නවතම ප්‍රවනතා සහ ශ්‍රී ලංකාව පිළිබඳ ගමනාන්ත අවධානය හසු කිරීම් ඇතුළත් විය.




3. **රාමායණ යාත්‍රා ප්‍රවර්ධනය**

**ශ්‍රී ලංකාව තුළ රාමායන ප්‍රවර්ධනය කිරීම සඳහා අති විශේෂ රාමායන් අමුත්තන් පිරිසක් සාදරයෙන් පිළිගෙන පහසුකම් සළසන ලදී.**

ශ්‍රී ලංකාවේ රාමායන් ප්‍රවර්ධනය කිරීම සඳහා අති විශේෂ (VVIP) රාමායන් නියෝජිත පිරිස පිළිගැනීම හා අවස්ථාව ලබාදීම

**2024.12.31 දක්වා වූ නව නිපැයුම් සැකසුම් මුළු වියදම (එක් එක් පදනම මත) රු. 28,768,065/- ක් විය.**
**60.53% ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත.**

➢ අනුමත වාර්ෂික අයවැය **2024**

වගු අංක **4.1.**

| වියදම් | අනුමත අයවැය 2024 රු. | සංශෝධිත අයවැය 2024 රු. | 2024.12.31 දිනට වියදම |
|---|---|---|---|
| අලෙවි ප්‍රවර්ධන | 6,470,000,000 | 1,884,057,357 | 1,523,508,841 |
| කර්මාන්ත සහායක යෝජනා ක්‍රමය | 10,000,000 | 0 | 0 |
| විදේශ දූත මණ්ඩල සහායක ක්‍රියාකාරකම් | 10,000,000 | 13,347,000 | 9,053,070 |
| සංචාර මෙහෙයුම්කරුවන් සමඟ කටයුතු කිරීම් | 500,000,000 | 0 | 0 |
| **මුළු අලෙවිකරණ** | **6,990,000,000** | **1,897,404,357** | **1,532,561,911** |
| සංචාරක ජනමාධ්‍යවේදීන් සඳහා වූ වැඩසටහන (VJP) | 34,000,000 | 39,501,300 | 10,926,047 |
| සංචාරක බ්ලෝග්කරුවන් සඳහා වූ වැඩසටහන (VBP) | 140,000,000 | 40,639,900 | 50,070,732 |
| චිත්‍රපට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයන් | 81,000,000 | 3,201,160 | 3,621,184 |
| සංචාරක පහසුකම් සහ සංචාරක තොරතුරු මධ්‍යස්ථාන | 77,000,000 | 7,050,000 | 5,207,060 |
| දේශීය මාධ්‍ය | 18,300,000 | 1,200,000 | 1,131,426 |
| විශේෂ ව්‍යාපෘතිය | 30,000,000 | 19,000,000 | 18,983,976 |
| **මුළු මහජන සම්බන්ධතා** | **380,300,000** | **110,592,360** | **89,940,425** |
| උත්සව අවස්ථා | 745,355,949 | 119,200,000 | 53,799,150 |
| **උත්සව අවස්ථා මුළු සංඛ්‍යාව** | **745,355,949** | **119,200,000** | **53,799,150** |
| ප්‍රචාරණය | 659,500,000 | 314,690,456 | 26,246,017 |
| **මුළු ප්‍රචාරණ** | **659,500,000** | **314,690,456** | **26,246,017** |
| නව නිෂ්පාදන සංවර්ධනය | 262,000,000 | 47,530,578 | 28,768,065 |
| **මුළු නව නිෂ්පාදන සංවර්ධනය** | **262,000,000** | **47,530,578** | **28,768,065** |
| උපාය මාර්ගික සැලසුම් සහ පර්යේෂණ | 0 | 100,000 | 0 |
| **මුළු උපාය මාර්ගික සැලසුම් සහ පර්යේෂණ** | **0** | **100,000** | **0** |
| විශේෂ ව්‍යාපෘති | 230,000,000 | 27,280,000 | 2,768,700 |
| **මුළු විශේෂ ව්‍යාපෘති** | **230,000,000** | **27,280,000** | **2,768,065** |
| නිෂ්පාදන | 100,000,000 | 98,650,000 | 63,659,361 |
| පරිපාලන/මූල්‍ය/නෛතික/අභ්‍යන්තර විගණනය | 331,570,000 | 253,210,010 | 187,155,300 |
| **සාමාන්‍ය පරිපාලන සහ මූල්‍ය සහ අනෙකුත් උපකාරක සේවා** | **431,570,000** | **251,860,010** | **250,814,661** |
| මුළු වියදම | **9,699,225,949** | **2,868,657,761** | **1,984,898,929** |

*මූලාශ්‍රය : ශ්‍රීලංසංප්‍රකා*

## ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන ලද අභියෝග

1. විනිමය අනුපාතිකය ලෙස රුපියල අවප්‍රමාණය වීම සැලසුම් කරන ලද ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල සමස්ත රුපියල් පිරිවැය ඇස්තමේන්තු වලට බලපෑම.

2. සංකීර්ණ නොවන ජාත්‍යන්තර ප්‍රවර්ධනවල සම්පාදන ක්‍රියාවලියට අනුගත වීම සඳහා අවම වශයෙන් දින 42 ක ලංසු කාලයක් අවශ්‍ය වේ (උදා: ජාත්‍යන්තර සඟරාවල ප්‍රචාරණය, දින 3-4 ක් පවත්වන උත්සව සඳහා මණ්ඩප ඉදිකිරීම්, කෙටි කාලීන සමාජ මාධ්‍ය ප්‍රචාරණ / උපායශීලී වැඩසටහන් ආදිය).

3. සංචාරක කර්මාන්තය වේගයෙන් වර්ධනය වන කර්මාන්තයක් වන අතර අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්තමාන ඩිජිටල් යුගයේ වෙළඳපොළ අවශ්‍යතාවන්ට අනුකූල නොවේ.

4. පසුගිය ආර්ථික හා දේශපාලන අර්බුද හේතුවෙන් ජාත්‍යන්තර සැපයුම්කරුවන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපෘති සඳහා ලංසු තැබීමට මැලිකමක් දක්වයි.

5. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලය නොමැති වීම (උදා. අධ්‍යක්ෂ /දැන්වීම් ප්‍රචාරණ තනතුර පසුගිය වසර 5 තුළ පුරප්පාඩු වී ඇත).

SRI LANKA
CONVENTION BUREAU

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

# කාර්ය සාධන වාර්තාව 2024

## පටුන


පටුන ....................................................................................................................................257
**1. හැඳින්වීම**........................................................................................................................259
2. **දැක්ම සහ මෙහෙවර**..............................................................................................................259
3. සංවිධාන ව්‍යුහය ......................................................................................................................260
**4. අපේක්ෂිත ප්‍රතිදානය**...............................................................................................................261
5. **අපේක්ෂිත ප්‍රතිඵල** .................................................................................................................261
6. **මූල්‍ය ප්‍රගතිය 2024**...............................................................................................................262
7. 2024 **වර්ෂය තුළ ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම්** ..........................................................................263
7.1 **අලෙවිකරණ කටයුතු**.............................................................................................................263
7.1.1 **අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා**.................................................................................263
7.1.2 MICE **විශේෂිත ප්‍රදර්ශන**...................................................................................................266
**7.1.3** MICE **විශේෂ රට ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන**.........................................................270
**7.1.4. විශේෂ ව්‍යාපෘති**..................................................................................................................272
7.1.5 SLCB **වෙබ් අඩවිය** ...........................................................................................................273
7.1.6. SLCB **සමාජ මාධ්‍ය ව්‍යාපාරය**..........................................................................................274
7.1.7 SLCB MICE **සංචාරක සහායක යෝජනා ක්‍රමය** ..................................................................275
7.1.8 **ප්‍රවර්ධන කටයුතු සඳහා ද්‍රව්‍ය නිෂ්පාදනය** ........................................................................275
7.2 **පර්යේෂණ, සංවර්ධනය සහ පුහුණුව සහ ගමනාන්ත මංගල උත්සව ප්‍රවර්ධනය කිරීම** ......................276
*7.3 **දේශීය සහ ජාත්‍යන්තර සංගමය සමඟ අනුබද්ධ වීම** ...............................................................285

**05**

**ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය**

## 1. හැඳින්වීම

1987 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB), විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. එය ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ පාලන නීතිය වන 2005 අංක 38 දරන සංචාරක පනතේ රාමුව තුළ ක්‍රියාත්මක වේ.

සංචාරක සංවර්ධන බද්දෙන් සහ අපගමන බද්දෙන් ලැබෙන 4% ක ආදායමක් සහිතව **ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය** වාර්ෂික රජයේ අයවැයක් සමඟින් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන (MICE) සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට කැපවී සිටී.

## 2. දැක්ම සහ මෙහෙවර

### I. දැක්ම

MICE සංචාරක ව්‍යාපාරය (රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ වැඩසටහන්) සඳහා ආසියාවේ වැඩිම ඉල්ලුමක් ඇති ස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම

### II. මෙහෙයුම

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය MICE සංචාරක ව්‍යාපාරයෙන් තුළින් ප්‍රශස්ත විදේශ විනිමය ආදායමක් උපයනු ඇති අතර එමඟින් ශ්‍රී ලංකාවේ "රැස්වීම් කර්මාන්තය" මත යැපෙන අයගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම තුළින් ජාතික ආර්ථිකයට දායක වීම

## 3. සංවිධාන ව්‍යුහය

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය - අනුමත සංවිධාන ව්‍යුහය



## 4. අපේක්ෂිත ප්‍රතිදානය

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ සංඛ්‍යාව වැඩි කිරීම.
- විදේශයන්හි MICE ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
- ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්වීම සඳහා දේශීය MICE කර්මාන්තය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය.
- SLCB Event Support යෝජනා ක්‍රමය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාර වැඩසටහන් ක්ෂේත්‍රයේ සජීවීව පෙනී සිටීම සඳහා සමාජ මාධ්‍ය අලෙවිකරණ ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම.
- ආසියාතික රටවල් අතර හුවමාරුවන අයුරින් සංගම් රැස්වීම් දිරිමත් කිරීම සඳහා කලාපයේ අනෙකුත් සම්මුති කාර්යාංශ සමඟ සම්බඳකම් පැවැත්වීම.

## 5. අපේක්ෂිත ප්‍රතිඵල

- ශ්‍රී ලංකාව ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය ව්‍යාපාරික වැඩසටහන් සඳහා ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.
- වෙළඳපල අපේක්ෂාවන් කඩිනමින් හඳුනාගැනීම
- ලංසු අවස්ථා සහ පරිවර්තන අනුපාතය වැඩි කිරීම
- ඉලක්ක වෙළඳපල හරහා ‘Meet in Sri Lanka’ සංකල්පය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම
- විනෝදාස්වාද වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම
- බහුකාර්ය ස්ථාන, ජාත්‍යන්තරව සන්නාමගත අධි පරිමා හෝටල් සහ ක්ෂේත්‍රයේ වර්ධනයට සහ සේවා සැපයීමට සහාය වන සේවාවන් ඇතුළු MICE/ව්‍යාපාරික වැඩසටහන් සඳහා රටේ ධාරිතාව වැඩි කිරීම සහ දිරිමත් කිරීම.
- ප්‍රතිරූපය ගොඩනඟා ගමනාන්තයේ ප්‍රොෆයිලය(පැතිකඩ) වර්ධනය කිරීම
- ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- යටිතල පහසුකම් සංවර්ධනය දිරිගැන්වීම

## 6. මූල්‍ය ප්‍රගතිය 2024

| **අනුමත වාර්ෂික අයවැය 2024:** | | **රුපියල් මිලියන** |
| --- | --- | --- |
| ඇස්තමේන්තු කළ ආදායම | : | 318 |
| ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන වියදම | : | 2.5 |
| ඇස්තමේන්තු කළ පුනරාවර්තන වියදම | : | 318 |

| **2024.12.31 දිනට තත්‍ය ආදායම සහ වියදම** | | **- රුපියල් මිලියන** |
| --- | --- | --- |
| තත්‍ය ආදායම | : | 318 |
| **තත්‍ය ප්‍රාග්ධන වියදම** | : | 0.95 |
| තත්‍ය පුනරාවර්තන වියදම | : | 377 |

## 7. 2024 වර්ෂය තුළ ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම්

### 7.1 අලෙවිකරණ කටයුතු

#### 7.1.1 අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා

**I.**

**ව්‍යාපෘතියේ නම** : අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා 2024 අප්‍රේල් 23-28

**ක්‍රියාකාරකම** : පාකිස්තාන මාධ්‍ය නියෝජිත පිරිස සඳහා අවබෝධය වර්ධනය කරවීමේ චාරිකාව

**ස්ථානය** : කොළඹ සහ දකුණ

**ඉලක්කගත කණ්ඩායම** : පකිස්ථාන MICE සංචාරකයින්

**ආරම්භක සහ අවසන් දිනය**: 2024ජනවාරි සිට අප්‍රේල්

**ජයග්‍රහණ** :

- දැනුවත් කිරීම සහ පාකිස්තාන MICE වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛතම MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- සියලුම ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා එකවර ප්‍රසිද්ධිය ලබා ගැනීම
- ව්‍යාපාර සහ Bis-leisure market සඳහා MICE ස්ථාන, ව්‍යාපාරික විභවයන් සහ ආකර්ෂණීය ස්ථාන ප්‍රදර්ශනය කිරීම
- MICE කර්මාන්තයේ වෘත්තිකයන් ව්‍යාපාර සඳහා සූදානම් බවට පණිවිඩය සපයා ඇත.

**වියදම** : රුපියල් මිලියන 3.35






II. **ව්‍යාපෘතියේ නම** : අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා 2024 සැප්තැම්බර් 13-18

**ක්‍රියාකාරකම්** : චෙන්නායි මාධ්‍ය නියෝජිත පිරිස සඳහා අවබෝධය වර්ධනය කරවීමේ චාරිකාව

**ස්ථානය** : දකුණේ වෙරළබඩ ප්‍රදේශය

**ඉලක්ක කණ්ඩායම** : චෙන්නායි MICE වෙළඳපොළ

**ආරම්භක සහ අවසන් දිනය**: ජූලි 2024 සිට සැප්තැම්බර් 2024 දක්වා

**ජයග්‍රහණ** :

- දැනුවත් කිරීම සහ චෙන්නායි MICE වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛතම MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- සියලුම ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා එකවර ප්‍රසිද්ධිය ලබා ගන්න
- ව්‍යාපාර සහ Bis-leisure market සඳහා MICE ස්ථාන, ව්‍යාපාරික විභවයන් සහ ආකර්ෂණීය ස්ථාන ප්‍රදර්ශනය කිරීම
- MICE කර්මාන්තයේ වෘත්තිකයන් ව්‍යාපාර සඳහා සූදානම් බවට පණිවිඩය සපයා ඇත.

.

**වියදම** : රුපියල් මිලියන 3.3







III. **ව්‍යාපෘතියේ නම** : අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා 2024 සැප්තැම්බර් 5-12

**ක්‍රියාකාරකම්** : චීන සංචාරක නියෝජිතයින් සඳහා අවබෝධය වර්ධනය කරවීමේ චාරිකාව

**ස්ථානය** : දකුණේ වෙරළබඩ ප්‍රදේශය

**ඉලක්ක කණ්ඩායම** : චීන MICE වෙළඳපල

**ආරම්භක සහ අවසන් දිනය**: ජූලි 2024 සිට සැප්තැම්බර් 2024 දක්වා

ජයග්‍රහණ :

- දැනුවත් කිරීම සහ චීන MICE වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛතම MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම

- සියලුම ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා එකවර ප්‍රසිද්ධිය ලබා ගන්න

- ව්‍යාපාර සහ Bis-leisure market සඳහා MICE ස්ථාන, ව්‍යාපාරික විභවයන් සහ ආකර්ෂණීය ස්ථාන ප්‍රදර්ශනය කිරීම

- MICE කර්මාන්තයේ වෘත්තිකයන් ව්‍යාපාර සඳහා සූදානම් බවට පණිවිඩය සපයා ඇත.

වියදම : රුපියල් මිලියන 3.2







II. ව්‍යාපෘතියේ නම : අවබෝධය වර්ධනය කරවීමේ චාරිකා 13-18 ඔක්තෝබර් 2024

ක්‍රියාකාරකම් : ගුජරාට් මාධ්‍ය නියෝජිත පිරිස සඳහා අවබෝධය වර්ධනය කරවීමේ චාරිකාව

ස්ථානය : මීගමුව වෙරළ තීරය, දඹුල්ල, සීගිරිය සහ මහනුවර

ඉලක්ක කණ්ඩායම : ගුජරාට් MICE වෙළඳපල

ආරම්භක සහ අවසන් දිනය: ජූලි 2024 සිට ඔක්තෝබර් 2024 දක්වා

ජයග්‍රහණ :

- ගුජරාට් MICE වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛතම MICE ගමනාන්තයක් ලෙස දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

- ශ්‍රී ලංකාවේ MICE පාර්ශ්වකරුවන් සහ චීන සංචාරක නියෝජිතයන් අතර සම්බන්ධය ගොඩනගා ගැනීම සඳහා පැමිණෙන සංචාරක අවස්ථා වැඩි කිරීම

- ව්‍යාපාර සහ Bis-leisure market සඳහා MICE ස්ථාන, ව්‍යාපාරික විභවයන් සහ ආකර්ෂණීය ස්ථාන ප්‍රදර්ශනය කිරීම

- MICE කර්මාන්තයේ වෘත්තිකයන් ව්‍යාපාර සඳහා සූදානම් බවට පණිවිඩය සපයා ඇත.

වියදම : රුපියල් මිලියන 6.5





### 7.1.2 MICE විශේෂිත ප්‍රදර්ශන

V. **ව්‍යාපෘතියේ නම** : OTM සහ SATTE 2024 සහ මුම්බායි සහ නවදිල්ලියේ සංචාරක ජාලකරණ වැඩසටහන්

**ක්‍රියාකාරකම්** : SLTPB සමඟ සහයෝගයෙන් OTM 2023 සහ SATTE, India 2024 වෙත සහභාගී වීම

**ස්ථානය** : OTM - මුම්බායි, ඉන්දියාව සහ SATTE - ග්‍රේටර් නොයිඩා, දිල්ලි, ඉන්දියාව.

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියානු MICE වෙළඳපොළ

**ආරම්භක සහ අවසන් දිනය** : දෙසැම්බර් 2023 පෙබරවාරි 2024

**ජයග්‍රහණ** :

- ශ්‍රී ලංකාව ඉන්දියානු සංචාරකයින්ට යෝග්‍ය MICE සහ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රදර්ශනය කිරීම සහ ඉන්දියානු වෙළෙඳපොළ තුළ පාරිභෝගික දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සහ වර්තමාන වෙළඳපල ප්‍රවණතා, ඇඟවුම් සහ ගැටළු හඳුනා ගැනීමට හැකි විය.

- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රවර්ධනය කිරීම

**වියදම** : රුපියල් 6,562,440.43






VI ව්‍යාපෘතියේ නම : IMEX 2024

ක්‍රියාකාරකම : IMEX 2024 හි ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම

ස්ථානය : ෆ්‍රැන්ක්ෆර්ට්, ජර්මනිය

ඉලක්ක කණ්ඩායම : යුරෝපීය සහ අනෙකුත් සියලුම රටවල් - MICE වෙළඳපල

ආරම්භක සහ අවසන් දිනය: ජනවාරි 2024 සිට මැයි 2024 දක්වා

ජයග්‍රහණ :

- ප්‍රමුඛ ජාත්‍යන්තර සහයෝගිතා, නියෝජිතයන් හමුවී ශ්‍රී ලංකාව සහ එහි MICE අවස්ථා ශ්‍රී ලංකාව පිළිබඳව දැනුවත් කිරීම
- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවට පැමිණීම්/සංචාර සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රියාකරුවන් සමඟ දැනට වැඩ කරන යුරෝපීය සහ අනෙකුත් MICE නියෝජිතයින් සහ සංචාරක මෙහෙයවන්නන් දිරිමත් කිරීම.

වියදම : රුපියල් 37,669,374.16







VII. ව්‍යාපෘතියේ නම : IT & CM China 2024

ක්‍රියාකාරකම : IT & CM China 2024 හි ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කිරීම

ස්ථානය : ෂැංහයි, චීනය

ඉලක්ක කණ්ඩායම : යුරෝපීය සහ අනෙකුත් සියලුම රටවල් - MICE වෙළඳපල

ආරම්භක සහ අවසන් දිනය: ජනවාරි 2024 සිට මැයි 2024 දක්වා

ජයග්‍රහණ :

- ෂැංහයි හි ප්‍රමුඛ ජාත්‍යන්තර සමුපකාර සමාගම්, නියෝජිතයින් හමුවී ශ්‍රී ලංකාව සහ එහි MICE අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම

- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- ශ්‍රී ලංකාවට පැමිණීම්/සංචාර සංඛ්‍යාව වැඩි කිරීමට ශ්‍රී ලංකා ක්‍රියාකරුවන් සමඟ දැනට කටයුතු කරන චීන MICE නියෝජිතයින් සහ සංචාරක ක්‍රියාකරුවන් දිරිමත් කිරීම.

වියදම : රුපියල් 15,393,375.48

VIII. ව්‍යාපෘතියේ නම : Business Luxury Travel Mart (BLTM) වෙළඳ ප්‍රදර්ශනය 2024 - 2024 අගෝස්තු 29-31

ක්‍රියාකාරකම් : BLTM 2024 හි ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරන ලදී

ස්ථානය : නවදිල්ලිය, ඉන්දියාව

ඉලක්ක කණ්ඩායම : ඉන්දියානු MICE වෙළඳපොළ

ආරම්භක සහ අවසන් දිනය : අප්‍රේල් 2024 - සැප්තැම්බර් 2024

ජයග්‍රහණ :

- SLCB BLTM ප්‍රදර්ශනයේදී "යෝග්‍යතම MICE ගමනාන්තය" ලෙසින් සම්මානයට පාත්‍ර වූ අතර BLTM 2024 හි නිල හවුල්කාර රට ලෙස නම් කරන ලදී.

- ඉන්දියානු MICE නියෝජිතයන්, සංගම් සහ ආයතන අතර SLCB MICE සංචාරක ආධාර යෝජනා ක්‍රමය (SLCB MICE Traveler Assistance Scheme) පිළිබඳව දැනුවත් කර ඔවුන්ගේ ඉදිරි වසරේ සංචාරක සැලසුම්වලට ශ්‍රී ලංකාව ඇතුළත් කර ගැනීමට ඔවුන් දිරිමත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- ප්‍රදර්ශන කරපටි සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය අනුග්‍රහය ලබා දෙන ලදී. ප්‍රදර්ශනයට පැමිණි සියලුම අමුත්තන්, සත්කාරක ගැනුම්කරුවන් සහ ප්‍රදර්ශකයින්ට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ලාංඡනය සහිත කරපටි ලබා දෙන ලදී.

වියදම : රුපියල් 32,766,421.82









IX. ව්‍යාපෘතියේ නම : දිරිගැන්වීම්, ව්‍යාපාර සංචාර සහ රැස්වීම් (IBTM) ලෝක වෙළඳ ප්‍රදර්ශනය 2024 – 19-21 නොවැම්බර් 2024

ක්‍රියාකාරකම් : IBTM World 2024 හි ශ්‍රී ලංකා මණ්ඩපය සංවිධානය කරන ලදී

ස්ථානය : බාර්සිලෝනා, ස්පාඤ්ඤය

ඉලක්ක කණ්ඩායම : ලෝක MICE වෙළඳපල

ආරම්භක සහ අවසන් දිනය : අප්‍රේල් 2024 - දෙසැම්බර් 2024

ජයග්‍රහණ :

- ප්‍රමුඛ ජාත්‍යන්තර සහයෝගිතා, නියෝජිතයන් හමුවී ශ්‍රී ලංකාව සහ එහි MICE අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම
- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවට පැමිණීම්/සංචාර සංඛ්‍යාව වැඩි කිරීමට ශ්‍රී ලංකා ක්‍රියාකරුවන් සමඟ දැනට වැඩ කරන යුරෝපීය සහ අනෙකුත් MICE නියෝජිතයින් සහ සංචාරක ක්‍රියාකරුවන් දිරිමත් කිරීම.
- සත්කාරක ගැනුම්කරුවන්ට ගමනාන්ත දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම

වියදම : රුපියල් 37,085,239.63






**7.1.3** MICE විශේෂ රට ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන

**X. ව්‍යාපෘතියේ නම** : **India Roadshow --** ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය **(SLTPB)** සමග සහයෝගීව 2024 ජූලි 10, 12 සහ 14

**ක්‍රියාකාරකම්** : ඉන්දියානු නගර තුනක මාර්ග සංදර්ශන සංවිධානය කරන ලදී

**ස්ථානය** : ඉන්දෝර්, වඩෝදර සහ සූරත්

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියානු සංචාරක ක්‍රියාකරුවන්, **MICE** නියෝජිතයන්, මාධ්‍ය සහ සංගම්

**ආරම්භක සහ අවසන් දිනය** : 2024 පෙබරවාරි සිට 2024 අගෝස්තු දක්වා

**ජයග්‍රහණ** :

- ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යවේදීන්, බ්ලොග්කරුවන් සහ වෙනත් මත දරන නායකයන් සමඟ වැදගත් සම්බන්ධතා ලබා ගැනීම.

- ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සහ **MICE** පිළිබඳ උපරිම මාධ්‍ය නිරාවරණයක් ලබා ගැනීම, තවදුරටත් මහා පරිමාණයෙන් ඵලදායී දැනුවත්භාවයක් ඇති කිරීමට උපකාරී විය.

**වියදම** : **රුපියල්** 7,212,633.81 (**රුපියල්** 5,041,331.00 - ඒකාබද්ධ ප්‍රවර්ධනය සඳහා **SLCB** දායකත්වය ලෙස **SLTPB** වෙත ගෙවීමට)








XI. ව්‍යාපෘතියේ නම : පකිස්තාන MICE Roadshow - 2024 ජූනි 26 සහ 28

ක්‍රියාකාරකම් : MICE ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කිරීම

ස්ථානය : කරච්චි සහ ලාහෝර්

ඉලක්ක කණ්ඩායම : පකිස්තාන සංචාරක ක්‍රියාකරුවන්, MICE නියෝජිතයන්, මාධ්‍ය සහ සංගම්

ආරම්භක සහ අවසන් දිනය : පෙබරවාරි 2024 සිට ජූලි 2024 දක්වා

ජයග්‍රහණ :

- ශ්‍රී ලංකාව පකිස්තාන සංචාරකයින්ට ප්‍රියජනක MICE සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රදර්ශනය කිරීම සහ පාකිස්ථානයේ පාරිභෝගික දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සහ වර්තමාන වෙළඳපල ප්‍රවණතා සහ ගැටළු හඳුනා ගැනීම.

- ශ්‍රී ලංකාවට පැමිණීම්/සංචාර සංඛ්‍යාව වැඩි කිරීමට ශ්‍රී ලංකා ක්‍රියාකරුවන් සමඟ දැනට කටයුතු කරන පාකිස්තාන MICE නියෝජිතයින් සහ සංචාරක ක්‍රියාකරුවන් දිරිමත් කිරීම.

වියදම : රුපියල් 23,620,026.95/-











**XII.** **ව්‍යාපෘතියේ නම** : ශ්‍රී ලංකා සංචාරක ජාලකරණ සැන්දෑව-- සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය **(SLTPB)** සමඟ එක්ව 2024 ජූලි 10

**ක්‍රියාකාරකම** : කල්කටා හි සංචාරක ජාලකරණ සන්ධ්‍යාව සංවිධාන කිරීම

**ස්ථානය** : **Ganges Queen** (සුඛෝපභෝගී භෝජන සංචාර) කොල්කටාහි

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියානු සංචාරක ක්‍රියාකරුවන්, **MICE** නියෝජිතයන්, මාධ්‍ය සහ සංගම්

**ආරම්භක සහ අවසන් දිනය** : අප්‍රේල් 2024 සිට අගෝස්තු 2024 දක්වා

**ජයග්‍රහණ** :

- ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යවේදීන්, බ්ලොග්කරුවන් සහ වෙනත් මත දරණ නායකයන් සමඟ වැදගත් සම්බන්ධතා ලබා ගැනීම.
- ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සහ **MICE** පිළිබඳ උපරිම මාධ්‍ය නිරාවරණයක් ලබා ගැනීම, තවදුරටත් මහා පරිමාණයෙන් ඵලදායී දැනුවත්භාවය ඇති කිරීමට උපකාරී විය.

**වියදම** : රුපියල් 17,459,762.47/-







### **7.1.4.** **විශේෂ ව්‍යාපෘති**

XIII. ව්‍යාපෘතියේ නම : Sri Lanka MICE Expo 2024 – දක්ෂිණ සංස්කරණය

**ක්‍රියාකාරකම්** : ශ්‍රී ලංකා MICE EXPO 202 4 - දක්ෂිණ සංස්කරණය සංවිධානය කිරීම

**ස්ථානය** : කොළඹ, ගාල්ල සහ හම්බන්තොට

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියාව (නවදිල්ලි, මුම්බායි, බැංගලෝර්, චෙන්නායි) බංග්ලාදේශය, පකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, ජර්මනිය, ඉන්දුනීසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සිංගප්පූරුව, තුර්කිය, ප්‍රංශය, චීනය, ඕස්ට්‍රේලියාව (රටවල් 15 කට වැඩි)

**ආරම්භක සහ අවසන් දිනය** : ජනවාරි 2024 සිට 2024 ජූනි 01 දක්වා

**ජයග්‍රහණ** :

• ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ MICE පාර්ශවකරුවන් විදේශීය ගැනුම්කරුවන් සමඟ සම්බන්ධ කිරීම

• ගෝලීය MICE පාර්ශවකරුවන්ට ශ්‍රී ලංකාවේ MICE කර්මාන්තයේ තත්ත්වය ප්‍රදර්ශනය කිරීම

• MICE කර්මාන්තයේ වෘත්තිකයන් ව්‍යාපාර සඳහා සූදානම් බවට පණිවිඩය සපයා ඇත.

• MICE සංචාරක ස්ථානයක් ලෙස දකුණු ශ්‍රී ලංකාව ප්‍රදර්ශනය කිරීම

**වියදම** : රුපියල් 94,863,408.67





7.1.5 SLCB වෙබ් අඩවිය

XIV. **ව්‍යාපෘතියේ නම** : SLCB වෙබ් අඩවිය

**ක්‍රියාකාරකම්** : වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය, නඩත්තුව සහ SEO සක්‍රීය කිරීම

**ස්ථානය** : මාර්ගගත/ඩිජිටල්

**ඉලක්ක කණ්ඩායම** : විදේශීය MICE වෙළඳපොළ සහ දේශීය MICE පාර්ශවකරුවන්

**ආරම්භක සහ අවසන් දිනය:**

**ජයග්‍රහණ** :

- වැඩිදියුණු කළ පරිශීලක අත්දැකීමක් සමඟින් නව SLCB වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කර දියත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ MICE පහසුකම් සහ අවස්ථා ප්‍රදර්ශනය කිරීම

- MICE ආශ්‍රිත මූල පද කෙරෙහි අවධානය යොමු කරමින් උපායමාර්ගික SEO ප්‍රශස්තකරණය හරහා වෙබ් අඩවි ගමනාගමනය වැඩි වීම

- සියලුම උපාංග හරහා බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කරන ජංගම-ප්‍රතිචාරාත්මක සැලසුමක් සංවර්ධනය කරන ලදී

- ප්‍රාථමික මූලාශ්‍ර වෙළඳපොලවල් වලට සේවය සැපයීම සඳහා ප්‍රධාන භාෂාවලින් (ඉංග්‍රීසි, චීන, ජර්මන්, ප්‍රංශ) බහුභාෂා සහාය ක්‍රියාත්මක කර ඇත

**වියදම** : රුපියල් 3,267,692.22







### 7.1.6. SLCB සමාජ මාධ්‍ය ව්‍යාපාරය

XV. **ව්‍යාපෘතියේ නම** : SLCB සමාජ මාධ්‍ය ව්‍යාපාරය

**ක්‍රියාකාරකම්** : සමාජ මාධ්‍ය අන්තර්ගතයන් නිර්මාණය, pai මාධ්‍ය ව්‍යාපාරය සහ පිටු පවත්වාගෙන යාම

**ස්ථානය** : අදාල නොවේ

**ඉලක්ක කණ්ඩායම** : විදේශීය MICE වෙළඳපොළ සහ දේශීය MICE කොටස් හිමියන්

**ආරම්භක දිනය** : 2022 සහ වාර්ෂික පදනමින් ක්‍රියාත්මක වේ

**ජයග්‍රහණ :**

- Facebook - පිටු මිලියන 13ක් ලබාගෙන අනුගාමිකයින් 20.5K දක්වා වැඩි කර ඇත.
- Instagram - මිලියන 6.1 ක ප්‍රතිචාර ලබා ගත් අතර අනුගාමිකයින් 1.1 K දක්වා වැඩි කර ඇත
- Google සහ YouTube - Google සහ YouTube වේදිකා හරහා මිලියන 3.3 ක ප්‍රතිචාර ජනනය කරන ලදී
- LinkedIn - 15K දක්වා පුළුල් කර ඇත
- X(Twitter) - මිලියන 2.9 ක ප්‍රතිචාර ලබා ගත් අතර අනුගාමිකයින් 1 K දක්වා වැඩි කර ඇත

වියදම : රුපියල් මිලියන 6.5







7.1.7 SLCB MICE සංචාරක සහායක යෝජනා ක්‍රමය

XVI. ව්‍යාපෘතියේ නම : SLCB Event Support

ක්‍රියාකාරකම් : SLCB MICE හරහා දේශීය MICE කර්මාන්තයට සහාය වීම සංචාරක ආධාර යෝජනා ක්‍රමය

ස්ථානය : ශ්‍රී ලංකාව

ඉලක්ක කණ්ඩායම : ජාත්‍යන්තර MICE ගැනුම්කරුවන්, නියෝජිතයන්, මාධ්‍ය සහ සංගම්

ආරම්භක සහ අවසන් දිනය: 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

ජයග්‍රහණ :

- ඉලක්ක වෙළඳපල හරහා 'Meet in Sri Lanka' සංකල්පය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම
- MICE සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාව වඩාත් කැමති ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට දේශීය MICE කර්මාන්තයට සහාය වීම
- දේශීය සමාගම් 26ක් සඳහා සහය දක්වන ලදී

වියදම : රුපියල් 16,326,392.00

7.1.8 ප්‍රවර්ධන කටයුතු සඳහා ද්‍රව්‍ය නිෂ්පාදනය

XVII. ව්‍යාපෘතියේ නම : ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ වීඩියෝ නිෂ්පාදනය

ක්‍රියාකාරකම් : ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ වීඩියෝ නිෂ්පාදනය - ප්‍රධාන ටැග්, බෑග්, ෆ්ලයියර්, පෝසිලේන් භාණ්ඩ සහ වීඩියෝ

ස්ථානය : අදාල නොවේ

ඉලක්ක කණ්ඩායම : උනන්දුවක් දක්වන පාර්ශ්වයන් අතර ප්‍රවර්ධනය කිරීම

ආරම්භක සහ අවසන් දිනය : 2024 ජනවාරි සිට 2024 දෙසැම්බර් දක්වා

ජයග්‍රහණ : MICE ප්‍රවර්ධනය සඳහා ප්‍රවර්ධන ද්‍රව්‍ය තිබීම

වියදම : රුපියල් 5,137,132.50




7.2 පර්යේෂණ, සංවර්ධනය සහ පුහුණුව සහ ගමනාන්ත මංගල උත්සව ප්‍රවර්ධනය කිරීම

I. **ව්‍යාපෘතියේ නම**: දකුණු කලාපයේ හෝටල්, ස්ථාන සපයන්නන් සහ නරඹන්නන්ගේ අත්දැකීම් සපයන්නන් සඳහා වන කලාපීය MICE පුහුණු වැඩසටහන: පූර්ණ-දින අධ්‍යාපන සැසිය

| | |
|---|---|
| **ක්‍රියාකාරකම්** | : MICE ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී |
| **ස්ථානය** | : බේරුවල |
| **ඉලක්ක කණ්ඩායම** | : හෝටල් හිමියන්/ස්ථාන සපයන්නන් |
| **දිනය** | : 8 මැයි 2024 |
| **ජයග්‍රහණය** | : දකුණු කලාපයේ හෝටල් හිමියන් 40 දෙනෙකු අධ්‍යාපනය ලබා ඇත |
| **වියදම** | : රු. 1,917,480.00 කි |




උත්සවයට සහභාගිවන්නන්

II. **ව්‍යාපෘතියේ නම** : සංස්කෘතික ත්‍රිකෝණ කලාපයේ හෝටල්, ස්ථාන සපයන්නන් සහ නරඹන්නන්ගේ අත්දැකීම් සපයන්නන් සඳහා වන කලාපීය MICE පුහුණු වැඩසටහන: පූර්ණ-දින අධ්‍යාපන සැසිය

**ක්‍රියාකාරකම** : MICE හි අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : හබරණ

**ඉලක්ක කණ්ඩායම** : හෝටල් හිමියන්/ස්ථාන සපයන්නන්

**කාලය** : 15 ඔක්තෝබර් 2024

**ජයග්‍රහණ** : සංස්කෘතික ත්‍රිකෝණ කලාපයේ හෝටල් හිමියන් 40 දෙනෙකු අධ්‍යාපනය ලබා ඇත

**වියදම** : රු. 2,386,128.00 කි




සිදු වෙමින් පවතින මණ්ඩල සාකච්ඡාවක්

---

**III. ව්‍යාපෘතියේ නම** : උතුරු කලාපයේ හෝටල්, ස්ථාන සපයන්නන් සහ නරඹන්නන්ගේ අත්දැකීම් සපයන්නන් සඳහා වන කලාපීය MICE පුහුණු වැඩසටහන: පූර්ණ-දින අධ්‍යාපන සැසිය

**ක්‍රියාකාරකම** : MICE හි අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : යාපනය

**ඉලක්ක කණ්ඩායම** : හෝටල් හිමියන්/ස්ථාන සපයන්නන්

**කාලය** : 2024 නොවැම්බර් 26

**ජයග්‍රහණ** : උතුරු කලාපයේ හෝටල් හිමියන් 40 දෙනෙකු අධ්‍යාපනය ලබා ඇත

**වියදම** : රු. 2,118,770.00 කි




හෝටල් හිමියන් නියෝජනය කරමින් අවස්ථාවට සහභාගීවූවන් 55/5,000

IV. **ව්‍යාපෘතියේ නම** : කර්මාන්ත සහ අනෙකුත් අංශ සඳහා MICE පුහුණු වැඩසටහන: MICE කර්මාන්තය වෙනුවෙන් සාර්ථක ව්‍යාපාරික වැඩසටහන් සඳහා ඩිජිටල් අලෙවිකරණය

**ක්‍රියාකාරකම්** : MICE වැඩසටහන් සඳහා ඩිජිටල් අලෙවිකරණය භාවිතා කිරීම පිළිබඳ අධ්‍යාපන සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : කොළඹ

**ඉලක්ක කණ්ඩායම** : PCO/DMC/EMC/හෝටල්කරුවන්/ උපාධි අපේක්ෂකයින්

**කාලය** : 27 මාර්තු 2024

**ජයග්‍රහණ** : කර්මාන්තයේ සහභාගිවන්නන් 100ක් අධ්‍යාපනය ලබා ඇත

**වියදම** : රු. 308,500.00 කි




සැසිවාරයේ කථිකයන් දෙදෙනෙක්

---

V. **ව්‍යාපෘතියේ නම** : කර්මාන්ත සහ අනෙකුත් අංශ සඳහා MICE පුහුණු වැඩසටහන: ව්‍යාපාරික වැඩසටහන් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පළාත් මට්ටමේ රාජ්‍ය ආයතන සහ පාර්ශවකරුවන් සමඟ සංවාදයක් ආරම්භ කිරීම සඳහා පළාත් මට්ටමේ රාජ්‍ය ආයතන සහ පාර්ශවකරුවන් සඳහා ව්‍යාපාරික වැඩසටහන් වල වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන: දකුණ කලාපය

**ක්‍රියාකාරකම** : MICE සිදුවීම් පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : ගාල්ල

**ඉලක්ක කණ්ඩායම** : දකුණු පළාතේ රජයේ නිලධාරීන්

**කාලසීමාව** : 7 මැයි 2024

**ජයග්‍රහණ** : රාජ්‍ය නිලධාරීන් 25 දෙනෙකු අතර දැනුවත් කිරීම

**වියදම** : රු. 5,437.00 කි



සිදුවෙමින් පවතින දැනුවත් කිරීමේ වැඩසටහනක්

---

VI **ව්‍යාපෘතියේ නම** : කර්මාන්ත සහ අනෙකුත් අංශ සඳහා MICE පුහුණු වැඩසටහන: MICE කොළඹ දිස්ත්‍රික්කයේ ආගන්තුක සත්කාර, සංචාරක සහ වැඩසටහන් කළමනාකරණ උපාධි හදාරන සිසුන් සඳහා පුහුණු වැඩසටහන

**ක්‍රියාකාරකම්** : MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : කොළඹ

**ඉලක්ක කණ්ඩායම** : උපාධි අපේක්ෂකයින් / සිසුන්

**කාලසීමාව** : 3 ජූලි 2024

**ජයග්‍රහණ** : උපාධි අපේක්ෂකයින් 50 දෙනෙකු පුහුණු කර ඇත

**වියදම** : රු. 1,386,750.00 කි



වැඩසටහනේදී ඉදිරිපත් කිරීමක් සිදුකරන කථිකයන්

--------------------------------------------------------------------------------------------------------

VII. **ව්‍යාපෘතියේ නම** : කර්මාන්ත සහ අනෙකුත් අංශ සඳහා MICE පුහුණු වැඩසටහන: MICE උතුරු කලාපයේ ආගන්තුක සත්කාර, සංචාරක සහ වැඩසටහන් කළමනාකරණ උපාධි අනුගමනය කරන සිසුන් සඳහා පුහුණු වැඩසටහන

**ක්‍රියාකාරකම්** : MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී

**ස්ථානය** : යාපනය

**ඉලක්ක කණ්ඩායම** : උපාධි අපේක්ෂකයින් / සිසුන්

**කාලය** : 2024 නොවැම්බර් 27

**ජයග්‍රහණ** : උපාධි අපේක්ෂකයින් 50 දෙනෙකු පුහුණු කර ඇත

**වියදම** : රු. 1,107,155.00 කි




සිසුන්ගේ කණ්ඩායම් ඡායාරූපයක්

---

VIII. ව්‍යාපෘතියේ නම : කර්මාන්ත සහ අනෙකුත් අංශ සඳහා MICE පුහුණු වැඩසටහන: MICE ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ආගන්තුක සත්කාර, සංචාරක සහ වැඩසටහන් කළමනාකරණ උපාධි හදාරන සිසුන් සඳහා පුහුණු වැඩසටහන

**ක්‍රියාකාරකම්** : MICE සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපනික සැසියක් පවත්වන ලදී
**ස්ථානය** : බදුල්ල
**ඉලක්ක කණ්ඩායම** : උපාධි අපේක්ෂකයින් / සිසුන්
**කාලය** : 17 දෙසැම්බර් 2024
**ජයග්‍රහණ** : උපාධි අපේක්ෂකයින් 80 දෙනෙකු පුහුණු කර ඇත
**වියදම** : රු. 614,385.00 කි




වැඩසටහනට සහභාගීවූවන්

---

**IX.** ව්‍යාපෘතියේ නම : **MICE ගැනුම් කරුවන්ගේ දත්ත පද්ධතිය**
**ක්‍රියාකාරකම** : **MICE ගැනුම්කරුවන්ගේ දත්ත සමුදායේ සත්කාරකත්වය**
**ස්ථානය** : **අදාල නොවේ**
**ඉලක්ක කණ්ඩායම** : **MICE කර්මාන්තය**
**කාලසීමාව** : **1 ජනවාරි - 12 නොවැම්බර් 2024**
**ජයග්‍රහණ** : **100% (සම්පූර්ණයි)**
**වියදම** : **රු. 4,900.00 කි**

---

**X.** වයාපෘතියේ නම : **තෑගි භාණ්ඩ**
**ක්‍රියාකාරකම්** : **ප්‍රසංශා කිරීමේ සංකේතයක් ලෙස භාවිතා කිරීමට තෑගි භාණ්ඩ නිෂ්පාදනය කිරීම කපීකයන්/කණ්ඩාමේ සාමාජිකයන්**
ස්ථානය : අදාල නොවේ
ඉලක්ක කණ්ඩායම : **MICE පුහුණු වැඩසටහන් වලට සහභාගී වන සම්පත් දායකයින්**
කාලසීමාව : අදාල නොවේ
ජයග්‍රහණ : **55% (තෑගි භාණ්ඩ සඳහා ටෙන්ඩරය අවසන් කිරීමට බලාපොරොත්තු වේ)**
වියදම : රු. **30,429.00 කි**

---

XI. **වයාපෘතියේ නම** : මංගල උත්සව සඳහා වෙළඳ ප්‍රදර්ශන/ එක්ස්පෝ 2024 සඳහා සහභාගී වන්න/ ශ්‍රී ලංකාවේ ගමනාන්ත මංගල උත්සව ප්‍රවර්ධනය සඳහා උනන්දුවක් දක්වන විවාහ සැලසුම්කරුවන් සඳහා සම්මන්ත්‍රණය (EWPC) 2024

**ක්‍රියාකාරකම්** : ජාත්‍යන්තර ගමනාන්ත මංගල උත්සව සත්කාරකත්වය සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කිරීම

**ස්ථානය** : බෝඩ්රම්: ටර්කියේ

**ඉලක්ක කණ්ඩායම** : ජාත්‍යන්තර විවාහ සැලසුම්කරුවන්

**කාලසීමාව** : 2024 අප්‍රේල් 24-26

**ජයග්‍රහණ** :

- ගමනාන්ත මංගල උත්සව සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම

- ජාත්‍යන්තර විවාහ සැලසුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාව ලබා දිය යුතු පහසුකම් පිළිබඳව ජාත්‍යන්තර විවාහ සැලසුම්කරුවන් අතර දැනුවත් කිරීම. ශ්‍රී ලංකාව ඒකාබද්ධව ප්‍රවර්ධනය කිරීම සඳහා මංගල සැලසුම්කරුවන් සමඟ මුණගැසී ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගැනීම

**වියදම** : රු. 3,233,819,66




**මංගල උත්සව සැලසුම්කරුවන් සමඟ ව්‍යාපාරික සැසිය**

---

XII. **ව්‍යාපෘතියේ නම** : ශ්‍රී ලංකාවට ගමනාන්ත මංගල උත්සව ප්‍රවර්ධනය කිරීම සඳහා මංගල වෙළඳ සංදර්ශන/Expo2024 සඳහා සහභාගී වීම: WOW ජාලකරණ සමුළුව සහ සම්මාන 2024

**ක්‍රියාකාරකම්** : ඉන්දියානු සත්කාරකත්වය සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කෙරේ ගමනාන්ත මංගල උත්සව

**ස්ථානය** : මුම්බායි: ඉන්දියාව

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියානු විවාහ සැලසුම්කරුවන්

**කාලය** : 17-18 අගෝස්තු 2024

**ජයග්‍රහණ** :
* මංගල උත්සව ගමනාන්තය සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම
* ඉන්දියානු විවාහ සැලසුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාව ලබා දිය යුතු පහසුකම් පිළිබඳව ඉන්දියානු විවාහ සැලසුම්කරුවන් අතර දැනුවත් කිරීම

**වියදම** : රු. 1,426,910.12 කි




වැඩසටහනේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය

---

XIII. **ව්‍යාපෘතියේ නම** : මංගල උත්සව වෙළඳ සංදර්ශන සඳහා සහභාගී වීම / ශ්‍රී ලංකාවේ ගමනාන්ත මංගල උත්සව ප්‍රවර්ධනය කිරීම සඳහා Expo2024: ANANT EPCC 2024

**ක්‍රියාකාරකම්** : ඉන්දියානු ගමනාන්ත මංගල උත්සව පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රදර්ශනය කෙරේ

**ස්ථානය** : අහමදාබාද්: ඉන්දියාව

**ඉලක්ක කණ්ඩායම** : ඉන්දියානු විවාහ සැලසුම්කරුවන්

**කාලය** : 10-13 ඔක්තෝබර් 2024

**ජයග්‍රහණ** :

- ගමනාන්තය සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම මංගල උත්සව
- ඉන්දියානු විවාහ සැලසුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාව ලබා දිය යුතු පහසුකම් පිළිබඳව ඉන්දියානු විවාහ සැලසුම්කරුවන් අතර දැනුවත් කිරීම

**වියදම** : රු. 1,913,663.85 කි



**XIV.** වයාපෘතියේ නම : විවාහ සැලසුම්කරුවන්ට ආධාර සැපයීම

| | |
|---|---|
| ක්‍රියාකාරකම | : අනුමැතිය/නිෂ්කාශන ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම සහ ගමනාන්ත මංගල උත්සව සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව අලෙවි කිරීමට සැලසුම්කරුවන් පෙළඹවීම. |
| ස්ථානය | : කොළඹ |
| ඉලක්ක කණ්ඩායම | : මංගල සැලසුම්කරුවන් / උත්සව සංවිධායකයින් / හෝටල්කරුවන් |
| කාලය | : 1 ජනවාරි - 31 දෙසැම්බර් 2024 |
| ජයග්‍රහණ / දැනුවත් කිරීම | : ගමනාන්ත මංගල උත්සව පැවැත්වීමේදී සැලසුම්කරුවන්ගේ ගැටළු නිරාකරණය කර |
| වියදම | : රු. 71,950.00 කි |

*7.3 දේශීය සහ ජාත්‍යන්තර සංගමය සමඟ අනුබද්ධ වීම

| | |
|---|---|
| වයාපෘතියේ නම | : ලංසු තැබීමට සහය වීම සහ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත සංගම් සම්මේලන සඳහා සහාය වීම |
| ක්‍රියාකාරකම් | : ලංසු යෝජනා සකස් කිරීම සහ ප්‍රාදේශීය සංගම්වලට සහාය වීම |
| ස්ථානය | : කොළඹ |
| ඉලක්ක කණ්ඩායම | : දේශීය සංගමය |
| දිනය | : 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| ජයග්‍රහණ | : ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 14ක් පවත්වන ලදී * |
| වියදම | : රුපියල් 10, 002,727.00 |

| | **2024 වර්ෂය තුල සංගමය මගින් පවත්වන ලද සම්මන්ත්‍රණ** |
|---|---|
| 1 | ආසියා පැසිෆික් වෛද්‍ය අධ්‍යාපනික සම්මන්ත්‍රනය |
| 2 | වාර්ෂිකව පවත්වනු ලබන අන්තර්ජාතික මළ දරු උපත් සංධානයේ සම්මන්ත්‍රණ |
| 3 | තත්ත්ව පාලන කවයන්ගේ ජාත්‍යන්තර සම්මුතිය |
| 4 | ශ්‍රී ලංකා හෘද රෝග විද්‍යායතනයෙ වාර්ෂික ශාස්ත්‍රීය සැසිවාරය |
| 5 | පුස්තකාල සහ තොරතුරු විද්‍යාව සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ජාතික සම්මන්ත්‍රණය |
| 6 | දූරස්ථ සංවේදනය පිළිබඳ ආසියානු සම්මන්ත්‍රණය |
| 7 | SAPA විද්‍යාත්මක සම්මන්ත්‍රණය |
| 8 | ලොවපුරා මිතුරන්ගේ සම්මන්ත්‍රණය |
| 9 | RESPIRE වාර්ෂික විද්‍යාත්මක හමුව |
| 10 | 57 වැනි වාර්ෂික ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය |
| 11 | එන්ඩොමෙට්‍රියොසිස් සහ ඇඩිනොමියොසිස් පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය |
| 12 | 2024 ජාත්‍යන්තර ආඝාත සමුළුව (ISCSL) |
| 13 | ජාත්‍යන්තර ප්‍රවාහන සහ සැපයුම් කර්මාන්තය පිළිබඳ පර්යේෂණ සමුළුව |
| 14 | ප්‍රජා වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසිවාරය 2024 |